ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

# 2024

# වාර්ෂික වාර්තාව



**විශිෂ්ටත්වයේ මඟ පෙන්වීමෙන්,**
**අරමුණු කරා**

මෙම වාර්තාව සබැඳිව බැලීමට ඔබගේ ස්මාර්ට් උපාංගය සමඟ
QR කේතය පරිලෝකනය කරන්න

# විශිෂ්ටත්වයේ මඟ පෙන්වීමෙන් අරමුණු කරා

අපි අපගේ නවෝත්පාදන පිළිබඳව
වන ආකල්ප සහ සේවාව පිළිබඳ
කැපවීම අඛණ්ඩව පවත්වාගෙන
යන්නෙමු. වසර පුරා, අපගේ
පාර්ශවකරුවන්ට තිරසාර
වටිනාකමක් සැපයීමට අවධානය
යොමු කළ අතර මෙහෙයුම්
කාර්යක්ෂමතාව වර්ධනය කළෙමු.
අපගේ අරමුණ සියලු තීරණ වල
මූලික සාධකය වන අතර,
විශිෂ්ටත්වයට ඇති කැපවීම මෙන්ම
අනාගත අපේක්ෂා සහිත
ආයතනයක් ලෙස සංස්ථාවෙහි
භූමිකාව සවිමත් කරමින් පුළුල්
වන අපේක්ෂා අප විසින් සපුරා
ගන්නා බව තහවුරු කරයි.

# පටුන


**අප ගැන**

02 අපි ගැන

05 අපගේ ගමන් මඟ

07 අපගේ වාර්තාව පිලිබඳව

**සුවිශේෂතා**

09 මූල්‍ය සුවිශේෂතා

11 මෙහෙයුම් සුවිශේෂතා

**පණිවිඩ**

13 සභාපතිතුමාගේ පණිවිඩය

16 කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය

**අපගේ නායකත්වය**

19 අධ්‍යක්ෂ මණ්ඩලය

24 සංස්ථායික කළමනාකාරීත්වය

27 ආයතනික ව්‍යුහය

**සමාලෝචන වාර්තා**

29 මෙහෙයුම් සන්දර්භය

33 කළමණාකරණ විශ්ලේෂණය

43 අපගේ උපාය මාර්ග

**අගය නිර්මාණය කිරීම**

45 ව්‍යාපාර මාදිලිය

47 මූල්‍ය ප්‍රාග්ධනය

51 නිපැයුම් ප්‍රාග්ධනය

55 බුද්ධිමය ප්‍රාග්ධනය

58 මානව ප්‍රාග්ධනය

63 සමාජීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය

67 ස්වාභාවික ප්‍රාග්ධනය

70 පාර්ශවකරුවන් කළමණාකරණය

73 තිරසාර වාර්තාව

**අවදානම් වාර්තාව**

75 අවදානම් කළමනාකරණ වාර්තාව

**පාලනය**

81 ආයතනික යහපාලනය

85 විගණන හා කළමණාකරන කමිටු වාර්තාව

87 අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

**මූල්‍ය ප්‍රකාශන**

92 විගණකාධිපති වාර්තාව

109 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

110 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

111 ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

112 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

113 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**අතිරේක තොරතුරු**

145 දස වසරක සාරාංශය

146 සංස්ථායික තොරතුරු

# අපි ගැන

## දැක්ම

ඛනිජ තෙල් ක්ෂේත්‍රය හා අදාළ කර්මාන්ත සඳහා තිරසාර භාවයක් ලබාදීම මෙන්ම නව අවස්ථාවන් මඟින් සේවාදායකයින්ට නිරන්තර වටිනාකම් සැපයීම.

## මෙහෙවර

**තරඟකාරීත්වය -** ඛනිජ තෙල් සහ ඒ හා බැඳුණු නිෂ්පාදන තරඟකාරී මිල ගණන් යටතේ ලබාදෙමින් වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස කටයුතු කිරීමට ප්‍රයත්න දැරීම.

**තිරසාරබව -** ආර්ථිකමය සමාජමය සහ පාරිසරික වශයෙන් තිරසාර ව්‍යාපාරයක් ලෙස දීර්ඝකාලීන අනාගත ප්‍රතිලාභ උදා කරදීම.

**නිරන්තර වර්ධනය** - මානව සම්පත සහ ක්‍රියාදාමයන්හි සංවර්ධනය මත සංස්ථාවේ වර්ධනය තහවුරු කිරීම මෙන්ම අදාළ සියලු අංශයන්හි වර්ධනයන් ගැන සුපරික්ෂාකාරී වීම.

**අවංක බව -** සංස්ථාවේ යහපත සහතික කරනු සඳහා සියලු අවස්ථාවන්හිදී විශ්වාසදායී ලෙස කටයුතු කිරීම.

**පොදු යහපත** - රටේ සංවර්ධනය වෙනුවෙන් සහයෝගය ලබාදීමේ ඉලක්ක සපුරා ගැනීම.

## අගයන්

තරඟකාරීත්වය

තිරසාර බව

අඛණ්ඩ දියුණුව

අඛණ්ඩත්වය

පොදු යහපත



ලංකා ඛනිජ තෙල් සංස්ථාව (සංස්ථාව) යනු 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා පනත යටතේ සංස්ථාපිත රාජ්‍ය සංස්ථාවකි. අපගේ මූලික අරමුණ වන්නේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, පිරිපහදුව සහ ශ්‍රී ලංකාව පුරා බෙදා හැරීමයි. අපගේ විස්තීර්ණ බෙදාහැරීමේ ජාලය දේශයේ ඉන්ධන ඉල්ලුම සපුරාලීම සහතික කරමින් රට පුරා ව්‍යාප්ත වූවකි. ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය ලෙස, දිවයින පුරා උපායමාර්ගික ලෙස ස්ථාන ගත වූ ඉන්ධන පිරවුම්හල් 1002 ජාලයක් හරහා ඉන්ධන බෙදා හැරීම මගින් අපි අපගේ වෙළඳපල තත්ත්වය පවත්වා ගන්නෙමු.

අපගේ දශක හයක සාර්ථක ඉතිහාසය තුළ, සංස්ථාව ජාතියේ මූලික බලශක්ති සැපයුම්කරු ලෙස ක්‍රියා කර ඇති අතර, එමගින් දේශයේ ආර්ථික ප්‍රගමනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. පසුගිය පනස් වසර පුරා ප්‍රධාන උපාය මාර්ගික වත්කම වන සංස්ථා පිරිපහදුව දේශයට මහඟු මූල්‍ය උත්පාදන වටිනාකමක් ලබා දී ඇත. වර්තමානයේ සංස්ථා අලෙවියෙන් 35% - 50% ප්‍රතිශතයක් පිරිපහදුව මඟින් සපයන අතර ඉතිරිය පිරිපහදු කරන ලද නිෂ්පාදන ආනයන මඟින් සපුරාලයි.



අපගේ මෙහෙයුම්වල සෑම අදියරකදීම පාර්ශවකරුවන්ට වටිනාකමක් ලබා දීමේදී අපගේ දක්ෂ වෘත්තිකයන් 1,972 දෙනෙකුගෙන් යුත් කණ්ඩායම වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අපගේ අනුබද්ධිත සමාගම් අතරින්, තුනෙන් දෙකක හිමිකාරිත්වයක් අප සතු සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL), අපගේ මෙහෙයුම් යටිතල පහසුකම් තුළ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදා හැරීම සහ තොරතුරු තාක්ෂණ සේවා සැපයීම මූලික අරමුණ කරගනිමින් CPSTL ආයතය ස්ථාපිත කරන ලදී. අපගේ අනුබද්ධිත සමාගමක් වන ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් (පුද්ගලික) සමාගමේ 51% ක කොටස් ද අප සතුව ඇති අතර එය බද්ධ ව්‍යාපාර මෙහෙයුමකි.

CPC හි ව්‍යාපාරය මෙහෙයුම් ප්‍රවාහන, ගුවන් තෙල්, විදුලිබල උත්පාදනය, කාර්මික යෙදීම්, කෘෂි රසායන සහ ලිහිසි තෙල් ඇතුළු පුළුල් පරාසයක අංශ ආවරණය කරයි. වසර තුළ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රුපියල් මිලියන 923,442 ක ආදායමක් වාර්තා කළ අතර, රුපියල් මිලියන 32,739 ක ශුද්ධ ලාභයක් උපයා ඇත.

| අංශ | නිෂ්පාදන |
|---|---|
| ප්‍රවාහනය | 92 පෙට්‍රල්<br>95 පෙට්‍රල්<br>ඔටෝ ඩීසල්<br>සුපිරි ඩීසල් |
| බලශක්ති උත්පාදනය | ඔටෝ ඩීසල්<br>දැවි තෙල්<br>නැප්තා |
| ගුවන් සේවා | ජෙට් A-1<br>Av Gas |
| කර්මාන්ත | දැවි තෙල්<br>කාර්මික භූමිතෙල්<br>ලිහිසි තෙල්<br>බිටුමන්<br>සොල්වන්ට් |
| කෘෂි රසායන | කෘෂි රසායන නිෂ්පාදන |
| නැව් තෙල් ව්‍යාපාරය සහ අපනයන | දැවි තෙල්<br>ඩීසල් |

# අපගේ ගමන්මඟ

## 1961

1961 අංක 28 දරන පනත යටතේ රජය සතු ව්‍යාපාරයක් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ස්ථාපිත කරන ලදි.

## 1962

එවකට මෙරට ක්‍රියාත්මක වූ අනෙකුත් තෙල් සමාගම් සමඟ තරඟ කරමින් සංස්ථාව තම ව්‍යාපාරය ආරම්භ කරන ලදි.



## 1964

රට තුළ ඛනිජ තෙල් නිෂ්පාදනය ආනයනය කරනු ලබන, අළෙවි කරන සහ බෙදාහරින එකම ව්‍යාපාරය බවට පත්විය.

## 1968

දිනකට බැරල් 38,000 ක් පිරිපහදු කළ හැකි පිරිපහදුවක් සංස්ථාව විසින් ඉදිකර ඇත

## 1969

පිරිපහදු මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදි. කොලොන්නාව නිමාව තුළම ලිහිසි තෙල් මුසු යන්ත්‍රාගාරයක් එක් කරන ලදි. කෘෂි රසායන අංශය වෙත ප්‍රවේශ විය.

## 1971

සංස්ථා පනතට සිදු කරන ලද සංශෝධන හරහා නැව්තෙල් මෙහෙයුම් කටයුතු සහ ගුවන්තෙල් පිරවීම් මෙහෙයුම් කටයුතු සංස්ථා විෂය පථයට එකතු කරන ලදී.

## 1978

රෙදිපිළි, ටයර් සහ ධීවර කර්මාන්තය සඳහා නයිලෝන් 6 නූල් නිෂ්පාදනය සඳහා යන්ත්‍රාගාරයක් පිහිටුවන ලදි.

## 1979

බොරතෙල් පිරිපහදු ධාරිතාවය වැඩි කරමින් දිනකට බැරල් 50,000 ක් පිරිපහදු කළ හැකි වන පරිදි පිරිපහදු ධාරිතාවය ඉහළ නංවන ලදි.

## 1987

ඔරුගොඩවත්ත ප්‍රදේශයේ බොරතෙල් ගබඩාකරණ ටැංකි සංකීර්ණයක් අතරමැදි පහසුකමක් ලෙස ස්ථාපිත කරමින්, කොළඹ වරායේ සිට 9.2 Km පිටතින් එක ලක්ෂික පාවෙන නැව් නැවැත්වීමේ පහසුකමක් ස්ථාපිත කරන ලදී.

## 1992

පිරිපහදු ක්‍රියාවලියේ නම්‍යතාවය සහ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා බොරතෙල් පිරිපහදු ඒකකය පුනර්ජීවනය කරන ලදි.

## 1994

ද්‍රවිකරණ සහ ලිහිසි තෙල් ආනයනය කිරීම සහ බෙදාහැරීම නියාමනය කරන ලදී.

## 1995

ත්‍රස්තවාදි ප්‍රහාර හේතුවෙන් හානි වූ කොලොන්නාව සහ ඔරුගොඩවත්ත ටැංකි සංකීර්ණ ප්‍රතිසංස්කරණය කිරීම.

## 1999

සපුගස්කන්ද ගින්නෙන් හානි වූ ටැංකි නව බෙදාහැරීම් පර්යන්තයක් සමඟ නැවත ඉදි කරන ලදි. පෙට්‍රල් මුසු තොග නිෂ්පාදනය කිරීමට හැකිවන පරිදි ප්ලැට්ෆෝමර් ඒකකයේ ධාරිතාව වැඩි කරන ලදි.

## 2002

ඔටෝ ඩීසල් තුළ ඇති ගෙන්දගම් අගය අඩු කිරීම සඳහා නවීකරන කටයුතු සිදු කිරීම. පවත්නා ඩීසල් හයිඩ්‍රොට්‍රීටර් (ඒකක 04) පුනර්ජීවනය කිරීම සහ භූමිතෙල් හයිඩ්‍රොට්‍රීටර් (ඒකක 07) ඩීසල් හයිඩ්‍රෝට්‍රීටර් පද්ධතියක් ලෙස පරිවර්තනය කිරීම.

## 2003

සංස්ථාව, ශ්‍රී ලංකා රජය සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම විසින් සමාන අයිතියක් දරනු ලබන අළුතින් පිහිටුවනු ලැබූ පොදු පරිශීලක පහසුකම වෙත ගබඩාකරණ සහ බෙදාහැරීම් ව්‍යාපාරය පවරන ලදි. බණ්ඩාරනායක ගුවන්තොටුපල පරිශ්‍රය තුළ ගුවන් තෙල් පහසුකම් සංකීර්ණයක් සහ ඉන්ධන නළ පද්ධතියක් ආරම්භ කරන ලදි.




## 2010

පිරවුම්හල් 107 ක් සහ තොග ගබඩා පර්යන්ත සමාගමේ 1/3ක සංස්ථාව වෙත ලබාදීමට කැබිනට් මණ්ඩලය තීරණය කරන ලදි. සංස්ථාව විසින් සුපර් ඩීසල් (10 ppm) වෙළඳපල වෙත හඳුන්වා දෙන ලදි.

## 2011

කොළඹ 09 ප්‍රදේශයේ නව ගොඩනැගිල්ලක් වෙත සංස්ථා ප්‍රධාන කාර්යාලය ගෙන යන ලදි. මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපලේ 1 වන අදියර යටතේ ඉන්ධන නල පද්ධතියක් ඉදිකිරීම ආරම්භ කරන ලදි.

## 2012

කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ කොටසක් ලෙස, කොළඹ වරාය තුළ සබ්මැරීන් බොරතෙල් නල මාර්ගය සහ නල සම්බන්ද වන කෙළවර ගමන් මග වෙනස් කිරීම/ ආදේශ කිරීම සම්පූර්ණ කිරීම. මත්තල පිහිටා ඇති හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපලේ දෙවන අදියර යටතේ ගුවන්තෙල් පර්යන්තයේ ඉදි කිරිම් කටයුතු ආරම්භ කරන .ලදි.

## 2013

පෙට්‍රල් ඔක්ටේන් 90 පෙට්‍රල් ඔක්ටේන් 92 දක්වා වන ඉහළ ශ්‍රේණියට ගෙන එන ලදි.

## 2014

මත්තල, හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ගුවන්තෙල් පිරවුම් පර්යන්තය සහ ඉන්ධන නළ පද්ධතිය ස්ථාපිත කරන ලදි. ඒකාබද්ධ පරීක්ෂණ කණ්ඩායමේ (JIG) වාර්ෂික විගණනයේදී “හොඳයි” යන තත්වය (“සාමාන්‍ය” යන තත්වයෙන් ඉහළ තත්වය) සංස්ථාවේ ගුවන් තෙල් අංශයට ලබා දෙන ලදි. ආනයනය සඳහා 500 ppm ඉන්ධන පිරිවිතර හඳුන්වා දෙන ලදි.

## 2016

ඉදිකිරිම්, ක්‍රියාකරවීම සහ පවරා දීම යන පදනම යටතේ ශ්‍රී ලංකාව තුළ ලිහිසි තෙල් මුසු යන්ත්‍රාගාරයක් ක්‍රියාත්මක කිරීම සඳහා හයිරැක්ස් සමාගම සමඟ සංස්ථාව ගිවිසුමකට එළඹෙන ලදි.

## 2018

ගුවන්තෙල් පිරවුම් පද්ධතිය සහ පවත්නා ඉන්ධන නළ පද්ධතිය සංවර්ධනය කිරීම ආරම්භ කිරීම, බණ්ඩාරනායක ජාත්‍යන්තරගුවන්තොටුපලේ සංවර්ධන ව්‍යාපෘතියේ 2 අදියරේ 11 පියවර සමඟ යමින් නව ඒප්‍රන් 4 ඊ කොටසේ ඉන්ධන නළ පද්ධතියක් ස්ථාපිත කිරීම, දැවි තෙල් භාවිතා කරමින් දියර තාර නිෂ්පාදනයට නැවත ප්‍රවේශ විය. ලංකා සුපර් ඩීසල් යුරෝ 4 සහ පෙට්‍රල් 95 යුරෝ 4 හඳුන්වා දෙන ලදී.

## 2019

පිරිපහදුවේ වසර 50ක සංවත්සරය සමරන ලදි.

.

## 2020

ස්වාභාවික ද්‍රවීකෘත වායු (LNG) අංශයේ ආරම්භය.

## 2021

නැව් තෙල් ව්‍යාපාරය නැවත ආරම්භ කිරීම.

.

## 2022

**TPTL** හි ආයෝජනය කිරීම හා ඇ.ඩො. බි. 2.4ක ණය රජය විසින් ලබා ගැනුණි



## 2023

සංස්ථාවේ ඉහළම ආදායම සහ ඉහළම ලාභය වාර්තා කරන ලදී

## 2024

ශ්‍රී ලංකාවේ ප්‍රථම වාණිජ සංවිධානය ලෙස මුදල් වෙළඳ වෙළඳපොළට ඇතුළු වීම.

# අපගේ වාර්තාව පිළිබඳව

මෙම 2024 වර්ෂය සඳහා වන අපගේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව අපගේ ක්‍රියාකාරකම් වාර්තා කිරීමෙහිලා විනිවිදභාවය සඳහා වන අපගේ කැපවීම ප්‍රදර්ශනය කරනු වස් ඒකාබද්ධ ප්‍රවේශයකින් පිළියෙල කර ඇත. මෙම වාර්තාව සංස්ථාවේ උපාය මාර්ග, කාර්ය සාධනය, පාලනය, අවදානම් කළමනාකරණය සහ වටිනාකම් නිර්මාණය කිරීමේ කලාව පිළිබඳ සවිස්තරාත්මක අවබෝධයක් ලබා දීම අරමුණු කරයි.

## විෂය පථය සහ සීමාවන්

2024 ජනවාරි 1 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කාලසීමාව තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ව්‍යාපාරික ආකෘතිය, මෙහෙයුම් පරිසරය, උපාය මාර්ග, සැලකිය යුතු අවදානම් සහ අවස්ථා, පාලනය සහ මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මෙම වාර්ෂික වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇත. මෙම වාර්තාවට මෙම කාලය පුරාවට අපගේ උපාය මාර්ගික ව්‍යාපාර ඒකක වල කාර්ය සාධනයන් ද අන්තර්ගත වේ.

## ප්‍රමාණාත්මකතාව

කෙටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වටිනාකම් උත්පාදනය කිරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු හැකියාව පිළිබඳව දැනුවත් ඇගයීම් කිරීමට අපේක්ෂා කරන වත්මන් සහ විභව පාර්ශ්වකරුවන් විසින් සැලකිය යුතු උනන්දුවක් දක්වනු ඇති බවට අප අපේක්ෂා කරන ප්‍රමාණාත්මකතාව මූලධර්මයේ භාවිතය සම්බන්ධයෙන් අදාළ තොරතුරු මෙම වාර්තාව ඉදිරිපත් කරයි. අපගේ අරමුණ වී ඇත්තේ මෙම වාර්තාවේ ඇතුළත් සියලුම තොරතුරු සංස්ථාවෙහි වටිනාකම් නිර්මාණයට බලපාන සාධකවලට අදාළ වන බව සහතික කිරීමයි.

මීට අමතරව, මෙහි විගණන වාර්තාව සමඟ වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ද ඇතුළත් කර ඇත. මූල්‍ය තොරතුරු නියාමන අවශ්‍යතාවලට අනුකූලව ඉදිරිපත් කර ඇති අතර, එලෙස නොවන බවට පැහැදිලිව ප්‍රකාශ කර නොමැති විට, වාර්තාවේ ඇතුළත් මූල්‍ය නොවන තොරතුරු, සංස්ථාව සඳහා පමණක් අදාළ වන අතර, සංස්ථාවෙහි සමස්ත මෙහෙයුම් ආදායම, වත්කම්, සහ සම්පූර්ණ වගකීම් වලින් 90%කට වඩා වැඩි ප්‍රමාණයක් සංස්ථාව සතු බැවින් ඉන් එහි අනුබද්ධිත ආයතනයන් බැහැර කෙරෙයි.

කෙටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වටිනාකම් නිර්මාණය කිරීමේ හැකියාව කෙරෙහි බාහිර පරිසරය සහ විවිධ ප්‍රාග්ධන සමඟ අන්තර්ක්‍රියා බලපා ඇති ආකාරය සැලකිල්ලට ගනිමින්, අපගේ සියලු වාර්තා සඳහා වාර්තාකරණ රාමුවට මඟ පෙන්වනු ලබන්නේ මෙහි ගෙනහැර දක්වා ඇති මූලධර්ම සහ අවශ්‍යතා මගිනි.

අපගේ ආයතනය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීම සඳහා අපගේ ව්‍යාපාරයේ අංශ (පිටු 2 සිට 12 දක්වා), ව්‍යාපාර ආකෘතිය (පිටු 45 සිට 46 දක්වා) සහ අපගේ වටිනාකම් දාමය පුරා ඇති ක්‍රියාකාරකම් සහ බලපෑම් (පිටු 47 සිට 69 දක්වා) සමාලෝචනය කර ඇත. මෙම විශ්ලේෂණය සංස්ථාව අගය උත්පාදනය කරන ආකාරය හඳුනා ගැනීමට සහ මෙම අගයට බලපාන සාධක හඳුනා ගැනීමට පදනම ලෙස ක්‍රියා කරයි. වටිනාකමක් නිර්මාණය කිරීමේ අපගේ හැකියාව අපගේ මෙහෙයුම් සන්දර්භය (පිටු 29 සිට 32 දක්වා) සහ ඒ ආශ්‍රිත අවදානම් සහ අවස්ථාවන්ට අපගේ ප්‍රතිචාරය (පිටු 75 සිට 80 දක්වා) මත රඳා පවතී.

තවද, මෙම වාර්තාව අපගේ කාර්ය සාධනය (පිටු 33 සිට 42 දක්වා), නායකත්ව කණ්ඩායම (පිටු 19 සිට 26 දක්වා) සහ පාලන භාවිතයන් (පිටු 81 සිට 90 දක්වා) ඉදිරිපත් කරයි. අමතර තොරතුරු අපේක්ෂා කරන පාර්ශ්වකරුවන් සඳහා, අපගේ වාර්ෂික වාර්තා අවශ්‍ය විය හැකි අතිරේක තොරතුරු ඉදිරිපත් කරයි.

අපගේ විගණන කමිටුව විසින් ඒකාබද්ධ සහතික කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නියමිත වේලාව මත පදනම්ව අධ්‍යක්ෂක මණ්ඩලයට අභ්‍යන්තර සහතිකයක් ලබා දේ. විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව 85 සිට 86 දක්වා පිටුවලඉදිරිපත් කර ඇත.

| **වාර්තා කිරීමේ මාදිලිය** |
| --- |
| ♦ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS / LKAS) |
| ♦ යහපාලනය සඳහා පොදු ව්‍යවසාය මාර්ගෝපදේශ |
| ♦ 1971 අංක 28 දරන මුදල් පනත |
| ♦ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත |
| ♦ ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලය විසින් ප්‍රකාශයට පත් කරන ලද ඒකාබද්ධ වාර්තාකරණ (IR) රාමුව |
| ♦ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) |
| ♦ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ හොඳම භාවිතයන් සංග්‍රහය |
| ♦ ලෝක වාර්තාකරණ මූලාරම්භයන් (GRI) |

විගණකාධිපති විසින් අපගේ 2024 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණන වාර්තාව ලබා දී ඇත. (92 සිට 108 දක්වා පිටු බලන්න).

ස්ථාපිත ක්‍රියා පටිපාටි, මූල්‍ය සහ මූල්‍ය නොවන දත්ත ඇතුළත් අපගේ 2024 ඒකාබද්ධ වාර්තාවේ විශ්වසනීයත්වය පිළිබඳ තහවුරුවක් ලබා දෙයි.

## ප්‍රතිචාර

අපගේ වාර්තාවේ අදාලත්වය සහ කියවීමේ පහසුව සම්බන්ධව සංස්ථාව කැප වී ඇත. 2024 වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් වන යෝජනා, විමසීම් සහ ප්‍රතිචාර ඉතා අගය කරනු ලැබේ. ඔබගේ ප්‍රතිචාර පහත ලිපිනයට යොමු කරන්න.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)
අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත
කොළඹ 09.

finadminsec@ceypetco.gov.lk
+94117296147

# අපගේ වාර්තාව වෙත ප්‍රවේශය

### ප්‍රාග්ධනයන්

- මූල්‍ය ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- නිපැයුම් ප්‍රාග්ධනය
- සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
- බුද්ධිමය ප්‍රාග්ධනය
- ස්වාභාවික ප්‍රාග්ධනය

### පාර්ශවකරුවන්

- පාරිභෝගිකයින්
- සේවකයන්
- හිමිකරුවන්
- සැපයුම්කරුවන්
- නියාමකයින්
- ප්‍රජාව

### උපායමාර්ග

- ලාභ වර්ධනය
- මෙහෙයුම් විශිෂ්ටත්වය
- තාක්ෂණික දියුණුව
- මානව ප්‍රාග්ධනයේ ආයෝජනය
- තිරසාර බව
- සැපයුම් දාම කළමනාකරණය

# මූල්‍ය සුවිශේෂතා

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2024 | 2023 යළි ප්‍රකාශිත* | 2024 | 2023 යළි ප්‍රකාශිත |
| | රු. මි. | රු. මි | රු. මි | රු. මි |
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | | | |
| ආදායම - (දළ) | 971,156.09 | 1,314,829.11 | 976,911.66 | 1,313,009.33 |
| දළ ලාභය/(අලාභය ) | 75,720.56 | 162,114.62 | 73,990.53 | 156,073.83 |
| මෙහෙයුම් ලාභය/(අලාභය) | 16,613.25 | 89,871.49 | 21,267.98 | 88,992.30 |
| මූල්‍ය ආදායම | 3,634.82 | 17,588.92 | 3,969.94 | 17,898.96 |
| විනිමය අනුපාත විචලනය | 13,857.90 | 20,340.30 | 13,857.90 | 20,340.30 |
| වර්ෂය සඳහා වන ලාභය/(අලාභය) | 32,930.84 | 120,346.36 | 36,277.02 | 119,746.69 |
| මුළු විස්තීර්ණ ආදායම | 32,738.55 | 120,203.20 | 53,071.44 | 119,549.04 |
| **මූල්‍ය තත්වය** | | | | |
| මුළු වත්කම් | 235,057.54 | 291,674.10 | 285,025.64 | 313,247.74 |
| තොගය | 104,391.89 | 166,802.60 | 105,259.62 | 167,685.66 |
| මුදල් හා මුදල් සමාන දෑ | 55,186.13 | 43,337.62 | 59,611.58 | 44,540.43 |
| ස්කන්ධය | 69,349.61 | 36,611.05 | 111,212.67 | 58,102.03 |
| ජංගම නොවන වගකීම් | 13,102.06 | 14,225.30 | 24,298.58 | 17,944.22 |
| ජංගම නොවන ණය හා ණය ලබාගැනීම් | 9,223.65 | 10,678.38 | 9,223.65 | 10,678.38 |
| කෙටි කාලීන ණය ලබාගැනීම් | - | 59,019.90 | - | 59,019.90 |
| මුළු ණය ගැනීම් | 9,223.65 | 69,698.28 | 9,223.65 | 69,698.28 |

| ප්‍රධාන අනුපාත - සංස්ථාව | 2024 | 2023 | 2022 | 2021 |
|---|---|---|---|---|
| දළ ලාභ අනුපාතය | 7.80% | 12.33% | 3.47% | -0.70% |
| මෙහෙයුම් ලාභාන්තිකය | 1.71% | 6.84% | -0.54% | -7.07% |
| ශුද්ධ ලාභ අනුපාතය | 3.39% | 9.15% | -53.28% | -13.78% |
| මුළු වත්කම් මත ප්‍රතිලාභ | 14.01% | 38.63% | -1.25% | -9.77% |
| තොග පිරිවැටුම් අනුපාතය | 8.12 | 6.60 | 7.43 | 14.05 |
| වත්කම් පිරිවැටුම් අනුපාතය | 4.13 | 4.06 | 2.33 | 1.38 |
| ජංගම අනුපාතය | 1.16 | 0.97 | 0.77 | 0.48 |
| ද්‍රවශීලතා අනුපාතය | 0.48 | 0.34 | 0.51 | 0.42 |
| පොලී ආවරණය | 14.14 | 12.06 | (0.05) | (1.61) |

**971.16**

(රු. බි.)

ආදායම

**75,720**

(රු. මි.)

දළ ලාභය

**277,875**

(රු. මි.)

රජයට දායකත්වය

**235,057.54**

(රු. මි.)

මුළු වත්කම්

**2,586.62**

(රු. මි.)

ප්‍රාග්ධන

**3,634.82**

(රු. මි.)

මූල්‍ය ආදායම

ආදායම




ආදායම වර්ග



# මෙහෙයුම් සුවිශේෂතා

| | ඒකකය | 2024 | 2023 |
|---|---|---|---|
| විකුණුම් | මි. ලීටර | 3,898 | 4,184 |
| වසර අවසානයේ තොගය | මි. ලීටර | 275.24 | 504.46 |
| මුළු පිරවුම්හල් ගණන | ප්‍රමාණය | 1002 | 990 |
| | | | |
| සේවකයන් | ප්‍රමාණය | 1972 | 2,219 |
| කාර්ය මණ්ඩල පිරිවැය | රු. මි. | 6,806 | 6,483 |
| පුහුණු කිරීම් පිරිවැය | රු. මි. | 1.68 | 6.40 |
| | | | |
| මෙහෙයුම් කාල කාර්යක්ෂමතාවය - බොරතෙල් පෙරනය | % | 84.09 | 94.28 |
| පිරිපහදු අපේක්ෂිත හානිය | මෙ.ටො. | 8,786 | 9,708 |
| ජල පරිභෝජනය | මෙ.ටො. | 593,770 | 716,899 |
| | | | |
| **පිරිපහදුවේ සෞඛ්‍ය සහ ප්‍රවේසම්** | | | |
| සේවා කාලය තුළ සිදු වූ අනතුරු | ප්‍රමාණය | 04 | 2 |
| ප්‍රථමාධාර අනතුරු | ප්‍රමාණය | 01 | - |
| වාර්තා වූ සුළු ගිනි ගැනීම් | ප්‍රමාණය | 04 | - |
| | | | |

| පිරිපහදු මෙහෙයුම් | බොරතෙල් ගැනීම් - මෙ. ටො. | වර්ෂයට දින | කැලැන්ඩර් දිනකට ටොන් ගණන |
|---|---|---|---|
| 2024 | 1,543,836 | 308 | 4,218 |
| 2023 | 1,677,034 | 344 | 4,595 |
| 2022 | 529,779 | 140 | 3,790 |
| 2021 | 1,269,938 | 314 | 4,452 |
| 2020 | 1,685,441 | 362 | 4,605 |
| 2019 | 1,864,817 | 357 | 5,109 |



**3,898**

(ලී. මි.)
විකුණුම්



**1,002**

පිරවුම්හල්
ගණන



**1,544**

(000 මෙ.ටො)
බොරතෙල්
යෙදවුම්



**6,806**

(රු. මි.)
කාර්ය මණ්ඩල
පිරිවැය



**1,972**

කාර්ය
මණ්ඩලය



**1,646 326**

ස්ථිර කාර්ය
මණ්ඩලය

### විකුණුම් ප්‍රමාණය




### පිරිපහදු නිෂ්පාදන



# සභාපතිතුමාගේ පණිවුඩය



ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2024 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මට මහත් සතුටකි.

සමාලෝචනයට භාජනය වන වසර, ඔරොත්තු දීමේ හැකියාව, ප්‍රගතිය සහ ජාතික සේවය සඳහා අඛණ්ඩ කැපවීමක් පෙන්නුම් කරන වසරකි. ගෝලීය බලශක්ති ක්ෂේත්‍රය තුළ ඇති අභියෝග මධ්‍යයේ වුවද, මූල්‍ය ස්ථාවරත්වය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය පවත්වා ගනිමින් රට පුරා අඛණ්ඩ ඉන්ධන සැපයුමක් සංස්ථාව සාර්ථකව සහතික කර ඇත. තිරසාරභාවය සහ කාර්යක්ෂමතාව පිළිබඳ දැක්මකින් මෙහෙයවනු ලබන අපගේ උපායමාර්ගික මුලපිරීම්, අපගේ සැපයුම් දාමය ශක්තිමත් කර, බෙදාහැරීමේ ජාල වැඩිදියුණු කර, ඉහළම ගුණාත්මක ප්‍රමිතීන් පවත්වා ගෙන ගොස් ඇත. ගතික මිලකරණ යාන්ත්‍රණයක් අනුගමනය කිරීම තුළින්, අපි මහජන ප්‍රතිලාභ සමඟ පිරිවැය කාර්යක්ෂමතාව ඵලදායී ලෙස සමතුලිත කර ඇති අතර, සියලුම ශ්‍රී ලාංකිකයින් සඳහා විශ්වාසදායක සහ දැරිය හැකි මිලකට බලශක්තිය ලබා දීම සඳහා අප කටයුතු කර ඇත.

## ගෝලීය පරිසරය

2024 දී, ගෝලීය භූ දේශපාලනික භූ දර්ශනය නොසන්සුන්ව පැවති අතර, නැගෙනහිර යුරෝපයේ සහ මැද පෙරදිග පවතින ගැටුම්, එක්සත් ජනපද චීන උපායමාර්ගික එදිරිවාදිකම් ඉහළ යාම සහ මාරුවන සන්ධාන මගින් සලකුණු විය. ආර්ථික සම්බාධක, බලශක්ති ආරක්ෂණ ගැටළු සහ කලාපීය අස්ථාවරත්වය ජාත්‍යන්තර සබඳතා හැඩගැස්වීම දිගටම කරගෙන ගියේය. ගෝලීය ආර්ථිකය 2023 ට සමානව 3.1 - 3.2% කින් පමණ මධ්‍යස්ථව වර්ධනය වූ නමුත් 2019 ට පෙර සාමාන්‍යය වූ 3.8% ට වඩා අඩු විය. ගෝලීය උද්ධමනය 2023 දී 6.8% සිට 2024 දී 5.8% දක්වා අඩු වූ අතර 2025 දී 4.4% දක්වා තවදුරටත් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ, එය ක්‍රමයෙන් ආර්ථික ස්ථාවරත්වය පෙන්නුම් කරයි.

ගෝලීය බොරතෙල් මිල වසරින් වසර පහත වැටුණු අතර, නෝර්ත් සී බ්‍රෙන්ට් බැරලයක සාමාන්‍යයෙන් ඩොලර් 80.64 (−2.3%), WTI ඩොලර් 75.91 (−2.2%) සහ ඩුබායි බොරතෙල් ඩොලර් 79.57 (−3%) විය. වසරේ දෙවන භාගයේදී වඩාත්ම කැපී පෙනෙන පහත වැටීම දුර්වල වෙළඳපල හැඟීම්, සමපේක්ෂණීය විකුණුම් සහ මිල අස්ථාවරත්වය වැඩිවීම නිසා සිදු විය. ගෝලීය තෙල් ඉල්ලුම 1.5 mb/d කින් ඉහළ ගොස් 103.7 mb/d දක්වා පෙන්නුම් කරමින්, පූර්ව වසංගත මට්ටම ඉක්මවා ගියේය. OECD නොවන රටවල් වර්ධනයෙන් වැඩි ප්‍රමාණයක් (1.4 mb/d) මෙහෙයවූ අතර, OECD ඉල්ලුම සුළු වශයෙන් ඉහළ ගියේය. නිෂ්පාදන අනුව, LPG, ගුවන් තෙල්, පෙට්‍රල් සහ නැප්තා පරිභෝජනය වැඩි වූ අතර, ඛනිජ රසායනික ද්‍රව්‍ය වන ඩීසල්/ ගෑසොයිල් ඉල්ලුම 23 tb/d කින් සුළු වශයෙන් අඩු විය.

## දේශීය පරිසරය

වසර දෙකක ආර්ථික හැකිලීමකින් පසු, 2024 දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය 5.0% ක සැබෑ දළ දේශීය නිෂ්පාදිත වර්ධනයක් සමඟ ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත් විය. වර්තමාන මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 29,898.6 ක් වූ අතර, ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය රුපියල් 1,364,235 දක්වා ඉහළ ගිය අතර, ඉහළ නාමික දළ දේශීය නිෂ්පාදිතය සහ 3.8% ක දළ දේශීය නිෂ්පාදිත අවධමනය මෙන්ම සුළු ජනගහන පහත වැටීම ද ඊට හේතු විය.

ආර්ථිකය පුළුල් පදනමක් සහිත ප්‍රකෘතියක් පෙන්නුම් කරමින් කෘෂිකර්මාන්තය 1.2% කින් මධ්‍යස්ථව වර්ධනය වූ අතර (2023 දී 1.6% ට වඩා තරමක් අඩු), 2023 දී 9.2% ක හැකිලීමකින් පසු කර්මාන්ත අංශය 11.0% ක වර්ධනයක් සමඟ ශක්තිමත් ලෙස යථා තත්ත්වයට ද 0.2% ක හැකිලීමකින් පසු සේවා අංශය 2.4% දක්වා වර්ධනයක් පෙන්නුම් කර ක්‍රමයෙන් ආර්ථික සාමාන්‍යකරණය ළඟා කරගෙන ඇත.

පාරිභෝගික සහ ආයෝජක විශ්වාසය යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින්, පරිභෝජනයේ 6.4% ක වැඩිවීමක් සහ ආයෝජනවල 19.6% ක වැඩිවීම හේතුවෙන් දේශීය ඉල්ලුම 9.5% කින් වර්ධනය විය. මේ අතර, උද්ධමනය සෘණාත්මක ලෙස CCPI 4% සිට -1.7% දක්වා සහ NCPI 4.2% සිට -2% දක්වා පහත වැටීම මගින් එය අවධමනකාරී ප්‍රවණතාවයන් පෙන්නුම් කරයි.

ගෝලීය බොරතෙල් මිලෙහි අස්ථාවරත්වය සහ ශ්‍රී ලංකා රුපියලෙහි අගය ඉහළ යාම හේතුවෙන් දේශීය ඛනිජ තෙල් මිල අඛණ්ඩව පහත වැටුණි. ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ සාමාන්‍ය බොරතෙල් ආනයන මිල බැරලයකට ඇමරිකානු ඩොලර් 84.69 දක්වා 5.5% කින් පහත වැටුණි. පිරිවැය පිළිබිඹු කරන මිලකරණය ක්‍රියාත්මක කිරීම තුළින් පෙට්‍රල් 92 සිල්ලර මිල 10.7% කින්, ඔටෝ ඩීසල් 13.1% කින් සහ භූමිතෙල් 23.9% කින් අඩු කරමින්, දේශීය ඉන්ධන පිරිවැය ස්ථාවර කිරීම එහි ප්‍රධාන කාර්යභාරය අවධාරනය කරයි. මේ අතර, පෞද්ගලික අංශයේ තරඟකරුවන් තිදෙනෙකු වෙළඳපොළට පිවිසීමත් සමඟ ශක්තිමත් ආර්ථික ක්‍රියාකාරකම් මධ්‍යයේ ඛනිජ තෙල් අලෙවි පරිමාව 11.3% කින් ඉහළ ගොස් ඇත.

## විශිෂ්ටත්වයේ මඟ පෙන්වීමෙන්, අරමුණු කරා

පසුගිය දශක හයක කාලය තුළ, අපගේ මව්බිමෙහි ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස CPC ආයතනය කටයුතු කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ඉන්ධන සැපයීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. විශිෂ්ටත්වය පිළිබඳ දැක්මකින් මෙහෙයවනු ලබන සංස්ථාව, රට පුරා කර්මාන්ත, කුටුම්භ සහ ප්‍රජාවන් බලගන්වන විශ්වාසදායක සහ නවා බලශක්ති විසඳුම් නිරන්තරයෙන් ලබා දී ඇත. මෙහෙයුම් කාර්යක්ෂමතාව, තාක්‍ෂණික දියුණුව සහ සුවිශේෂී පාරිභෝගික සේවය සඳහා එහි නොසැලෙන කැපවීම, විශ්වාසය, ජාතික අභිමානය සහ තිරසාර ප්‍රගතියේ උරුමයක් ස්ථාපිත කර ඇති අතර, පුළුල් සමාජ-ආර්ථික වර්ධනයට සහාය වන අතරම ඉදිරි පරම්පරාවන් සඳහා රටේ බලශක්ති සුරක්ෂිතභාවය සහතික කරයි.

## කාර්ය සාධනය

දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළවල උච්චාවචනයන් මධ්‍යයේ වුවද, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සිය විකුණුම් වලින් 35-50% ක් අතර ප්‍රමාණයක් පිරිපහදුව හරහා සපයන අතර ඉතිරි ඉල්ලුම ආනයන හරහා සපුරා ගනී. ඵලදායී උපායමාර්ගික මුලපිරීම් මගින් බොරතෙල් සහ පිරිපහදු කළ නිෂ්පාදන අඛණ්ඩව ගලා යාම සහතික කර ඇති අතර, පිරිපහදුවේ සැලසුම් සහගත නඩත්තු කිරීම සඳහා කර ඇති ප්‍රධාන වසා දැමීම් හමුවේ වුවද, මෙට්‍රික් ටොන් 1,543,836 ක නිෂ්පාදනයක් ලබා දී ඇත.

ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන් සහ අනෙකුත් ආර්ථික තත්ත්වයන්හි උච්චාවචනයන්ට අනුවර්තනය වීම සඳහා, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දේශීය විකුණුම් මිල ගණන් සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කළේය. නව වෙළඳපොළට පිවිසෙන්නන්ගෙන් වැඩි වූ තරඟකාරිත්වයක් තිබියදීත්, සංස්ථාව වසර සඳහා රුපියල් බිලියන 75.7 ක දළ ලාභයක් පවත්වා ගෙන ගිය අතර එහි දළ ලාභ අනුපාතය 8.2% කි. කෙසේ වෙතත්, මෙය පෙර වසරේ කාර්ය සාධනය හා සසඳන විට 53% ක පහත වැටීමක් සනිටුහන් කරයි.

ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනවල මිල ගණන් මාසිකව සකස් කරනු ලබන්නේ පිරිවැය සංරචකවල උච්චාවචනයන් පිළිබිඹු කිරීම සඳහා වන අතර එමඟින් ඕනෑම පිරිවැය ප්‍රතිලාභයක් පාරිභෝගිකයින්ට ලබා දෙන බව සහතික කෙරේ. ඒ හා සමානව, තරඟකාරීව පැවතීම සඳහා ජාත්‍යන්තර වෙළඳපල මිලෙහි වෙනස්කම් වලට අනුකූලව ගුවන් ඉන්ධන මිල ගණන් මාසිකව සංශෝධනය කෙරේ. දැවි තෙල්, ඉන්ධන සැපයුම් සහ නැප්තා මිල ගණන් ද ඒ අනුව සෑම මසකම සංශෝධනය කෙරේ

මුල්ම වාණිජ ආයතනය ලෙස විදේශ විනිමය මිලදී ගැනීමේ වේදිකාවට පිවිසීමෙන් සංස්ථාවට තරගකාරී හුවමාරු අනුපාත ලබාගැනීමට හැකිවූ අතර, එමගින් මුදල් පරිවර්තන පිරිවැය අඩු කර සමස්ත මූල්‍ය කාර්යක්ෂමතාව වැඩිදියුණු කරනු ඇත.

සියලුම ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති හෙයින් ගුවන් යානා ඉන්ධන සැපයීම සඳහා පර්යන්ත E ක්‍රියාත්මක කිරීම මෙම වසර තුළ සිදු කර ඇත. මීට අමතරව, අනාගත ඉල්ලුමට සරිලන පරිදි ඉන්ධන ටැංකි සංකීර්ණය තුළ ඉන්ධන සැපයුම් පද්ධතියේ වෙනස් කිරීම් ද සම්පූර්ණ කර ඇත.

TPTL සමඟ ඇති හවුල් ව්‍යාපාරය තුළ අපි සැලකිය යුතු ආයෝජනයක් සිදු කර ඇති අතර, අපගේ ඉන්ධන ගබඩා ධාරිතාව සැලකිය යුතු ලෙස වැඩි කිරීම සඳහා කල්බදු ක්‍රමය යටතේ ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණයෙන් ටැංකි 24 ලබාගෙන අපගේ ව්‍යාපාරය විවිධාංගීකරණය කර ඇත. මෙම වැදගත් යටිතල පහසුකම් ලෝක මට්ටමේ ජාත්‍යන්තර ගබඩා පහසුකමක් බවට වැඩිදියුණු කිරීම සඳහා අභිලාෂකාමී සහ පරිවර්තනීය සංවර්ධන මූලපිරීම් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර එය කාර්යක්ෂමතාව, ආරක්ෂාව සහ තිරසාරභාවය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කරන ගෝලීය වශයෙන් පිළිගත් මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගත කිරීමට බලාපොරොත්තු වේ.

## තිරසාර මෙහෙයුම්

ඛනිජ තෙල් අංශයේ තිරසාරභාවය සඳහා අපගේ කැපවීම, නවෝත්පාදනයන් සහ ආයතනික වගකීම ඒකාබද්ධ කිරීම ඉස්මතු කරයි. සියලුම මෙහෙයුම් හරහා, සංස්ථාව පාරිසරික භාරකාරත්වය, කාබන් විමෝචනය අඩු කිරීම සහ තිරසාර බලශක්ති භාවිතයන් ප්‍රවර්ධනය කිරීම අවධාරණය කරයි. සංස්ථාව අඛණ්ඩව වර්ධනය තිරසාරභාවය සමඟ සමතුලිත කර වෙනස්වන කර්මාන්තයක ආදර්ශයෙන් නායකත්වය දෙන බැවින්, සෑම තෙල් ඒකකයක්ම වගකිවයුතු පරිභෝජනය සංකේතවත් කරයි.

තිරසාර ප්‍රතිපත්ති සහ ප්‍රමිතිගත ඛනිජ තෙල් නිෂ්පාදන මගින් මග පෙන්වනු ලබන, කෘෂි රසායනික හා ඛනිජ රසායනික ක්‍රියාවලීන්ගෙන් ලැබෙන අන්තරායකර රසායනික ද්‍රව්‍ය අපි වගකීමෙන් යුතුව කළමනාකරණය කරමින් පාරිසරික ආරක්ෂාව සඳහා එහි කැපවීම ශක්තිමත් කරමින් සහ හරිත හා තිරසාර අනාගතයක් කරා අර්ථවත් ප්‍රගතියක් ලබා ගනිමු.

තවද, ජලය පිරිපහදු කිරීම සහ බැහැර කිරීම සම්බන්ධයෙන් අපි ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල වන අතර, පූර්ණ පාරිසරික අනුකූලතාව සහතික කරමු. ශක්තිමත් පාරිසරික, සමාජීය සහ පාලන (ESG) මූලධර්ම මගින් මෙහෙයවනු ලබන සංස්ථාව, තිරසාරභාවය, වගකිවයුතු මෙහෙයුම් සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා කැපවී සිටී.

## අනාගත දැක්ම

වේගයෙන් විකාශනය වන ගෝලීය සහ දේශීය බලශක්ති ක්ෂේත්‍රය තුළ අපි අපගේ පරිවර්තන ගමන දිගටම කරගෙන යන අතර, අපගේ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව, මූල්‍ය තිරසාරභාවය සහ ශ්‍රී ලංකාවේ බලශක්ති ආරක්ෂාවට දායකත්වය ලබා දීමට කැපවී සිටිමු.

ඉදිරි වසරවලදී, යටිතල පහසුකම් නවීකරණය කිරීම, සැපයුම් දාම කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ ඛනිජ තෙල් නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් උපායමාර්ගික මූලපිරීම් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත්තෙමු. සැලසුම් කර ඇති පිරිපහදු නවීකරණය සහ පුළුල් කිරීමේ ව්‍යාපෘති දේශීය පිරිපහදු ධාරිතාව වැඩි කිරීම, පිරිපහදු කළ නිෂ්පාදන ආනයනය මත යැපීම අඩු කිරීම සහ ජාත්‍යන්තර පාරිසරික සහ ආරක්ෂක ප්‍රමිතීන්ට අනුකූලව මෙහෙයුම් පෙළගැස්වීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත.

මෙහෙයුම් කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා අපගේ උපාය මාර්ගයන්ගේ කේන්ද්‍රීයව මෙහෙයුම් විශිෂ්ටත්වය, ඩිජිටල් පරිවර්තනය සහ පාලන ප්‍රතිසංස්කරණ පවතිනු ඇත. ශ්‍රම බලකාය සංවර්ධනය සහ ආරක්ෂාව සඳහා අඛණ්ඩ ආයෝජන මෙම උත්සාහයන්ට සහාය වනු ඇති අතර, අප විශ්වාසදායක ජාතික බලශක්ති හවුල්කරු ලෙස සිටීම මෙමඟින් සහතික කරයි.

ගෝලීය තෙල් මිල උච්චාවචනය වීම, විනිමය අනුපාතික පීඩනයන් සහ විකාශනය වන නියාමන පරිසරයන් වැනි අභියෝග මධ්‍යයේ වුවද, අනුගත වීමට සහ වර්ධනය වීමට අපි හොඳින් ස්ථානගත වී සිටිමු. පැහැදිලි උපායමාර්ගික සැලැස්ම, විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණය සහ තිරසාරභාවය කෙරෙහි අවධානය යොමු කරමින්, ඉදිරි දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ වර්ධනය හා සංවර්ධනය බලගන්වමින් ස්ථාවර හා තරඟකාරී අනාගතයක් තුළ සුරක්ෂිත වීම අපගේ අරමුණයි.

## ස්තූතිය පිළිගැන්වීම

අපගේ අඛණ්ඩ ප්‍රගතියට සැබවින්ම උපකාරී වූ මිල කළ නොහැකි මහ පෙන්වීම, නොසැලෙන සහයෝගය සහ කැපවීම වෙනුවෙන් ගරු අමාත්‍යතුමාට, ලේකම්තුමාට සහ බලශක්ති අමාත්‍යාංශයේ නිලධාරීන්ට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

තවද අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින මගේ ගෞරවනීය සහ පළපුරුදු නිළධාරීන්ට ඔවුන්ගේ කැපී පෙනෙන නායකත්වය වෙනුවෙන් මගේ අවංක කෘතඥතාව පළ කරමි. බාහිර පරිසරය විසින් ගෙන එන ලද අභියෝග මධ්‍යයේ වුවද, සංවිධානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ මහ පෙන්වීම යටතේ ඔවුන්ගේ නොසැලෙන කැපවීම සහ නොපසුබට උත්සාහය වෙනුවෙන් ආයතනික කළමනාකරණයට ද ප්‍රශංසා කරමි.

අපගේ දක්ෂ කණ්ඩායම වත්මන් අභියෝග සාර්ථකව ජය ගනිමින්, සංවිධානයේ අනාගතය සඳහා සමෘද්ධිමත්, ඔරොත්තු දෙන සහ තිරසාර ව්‍යවසායයක් බවට පරිවර්තනය කරනු ඇතැයි අපි ශුභවාදීව සහ විශ්වාසයෙන් සිටිමු.



ඩී.ජේ.ඒ.එස් ද එස්. රාජකරුණා

සභාපති

20.11.2025

# කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය



2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟින්, 2024 සඳහා ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

## මෙහෙයුම් පරිසරය

2024 දී, ශ්‍රී ලංකාවේ ආර්ථිකය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ(IMF) සහයෙන් ලද ප්‍රතිසංස්කරණ, දැඩි මුදල් ප්‍රතිපත්ති සහ ශක්තිමත් මූල්‍ය විනය මඟින් 2022 ලැබූ ආර්ථික අර්බුදයෙන් ප්‍රකෘතිමත් වීමේ සලකුණු පෙන්නුම් කළේය. මෙම පියවරයන් උද්ධමනය අඩු කිරීමට සහ ආයෝජක විශ්වාසය වැඩිදියුණු කිරීමට හේතු විය. මෙම වැඩිදියුණු වන ජාතික තත්වය තුළ, සංස්ථාව තීරණාත්මක අවධියකට පිවිසි අතර, දියුණු වෙමින් පවතින ආර්ථික තත්ත්වයන් තුල මෙහෙයුම් සහ උපායමාර්ගික දිශාව ධනාත්මකව හැඩගස්වා ඇත.

ගෝලීය ආර්ථිකය තුළ, උද්ධමනය 2023 දී 6.8% ක් පමණ වූ අතර 2024 දී 5.9% දක්වා අඩුවෙමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට බාහිර මිල පීඩනය අඩු විය. ඊට අනුරූපව, ශ්‍රී ලංකා මහ බැංකු (CBSL) වාර්තා අනුව රටේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (CCPI) 2023 දී 16.5% සිට 2024 දී 0.4% ක් පමණ දක්වා තියුනු ලෙස පහත වැටී ඇති බවත්, එය කෙටි අවධමන කාල පරිච්ඡේදයකින් ද සනිටුහන් කර තිබේ. ගෝලීය වශයෙන් භාණ්ඩ හා ඉන්ධන මිල පහත වැටීම,ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම සහ දැඩි මුදල් හා මූල්‍ය ප්‍රතිපත්ති මෙම මධ්‍යස්ථභාවයට බොහෝ දුරට හේතු විය. උද්ධමනය පහත වැටීම ජීවන වියදම ලිහිල් කිරීමට, දේශීය ඉන්ධන මිල ස්ථාවර කිරීමට සහ සමස්ත ආර්ථික ප්‍රකෘතියට සහාය විය.

2024 දී ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම, ආනයනික ඛනිජ තෙල් නිෂ්පාදනවල පිරිවැය අඩුවීම සංස්ථාවට තවදුරටත් ප්‍රතිලාභ ලබා දුන්නේය. මෙම මුදලේ අගය ඉහළ යාම දේශීය ඉන්ධන මිල අඩුවීමට සෘජුවම දායක වූ අතර, පාරිභෝගිකයින්ට සහන ලබා දී උද්ධමනකාරී පීඩනයන් ලිහිල් කළේය. මෙම හිතකර විනිමය අනුපාතික චලනයන්හි ප්‍රතිඵලයක් ලෙස, 2024 දී සංස්ථාව රුපියල් බිලියන 13.86 විනිමය අනුපාතික ලාභයක් වාර්තා කළ අතර, එය පසුගිය වසරේ රුපියල් බිලියන 20.34 ක් විය. මෙම ලාභය සංස්ථාවේ අඛණ්ඩ මූල්‍ය දියුණුව පිළිබිඹු කරන අතර මෙහෙයුම් පිරිවැය කළමනාකරණය කිරීමේදී මුදල් ස්ථාවරත්වයේ කාර්යභාරය ඉස්මතු කරයි.

දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා මිල නියම කිරීමේ උපාය මාර්ගය අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන අතර, ගෝලීය ඉන්ධන මිලෙහි උච්චාවචනයන් සහ අනෙකුත් ප්‍රධාන පිරිවැය සාධකවලට ප්‍රතිචාර දැක්වීම සඳහා ගැලපීම් සිදු කරනු ලැබේ. ජාත්‍යන්තර ඉන්ධන පිරිවැය, මුදල් විනිමය අනුපාත සහ අනෙකුත් අදාළ වියදම් පිළිබිඹු කිරීම සඳහා මාසිකව මිල ගණන් සමාලෝචනය කර සංශෝධනය කරනු ලැබේ.

## අපගේ කාර්යය සාධනය

සමාලෝචන කාල සීමාව තුළ සැලසුම්ගත නඩත්තු කටයුතු සඳහා නියමිත වේලාවට වසා දැමීමට සිදු වුවද, පිරිපහදුව වසර පුරා මෙහෙයුම් පවත්වා ගෙන ගිය අතර, වාසිදායක ආන්තිකයක් අත්කර ගනිමින් සමස්ත ලාභදායිතාවයට ධනාත්මක දායකත්වයක් ලබා දෙන ලදී. වසර තුළ, අපි ප්‍රධාන වශයෙන් මර්බන් බොරතෙල් එහි පිරිපහදු මෙහෙයුම් සඳහා භාවිතා කරන ලදී. වසර තුළදී බොරතෙල් මෙට්‍රික් ටොන් මිලියන 1.61 (MT) ක් ආනයනය කරන ලද අතර, එයින් මෙට්‍රික් ටොන් මිලියන 1.5 ක් පමණ පිරිපහදුවේදී සකස් කරන ලදී.

නව තරඟකරුවන් ඉන්ධන වෙළඳපලට ඇතුල්වීම සමස්ත ආදායමේ පහත වැටීමකට හේතු වූ අතර එනිසා 2024 දී රුපියල් බිලියන 1,263.6 සිට රුපියල් බිලියන 923 දක්වා පහත වැටීමට හේතුවිය. ප්‍රවාහන අංශය ඉහළම ආදායම් දායකයා ලෙස රැඳී සිටින අතර, එය රුපියල් බිලියන 649 ක් උපයා ඇති අතර 2023 වර්ෂයට ට වඩා 32% ක පහත වැටීමක් වුව ද මිල ගණන් අඩුවීම හේතුවෙන් විකුණුම් පරිමාව 18% කින් පමණක් පෙන්නුම් කරයි තවද පෙට්‍රල් සහ ඩීසල් මිල ඉතා සංවේදීව පැවතුන අතර එය රටේ ජීවන වියදමට සංවේදී ලෙස බලපෑම් කරයි.

වසර තුළ, සියලුම නිෂ්පාදන ඉල්ලුම පහත වැටුණු අතර, නව තරඟකරුවන් හේතුවෙන් පෙට්‍රල් 92 18% කින් ද, පෙට්‍රල් 95 28% කින් ද, ඔටෝ ඩීසල් 17% කින් සහ සුපර් ඩීසල් 21% කින් පහත වැටුණි. සැපයුම් දාම බාධා ඵලදායී ලෙස කළමනාකරණය කරමින් සංස්ථාව වසර පුරා ස්ථාවර ඉන්ධන සැපයුමක් සහතික කළේය. අලෙවි නියෝජිත තොග මට්ටම් අධීක්ෂණ පද්ධති ජාලය හරහා තොග කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කළ අතර, සිල්ලර වෙළඳසැල්වල ස්ථාවර ඉන්ධන සැපයුම සහතික කරන අතර විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල ඉන්ධන හිඟය වලකා ලන ලදී.

ගුවන් යානා ඉන්ධන සැපයුම දෙවන විශාලතම ආදායම් දායකයා වන අතර එය රුපියල් බිලියන 120 ක් ලෙස සටහන් වූයේ සංචාරක ව්‍යාපාරය ප්‍රකෘතිමත් වීම සහ සමස්ත ආර්ථික දියුණුව හරහා වේ. වර්ෂය පුරාම ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ගුවන්තෙල් අංශය සඳහා ස්ථාවර ඉන්ධන සැපයුමක් සහතික කරන ලදී. ඊට අමතරව, සංස්ථාව සාර්ථක ලෙස නව මෙහෙයුම් E පර්යන්තය මෙහෙයුම් කටයුතු සඳහා ආරම්භ කල අතර මෙහෙයුම් පර්යන්ත වන A ,B හා C මෙහෙයුම් වල ශක්තිය වර්ධනය සඳහා පවත්නා නල පද්ධතිය වැඩි දියුණු කරන ලදී.

තවද, විදුලිබල උත්පාදන අංශයෙන් ඉන්ධන ඉල්ලුම 38% කින් පහත වැටුණු අතර, එමඟින් 2023 දී රුපියල් බිලියන 181.38 ක් වූ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආදායම රුපියල් බිලියන 112.15 දක්වා අඩු විය. සංස්ථාව මේ සඳහා මාසික ඉන්ධන මිල සංශෝධනය ක්‍රියාත්මක කළ අතර, අඛණ්ඩ පිරිපහදු මෙහෙයුම් මගින් විශ්වාසදායක ඉන්ධන සැපයුමක් සහතික වීමෙන් ජාතික ආර්ථිකය තුළ මෙම අංශයේ වැදගත් කාර්යභාරය අවධාරණය කෙරිණි.

වැඩිදියුණු කළ සැපයුම් දාම තත්ත්වයන් හේතුවෙන් භූමිතෙල් ඉල්ලුම සම්පූර්ණයෙන්ම සපුරාලීමට අඛණ්ඩ පිරිපහදු මෙහෙයුම් මඟින් හැකි විය. LPG සැපයුමේ සුළු අඩුවීමක් තිබියදීත්, දේශීය අංශයේ ආදායම 28% කින් ඉහළ ගොස් මූල්‍ය වර්ෂය තුළ රුපියල් බිලියන 41.2 ආදායමක් පෙන්නුම් කලේය. තවද, නව තරඟකරුවකු ලෙස නැව්තෙල් අංශයට එක් වී ඉන්ධන සැපයුම් අංශයේ සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ සංස්ථාව, මුළු ආදායමට රුපියල් බිලියන 28 ක දායකත්වයක් ලබා දෙන ලදී.

ඊට අමතරව කර්මාන්ත අංශයේ විකුණුම් ආදායම රුපියල් බිලියන 18.79 සිට රුපියල් බිලියන 19.49 දක්වා වැඩි විය. මෙම අංශය කාර්මික භූමිතෙල්, SBP අලෙවිය, දැවි තෙල් අලෙවිය සහ ලිහිසි තෙල් අලෙවියෙන් උපයන ආදායමෙන් සමන්විත වේ. කෙසේ වෙතත්, කෘෂි රසායනික අංශයේ 46% ක පහත වැටීමක් වාර්තා වූ අතර එය කෘෂි රසායනික වෙළඳපොලේ දැවැන්ත තරඟකාරිත්වය මනාව පෙන්වයි.

තවද, ඩොලර් ගනුදෙනු කිරීමේ ක්‍රමය හඳුන්වාදීම මඟින් විනිමය අනුපාත අවදානම් අවම කරමින් ඉන්ධන ආනයන සඳහා විදේශ මුදල් සුරක්ෂිත කර ගැනීමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හැකි විය. 2024 දී, සංස්ථාව කාලෝචිත ගෙවීම් සහ ණයවර ලිපි හරහා ණය පහසුකම් ලබා ගැනීමෙන් සැපයුම්කරුවන්ගේ විශ්වාසය ශක්තිමත් කළ අතර, එමඟින් බොරතෙල් සහ පිරිපහදු කළ නිෂ්පාදනවල ස්ථාවර සැපයුමක් සහතික විය. පිරවුම්හල් සහ ගුවන්තොටුපළ වෙත විශ්වාසදායක ඉන්ධන බෙදා හැරීමක් පවත්වා ගැනීම සඳහා රජය ගන්නා උත්සාහයන්ගෙන් සහාය ලැබූ මෙම පියවර, ජාතික බලශක්ති සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම සහ කාර්යක්ෂම නිෂ්පාදන සැපයුම් කළමනාකරණය සහතික කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

## උපායමාර්ගික අවධානය

නව වෙළඳපොළ තරඟකරුවන්ගේ පිවිසීම සමඟ, රජය වෙළඳපොළ පැවැත්ම ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති හඳුන්වා දුන් අතර, සංස්ථාව ප්‍රවාහන අංශයේ උපායමාර්ගික ආයෝජන සහ තරඟකාරී මිලකරණය සහ IATA-එකඟතා ගිවිසුම් හරහා ජාත්‍යන්තර ගුවන් සමාගම් ආකර්ෂණය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ පැවැත්ම ඉහළ නැංවීම සඳහා දියුණු පර්යේෂණ හා සංවර්ධන රසායනාගාරවලින් සමන්විත මුතුරාජවෙල ලිහිසි තෙල් නිෂ්පාදන පහසුකමක් සහ අති නවීන කෘෂි රසායනික කර්මාන්ත ශාලාවක් සඳහා ද සංස්ථාව සැලසුම් ඉදිරියට ගෙන යමින් සිටී.

## සම්මාන සහ ගෞරවයන්

අප මුහුණ දුන් සුවිශේෂී අභියෝග අපගේ කණ්ඩායමේ කුසලතා සහ නිපුණතා ප්‍රදර්ශනය කිරීමට අවස්ථාවක් ලබා දුන් අතර, එමඟින් සංස්ථාව හට 2024 වසර සඳහා ගෞරවනීය සම්මානය ලබා ගැනීමට හැකි විය. ගුවන් තෙල් අංශය අඛණ්ඩව එකොළොස් වන වසරටත් 2024 දී ඒකාබද්ධ පරීක්ෂණ විගණනයේදී "හොඳ" සහතිකයක් ලබා ගත් අතර, එමඟින් අපගේ මෙහෙයුම් කෙරෙහි පාරිභෝගික විශ්වාසය ශක්තිමත් කළේය. ඊට අමතරව, සංස්ථාව IATA විගණනය සාර්ථකව සමත් වූ අතර කහ ශ්‍රේණියේ සිට කොළ ශ්‍රේණිය දක්වා උසස්වීමක් ලබා ගත්තේය. වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනය විසින් සංවිධානය කරන ලද හොඳම කළමනාකරණ පිළිවෙත් සම්මාන උළෙලේදී අප පිළිගැනීමේ සහතිකයක් ද දිනාගැනීමට සමත් විය.

මෙම ජයග්‍රහණ පැහැදිලිව පෙන්නුම් කරන්නේ සංස්ථාව වෙළෙඳපොළ තුළ තම ස්ථානය ශක්තිමත් කර පවත්වා ගැනීම සඳහා තම විශේෂඥතාව ඵලදායී ලෙස උපයෝගී කර ගෙන ඇති බවයි.

## ඉදිරි දැක්ම

අනාගත තරඟකාරිත්වය කළමනාකරණය කිරීම සඳහා මිලකරණ උපායමාර්ගය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම තීරණාත්මක වනු ඇති අතර එමඟින් සංස්ථාව මූල්‍යමය වශයෙන් ශක්තිමත්ව පවතින බව සහතික කෙරේ. ඊට අමතරව, විදේශ මුදල් ගනුදෙනු වෙළඳපොළ තුළ සංස්ථාවෙ හි සහභාගීත්වය විනිමය අනුපාත උච්චාවචනයන් හා සම්බන්ධ අවදානම් අවම කිරීමට උපකාරී වේ.

## අගය කිරීම

සංස්ථාවෙ හි මෙහෙයුම් සඳහා දක්වන නොසැලෙන කැපවීම වෙනුවෙන් සභාපතිවරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට මගේ අවංක කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. ආරවුල් විසඳීමට සහ ශ්‍රම බලකායේ හැකියාවන් ප්‍රශස්ත කිරීමට දරන උත්සාහයන් අන්තර් සංවිධාන සබඳතා ශක්තිමත් කර අපගේ අරමුණු ඉදිරියට ගෙන යාමට හේතු වූ අපගේ ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම්වල කැපවීම ද මම අගය කරමි.

ඊට අමතරව, බලශක්ති අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව, අපගේ බැංකුකරුවන්, විගණකවරුන්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් සහ සියලුම කොටස්කරුවන් විසින් ලබා දුන් අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් මම මගේ හෘදයාංගම කෘතඥතාව පළ කරමි.



ආචාර්ය එන්. කේ. එම්. සී. නෙත්තිකුමාර

කළමනාකාර අධ්‍යක්ෂ

19.12.2025







**ඩී.ජේ.ඒ.එස් ද එස්. රාජකරුණා මහතා - සභාපති**

රාජකරුණා මහතා 2024.09.24 දින ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති ලෙස පත් කරන ලද අතර ඔහු අපගේ අනුබද්ධිත ආයතනය වන ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි ද සභාපතිවරයා වේ.

රාජකරුණා මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් කාර්මික රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය ද කැලණිය විශ්වවිද්‍යාලයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ශුද්ධ ගණිතය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය ද ලබා ශක්තිමත් අධ්‍යයන පසුබිමකට හිමිකම් කියයි. මෙම ශක්තිමත් අධ්‍යාපනික පදනම, පුළුල් අත්දැකීම් සමඟින්, ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ නවෝත්පාදනය කෙරෙහි අවධානය යොමු කරමින් සංකීර්ණ මෙහෙයුම් අධීක්ෂණය කිරීමට ඔහුට ඇති හැකියාවට පිටිවහලක් ලබා දෙයි.

රාජකරුණා මහතා තෙල් හා ගෑස් කර්මාන්තයේ, විශේෂයෙන් පර්යන්ත මෙහෙයුම් සහ කළමනාකරණය පිළිබඳ පුළුල් විශේෂඥ දැනුමක් ඇති කීර්තිමත් ප්‍රමුඛයෙකි. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි(CPSTL) දශක දෙකකට අධික කාලයක් කැපවූ සේවාව තුළින් මෙහෙයුම් විශිෂ්ටත්වය කරා මෙහෙයවීමට සහ සංවිධානයේ සාර්ථකත්වය හැඩගැස්වීමට ඔහු මූලික වී ඇත.

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහිඔහුගේ සේවා කාලය පුරාවටම, රාජකරුණා මහතා මුතුරාජවෙල පර්යන්තයේ පර්යන්ත කළමනාකරු සහ නියෝජ්‍ය මෙහෙයුම් කළමනාකරු ඇතුළු ප්‍රධාන නායකත්ව තනතුරු හොබවා ඇත. මෙම කර්තව්‍යයන්හි නියැලෙමින්, ඔහු ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ යටිතල පහසුකම්වල ආරක්ෂිත සහ කාර්යක්ෂම කළමනාකරණය සහතික කළ අතර, එමගින් රටේ බලශක්ති සුරක්ෂිතතාව සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය.

ක්‍රියාශීලි සහ ක්ෂණික උකහාගන්නෙකු ලෙස, රාජකරුණා මහතා ස්වකීය තාක්ෂණික සහ කළමනාකරණ විශේෂඥතාව අඛණ්ඩව වැඩිදියුණු වන ප්‍රකට කර්මාන්ත ප්‍රවණතා සමඟ සමීපව කටයුතු කරයි. ඔහුගේ සුවිශේෂී තීරණ ගැනීමේ කුසලතාවයන් සහ බාධක වලට සන්සුන්ව මුහුණ දීමේ හැකියාව මගින් ඔහුට සංකීර්ණ අභියෝග ජය ගැනීමටත්, බලපෑම්කාරී ප්‍රතිඵල ලබා දීමටත් හැකියාව ලැබී ඇත.

සහයෝගී නායකත්ව විලාසය සඳහා ප්‍රකට ඔහු, ස්වකීය කණ්ඩායම් සාමාජිකයින්ගේ සංවර්ධනය සහ වෘත්තීය සාර්ථකත්වය යන දෙකටම ප්‍රමුඛත්වය දෙන කණ්ඩායම් වැඩ සහ අන්‍යෝන්‍ය ගෞරවය පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කරයි. අඛණ්ඩ වැඩිදියුණු කිරීම්, පාරිසරික භාරකාරත්වය සහ දැනුම හුවමාරු කර ගැනීම සඳහා ගැඹුරු කැපවීමක් සහිත රාජකරුණා මහතා ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයේ කැපී පෙනෙන චරිතයකි. කලාපයේ බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රධාන නායකයෙකු හැටියට . CPSTL සහ CPC ස්ථානගත කරමින්, ඔහුගේ නායකත්වය සහ කැපවීම තුළින් සංස්ථාවේ ප්‍රගතියට සහ නවෝත්පාදනයට අනුබල දීම අඛණ්ඩව සිදුවේ.



**ආචාර්ය එන්.කේ.එම්.සී. නෙත්තිකුමාර මහතා - කළමනාකාර අධ්‍යක්ෂ**

ආචාර්ය නෙත්තිකුමාර මහතා 2024.09.24 දින ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී. ඔහු ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙසද කටයුතු කරයි.

ආචාර්ය නෙත්තිකුමාර යනු විවිධ ක්ෂේත්‍ර වල ශාස්ත්‍රීය සුදුසුකම් සහ පුළුල් කර්මාන්ත අත්දැකීම් සම්මිශ්‍රණයක් සහිත කීර්තිමත් වෘත්තිකයෙකි. ඔහු මැලේසියාවෙන් කළමනාකරණය/ව්‍යාපාර පිළිබඳ ආචාර්ය උපාධියක් ද, එක්සත් රාජධානියෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක්ද, මොරටුව විශ්වවිද්‍යාලයෙන් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධියක් ද ලබා ඇත. ඊට අමතරව, ඔහු ස්වකීය බහුවිධ විශේෂඥතාව පිළිබිඹු කරමින් දේශපාලන විද්‍යාව, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව සහ පරිගණක පාදක ගණකාධිකරණය පිළිබඳ වැනි බහුවිධ ඩිප්ලෝමා ලබා ඇත.

සීමාසහිත CodeGen International (PVT) හි උපදේශක, SLOGAL Energy DMCC ඩුබායි හි දේශීය නියෝජිත / ගෝලීය වෙළඳ මෙහෙයුම් ප්‍රධානි, LGBL (Laugfs/Petredec/ Kleanheat) හි සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී, Edna සමූහයේ නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරී සහ Coca-Cola Sabco හි ව්‍යාපාර ඒකක උපදේශක සහ ව්‍යාපෘති කළමනාකරු,වැනි ගතික වෘත්තීය ජීවිතයක් පුරා විහිදුණු භූමිකාවන් සහිතව, ආචාර්ය නෙත්තිකුමාර මහතා, ව්‍යාපාර සංවර්ධනය, ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සහ තාක්ෂණික ව්‍යාපෘති නායකත්වය පිළිබඳ දැනුම සම්භාරයක් සහිතව අප සමඟ සම්බන්ධව සිටී.

ඔහුගේ විශේෂඥතාවට පර්යේෂණ සහ සංවර්ධන, සැපයුම් දාම කළමනාකරණය, ඉංජිනේරු සැලසුම්, නිෂ්පාදන සංවර්ධනය, සහ ESG අනුකූලතා ඇතුළු පුළුල් පරාසයක් අන්තර්ගත වේ. ඔහු ඉංජිනේරු, ප්‍රසම්පාදන, අති නවීන නිෂ්පාදන පහසුකම් ඉදි කිරීම, LPG / පෙට්‍රෝ රසායනික පර්යන්ත සහ නැව් ජැටි ඉදිකිරීමට නායකත්වය දී ඇත. ආචාර්ය නෙත්තිකුමාර මහතා විසින් CodeGen හි ගණුදෙණුකරුවන් සඳහා Al අනුගත කිරීම ඇතුළු ඵලදායිතා සංවර්ධන සහ ඩිජිටල් පරිවර්තන ව්‍යාපෘති සඳහා ද මූලිකත්වය ගෙන ඇත.

ඔහුගේ ශක්තිමත් ජාලකරණ සහ බහු පාර්ශ්වකරුවන් කළමනාකරණය කර ගැනීමේ කුසලතා නිසා යුනිලීවර්, බ්‍රිතාන්‍ය ගුවන් සේවය සහ ඔරකල් ඇතුළු කීර්තිමත් ගෝලීය පාරිභෝගික පදනමක් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට සහ ටෝටල්, විටෝල් සහ එක්සොන් මොබිල් වැනි බලශක්ති අංශයේ දැවැන්තයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමටද ඔහුට හැකි වී තිබේ. ජාත්‍යන්තර ව්‍යාපාර සඳහා ඔහුගේ දායකත්වය නවෝත්පාදනය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය මෙහෙයවීමට ඔහුට ඇති හැකියාව ඉස්මතු කර පෙන්වයි.



**ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා - අධ්‍යක්ෂක**

බණ්ඩාර මහතා 2024.10.03 දින ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂවරයා ලෙස පත් විය.

බණ්ඩාර මහතා ශ්‍රී ලංකාවේ බාහිර සම්පත් කළමනාකරණය කිරීම සහ ජාතික සංවර්ධන මුලපිරීම් ඉදිරියට ගෙන යාම සම්බන්ධයෙන් පුළුල් පළපුරුද්දක් ඇති ඉහළ දක්ෂ රාජ්‍ය පරිපාලකයෙක් සහ සංවර්ධන ආර්ථික විද්‍යාඥයෙකි. දැනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ බහුපාර්ශ්වික සහ තාක්ෂණික සහාය අංශයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස හෙතෙම කටයුතු කරයි.

ඔස්ට්‍රේලියාවේ Flinders විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක්, කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත්උපාධියක් සහ සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇති බණ්ඩාර මහතාගේ අධ්‍යයන පදනම ශක්තිමත් එකකි. කැලණිය විශ්වවිද්‍යාලයෙන් ගණිතය විෂයෙහි විද්‍යාවේදී (ගෞරව) උපාධියක් ලබා ඇති ඔහු, එමගින් ආර්ථික සැලසුම්කරණයේ සහ ප්‍රතිපත්ති සම්පාදනයේ ඔහුගේ භූමිකාවන් සඳහා අත්‍යවශ්‍ය විශ්ලේෂණ කුසලතාවලින් සන්නද්ධව සිටී.

ඔහුගේ වෘත්තීය ගමනේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මැදපෙරදිග සහ දකුණු ආසියාව සඳහා අධ්‍යක්ෂ, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ බැංකු රක්ෂණ සහ ධීවර අධ්‍යක්ෂ සහ සාර්ක් සහ මැදපෙරදිග කළාපයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වැනි ප්‍රධාන නායකත්ව භූමිකාවන් ඇතුළත්ය. මීට අමතරව, ඔහු ලෝක බැංකු අංශයේ සහ ජාතික අයවැය අංශයේ සහකාර අධ්‍යක්ෂවරයා ලෙස ද කටයුතු කර ඇත.

බණ්ඩාර මහතා තම පරිපාලන භූමිකාවෙන් පරිබාහිර වූ තේ පර්යේෂණ ආයතනය, සමාජ ආරක්ෂණ මණ්ඩලය, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය, ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව සහ සුනිත්‍ය බලශක්ති අධිකාරිය ඇතුළු විවිධ ප්‍රධාන මණ්ඩලවලද සේවය කර ඇත. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජිකයෙකු, පාලි සහ බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු සහ පරමාණුක බලශක්ති මණ්ඩලයේ නිරීක්ෂකයෙකු ලෙස ඔහුගේ දායකත්වය ප්‍රතිපත්තිමය නවෝත්පාදන සහ තිරසාර සංවර්ධනය සඳහා වූ ඔහුගේ කැපවීම පිළිබිඹු කරයි.



**එච්.ටී.පී.චන්දන මහතා - අධ්‍යක්ෂක**

2025.02.18 දින චන්දන මහතා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂවරයා ලෙස පත්විය.

චන්දන මහතා මූල්‍ය කළමනාකරණය, ආයතනික නායකත්වය සහ ව්‍යාපාර උපදේශනය යන ක්ෂේත්‍රවල පුළුල් අත්දැකීම් ඇති දක්ෂ මූල්‍ය වෘත්තිකයෙකි. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන අතර කැලණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් ලබා ඇත.

ඔහු සිය වෘත්තීය ජීවිතය සී.අයි.සී. හෝල්ඩින්ග්ස් පීඑල්සී වෙතින් ආරම්භ කරන ලද අතර එහිදී ඔහු ගණකාධිකාරී, තොරතුරු තාක්ෂණ කළමනාකරු, සමූහ ව්‍යාපාර විශ්ලේෂක සහ ප්‍රසම්පාදන සාමාන්‍යාධිකාරී වැනි ප්‍රධාන තනතුරු දරමින් දශක දෙකකට අධික කාලයක් විවිධ විෂයයන් ඔස්සේ විවිධ අත්දැකීම් ලබා ගත්තේය. සංවිධානය තුළ ඔහුගේ පුළුල් නිරාවරණය මූල්‍ය උපාය මාර්ග, ව්‍යාපාර විශ්ලේෂණ සහ මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට උපකාරි විය.

ඔහුගේ ආයතනික වෘත්තිය ජීවිතයට අමතරව, චන්දන මහතා වසර අටකට වැඩි කාලයක් තිස්සේ CP ඇසෝෂියේට්හි හවුල්කරුවෙකු ලෙස කටයුතු කරන අතර, එහිදී ඔහු පුළුල් පරාසයක සේවාදායකයින්ට මූල්‍ය හා ව්‍යාපාර උපදේශන සේවා සැපයීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

තවද, චන්දන මහතා සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන අතර, ඔහුගේ උපායමාර්ගික අවබෝධය, පාලන විශේෂඥතාව සහ මූල්‍ය ඥානය අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා දෙයි. ඔහුගේ පුළුල් වෘත්තීය පසුබිම සහ නායකත්ව අත්දැකීම් සමාගමේ උපායමාර්ගික තීරණ ගැනීමේ සහ අධීක්ෂණ කාර්යයන් සඳහා සැලකිය යුතු වටිනාකමක් එක් කරයි.



**එම්.කේ. ගරුසිංහ මහතා - අධ්‍යක්ෂ**

ගරුසිංහ මහතා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලද්දේ 2024.09.24 දින දීය.

ගරුසිංහ මහතා, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ (CPC) වසර 14ක ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කර්තව්‍යයන්ද ඇතුළුව වසර 27කට අධික විශේෂඥ දැනුමක් සහිත නාවික හා ඛනිජ තෙල් කර්මාන්ත පිළිබඳ ඉහළ පළපුරුද්දක් දරන වෘත්තිකයෙකි. ඔහු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ සහ සැපයුම් දාම) ලෙස 2023 සැප්තැම්බර් මාසයේදී විශ්‍රාම ගියේය.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් ද, ස්වීඩනයේ ලෝක සමුද්‍ර විශ්වවිද්‍යාලයෙන් සමුද්‍රීය කටයුතු (වරාය කළමනාකරණය) පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ද, කොළඹ විශ්වවිද්‍යාලයෙන් ශුද්ධ හා ව්‍යවහාරික ගණිතය හා රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ද ලබා ඇත. ඔහු වරලත් නැව් තැරැව්කරුවෙකුද වන අතර වරලත් නැව් තැරැව්කරුවන්ගේ කළමනාකරණ ආයතනයේ (MICS, UK) සාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණ ආයතනයේ (MISMM) ආයතනයේ සාමාජිකයෙක් ද වේ.

බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, සංවිධානය කිරීම සහ පාලනය කිරීම ඔහුගේ පුළුල් අත්දැකීම්වලට ඇතුළත් ය. ගරුසිංහ මහතා සංස්ථාවේ තොග සමාලෝචන කමිටු තුළ සිදු කළ ක්‍රියාකාරී සහභාගීත්වය තුළින් කොටස් කළමනාකරණයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත. ඔහු නෞව් ටැංකි හා ටග් කුලියට ගැනීමේ කාර්යයෙහි හසල දැනුමක් ඇත්තෙකුද වන අතර මත්තල ගුවන් තොටුපළේ ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධතිය වැනි යටි නැඹුරු ව්‍යාපෘති සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

ගරුසිංහ මහතාගේ වෘත්තීය ජීවිතය ඩෙන්මාර්කය, ප්‍රංශය, නෙදර්ලන්තය, මෝල්ටා සහ එක්සත් රාජධානිය යන රටවල විශේෂිත පාඨමාලා මගින් ලබාගත් ජාත්‍යන්තර නිරාවරණයෙන් පොහොසත්, සැපයුම්, සැපයුම් දාම කළමනාකරණය, වරාය මෙහෙයුම් සහ නාවික කර්මාන්ත කටයුතු කෙරෙහිද අවධානය යොමු කරයි. ඔහු ජාත්‍යන්තර සමුද්‍ර සංවිධානයේ (IMO) ජාත්‍යන්තර තෙල් දූෂණ වන්දි (IOPC) අරමුදල් රැස්වීම් වැනි ගෝලීය සංසදවලදී ශ්‍රී ලංකාව නියෝජනය කර ඇති අතර සංස්ථාව වෙනුවෙන් ජාත්‍යන්තර බේරුම්කරණ නඩු හැසිරවීමද සිදු කර ඇත.



**එම්. එම්. ක්‍රිස්ටි ඩොස් මහතා - අධ්‍යක්ෂ**

ක්‍රිස්ටි ඩොස් මහතා 2024.09.24 දින සංස්ථාවේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී.

ක්‍රිස්ටි ඩොස් මහතා පුළුල් පරාසයක සිවිල් නීති කටයුතු පිළිබඳ විශේෂඥතාවක් ඇති දශකයකට වැඩි පළපුරුද්දක් ඇති දක්ෂ නීතිඥවරයෙකි. ක්‍රිස්ටි ඩොස් මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිධාරියෙක් වන අතර ඔහු බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානයෙන් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ සහතිකයක් ද ලබා ඇත. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ LLM අපේක්ෂකයෙක් වන අතර ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයේ අධ්‍යාපනය ලබා ඇත.

ඉඩම් නීතිය, බෙදුම් නීතිය, මුදල් අයකර ගැනීම, වාණිජ නීතිය, පවුල් නීතිය, කම්කරු නීතිය, පරිපාලන නීතිය සහ මූලික අයිතිවාසිකම් ඇතුළු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඔහුට පුළුල් විශේෂඥ දැනුමක් තිබේ. ඔහු දිසා අධිකරණ, සිවිල් අභියාචනාධිකරණය, මහාධිකරණය, වාණිජ මහාධිකරණය, අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය යන අධිකරණවල කෘත්‍යයන්ට නිතිපතා සහභාගි වේ. ස්වකීය ප්‍රබල සන්නිවේදන, සංවිධානාත්මක සහ අන්තර් පුද්ගල කුසලතා සඳහා ප්‍රසිද්ධියක් දරන ක්‍රිස්ටි ඩොස් මහතා, කණ්ඩායම් ක්‍රියාකාරකම් සහ සුවිශේෂී නීති සේවා සැපයීමෙහි ලා විශිෂ්ටයෙකි.

# සංස්ථායික කළමනාකාරිත්වය



**එල්. ජී. එම්. ආර්. පෙරේරා මහතා**
**වැඩබලන පිරිපහදු කළමනාකරු**

පෙරේරා මහතා, මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇත.

1992 වසරේදී සංස්ථාවේ උපකරණ ඉංජිනේරුවරයෙකු වශයෙන් ඔහු සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරන ලදී. මෙහෙයුම් පාලන උපකරණ ක්ෂේත්‍රයේ වසර30 කට වඩා අධික අත්දැකීම් සම්භාරයක් ඔහු සතු අතර උපකරණ දෙපාර්තමේන්තුවේ විවිධ තනතුරු ගණනාවක් හොබවා ඇත. ඔහු නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු යන ධුරය හොබවමින් පිරිපහදු අංශයේ ඉලෙක්ට්‍රොනික්, උපකරණ සහ ද්‍රව්‍ය අංශයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරනු ලැබීය. වර්තමානයේ, වැඩබලන පිරිපහදු කළමනාකරු යන ධුරය දරමින් සමස්ත පිරිපහදු කළමනාකරණය සම්බන්ධයෙන් වගකීම් දරනු ලැබේ.



**කේ.ජී.එච්. කෝදාගොඩ මහතා**
**නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු**
**(නිෂ්පාදන සහ මෙහෙයුම්)**

කෝදාගොඩ මහතා මොරටුව විශ්ව විද්‍යාලයේ රසායනික ද්‍රව්‍ය සහ සැකසුම් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ප්‍රථම පන්තියේ ගෞරව උපාධියක් සහ තායිලන්තයේ Chulalonghorns විශ්ව විද්‍යාලය සහ මොරටුව විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන ඛනිජ තෙල් තාක්ෂණය සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි ලබා ඇත. ඔහු වරලත් ඉංජිනේරුවෙකු මෙන්ම ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමයේ ද ආයතනික සාමාජිකයෙකු වේ. ඔහු සිය පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම් සිදු කර ඇති අතර ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ රසායනික ද්‍රව්‍ය සහ සැකසුම් ඉංජිනේරු විද්‍යා අංශයේ සභාපති වශයෙන් ද කටයුතු කර ඇති අතර එහි වසර දෙකක් කවුන්සිලය නියෝජනය කර ඇත.

කෝදාගොඩ මහතා, සිය ඉංජිනේරු වෘත්තිය 2002 වසරේදී Piramal Glass පුද්ගලික සමාගමේ සේවයට එක් වෙමින් ආරම්භ කරනු ලැබීය. අනතුරුව රසායනික ද්‍රව්‍ය පිළිබඳ පළපුරුදු ඉංජිනේරුවරයෙකු වශයෙන් 2006 වසරේදී සංස්ථාවේ සේවයට එක් විය. ඔහු, පිරිපහදු අංශයේ සැකසුම් තාක්ෂණික සේවා සහ නිෂ්පාදන හා මෙහෙයුම් යන ක්ෂේත්‍ර ද ඇතුළත්ව කාර්මික ක්ෂේත්‍රයේ වසර 20කට වඩා අධික පළපුරුද්දක් ලබා ඇත. ඔහු 2021 පෙබරවාරි මාසයේදී නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (නිෂ්පාදන සහ මෙහෙයුම්) ලෙස සේවයට එක් වීමට පෙර රසායනික ඉංජිනේරු, උපයෝගිතා මෙහෙයුම් ප්‍රධානි, කළමනාකරු (පිරිපහදු මෙහෙයුම්) යන තනතුරුවල රාජකාරි ඉටු කර ඇත.

ඔහු දැනට, මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ගිනි සහ ආරක්ෂ දෙපාර්තමේන්තුව, ආර්ථික සහ උපලේඛනගත කිරීම් දෙපාර්තමේන්තුව, සහ සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තය ද ඇතුළත් පිරිපහදු අංශයේ නිෂ්පාදන සහ මෙහෙයුම් කටයුතු ප්‍රධානි වශයෙන් ක්‍රියා කරනු ලැබේ.



**එම්.ජේ.ඩී. මල්ලිකාරච්චි**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි**
**(තාක්ෂණික සේවා සහ ආයතනික කටයුතු)**

පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරු (නිෂ්පාදන) උපාධියක් ලබා ඇති මල්ලිකාරච්චි මහතා, ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යාපෘති කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකුද වේ. ඔහු ප්‍රධාන පෙළේ දේශීය සහ ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යයන, වෘත්තිය සහ කාර්මික පහසුකම් පිළිබඳ ආයතනයන්හි කළමනාකරණ සහ නායකත්වය පිළිබඳ පශ්චාත් උපාධි පුහුණු වැඩසටහන් කිහිපයකටම සහභාගි වී ඇත.

විවිධ ක්ෂේත්‍රවලට අදාළව තෙල් සහ ගෑස් කර්මාන්තයට සම්බන්ධයෙන් වසර 23කට වඩා අධික අත්දැකීම් සම්භාරයක් ඔහු සතුය. මල්ලිකාරච්චි මහතා, 1996 දී ජිනසේන සමාගමේ ඉංජිනේරුවකු වශයෙන් සේවයට බැඳී සිය වෘත්තිය ජීවිතය ආරම්භ කළ අතර අනතුරුව, ඉන්ටර්බෑච් පෝසිලේන් පුද්ගලික සමාගමේ සහකාර යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු ලෙස සේවට එක් විය.

ඔහු, 1999 වසරේදී යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු ලෙස සංස්ථාවට එක්වූ අතර සංස්ථාවට අයත් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ගුවන් සේවා කටයුතු වෙනුවෙන් ව්‍යාපෘති ඉංජිනේරුවරයෙකු, ගුවන් මෙහෙයුම් නියෝජ්‍ය කළමනාකරු වශයෙන් ද කටයුතු කර ඇත. වර්තමානයේ, තාක්ෂණික සේවා සහ ආයතනික කටයුතු පිළිබඳ නියෝජ්‍ය සාමාන්‍යාධිකාර ධුරයේ කටයුතු කරනු ලැබේ.



**කේ.ඩබ්.එස්. පුෂ්පලාල් මහතා**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**
**(මානව සම්පත් සහ පරිපාලන)**

පුෂ්පලාල් මහතා, කොළඹ විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී (දේශපාලන විද්‍යා පිළිබඳ විශේෂ) උපාධිධාරියෙකි. ඔහු ඕස්ට්‍රේලියාවේ AHRI හි සහතිකලත් වෘත්තීය සාමාජිකයෙක් මෙන්ම ශ්‍රී ලංකා සහතිකලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ ද සාමාජිකයෙක් වේ. ඔහු දේශීයව මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද පිළිගත් පුහුණු වැඩසටහන් කිහිපයක් සඳහාම සහභාගි වී ඇත.

කළමනාකරණ අභ්‍යාසලාභියෙකු වශයෙන් 1997දී සංස්ථාවේ සේවයට බැඳුනු පුෂ්පලාල් මහතා මේ වනවිට වසර 26 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත. ඔහුගේ සේවා කාලය තුළදී, නියෝජ්‍ය පිරිස් කළමනාකරු, පරිපාලන කළමනාකරු, මානව සම්පත් කළමනාකරු ආදි විවිධ තනතුරු ගණනාවක කටයුතු කර ඇති අතර දැනට සංස්ථාවේ මානව සම්පත් සහ කළමනාකරණයට අදාළ රාජකාරි සිදු කරමින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පාලන) ධුරයේ හොබවයි.



**එම්.සී.ඩී.පෙරේරා මෙනවිය**
**වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**
**(මුදල්)**

පෙරේරා මෙනවිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් (USJP) වාණිජ විශේෂවේදී දෙවන පන්තියේ ගෞරව උපාධියක් ලබා ඇත. ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (FCA) සාමාජිකාවක් මෙන්ම සහතික කළ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (ACMA) ආශ්‍රිත සාමාජිකාවකි. ඇය සහකාර ගණකාධිකාරිවරියක් ලෙස 2001 දී සංස්ථාව හා සම්බන්ධ වූවාය. සංස්ථාවේ දශක දෙකක දීර්ඝ වෘත්තීය ජීවිතය තුළ ඇය ගණකාධිකාරී, නියෝජ්‍ය මූල්‍ය කළමනාකරු, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මූල්‍ය කළමනාකරු සහ ජ්‍යෙෂ්ඨ මූල්‍ය කළමනාකාර තනතුරු ද 2023 සිට වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මූල්‍ය ලෙස ද කටයුතු කරයි.

පෙරේරා මෙනවිය SAP-ERP පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන සාමාජිකාවක් වශයෙන්ද කටයුතු කර ඇත.ඇය සංස්ථාවේ සියලුම ගිණුම්කරණයන් සහ මූල්‍ය කළමනාකරණ කටයුතු අධීක්ෂණය කරන අතර සංස්ථාවේහි පරිපාලන, සැලසුම්, ගිණුම්කරණය සහ අයවැය සම්බන්ධ ක්‍රියාකාරකම්වල නායකත්වය සහ සම්බන්ධීකරණය ලබා දීමද සිදු කරයි.



**සමන්ත ගුණවර්ධන මහතා**
**වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**
**(අලෙවි)**

ඩබ්ලිව්.කේ.එස්. ගුණවර්ධන මහතා 1994 දී කැලණිය විශ්ව විද්‍යාලයෙන් දෙවන පංතියේ (ඉහළ ගෞරව) ගණිතය පිළිබඳ විශේෂ උපාධියක් ලබා ඇත. ඔහු 2000 වසරේදී කොලොන්නාවේ ප්‍රධාන ගබඩා සහ බෙදාහැරීමේ පර්යන්ත පහසුකමේ "පුහුණු ගිනි නිවන අධිකාරී" ලෙස ලංකා ඛනිජ තෙල් සංස්ථාවට සම්බන්ධ විය. දශක දෙකකට වැඩි කාලයක් ඛනිජ තෙල් කර්මාන්තයේ විවිධ විෂයන් කෙරෙහි දක්වන ලද විශිෂ්ටත්වය හේතුවෙන් ඔහුට 2024 දී වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අලෙවිකරණ තනතුර ලබා දී ඇත. ඔහු විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් කුසලතා සුදුසුකම් ලබා ගත් අතර කැලණිය විශ්ව විද්‍යාලයේ කාර්මික කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද 2013 නොවැම්බර් මාසයේදී ස්වීඩනයේ මැල්මෝ හි එක්සත් ජාතීන්ගේ ලෝක සමුද්‍රීය විශ්ව විද්‍යාලයෙන් සමුද්‍රීය ආරක්ෂාව සහ පරිසර පරිපාලනය පිළිබඳ තවත් ශාස්ත්‍රපති උපාධියක් සමඟ තෙල් හා ගෑස් කර්මාන්ත ක්ෂේත්‍රයේ අදාළ විදේශීය සුදුසුකම් මේ අතර වේ. තවද ඔහු CPM, SLIM සහ WNPS ශ්‍රී ලංකාවේ ආයතනික සාමාජිකත්වයන් ද දරයි.



**අනෝමා සෙනෙවිරත්න මහත්මිය**
**වැ.බ. නියෝජ්‍ය පිරිපහදු**
**කළමනාකාරිණී (තාක්ෂණික සේවා)**

පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් රසායනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ව විද්‍යාවේදී උපාධියක් ලබා ඇති සහ ඛනිජ තෙල් පිරිපහදු කර්මාන්තයේ වසර 24 කට වැඩි පළපුරුද්දක් ඇති වරලත් ඉංජිනේරුවරියක් වන අනෝමා සෙනෙවිරත්න මහත්මිය, වැඩබලන නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු, වැඩබලන කළමනාකරු තාක්ෂණික සේවා සහ නියෝජ්‍ය තාක්ෂණික සේවා කළමනාකරු වැනි ජ්‍යෙෂ්ඨ නායකත්ව භූමිකාවන් ඇයගේ වෘත්තීය ජීවිතයට ඇතුළත් වේ.

ඇය IChemE (UK), ඉංජිනේරු කවුන්සිලය (UK) සහ IESL හි වරලත් සාමාජිකත්වයන් හරහා ජාත්‍යන්තරව පිළිගැනීමට ලක්ව ඇත. ඇයගේ ඉංජිනේරු පසුබිමට අමතරව, ඇන්ග්ලියා රස්කින් විශ්ව විද්‍යාලයෙන් (UK) විශිෂ්ට සාමාර්ථයක් සහිතව MBA උපාධිය ලබා ගත් අතර, නවීන කළමනාකරණ සංකල්ප, උපායමාර්ගික සැලසුම්කරණය සහ නායකත්වය පිළිබඳ ශක්තිමත් පදනම් වලින් සන්නද්ධ ව සිටී. බලශක්ති කළමනාකරුවෙකු (SEA) සහ ISO 14000 උපදේශක (SLSI) ලෙස කටයුතු කරමින් SLEMA හි ක්‍රියාකාරී සාමාජිකත්වය සමඟ එහි 2023 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදි.

ඇයගේ වෘත්තීය ජීවිතය ආරම්භය තුළ දී, පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනයේ කෘෂිකාර්මික/ආහාර අංශයෙහි උපදේශන යාන්ත්‍රික ඉංජිනේරුවරියක් ලෙස සේවය කරනු ලැබීය.

කර්මාන්ත ක්ෂේත්‍රයට ඇයගේ දායකත්වයට අමතරව, සෙනෙවිරත්න මහත්මිය අධ්‍යාපනඥවරියක් සහ කර්මාන්ත නායිකාවක් වන අතර, වෘත්තීය ආයතනවල සේවය සඳහා ක්‍රියාකාරීව දායක වන අතර ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල බාහිර කථිකාචාර්යවරියක් ලෙසද සේවය කරයි.



**ඒ.ජී.ඩී බණ්ඩාර මහතා**

**වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ සහ සැපයුම් දාම)**

බණ්ඩාර මහතා පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී (ආර්ථික විද්‍යාව) පිළිබඳව උපාධිධාරියකු සහ ඩලියන් නාවික විශ්වවිද්‍යාලයෙන් (චීනය) ලොජිස්ටික් සහ සැපයුම්දාම පිළිබඳව පශ්චාත් උපාධිය ලබා ඇත.ඔහු එක්සත් රාජධාණියේ වරලත් නාවික තැරැව්කරුවන්ගේ ආයතනයෙන් නැව්ගත කිරීම පිළිබඳ ඩිප්ලෝමාවක් (වරාය නියෝජිතායතන) ද, N.I.B.M වෙතින් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද, පරිගණක තාක්ෂණ ඩිප්ලෝමාව (SLIT)ක්ද ලබා ඇත. බණ්ඩාර මහතා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පුහුණු වැඩසටහන් ගණනාවක් සම්පූර්ණ කර ඇති අතර සංස්ථාව නියෝජනය කිරීමද ඔහු විසින් සිදු කරන ලදී.

ඔහු 1995 දි සංස්ථාවේ සේවයට බැඳී ඇති අතර, සංස්ථාවේ විවිධ තනතුරු වන නාවික සහකාර, සහකාර වාණිජ කළමනාකරු, නියෝජ්‍ය වාණිජ කළමනාකරු, වැඩ බලන වාණිජ කළමනාකාරු, නාවික කළමනාකාරු සහ වර්තමානයේ වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වාණිජ හා සැපයීම් දාම ලෙස කටයුතු කරයි. ඔහු සංස්ථාවේ නාවික, වාණිජ සහ ප්‍රසම්පාදන හා ගබඩා යන අංශ තුනහි කටයුතු කළමනාකාරණය සහ සම්බන්ධිකරණය සිදුකරයි

## ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

ආර්.ඒ.කේ.සී. ආරියරත්න මහත්මිය - ප්‍රධාන නීති නිලධාරී, වයි.ඒ.ඩී.එස්. ප්‍රියංකර මහතා - ප්‍රධාන අභ්‍යන්තර විගණක, එම්.සී.ඩී. පෙරේරා මහත්මිය - ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුදල්), ජී.පී. උපනන්ද මහතා - කළමනාකරු (මානව සම්පත්),), ජී.පී.කේ විජේකෝන් මහතා - කළමනාකරු (ඉංජිනේරු සහ පරිශ්‍ර), ආර්.ඒ.ටී.අයි. රණසිංහ මහතා - කළමනාකරු (විගණන), කේ.කේ.ඒ ජයවික්‍රම මහතා - කළමනාකරු (වාණිජ), ඒ.ජී.ඩී. බණ්ඩාර මහතා - කළමනාකරු (නාවික), බී.එස්.එස්. පෙරේරා මහතා - කළමනාකරු (කෘෂි රසායන), ඒ.අයි. වන්සේකර මහතා - කළමනාකරු (ගුවන් මෙහෙයුම්), එන්.බී.එම්.පී. ජීවසිරි මහතා - කළමනාකරු (මෙහෙයුම් - තොග සහ පර්යන්ත මෙහෙයුම්), ඩබ්.ඒ.ඒ.සී. වීරසිංහ මහත්මිය - කළමනාකරු (මානව සම්පත් සංවර්ධන), ඩබ්.කේ.එස්. ගුණවර්ධන - කළමනාකරු (පර්යේෂණ සහ සංවර්ධන), වයි.එස්. දිසානායක මහත්මිය - කළමනාකාර (නීති), එච්.ජී. කුමුදිනී මහත්මිය - කළමනාකාරිනී (ප්‍රසම්පාදන සහ ගබඩා) , V. ෂන්මුගනාදන් මහතා-කළමනාකරු (අලෙවිකරණය) (වැඩ බලන), ආර්. එම්. ආරිය මංජුල මහතා - කළමනාකරු (ආයතනික සැලසුම් සහ ව්‍යාපාර සංවර්ධනය) (වැඩ බලන), අයි සී ගල්ගොඩගේ මහතා - කළමනාකරු (අලෙවිකරණය - ලිහිසි තෙල් සහ විශේෂ නිෂ්පාදන) (වැඩ බලන) , ඒ.බී. කෝරලේගෙදර මහතා - සහකාර කළමනාකාර (ලේකම් කාර්යාලය) (වැඩ බලන), පී.එෆ්.ඩබ්. දයානාත් මහතා - කළමනාකරු (ඉංජිනේරු - සිවිල්), කේ.වී.ජේ. චන්ද්‍රවංක මහතා - කළමනාකරු (ඉංජිනේරු - විදුලි), ඩබ්ලිව්.එස්. රබෙල් මහතා - කළමනාකරු (ඉංජිනේරු - උපකරණ), ඒ.එස්. ප්‍රේමකාන්ති මෙනෙවිය - කළමනාකරු (ආර්ථික සහ උපලේඛනගත කිරීම), එම්.ඩබ්.ඩබ්.එස්.කේ. වටකැටිය මහතා - නියෝජ්‍ය කළමනාකරු (තාක්ෂණික සේවා - රසායනාගාර), ආර්.එම්.එම්.ඩබ්ලිව්. බණ්ඩාර මහතා - නියෝජ්‍ය කළමනාකරු (ගිනි සහ ආරක්‍ෂාව), ඩබ්.ඒ.ඩී.සී.ආර්. විජේසිංහ මහතා - වැඩ බලන) කළමනාකරු (පිරිපහදු මෙහෙයුම්), ආර්.එම්.එල්.රණතුංග මහතා - (වැඩ බලන) කළමනාකරු (ඉංජිනේරු - ව්‍යාපෘති) , එම්. රාජපක්ෂ මහතා - (වැඩ බලන) කළමනාකරු (ඉංජිනේරු - පරීක්‍ෂණ), ඒ.එම්.සී.ඩබ්. අබේකෝන් මහතා - සහකාර. කළමනාකරු (සපුගස්කන්ද පර්යන්තය - මෙහෙයුම්).

# ආයතනික ව්‍යුහය


Chairman
Managing Director
CLO
CIA
DGM (M)
DGM (C & SC)
DGM (TS & CA)
DGM (F)
DGM (HR &A )
Snr. Mgr (Finance)
Mgr (Legal)
Mgr (Audit)
Mgr (Investigation)
Mgr (Marketing)
Mgr (Agro Chemical)
Mgr (Lub & Spcl Prdt)
Mgr (Commercial)
Mgr (Pro. & Stores)
Mgr (Shipping)
Mgr (Engi. & Premises)
Mgr (Avi. Operations)
Mgr (Operations)
Mgr (R & D)
Mgr (CP & BD)
Mgr (LNG)
Head of HSE
Mgr (IT)
Mgr (HR)
Mgr (HRD)
Mgr (Security)
Mgr (Secretariat)
Medical Officer




RM - Refinery Manager

DGM - Deputy General Manager

DRM - Deputy Refinery Manager

Snr. Mgr. - Senior Manager

CIA - Chief Internal Auditor

CLO - Chief Legal Officer

Mgr - Manager

Dy. Mgr. - Deputy Manager

M - Marketing

TS & CA - Technical Services & Corporate Affairs

C & SC - Commercial & Supply Chain

F - Finance

HR & A - Human Resources & Administration

E & I - Electrical & Instrument

M & P - Maintenance & Projects

M & O - Manufacturing & Operations

Lub & Spcl Prdt - Lubricant & Special Product

Pro. & Stores - Procurement & Stores

Engi. - Engineering

Avi. - Aviation

R & D - Research & Development

CP & BD - Corporate Planning & Business Development

LNG - Liquefied Natural Gas

IT - Information Technology

HSE - Health Safety Environment

HR - Human Resources

HRD - Human Resources Development

TS - Technical Services

Lab. - Laboratory

ST Ops. - Sapugaskanda Terminal Operations

E & S - Economic & Scheduling

Ops R & T - Operations Refinery Terminal

# මෙහෙයුම් සන්දර්භය



## බොරතෙල් මිල චලනය




ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ශ්‍රී ලංකාව පුරා ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, පිරිපහදු කිරීම, ගබඩා කිරීම සහ බෙදා හැරීම සඳහා වගකීම දරයි. එය ක්‍රියාත්මක වන්නේ රජයේ ප්‍රතිපත්ති සහ මිල පාලනයන් මගින් ආධිපත්‍යය දරන වෙළඳපොළක වන අතර එහි ක්‍රියාකාරිත්වය බොරතෙල් මිල ගණන් සහ විනිමය අනුපාතවල චලනයන් සමඟ සමීපව බැඳී ඇත.

**3.2%**
ගෝලීය වර්ධනය

**103.82**
(දිනකට බැරල් මිලියන )
ගෝලීය ඉන්ධන ඉල්ලුම

**5%**
ශ්‍රී ලංකාවේ වර්ධනය

**302.118**
(රු. /ඇමරිකානු ඩොලර්)
විනිමය අනුපාතය (සාමාන්‍ය)

### දළ සටහන – 2024

- ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 3.2% ලෙසවාර්තා විය.
- ශ්‍රී ලංකා ආර්ථිකය 5% කින් ප්‍රසාරණය විය.
- විනිමය අනුපාතිකය 7.76% කින් අධි ප්‍රමාණය විය.
- ජාත්‍යන්තර ඉන්ධන මිල 15.7% කින් අඩු විය.
- 2024 දෙසැම්බර් මාසයේදී CCPI –1.7% දක්වා අඩු විය.

## ගෝලීය වර්ධනය




*WEO 2025 January—IMF*

## ගෝලීය ඉන්ධන ඉල්ලුම




*(OPEC monthly oil market report—January)*

## විනිමය අනුපාතය




*(CBSL Annual Report 2024)*

## ජාත්‍යන්තර ඉන්ධන මිල




*(CBSL Annual Report 2024)*

## ගෝලීය සන්දර්භය

2024 දී ගෝලීය ආර්ථිකය මධ්‍යස්ථ භාවයකින් පවත්වා ගෙන ගිය අතර එය 3.1%, 3.2% කින් පමණ ප්‍රසාරණයක් විය.එය මූලික වශයෙන් 2023 වර්ෂයේ මට්ටම් පිළිබිඹු කරන අතර 2000 -19 වර්ෂවල සාමාන්‍යය වන 3.8% ට වඩා අඩු මට්ටමක පැවතුණි. ගෝලීය මූලික උද්ධමනය 2023 දී 6.8% සිට 2024 දී 5.8% දක්වා අඩු වී ඇති අතර 2025 වන විට එය 4.4% දක්වා තවදුරටත් පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත.

2023 දී පැවති දියුණු ආර්ථිකයන්, 1.6% සිට 2024 දී 1.7% දක්වා සුළු වර්ධනයක් පෙන්නුම් කරන අතර නැගී එන වෙළඳපොලවල් 4.2% ක පමණ ස්ථාවර මට්ටමක පවතී. නැගී එන ආසියාවේ ආර්ථිකයන් වන, විශේෂයෙන් චීනය සහ ඉන්දියාව අර්ධ සන්නායක සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම සහ කෘතිම බුද්ධිය සඳහා වන රාජ්‍ය ආයෝජන වැඩිවීම නිසා සැලකිය යුතු ලාභ අත්කර ගෙන ඇත.

2024 දී, ගෝලීය බොරතෙල් ස්ථානීය මිල ගණන් 2023 ට සාපේක්ෂව පහත වැටීමක් වාර්තා කළේය. ඔපෙක් දත්ත වලට අනුව North Sea Dated බොරතෙල් බැරලය ඩොලර් 1.93 (−2.3%) කින් පහත වැටී සාමාන්‍ය මිල ඩොලර් 80.64 ක් දක්වා වූ අතර, West Texas Intermediate (WTI)හි බැරලයකට ඩොලර් 1.67 (−2.2%) කින් පහත වැටී ඩොලර් 75.91 ක් දක්වා අඩු විය. එමෙන්ම ඩුබායි බොරතෙල් බැරලයකට ඩොලර් 2.45 (−3%) කින් පහත වැටී ඩොලර් 79.57 ක් ලෙස පෙන්වයි. දුර්වල වෙළඳපොල හැඟීම්, සමපේක්ෂන විකුණුම් වැඩි වීම සහ මිල අස්ථාවරත්වය ඉහළ යාම හේතුවෙන් වසරේ දෙවන භාගයේ වන විට පහත වැටීම වඩාත් කැපී පෙනුණි.

OPEC Reference Basket (ORB) අනුව බොර තෙල් බැරලයක සාමාන්‍ය මිල ඩොලර් 79.89 දක්වා පහත වැටුන අතර එය වසරින් වසර අනුව ඩොලර් 3.06 (−3.7%) කින් පහත වැටීමකි. එක්සත් ජනපද ගල්ෆ් වෙරළ තීරයේ සහ ආසියා පැසිෆික් කලාපයේ පටු වීමෙන් සහ යුරෝපයේ පුළුල් වීමෙන් කලාපීය බොරතෙල් ව්‍යාප්තිය මිශ්‍ර ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත.

ඉල්ලුම සම්බන්ධයෙන් සැලකීමේ දී, 2024 දී ලෝක තෙල් පරිභෝජනය දිනකට බැරල් මිලියන 1.5 කින් වැඩි වී දිනක ඉල්ලුම බැරල් මිලියන 103.7 දක්වා ළඟා වී ඇති අතර එම ප්‍රමාණය කොවිඩ් වසංගත කාලයට පෙර තිබූ මට්ටම ද පසු කර ඇත. OECD නොවන රටවල් වර්ධනයෙන් වැඩිකොටසක් සඳහා දායක වූ අතර එය දිනකට බැරල් මිලියන 1.4 වූ අතර OECD ඉල්ලුම දිනකට බැරල් 150,000 කින් ඉහළ ගියේය.

නිෂ්පාදන අනුව ද්‍රව පෙට්‍රෝලියම් වායුව (LPG) සඳහා ඇති ඉල්ලුම දිනකට බැරල් 524,000 කින් ඉහළ ගිය අතර, එය ඛනිජ රසායනික අංශයේ වර්ධනයට ඉවහල් විය. ගුවන් යානා ඉන්ධන, ගැසොලින් සහ නැප්තා ද ඉල්ලුම වැඩිවීමක් පෙන්නුම් කර ඇත. නමුත් ඊට වෙනස්ව ඩීසල් ඉල්ලුම දිනකට බැරල් 23,000 කින් අඩු විය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට (IMF) අනුව 2023 වසරේ ගෝලීය උද්ධමන අනුපාතය 6.8 % වූ අතර එය 2024 දී 5.8% දක්වා අඩුවිය.ගෝලීය මූලික උද්ධමනය 2025 දී 4.2% දක්වා සහ 2026 දී 3.5% දක්වා තවදුරටත් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කරන අතර, නැගී එන වෙළඳපල සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ට වඩා දියුණු ආර්ථිකයන් එහි පෙර ඉලක්කය වෙත ආපසු ගමන්කරයි.

### ද.දේ. නි. වර්ධනය




*CBSL Annual Report 2024*

### රටේ දළ දේශීය නිෂ්පාදිතය

| වසර | ද.දේ.නි (රු. ට්‍රි.) | ද.දේ.නි. (ඇ.ඩො.බි.) |
|---|---|---|
| 2020 | 15.6 | 84.4 |
| 2021 | 17.6 | 88.56 |
| 2022 | 24.1 | 76.8 |
| 2023 | 27.6 | 84.4 |
| 2024 | 29.9 | 98.98 |

### උද්ධමන අනුපාත




*(CBSL Annual Report 2024)*

### දේශීය මිල සංශෝධන




## දේශීය සන්දර්භය

2024 දී, ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් ප්‍රකෘති තත්වයක් වාර්තා කළ අතර, අඛණ්ඩව දෙවසරක සංකෝචනයකින් පසු 5.0% ක සැබෑ දළ දේශීය නිෂ්පාදිත වර්ධනයක් අත්කර ගෙන ඇත.වර්තමාන වෙළඳපල මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 29,898.6 ක් වූ අතර, සැබෑ ආර්ථික වර්ධනය සහ 3.8% ක දළ දේශීය නිෂ්පාදිත අවධමනය යන දෙකම එයට සහාය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය 2023 වසරේ දී රුපියල් 1,244,262 සිට 2024 වසරේ දී රුපියල් 1,364,235 දක්වා ඉහළ ගොස් ඇත. මෙයට නාමික දළ දේශීය නිෂ්පාදිතය වැඩිවීම සහ මධ්‍ය වාර්ෂික ජනගහනයේ පහත වැටීම හේතු වී ඇත.

අංශ අනුව කාර්ය සාධනය පුළුල් ප්‍රකෘතියක් පිළිබිඹු කර ඇති අතර කෘෂිකාර්මික ක්‍රියාකාරකම් 1.2% කින් මධ්‍යස්ථව වර්ධනය වූ අතර එය 2023 දී 1.6% ක වර්ධනයට වඩා තරමක් අඩු විය. කර්මාන්ත ක්‍රියාකාරකම් පෙර වසරේ පැවති 9.2% ක සංකෝචනයට සාපේක්ෂව 2024 දී 11.0% කින් ප්‍රසාරණය වී සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. ආර්ථික තත්ත්වයන් ක්‍රමයෙන් සාමාන්‍යකරණය වීම පිළිබිඹු කරමින්, 2023 දී 0.2% ක සංකෝචයකින් පසු 2024 දී සේවා ක්‍රියාකාරකම් ද 2.4% කින් වර්ධනය විය.

පරිභෝජන වියදම්වල 6.4% ක වැඩිවීමක් සහ ආයෝජන වියදම්වල 19.6% ක කැපී පෙනෙන වැඩිවීම හේතුවෙන්, වර්තමාන මිල ගණන් යටතේ දේශීය ඉල්ලුම 9.5% කින් වර්ධනය විය. මෙම වර්ධනයන් මගින් වසර පුරාවට ප්‍රතිපත්ති ස්ථායිතාව සහ සාර්ව ආර්ථික මූලිකාංග වැඩිදියුණු කිරීම මගින් පාරිභෝගික සහ ආයෝජක විශ්වාසය අඛණ්ඩව යථා තත්ත්වයට පත් වීම ඉස්මතු වේ.

එසේම, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) 2023 දෙසැම්බර් මාසයේදී 4% සිට 2024 දෙසැම්බර් මාසයේදී -1.7% දක්වා පහත වැටී ඇත. ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) 2023 දෙසැම්බර් මාසයේ පැවති 4.2% සිට 2024 දෙසැම්බර් මාසයේදී -2% දක්වා පහත වැටී ඇත.

2024 දී ගෝලීය බොරතෙල් මිල ගණන් ඉතා අස්ථාවරව පැවති අතර ආරම්භක ඉහළ යාමේ ප්‍රවණතාවයක් සමඟ වසර අග භාගයේදී ක්‍රමයෙන් මධ්‍යස්ථ විය. දේශිය රුපියලේ අගය අධිප්‍රමාණය වීම 2024 වසරේ මුල් භාගයේ සිට දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන මිල ගණන් අඛණ්ඩව පහත වැටීමට හේතු විය.

මෙම ගෝලීය ප්‍රවණතා සහ ශ්‍රී ලංකා රුපියලේ අගය අධිප්‍රමාණය වීම පිළිබිඹු කරමින්, 2024 මුල් භාගයේ සිට දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන මිල ගණන් ක්‍රමයෙන් පහත වැටුණි. ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ (CPC) සාමාන්‍ය බොරතෙල් බැරලයක ආනයන මිල 2023 දී ඇමරිකානු ඩොලර් 89.60 සිට ඇමරිකානු ඩොලර් 84.69 දක්වා 5.5% කින් පහත වැටුණි. වසර පුරා පිරිවැය පිළිබිඹු කරන මිල ගැලපීම් හේතුවෙන් ප්‍රධාන නිෂ්පාදන වන පෙට්‍රල් 92 10.7% කින්, ඔටෝ ඩීසල් 13.1% කින් සහ භූමිතෙල් 23.9% කින් සිල්ලර මිල අඩු විය.ඛනිජ තෙල් නිෂ්පාදන විකුණුම් පරිමාව වසරින් වසර 11.3% කින් වැඩි වූ අතර එය වැඩිදියුණු කළ ආර්ථික ක්‍රියාකාරකම් පිළිබිඹු කරයි. 2024 අවසානය වන විට පුද්ගලික අංශයේ තිදෙනෙකු ක්‍රියාකාරී වීමත් සමඟ වෙළඳපල ලිහිල්කරණයක් පෙන්නුම් කෙරේ.

මූල්‍යමය වශයෙන්, 2023 දී රුපියල් බිලියන 120.2 ක ලාභයක් ලැබුව ද 2024 වසරේ දී ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රුපියල් බිලියන 32.7 ක ලාභයක් වාර්තා කළේය. 2024 වසරේදී ලාභයේ පහත වැටීමට නව තරඟකරුවන්ගේ පිවිසීමෙන් වෙළඳපල කොටස අඩුවීම ද හේතු විය. 2022 දී CPC හි ණය රජය විසින් පවරා ගැනීම හේතුවෙන් එය සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වයට උපකාරී විය. 2024 අවසානය වන විට, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගෙවිය යුතු විදේශ මුදල් බැඳීම් ඇමරිකානු ඩොලර් බිලියන 0.3 දක්වා පහත වැටී ඇති තිබූ අතර රජයේ ආයතනවලින් ලැබිය යුතු වෙළඳ ලැබීම් රුපියල් බිලියන 10.0 ක් විය.

### ඇස්තමේන්තුගත ගෝලීය වර්ධන

| කාණ්ඩය | 2025 | 2026 |
|---|---|---|
| ලෝකය | 3.30% | 3.30% |
| උසස් ආර්ථිකයන් | 1.90% | 1.80% |
| EM සහ සංවර්ධනය වන ආර්ථිකයන් | 4.20% | 4.30% |

*WEO Update , January 2025*

## ඉදිරි මග

OPEC සංවිධානයට අනුව ගෝලීය ප්‍රාථමික බලශක්ති ඉල්ලුම 2023 දී 301 mboe/d සිට 2050 වන විට 374 mboe/d දක්වා 24% කින් ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. එහිදි තෙල් ප්‍රමුඛ ප්‍රභවය ලෙස පවතී. පුනර්ජනනීය බලශක්තියේ කොටස 3.2% සිට 14% දක්වා වර්ධනය වනු ඇත. ආසියාව, මැදපෙරදිග සහ අප්‍රිකාව ප්‍රමුඛව රටවල තෙල් ඉල්ලුම දිනකට බැරල් මිලියන 120.1 දක්වා ඉහළ යනු ඇත. එහි දී පිරිපහදු ධාරිතාව දිනකට බැරල් මිලියන 19.2 කින් වර්ධනය වනු ඇත. 2050 වන විට තෙල් ආශ්‍රිත මුළු ආයෝජන ඩොලර් ට්‍රිලියන 17.4 දක්වා ළඟා වනු ඇත.

උද්ධමනය මැඩපැවැත්වීම අරමුණු කරගත් ඉහළ ගෝලීය පොලී අනුපාත සහ ඉහළ යන ණය හේතුවෙන් රජයේ මූල්‍ය සහයෝගය අඩුවීම ආර්ථික ක්‍රියාකාරකම් සඳහා බාධා ඇති කරයි. කෙසේ වෙතත්, වැඩිදියුණු කළ සැපයුම් දාමයන් සහ දැඩි මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් බොහෝ කලාපවල උද්ධමනය අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වේගයෙන් අඩු වෙමින් පවතී.

මෙම ව්‍යුහය තුළ, ස්ථාවර ජාතික ආර්ථිකය සුමට මෙහෙයුම් සඳහා සහාය වන නමුත්, නව ඉන්ධන සැපයුම්කරුවන්ගේ පැමිණීම සංස්ථාවෙහි හි වෙළඳපොළ කොටස සහ මූල්‍ය කාර්ය සාධනය සඳහා අභියෝග වී ඇත. ලාභදායීතාවය ආරක්ෂා කර ගැනීමට සහ සංස්ථාවෙහි දිගුකාලීන මූල්‍ය තිරසාරභාවය සහතික කිරීමට වත්මන් පිරිවැය පිළිබිඹු වන මිලකරණ උපාය මාර්ගය පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ.

ඉන්ධන වෙළඳපොළ තුළ තරඟකාරීව සිටීමට, සංස්ථාව විසින් වියදම් අඩු කිරීම සහ ප්‍රතිලාභ පාරිභෝගිකයින්ට ලබා දීම අරමුණු කරගත් පිරිවැය-කාර්යක්ෂම ප්‍රසම්පාදන සහ මෙහෙයුම් උපාය මාර්ග ක්‍රියාත්මක කර ඇත. ඉන්ධන ගබඩා ධාරිතාව පුළුල් කිරීම ඇතුළුව තීරණාත්මක යටිතල පහසුකම් සඳහා සැලකිය යුතු ආයෝජන ද සිදු කෙරේ. මෙම ප්‍රයත්නයන් සංස්ථාවේ හි වෙළඳපල තත්ත්වය සහ මෙහෙයුම්වල ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරන අතර ජාතියේ බලශක්ති අවශ්‍යතා සපුරාලීම සඳහා ස්ථාවර, ආරක්ෂිත සහ ප්‍රමාණවත් සැපයුමක් සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය



## දළ සටහන - 2024

- ♦ පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් සඳහා මිලකරණ යාන්ත්‍රණය අඛණ්ඩව පවත්වාගෙන යාම.
- ♦ රට තුළ අඛණ්ඩ ඉන්ධන සැපයුම.
- ♦ තරඟකාරී ආයතනයක් රට තුළ ව්‍යාපාර කටයුතු අත් හිටවූ අතර, එමඟින් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඔවුන්ගේ පිරවුම්හල්වල පාලනය නැවත ලබා ගැනීමට හැකි විය.
- ♦ ඩොලර් ගනුදෙනු වෙළඳපල තුළට පළමු වාණිජ ආයතනය ලෙස ඇතුළත් වීම.
- ♦ ඉන්ධන ඇණවුම් කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය යෙදවුමක් හරහා ක්‍රියාත්මක කිරීම.

## 2025 වසර සඳහා අපේක්ෂාව

- ගබඩා කිරීමේ සහ බෙදා හැරීමේ කටයුතු සඳහා වැඩිදියුණු කිරීම
- ත්‍රිකුණාමලය ටැංකි සංකීර්ණයෙන් කල්බදු පදනම මත ලබාගත් ටැංකි 24 ප්‍රතිසංස්කරණය කිරීම.
- පවතින අලෙවිසැල් නවීකරනය කිරීම.
- ලිහිසි තෙල් ව්‍යාපාරය නව

**971**
(රු. බිලියන )
ආදායම

**3,898**
(ලිටර් මිලියන)
විකුණුම්

| | | |
|---|---|---|
| **ප්‍රවාහන** |  | **649.09**<br>රු.බි. |
| **බලශක්ති** |  | **112.15**<br>රු.බි. |
| **ගුවන් සේවා** |  | **120.06**<br>රු.බි. |
| **කර්මාන්ත** |  | **19.49**<br>රු.බි. |
| **දේශීය** |  | **41.24**<br>රු.බි. |
| **නැව්තෙල්** |  | **18.26**<br>රු.බි. |

2022 වසරේ පැවති දැඩි ආර්ථික අර්බුදයෙන් පසු 2024 දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්නුම් කිරීමට පටන් ගත්තේය. IMF අනුග්‍රහයෙන් ලත් ප්‍රතිසංස්කරණ, දැඩි මුදල් ප්‍රතිපත්ති සහ වැඩිදියුණු කළ මූල්‍ය විනය මගින්ලැබූ සහයෙන් උද්ධමනය ලිහිල් වූ අතර ආයෝජකයින්ගේ විශ්වාසය වැඩිදියුණු විය. මෙම තත්වය මධ්‍යයේ, මෙහෙයුම් සහ උපායමාර්ගික දිශාවට ධනාත්මක ලෙස බලපෑ පරිණාමය වන ආර්ථික තත්ත්වයන් මගින් හැඩගැසුණු තීරණාත්මක අවධියකට සංස්ථාව පිවිසීය.

2022 වසරේ දරුණු ආර්ථික තත්ත්වයක් පැවතිය ද, සංස්ථාව රට පුරා ස්ථාවර හා අඛණ්ඩ ඉන්ධන සැපයුමක් සාර්ථකව පවත්වා ගෙන ගිය අතර, මහජන විශ්වාසය ශක්තිමත් කරමින් සහ ජාතික යටිතල පහසුකම් සහ දෛනික ජීවිතය ස්ථාවර කිරීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. 2024 දී, ජාත්‍යන්තර තෙල් මිල අඛණ්ඩව පහත වැටීම සහ ගෝලීය සැපයුම් දාම බාධාවන් ස්ථාවර ලෙස විසඳීම තුළින් සංස්ථාව සැලකිය යුතු සහනයක් අත්විඳීමට සමත් විය.

ඩොලර් ගනුදෙනු කිරීමේ වේදිකාව හඳුන්වාදීම හේතුවෙන් සහ විනිමය අනුපාත වාසිය අඩු වීම තුළින් ඉන්ධන ආනයනය සඳහා ඩොලර් සුරක්ෂිත කිරීමට හැකි විය.

මෙම වසරේදී, නියමිත වේලාවට ගෙවීම් අඛණ්ඩව සිදු කිරීමෙන් සංස්ථාව සැපයුම්කරුවන්ගේ විශ්වාසය සාර්ථකව ගොඩනඟා ගත්තේය. ඊට අමතරව, සංස්ථාව ණයවර ලිපි හරහා සැපයුම්කරුවන් සමඟ ගනුදෙනු කරන ලදි. බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ස්ථාවර ලෙස ලබා ගැනීම සහතික කිරීමට මෙම ප්‍රවේශය ඵලදායී ලෙස භාවිත විය. එහි ප්‍රතිඵලයක් ලෙස, සංස්ථාව සිය නිෂ්පාදන සැපයුම කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට සමත් වී තිබේ. අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ වුවද, පිරවුම්හල්වලට සහ ගුවන්තොටුපළ වෙත ඛනිජ තෙල් නිෂ්පාදන විශ්වාසදායක ලෙස සැපයුම පවත්වා ගැනීමෙන් ජාතික බලශක්ති ආරක්ෂාව සහතික කිරීම සඳහා රජය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත.

වත්මන් මිල යාන්ත්‍රණය පවත්වා ගැනීම සහ මුදල් මත පදනම් වූ විකුණුම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට රජය ගත් තීරණය සංස්ථාවේ ශේෂ පත්‍රය ශක්තිමත් කිරීමට හේතු වී ඇත. මෙම පියවර ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ද්‍රවශීලතාවය වැඩිදියුණු වී ඇත. ඊට අමතරව, ධනාත්මක ලාභාන්තිකයන් සහිත වූ අඛණ්ඩ පිරිපහදු මෙහෙයුම් සංස්ථාවේ ලාභදායීත්වයට දායක වූ අතර සමස්ත ප්‍රතිඵල වැඩිදියුණු වෙමින් සියලු අංශ වැඩිදියුණු කළ මූල්‍ය කාර්ය සාධනයක් වාර්තා කර ඇත.

කෙසේ වෙතත්, පිරවුම්හල් තරඟකරුවන්ට පැවරීම හේතුවෙන් සමස්ත ආදායම රුපියල් බිලියන 1,263.6 සිට රුපියල් බිලියන 923 දක්වා පහත වැටුණි. එසේ තිබියදීත්, මූල්‍ය වර්ෂය අවසන් වූයේ රුපියල් බිලියන 75.7 ක දළ ලාභයක් සහ රුපියල් බිලියන 16.6 ක මෙහෙයුම් ලාභයක් සමඟිනි. එපමණක් නොව, විනිමය ලාභ, පොලී ආදායම සහ අඩු කළ පොලී වියදම් ඇතුළුව අනෙකුත් ආදායම් ප්‍රභවයන් 2024 වසර සඳහා රුපියල් බිලියන 32.7 කින් අවසන් කිරීමට සමත් විය.



# ප්‍රවාහන

වර්ෂය තුළදී රටපුරා ව්‍යාප්ත වූ 1,002 කින් සමන්විත ඉන්ධන පිරවුම්හල් හරහා පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් බෙදා හැරීම මෙන්ම විදුලි උත්පාදනයට හැර අවසාන පාරිභෝගිකයා වෙත ඉන්ධන බෙදාහැරීම කාර්යක්ෂමව සිදු කරන ලදී.

| දළ සටහන - 2024 |
| --- |
| ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන් සහ අනෙකුත් පිරිවැය අංගයන්ට අනුකූලව මාසිකව ඉන්ධන මිල සංශෝධනය කිරීම සඳහා මිල යාන්ත්‍රණය අඛණ්ඩව පවත්වාගෙන යාම. |
| සීමාවකින් තොරව අපනයන මෙහෙයුම් සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් අපනයනකරුවන් හට ඩොලර් මත ඩීසල් අලෙවිය අඛණ්ඩව සිදු කරන ලදී. |
| ආදායම රු. බිලියන 649ක් ලෙස වාර්තා විය. |

2024 දී, ශ්‍රී ලංකාවේ ඉන්ධන වෙළඳපොළ පෙර වසරවලට සාපේක්ෂව යම් ස්ථාවරත්වයක් අත්විඳින ලදී. මිල ගණන්වල මධ්‍යස්ථ උච්චාවචනයන් සිදු වූ අතර, ප්‍රධාන වශයෙන් ලෝක තෙල් මිල ප්‍රවණතා, විනිමය අනුපාත චලනයන් සහ රජයේ මාසික මිල යාන්ත්‍රණය මෙයට හේතු විය. ජාත්‍යන්තර ඉන්ධන මිල සුළු වශයෙන් අඩු වූ අතර, දේශීය ඉන්ධන මිල එයට සාපේක්ෂ ව අඩු කිරීම් කරන ලද නමුත් 2022 ට පෙර පැවති මට්ටම්වලට වඩා ඉහළ මට්ටමක පැවතුනි. සැපයුම් දාමය අඛණ්ඩව පැවති අතර, රට පුරා ඉන්ධන ලබා ගැනීමේ හැකියාව වැඩිදියුණු විය. ආර්ථික අභියෝග මධ්‍යයේ වුවද, ස්ථාවර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මගින් මෙන්ම වඩා හොඳ විදේශ මුදල් කළමනාකරණය තුළින් සහාය වූ වෙළඳපොළ ඔරොත්තු දීමේ හැකියාවක් වෙළඳපල පෙන්නුම් කරනු ලැබීය. සමස්තයක් වශයෙන්, 2024 දී ඉන්ධන වෙළඳපළ පෙර වසරවලට සාපේක්ෂ ව වඩා අඩු හිඟයන් සහ සුමට බෙදාහැරීමේ මෙහෙයුම් සමඟ පුරෝකථනය කිරීමට හැකි විය

2024 වර්ෂයේදී ද ඩීසල් සහ පෙට්‍රල් මිල වෙනස් වීම සංවේදී ලෙස බලපෑම් කළ අතර සුළු උච්චාවචනයන් පවා සාමාන්‍ය ජනතාවට සැලකිය යුතු ලෙස බලපාමින් එය ඔවුන්ගේ ජීවන වියදම සහ ඒ ආශ්‍රිත වියදම් යන දෙකටම බලපෑවේය. ප්‍රවාහන අංශය රුපියල් බිලියන 649 ක් උපයා ගනිමින් මුළු ආදායමට ඉහළම දායකත්වය ලබා දෙමින් දිගටම පැවතුනි.

දේශීය විකුණුම් මිල ගණන්




නිෂ්පාදනය අනුව විකුණුම් ආදායම




නිෂ්පාදනය අනුව විකුණුම් ප්‍රමාණය




ජාත්‍යන්තර මිල ගණන්




කෙසේ වෙතත්, වසර තුළ අඩු විකුණුම් මිල ගණන් හේතුවෙන් විකුණුම් පරිමාවේ 18% ක පහත වැටීමක් තිබුණ ද, 2023 ට සාපේක්ෂව විකුණුම් ආදායමේ 32% ක අඩුවීමක් පෙන්නුම් කළේය.

2023 වසරට සාපේක්ෂව, පෙට්‍රල් 92 සඳහා ඇති ඉල්ලුම 18% කින් පහත වැටුණු අතර, පෙට්‍රල් 95 සඳහා ඇති ඉල්ලුම 28% කින් තියුණු ලෙස පහත වැටීමක් පෙන්නුම් කළේය. එසේම ඔටෝ ඩීසල් ඉල්ලුම 17% කින් සහ සුපර් ඩීසල් ඉල්ලුම 21% කින් පහත වැටුණි. මෙම අභියෝග මධ්‍යයේ වුවද, ස්ථාවර ඉන්ධන සැපයුමක් පවත්වා ගැනීමට සහ සැපයුම් දාම බාධා ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට සංස්ථාව අවශ්‍ය පියවර ක්‍රියාත්මක කර ඇත.

රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලද පිරවුම්හල් තරඟකරුවන්ට පැවරීම, සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ විකුණුම් ආදායම පහත වැටීමට හේතු වී ඇත.

මීට අමතරව, අලෙවි නියෝජිත තොග මට්ටම් අධීක්ෂණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම මගින් අලෙවි නියෝජිත ජාලය පුරා තොග කළමනාකරණය වැඩිදියුණු වීමට හේතු විය. මෙම පද්ධතිය පිරවුම්හල්වල ඉන්ධන ස්ථාවරව ලබා දීමේ හැකියාව සහතික කරන අතර, විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල තොග හිඟය වැළැක්වීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත.



## සෘජු පාරිභෝගික විකුණුම්

CPC විසින් ප්‍රවාහනය සහ කාර්මික භාවිතය සඳහා පාරිභෝගිකයින්ට සෘජුවම ඩීසල් සහ පෙට්‍රල් සැපයුම සිදු කරයි. මෙම සේවාව පෞද්ගලික අංශයේ ව්‍යවසායන් සහ හමුදාවන් ඇතුළු රාජ්‍ය ආයතන යන දෙකටම සහාය වන අතර, පුළුල් පරාසයක මෙහෙයුම් හරහා විශ්වාසදායක ඉන්ධන සැපයුමක් සහතික කරයි.

## ඇමරිකානු ඩොලර් මත විකුණුම්

අපනයන ආශ්‍රිත මෙහෙයුම් සඳහා සහාය වීම සහ විධිමත් කිරීම සඳහා, සංස්ථාව උපායමාර්ගිකව එහි ඉන්ධන විකුණුම් ඇමරිකානු ඩොලර් වලින් පවත්වාගෙන ගොස් ඇත. මෙමගින් සංස්ථාව සහ අපනයන සමාගම් අතර අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සම්බන්ධතාවයක් ඇති කළ අතර, විදේශ මුදල් සමුච්චය කිරීමට මෙන්ම, එය ජාත්‍යන්තර ඉන්ධන සැපයුම්කරුවන් හට ගෙවීම් පියවීම සඳහා ඵලදායී ලෙස භාවිතා කිරීමට උපකාර විය.

අපනයන ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපාර ඇමරිකානු ඩොලර් වලින් ඉන්ධන මිල දී ගැනීමට ධනාත්මකව ප්‍රතිචාර දැක්වූ අතර, එය ඔවුන්ගේ අඛණ්ඩ මෙහෙයුම් සඳහා ප්‍රධාන පහසුකම් සපයන්නෙකු ලෙස හඳුනාගෙන ඇත. සංස්ථාව මෙම අංශය තුළට නව ගනුදෙනුකරුවන් කිහිප දෙනෙකු ද ඇතුළත් කර ඔවුන්ගේ ඉන්ධන අවශ්‍යතා සාර්ථකව සපුරාලන ලදී.



# බලශක්ති උත්පාදනය



ජල විදුලි උත්පාදනයේ සීමාවන් සහ ගල් අඟුරු භාවිතය සීමා කිරීම හේතුවෙන් තාප විදුලිය සඳහා ඇති ඉල්ලුම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස , ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සහ ස්වාධීන විදුලි නිෂ්පාදකයින් (IPPs) යන දෙපිරිසටම ස්ථාවර ඉන්ධන සැපයුමක් සහතික කිරීමට සංස්ථාව සැලකිය යුතු උත්සාහයක් ගන්නා ලදී. තාප බලාගාර අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා මෙම පියවර ඉතා වැදගත් වූ අතර එමඟින් රට පුරා අඛණ්ඩ විදුලි සැපයුමක් ලබා ගැනීමට හැකි විය.

| දළ සටහන - 2024 |
|---|
| ආදායම රුපියල් බිලියන 112 කි |
| මිල සංශෝධනය මාසිකව සිදු විය. |

වසර තුළ විදුලිබල උත්පාදන අංශයේ ඉන්ධන ඉල්ලුම සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, එය පෙර වසරට සාපේක්ෂව 38% ක අඩුවීමක් ලෙස වාර්තා විය. මෙම කාලය පුරාම, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මාසික ඉන්ධන මිල සංශෝධන ක්‍රියාත්මක කරමින්, ඉන්ධන සැපයුමේ සැබෑ පිරිවැය සහ ප්‍රතිලාභ සමඟ මිල ගණන් පෙළගස්වන ලදී.

විදුලිබල උත්පාදන අංශය සංස්ථාවේ දෙවන විශාලතම ආදායම් මාර්ගය ලෙස පැවති අතර, එය 2023 දී රුපියල් බිලියන 181.38 ක් වූ අතර වත්මන් වසරේදී රුපියල් බිලියන 112.15 ක් විය. විදුලිබල උත්පාදනය සඳහා ඉන්ධන සැපයීම ජාතික ආර්ථිකයට අත්‍යවශ්‍ය වන අතර, මෙම ක්ෂේත්‍රය සෑම මුලපිරීමකම වැදගත්කම ඉස්මතු කරයි. මීට අමතරව, පිරිපහදුවේ අඛණ්ඩ මෙහෙයුම් බලශක්ති උත්පාදනය සඳහා ඉන්ධන අවශ්‍යතා සපුරාලීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත.

සංස්ථාව වෙත ලැබිය යුතු හිඟ මුදල් පියවීමෙන් රජය සතු ව්‍යවසායයන්හි ශේෂ පත්‍ර ශක්තිමත් කිරීම සඳහා රජයේ මුලපිරීමේ කොටසක් ලෙස, සංස්ථාව ණය ලබාදීමේ නීති දැඩි ලෙස බලාත්මක කරන ලද අතර නියමිත ණය කාල සීමාව තුළ ගෙවීම් පිළිබඳ සක්‍රියව පසු නිරීක්ෂණය කරයි.

විකුණුම් ආදායම




සුදුසු ආරක්ෂණ ක්‍රම පවත්වා ගැනීම සහතික කිරීම සඳහා, තොග සමාලෝචන කමිටුව විදුලිබල අංශයේ ඉන්ධන ඉල්ලුම පිළිබඳ සතිපතා ඇගයීම් සිදු කරයි.

නිෂ්පාදනය අනුව විකුණුම් ආදායම




එසේම ජාතියට අඛණ්ඩ සහ විශ්වාසදායක බලශක්ති සහ විදුලි සැපයුමක් පවත්වාගෙන යාමේ ප්‍රධාන අරමුණට සහාය වීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සහ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් (IPPs) අතර සාර්ථක සහයෝගී හවුල්කාරිත්වයක් තහවුරු කරගෙන ඇත

නිෂ්පාදනය අනුව විකුණුම් ප්‍රමාණය




# ගුවන් සේවා



කටුනායක, මත්තල සහ රත්මලාන ගුවන්තොටුපළවලට මෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ ගුවන් සේවා පුහුණු ආයතන වැනි අනෙකුත් පරිශීලකයින්ට ඔවුන්ගේ අවශ්‍යතා මත සංස්ථාව ගුවන්යාන ඉන්ධන සපයයි. එසේම ගෝලීය ප්‍රවාහන සම්බන්ධතා සඳහා සහාය වීමට මෙන්ම දේශීය හා ජාත්‍යන්තර ගුවන්යානා දෙවර්ගයටම ඉන්ධන සැපයීමට අත්‍යවශ්‍ය වන බැවින් මෙම අංශය උපායමාර්ගික වැදගත්කමක් දරයි.

විකුණුම් ආදායම




නිෂ්පාදනය අනුව විකුණුම් ආදායම




නිෂ්පාදනය අනුව විකුණුම් ප්‍රමාණය




ගුවන් ගමන් පහසු කිරීම සඳහා එහි තීරණාත්මක කාර්යභාරය හඳුනාගෙන සංචාරක කර්මාන්තයේ වර්ධනයට සහ තිරසාරභාවයට දායක වෙමින්, අඛණ්ඩ ගුවන් යානා ඉන්ධන සැපයුමක් සහතික කිරීම කෙරෙහි CPC දැඩි අවධානයක් යොමු කර ඇත.

2024 දී, සංචාරක කර්මාන්තයේ ප්‍රකෘතිමත් වීමත් සමඟ ගුවන් සේවා අංශයේ ස්ථාවර වර්ධනයට සහාය වෙමින්, සංස්ථාව ගුවන් යානා ඉන්ධන අඛණ්ඩව සැපයීම සාර්ථකව කරන ලදී.

ගුවන් යානා ඉන්ධන අඛණ්ඩව සැපයීම තුළින් ජාත්‍යන්තර ගුවන් ගමන් සඳහා පහසුකම් සැලසීමෙන් සංස්ථාවට සහ රටට සැලකිය යුතු ප්‍රතිලාභ ලබා දී ඇති අතර එමඟින් සංචාරක අංශයේ තිරසාර පුනර්ජීවනයට සහ ව්‍යාප්තියට දායක විය.

## දළ සටහන - 2024

**JIG** විසින් අඛණ්ඩව 2024 සඳහා සංස්ථාව 'හොඳ' (සාමාන්‍යයට වඩා වැඩි) ස්ථානයට පිළිගෙන ඇති අතර, එමඟින් දැක්වෙන්නෙ සංස්ථාවෙහි මෙහෙයුම් විශිෂ්ටත්වය, හා ගුවන් සේවා කෙරෙහි සංස්ථාව විශ්වාසය ගොඩනඟා ගෙන සිටින බවයි.

ආදායම රුපියල් බිලියන 120 ක් ලෙස වාර්තා වී ඇත.

සංස්ථාව විසින් පර්යන්ත **E** හි නව හයිඩ්‍රන්ට් පද්ධති නල මාර්ගයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර ක්‍රියාත්මක ඇත.

කලාපයේ තරඟකාරීත්වයට උපකාරී වන ශක්තිමත් මිලකරණ යාන්ත්‍රණයක් සංස්ථාව ක්‍රියාත්මක කර ඇත.

සංස්ථාව **IATA** විගණනය සාර්ථකව සමත් වූ අතර කහ ශ්‍රේණියේ සිට කොළ ශ්‍රේණිය දක්වා උසස් වී ඇත.

2024 දී, සංචාරක අංශයේ ප්‍රකෘතිය සහ ආර්ථික ක්‍රියාකාරකම්වල සමස්ත දියුණුව, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අඛණ්ඩ සහ විශ්වාසදායක ඉන්ධන සැපයුම සමඟ ඒකාබද්ධව, වසර පුරා ස්ථාවර ගුවන් ඉන්ධන පරිමාවන් පවත්වා ගැනීමට උපකාර විය.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ දෙවන අදියර සංවර්ධන ව්‍යාපෘතියේ කොටසක් ලෙස ඉදිකරන ලද පර්යන්ත E හි නව හයිඩ්‍රන්ට් පද්ධති නල මාර්ගය විවෘත කර මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. මීට අමතරව, පර්යන්ත A B සහ ස C හි හයිඩ්‍රන්ට් නල මාර්ග පද්ධතියේ ප්‍රතිසංස්කරණ කටයුතු සාර්ථකව නිම කරන ලදී.

අනුකූලතා සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරාලීම සඳහා සංස්ථාවෙහි කැපවීමේ කොටසක් ලෙස, තත්ත්ව සහතික නිර්ණායක සපුරාලන බව සහතික කිරීම සඳහා ඒකාබද්ධ පරීක්ෂණ කණ්ඩායම (JIG) වාර්ෂික විගණන පවත්වන ලද අතර 2024 සඳහා අඛණ්ඩව 'හොඳ' (සාමාන්‍යයට වඩා වැඩි) ස්ථානයට සංස්ථාව පිළිගෙන ඇති බව සැලකිල්ලට ගැනීම වැදගත්ය. එයින් ඇඟවෙන්නේ සංස්ථාවෙහි මෙහෙයුම් විශිෂ්ටත්වය මෙන්ම ගුවන් සේවා කෙරෙහි විශ්වාසය ගොඩනඟන බවයි. තවද CPC IATA විගණනයෙන් සාර්ථකව සමත් වූ අතර කහ ශ්‍රේණියේ සිට කොළ ශ්‍රේණියට උසස් වීමක් ලබා ඇත.

## ඉදිරි මග

සියලුම ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපළවල් සඳහා ජාත්‍යන්තර තත්ත්ව සහ පිරිවිතරයන්ට සරිලන ගුවන්යානා ඉන්ධන සැපයීමට සංස්ථාව කැපවී සිටී. මේ සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ නවීකරණය කිරීම මෙන්ම අති නවීන තාක්ෂණය භාවිතයෙන් ඉන්ධන සැපයීම සඳහා ආයෝජන සිදු කෙරේ. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සහ යාපනය ගුවන්තොටුපළේ ඉන්ධන ගබඩා ධාරිතාව වැඩි දියුණු කිරීම සහ ඉන්ධන අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා ව්‍යාපෘති ආරම්භ කර පවත්වාගෙන යනු ලැබේ.

2030 වසර වන විට අනාගත ඉල්ලුම සපුරාලීම සඳහා ඉන්ධන සංකීර්ණය තුළ ඉන්ධන සැපයුම් පද්ධතියේ නවීකරණය කිරීම් සිදු කරමින් පවතී. මෙයට ගිනි නිවන පද්ධතිය, පෙන පද්ධතිය, ගිනි හඳුනාගැනීම, බල උත්පාදනය, පාලන පද්ධති සහ ගොඩනැගිලි සංවර්ධනය කිරීම සහ වෙනස් කිරීම ඇතුළත් වේ. 2024 අවසානය වන විට, මෙම ව්‍යාපෘතිය 96% ක භෞතික ප්‍රගතියක් සහ 82.72% මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන තිබුණි. මෙය 2025 දී ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ.

තවද, තරඟකාරී මිල ගණන් සහ අගය එකතු කළ සේවාවන් ලබා දීමෙන් සෘජු ගනුදෙනුකරුවන් ලෙස ජාත්‍යන්තර ගුවන් සමාගම් ආකර්ෂණය කර ගැනීම සඳහා සංස්ථාව මුලපිරීම් සිදුකර ඇත. මෙම උපාය මාර්ගයට අනුකූල වීම සඳහා IATA ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි එහි ඉන්ධන සැපයුම් ගිවිසුම් සංශෝධනය කිරීමේ ක්‍රියාවලියක ද සංස්ථාව නිරතව සිටී.

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගුවන් තෙල් ඉන්ධන මිලකරණ උපාය මාර්ගය ජාත්‍යන්තර ඉන්ධන මිල චලනයන්ට අනුකූලව මාසික මිල සංශෝධන ඇතුළත් වේ. මෙම ප්‍රවේශය විනිවිදභාවය සහතික කරන අතර සියලුම කොටස්කරුවන්ට ජයග්‍රාහී තත්වයක් නිර්මාණය කරයි.



## කර්මාන්ත

මෙම අංශයෙන් කාර්මික භූමිතෙල්, කර්මාන්ත සඳහා ඉන්ධන, ලිහිසි තෙල් සහ ද්‍රාවක (SBP) පුද්ගලික ගනුදෙනුකරුවන්ට විකිණීමෙන් ලැබෙන ආදායම නිරූපණය කරයි. මෙම අංශයෙන් ලැබුණු මුළු ආදායම සුළු වැඩිවීමක් පෙන්නුම් කළ අතර එය පෙර වසරේ රුපියල් බිලියන 18.8 ට සාපේක්ෂව 2024 දී රුපියල් බිලියන 19.5 දක්වා ඉහළ ගොස් ඇත. විකුණුම් පරිමාව වසරින් වසර 24% කින් වැඩි වුවද විකුණුම් මිල පහත වැටීම හේතුවෙන් සමස්ත ආදායම් වර්ධනය සීමා විය.

**නිෂ්පාදනය අනුව විකුණුම් ආදායම**




කර්මාන්ත ආදායම් මිශ්‍රණය තුළ දැවි තෙල් ආදායම විශාලතම කොටස හිමිකර ගත් අතර එය මුළු කර්මාන්ත ආදායමෙන් 83% කට දායක විය. 2024 දී දැවි තෙල් රුපියල් බිලියන 16.2 ක ආදායමක් උපයා ඇති අතර එය පෙර වසරේ රුපියල් බිලියන 15.7 සිට සුළු වැඩිවීමක් සනිටුහන් කරයි.

ලිහිසි තෙල් යනු කර්මාන්ත අංශයේ අපගේ තරඟකාරී සහ උපායමාර්ගික ව්‍යාපාරික ඒකකයකි. අපගේ සියලුම ලිහිසි තෙල් ISO 9001/2000 සහතිකය ඇති මිශ්‍ර කිරීමේ කම්හලක මිශ්‍ර කර ඇත. සිපෙට්කෝ (Ceypetco) ලිහිසි තෙල් සන්නාමය ඇමරිකානු පෙට්‍රෝලියම් ආයතනය (API), MTU Friedrichshafen SmbH සහ European Automobile Manufacturers Association (ACEA) සහ කාර්මික සහ මෝටර් රථ යෙදුම් යන සේවා දෙඅංශයෙහිම අදාළ ජාත්‍යන්තර පිරිවිතරයන්ට අනුකූලව වන අතර කාර්මික සහ මෝටර් රථ යෙදවුම් යන දෙඅංශයට ම අදාළ වේ.

සේවයට කැපවූ වෘත්තිකයන්ගෙන් යුත් අපගේ කණ්ඩායම, විශ්වාසදායක සහ ඵලදායී අලෙවි නියෝජිත ජාලය සමඟ එක්ව, පාරිභෝගික අපේක්ෂාවන් ඉක්මවා යන පුළුල් විසඳුම් සහ සේවාවන් නිරන්තරයෙන් සපයයි සහ ඔවුන් අපගේ ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීමට කැපවී සිටියි.

**විකුණුම් ආදායම**




අපගේ සැපයුම්කරුවන් සමඟ සැපයුම් දාම අභියෝග විසඳීමෙන් පසුව, ආදායම පෙර වසරට සාපේක්ෂව ස්ථාවරව පැවති අතර එය රුපියල් බිලියන 1.7 කි.

**නිෂ්පාදනය අනුව විකුණුම් ප්‍රමාණය**




2024 දී කාර්මික භූමිතෙල් සඳහා ඇති ඉල්ලුම රුපියල් බිලියන 1.01 ක් ලෙස වාර්තා වූ අතර එය 2023 දී රුපියල් බිලියන 0.7 සිට ඉහළ යාමකි. මෙම වර්ධනයට හේතු වූයේ රටේ ආර්ථික තත්ත්වයන් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම සහ ආර්ථික සංවර්ධනය අරමුණු කරගත් රජයේ ප්‍රතිපත්ති මගිනි. විකුණුම් පරිමාව අනුව, 2023 දී ලීටර් මිලියන 2.3 ක් වූ අතර එය 2024 දී ලීටර් මිලියන 5.3 ක් දක්වා වැඩි විය. ගෝලීය ඉන්ධන වෙළඳපොළ ප්‍රවණතා සමඟ සමපාත වූ මිල ගැලපීම් හේතුවෙන් ඉන්ධන විකුණුම් පරිමාවේ සැලකිය යුතු වැඩිවීමක් ප්‍රධාන වශයෙන් සිදුවිය

ඛනිජ තෙල් නීතිගත සංස්ථාව SBP සඳහා මුළු ඉල්ලුම සාර්ථකව සපුරන ලදි. කෙසේ වෙතත්, රට තුළ ඉන්ධන සැපයුම වැඩිවීම හේතුවෙන්, SBP සඳහා ඇති ඉල්ලුම 20% කින් පහත වැටුණු අතර, එය පෙර වසරට සාපේක්ෂව ආදායමේ 39% පහත වැටීමත් වේ. ජාත්‍යන්තර ඉන්ධන මිල අඩුවීමට අනුකූලව විකුණුම් මිල අඩු කිරීම මෙම පහත වැටීමට තවදුරටත් බලපෑවේය.

## ඉදිරි මග

ජාත්‍යන්තර වෙළඳපොළට පිවිසීමේ අරමුණින් ලිහිසි තෙල් නිෂ්පාදන පහසුකමක් ස්ථාපිත කිරීම සඳහා උද්යෝගිමත් මුලපිරීමක් දියත් කර ඇත. ඊට අමතරව, දේශීය ලිහිසි තෙල් වෙළඳපොළ තුළ සංස්ථාවේ හි පැවැත්ම ශක්තිමත් කිරීම සඳහා, ප්‍රාදේශීය කාර්යාල සහ සංස්ථාව සතු පිරවුම්හල් හරහා බෙදාහැරීමේ ජාලය පුළුල් කිරීමට පියවර ගෙන ඇත.



## ගෘහස්ථ අංශය



සැපයුම් දාම අභියෝග ක්‍රමයෙන් නිරාකරණය වී ඇති අතර, පිරිපහදුවට අඛණ්ඩ මෙහෙයුම් පවත්වා ගැනීමට එය ඉඩ සලසන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස භූමිතෙල් සඳහා වන සම්පූර්ණ ඉල්ලුම සාර්ථකව සපුරා දීමට හේතු වී ඇති අතර, ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) සැපයුමේ සුළු අඩුවීමක් පෙන්නුම් කරයි. LPG ඉල්ලුමේ අඩුවීමක් තිබියදීත්, මෙම අංශයෙන් ලැබෙන ආදායම 28% කින් ඉහළ ගොස් මූල්‍ය වර්ෂය තුළ රුපියල් බිලියන 41.2 ක් දක්වා වාර්තා විය.

**විකුණුම් ආදායම**




**නිෂ්පාදනය අනුව විකුණුම් ආදායම**




**නිෂ්පාදනය අනුව විකුණුම් ප්‍රමාණය**




රජයේ ප්‍රතිපත්තියට අනුකූලව, භූමිතෙල් මිල ගණන් එහි සැපයුමට අදාළ පිරිවැයට ගැලපෙන පරිදි සකස් කර ඇති අතර, මෙම ප්‍රවණතාවය 2024 වසර පුරාම පැවතුන අතර එමඟින් ආදායම 36% කින් සහ විකුණුම් පරිමාව 69% කින් වැඩි විය. මීට අමතරව, ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන් සහ අනෙකුත් පිරිවැය සාධක සමඟ විකුණුම් මිල පෙළගැස්වීම සඳහා භූමිතෙල් මිල මාසිකව සංශෝධනය කෙරේ.

ඩීසල් සහ භූමිතෙල් අතර පවතින මිල විෂමතාවය හේතුවෙන් ඇතැම් විශාල වාහන විශේෂයෙන්ම බස් රථ සහ ට්‍රක් රථ භූමිතෙල් සහනාධාර අවභාවිත කර ඇත. ඊට ප්‍රතිචාර වශයෙන්, සහනාධාර කාන්දුවීම් අඩු කිරීම සහ ප්‍රතිලාභ අපේක්ෂිත ලබන්නන්ට ළඟා වීම සහතික කිරීම අරමුණු කර ගනිමින් බර වාහන මගින් භූමිතෙල් අවභාවිතය වැළැක්වීම සඳහා දැඩි පියවර ක්‍රියාත්මක කර ඇත.

පිරිපහදුව වසර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස කිලෝග්‍රෑම් මිලියන 20.8 ක LPG සැපයුමක් වාර්තා විය. එමෙන් ම වසර තුළ, LPG අලෙවියෙන් ලැබුණු ආදායම රුපියල් බිලියන 4.6 ක් විය.

## කෘෂි රසායන



සංස්ථාව දශක පහකට වැඩි කාලයක් කෘෂි රසායනික කර්මාන්තයේ ක්‍රියාකාරීව කටයුතු කර ඇත. රජයේ ආයතනයක් ලෙස, අපි මිල නියාමකයෙකු ලෙස සේවය කරන අතර, ගොවීන් අසාධාරණ තරඟකාරිත්වයෙන් ආරක්ෂා කරන අතරම සාධාරණ මිලකට උසස් තත්ත්වයේ කෘෂි රසායනික නිෂ්පාදන ලබා ගත හැකි බව සහතික කරමු.

**විකුණුම් ආදායම**




කෘෂි රසායනික ආනයනය සහ දේශීය නිෂ්පාදනයට පහසුකම් සපයන රජයේ ප්‍රතිපත්ති වෙනස්කම් හේතුවෙන් මෙම අංශය දැනට නැවත පිබිදීමක් අත්විඳිමින් සිටී. කෘෂි රසායනික ආනයන තහනම ඉවත් කිරීම වෙළඳපොළ පුනර්ජීවනය කිරීමට සහ නව තරඟකරුවන්ට වෙළඳපල තුළට ඇතුළත් වීමට අවස්ථාව ලබා දීමට හේතු විය.

එහි ප්‍රතිඵලයක් ලෙස, කෘෂි රසායනික අංශයෙන් ලැබෙන ආදායම 2023 දී රුපියල් බිලියන 1.6 සිට මෙම වසරේදී රුපියල් බිලියන 0.8 දක්වා සැලකිය යුතු ලෙස පහත වැටී ඇති අතර එය වැඩි වූ තරඟකාරිත්වය සහ වෙළඳපල ගැලපීම් පිළිබිඹු කරන 50% ක අඩුවීමකි.

නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම සහ සෞඛ්‍ය සම්පන්න සහ ආරක්ෂිත පරිසරයක් පවත්වා ගැනීම සඳහා ස්ථාපිත ක්‍රමවේද වලට අනුකූල වීමට සංස්ථාව කැපවී සිටී. කෘෂි රසායන හා සම්බන්ධ ආවේණික අවදානම් සැලකිල්ලට ගෙන, අපගේ මෙහෙයුම් ප්‍රශස්ත කිරීම සඳහා අපි විවිධ ක්‍රියාවලීන් සහ පාලනයන් ක්‍රියාත්මක කර ඇත්තෙමු. මේ සඳහා, අපි ISO 9001:2015, ISO 14001:2015 සහ ISO 45000:2018 වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය සඳහා ISO කාර්ය සාධන ඇගයීම් සිදු කර ඇති අතර එය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සිදු කරන ලද ඒකාබද්ධ කළමනාකරණ පද්ධතිය සහ වාර්ෂික නිරීක්ෂණ විගණනය යටතේ අඛණ්ඩව කරමින් පවතී.

විශිෂ්ටත්වය සඳහා අපගේ කැපවීම අගයමින්, ශ්‍රී ලංකාවේ වරලත් වෘත්තීය කළමනාකරුවන් විසින් හොඳම කළමනාකරණ පිළිවෙත් සඳහා කුසලතා සම්මානයකින් ද සංස්ථාව පිදුම් ලබා ඇත.

නවෝත්පාදනය සඳහා අපගේ කැපවීම පෙන්නුම් කරමින්, අපගේ පරිසර හිතකාමී නිෂ්පාදන පරාසය පුළුල් කිරීම සඳහා මුලපිරීමේ කාර්යයක් ලෙස සංස්ථාව "Flipper" නමින් ජෛව-කෘමිනාශකයක් හඳුන්වා දුන්නේය. එසේම එය, 2021 වසරේ දී එක්සත් රාජධානියේ හොඳම නවෝත්පාදනය සඳහා ක්වීන්ස් සම්මානය ද හිමි කරගෙන ඇත.

තිරසාර සංවිධානයක් ලෙස, අපි පාරිසරික භාරකාරත්වය සහ කෘෂි රසායනවල විභව අවදානම් සහ අනිසි භාවිතය අවම කිරීම සඳහා කැපවී සිටිමු. ඊට අමතරව, තරඟකාරී මිල ගණන් යටතේ උසස් තත්ත්වයේ කෘෂි රසායනික නිෂ්පාදන ලබා දීමෙන් අඩු ආදායම්ලාභී ගොවීන්ට සහාය වීමට අපි උත්සාහ කරමු, එමඟින් ඔවුන්ගේ බෝග අස්වැන්න වැඩි කිරීම සහ ඔවුන්ගේ ජීවනෝපායන් වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වේ.

පසුගිය වසර පුරා, අපගේ කෘෂි රසායනික ව්‍යාපාරය ඌන සේවා ලත් වෙළඳපොළවල් වෙත තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා සංස්ථාව විසින් කෘෂි තොග අලෙවිකරුවන් දෙදෙනෙකු සහ නව අලෙවි නියෝජිතයින් 45 දෙනෙකුද පත් කර ඇත.

## ඉදිරි මග

මුතුරාජවෙල අති නවීන කෘෂි රසායනික කර්මාන්ත ශාලාවක් පිහිටුවීම සඳහා සංස්ථාව උද්යෝගිමත් මුලපිරීමක් දියත් කර ඇත. මෙම අභිලාෂකාමී ව්‍යාපෘතියේ අරමුණ වන්නේ සියලුම අත්‍යවශ්‍ය පහසුකම් සහ නවතම තාක්ෂණික දියුණුව ඇතුළත් කිරීමයි. මෙහි ප්‍රධානම උපාංගයක් ලෙස අති නවීන රසායනාගාරක් වඩාත් දියුණු උපකරණ ස්ථාපනය කර නිර්මාණය කර ඇති අතර එය බිම් මට්ටමේ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා මග පාදයි.



## සපුගස්කන්ද බෙදාහැරීමේ පර්යන්තය

අපගේ බෙදාහැරීම් මධ්‍යස්ථානයක් වන සපුගස්කන්ද බෙදාහැරීමේ මධ්‍යස්ථානය හරහා පෙට්‍රල් 92, ඔටෝ ඩීසල්, භූමිතෙල්, දැවි තෙල් සහ ගුවන්යානා ඉන්ධන වැනි ඉන්ධන බෙදාහැරීම සිදු කරයි. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් හිමිකාරිත්වය දරන සහ ක්‍රියාත්මක කරන මෙම පහසුකම, පිරිපහදුවේ සිට අසල ඇති විවිධ ගමනාන්ත වෙත පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන සෘජුව ලබා දීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

වසර තුළ, සපුගස්කන්ද බෙදාහැරීම් පර්යන්තය පෙට්‍රල් 92, ඔටෝ ඩීසල්, භූමිතෙල් සහ දැවි තෙල් යන නිෂ්පාදන හතර හසුරුවා ඇති අතර, එය මුළු ලීටර් මිලියන 308.4 ක් වූ අතර වසරේ මුළු ආදායමට රුපියල් බිලියන 70.3 කින් දායක විය.

සපුගස්කන්ද පර්යන්තය ප්‍රධාන වශයෙන තෙල් අලෙවි නියෝජිතයන් සතු බවුසර් හරහා ඉන්ධන බෙදාහැරීමට කටයුතු කරයි. එය ප්‍රතිදාන ගාස්තු අඩු කිරීම සහ කොළොන්නාවේ බෙදාහැරීමේ මධ්‍යස්ථානය වටා රථවාහන තදබදය සමනය කිරීමට උපකාරී වන උපායමාර්ගික ප්‍රවේශයකි. මීට අමතරව, පර්යන්තය දැවි තෙල් බෙදා හැරීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරමින් ජාතික බලශක්ති සැපයුම් දාමයේ එහි ස්ථානය තවදුරටත් ශක්තිමත් කරයි. පිරිපහදුව මෙහෙයුම් වැඩිවීම මගින් මෙම බෙදාහැරීමේ මධ්‍යස්ථානයේ භාවිතය ද වැඩි වී ඇත.

වසර පුරා, සංස්ථාව එහි බෙදාහැරීමේ පර්යන්තවල කාර්යක්ෂමතාව සහ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපෘති රාශියක ආයෝජනය කර ඇත. ප්‍රධාන වැඩිදියුණු කිරීම් අතරට ඉන්ධන ගබඩා ටැංකි ප්‍රතිසංස්කරණය කිරීම සහ ටැංකි මිනුම් පද්ධතියක් සම්පූර්ණ කිරීම, සංස්ථාවෙ හි ඉන්ධන බෙදා හැරීමේ ජාලයේ තීරණාත්මක අංගයක් ලෙස පර්යන්තයේ කාර්යභාරය ශක්තිමත් කිරීමට උපකාරී විය.





## පිරිපහදු මෙහෙයුම්

1969 දී ආරම්භ කළ දා සිට, සපුගස්කන්ද පිරිපහදුව අපේ ජාතියට වටිනාකම් ඇති කරන මූලික අංගයක් ලෙස කටයුතු කරයි. 1970 පිරිපහදුව රටේ සමස්ත ඉන්ධන ඉල්ලුම සපුරාලූ අතර, අදටත් එය වැදගත් කාර්යභාරයක් ඉටු කරමින් ඉහළ යන ඉල්ලුම මධ්‍යයේ සංස්ථාවේ විකුණුම් වලින් ආසන්න වශයෙන් 35%-50% ක් සපුරාලයි.

### එය වටිනාකමක් නිර්මාණය කරන්නේ කෙසේද?

- 100% ශ්‍රී ලාංකික කාර්ය මණ්ඩලයක් යටතේ ක්‍රියාත්මක වේ.
- පුරවැසියන් 900 ක් සඳහා සෘජු රැකියා අවස්ථා සපයයි.
- ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මුළු විකුණුම් පරිමාවෙන් 35%-50% ක් සපයයි.
- විදේශ මුදල් පිටතට ගලා යාම ඉතිරි කරයි.
- වසර 54 ක අඛණ්ඩ මෙහෙයුම් සාර්ථකව සම්පූර්ණ කර ඇත
- විදේශ රටවල් විසින් පිරිපහදු පුහුණුව සඳහා ඉහළ පිළිගැනීමක් ඇත.

රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්නුම් කිරීමත්, රජයේ විවිධ මූලපිරීම් ක්‍රියාත්මක වීමත් සමඟ - සංස්ථාවෙ හි උපායමාර්ගික සැලසුම්කරණය සහ ක්‍රියාකාරී පියවරයන් හේතුවෙන් සංස්ථාවට 2024 වසර පුරාම පිරිපහදුවට ස්ථාවර බොරතෙල් සැපයුමක් පවත්වා ගෙන යාමට හැකි විය. කෙසේ වෙතත්, අඛණ්ඩ ව පිරිපහදුවේ මෙහෙයුම් පවත්වා ගැනීම සහතික කිරීම සඳහා වසර තුළ ප්‍රධාන සැලසුම්ගත අලුත්වැඩියාවට මෙහෙයුම් නවත්වන ලදී.

එහි ප්‍රතිඵලයක් ලෙස, පිරිපහදුව වසරේ ඉතිරි කාලය සඳහා කාර්යක්ෂමව ක්‍රියාත්මක විය. 2024 දී, පිරිපහදුව බොරතෙල් මෙට්‍රික් ටොන් 1,543,836 ක් සැකසූ අතර, එය 2023 දී මෙට්‍රික් ටොන් 1,677,033 ක් වූ අතර එය නියමිත අලුත්වැඩියා සඳහා වසා දැමීම හේතුවෙන් 9% ක අඩුවීමක් ලෙස සටහන් විය.

| බොරතෙල් වර්ගය | ප්‍රතිශතය |
| --- | --- |
| මර්බන් බොරතෙල් | 100 |

නඩත්තු කිරීම සඳහා අවශ්‍ය ප්‍රධාන වසා දැමීමක් හැරුණු විට, 2024 වසර පුරාම පිරිපහදුව අඛණ්ඩව ක්‍රියාත්මක විය. වර්ෂය තුළ පිරිපහදුව මර්බන් බොරතෙල් පමණක් සැකසුවේය.

2024 දී, පිරිපහදුව මෙට්‍රික් ටොන් 1,543,836 (MT) ක මුළු නිෂ්පාදනයක් වාර්තා කළ අතර, එය 2023 දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 1,677,034 ට සාපේක්ෂව 9% ක අඩුවීමක් වේ. පිරිපහදුවේ ඔටෝ ඩීසල්, දැවි තෙල්, ගුවන් යානා ඉන්ධන, පෙට්‍රල් 92 සහ භූමිතෙල් නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් සමන්විත වන අතර විවිධ ඛනිජ තෙල් නිෂ්පාදන දහයක් සාර්ථකව වසර පුරා නිෂ්පාදනය කර ඇත. මෙම නිෂ්පාදන කොළොන්නාව පර්යන්තය, සපුගස්කන්ද බෙදාහැරීමේ පර්යන්තය සහ ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සහ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් ඇතුළු ප්‍රධාන ගනුදෙනුකරුවන්ට සෘජුවම බෙදා හරින ලදී.

1969 දී ස්ථාපිත කළද ලංකා ඛනිජ තෙල් සංස්ථාව දැඩි නඩත්තු පිළිවෙත් හරහා පිරිපහදුවේ අඛණ්ඩ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සහතික කර ඇත. ඊට අමතරව මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ නිෂ්පාදන ප්‍රතිලාභ උපරිම කිරීම සඳහා සේවක පුහුණුව කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කර ඇත.



# අපගේ උපායමාර්ග

ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දේශීය හා විදේශීය වශයෙන් ආර්ථික උච්චාවචනයට ලක් වන පරිසරයක් තුල එහි මෙහෙයුම් කටයුතු සිදු කරයි. ශ්‍රී ලංකාවේ වර්තමාන තත්වය සලකන විට 2024 වර්ෂය තුලදී බලශක්ති ක්ෂේත්‍රය තුල ස්ථාවරයක් ලබා ගැනීම සඳහා රජයේ ප්‍රතිපත්තිමය තීරණය වන නව තරඟකරුවන් ඇතුලත්වීම ද පිටුවහල් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සංස්ථාවට දැඩි තරගකාරීත්වයකට මුහුණ දීමට සිදුවූ අතර, ඒ සඳහා සංස්ථාවේ බෙදුම්හල් නව තරගකරුවන්ට භාර දීමද හේතු විය.

එයට මුහුණදීම අරමුණු කර ගනිමින් සංස්ථාව, මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම, යහපැවැත්ම සහතික කිරීම මෙන්ම කෙටි, මධ්‍යම හා දිගුකාලීන අරමුණු ළඟා කර ගැනීමට සංකීර්ණ උපාය මාර්ග නිර්මාණය කර ඇත. මෙම උපාය මාර්ග ජාතියේ අරමුණු සහ ඒවා ශක්තිමත් කිරීමට මෙන්ම ආර්ථිකය ශක්තිමත් කිරීම සහ බලශක්ති ආරක්ෂාව කෙරෙහි යොමු වෙමින් පවතී. කලින් සලකා බලමින් කරනු ලබන සැලසුම් සහ උපාය මාර්ගික ඒකාබද්ධ වීම හරහා සංස්ථාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට මෙන්ම ජාතියේ බලශක්ති ආර්ක්ෂාවට හා සංවර්ධනයට ප්‍රධාන දායකයා වශයෙන් කටයුතු කරයි.





තවද, සැපයුම් දාම කළමනාකරණය සඳහා ප්‍රගතිශීලී ප්‍රවේශයක් අනුගමනය කරමින් පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් පිහිටුවීම සක්‍රියව සිදුවෙමින් පවතී.

## ලාභදායි වර්ධනය

සංස්ථාව කැපවී සිටින්නේ අභියෝග හඳුනාගෙන ලාභදායිත්වය ඉහළ නැංවීමට සහ මූල්‍ය තිරසාරභාවය සහතික කිරීමට ඇති අවස්ථා ප්‍රයෝජනයට ගන්නා නව්‍ය උපාය මාර්ග සැකසීම සඳහාත් වේ. සන්නාම සමානාත්මතාවය ගොඩනැගීම, ලාභ උත්පාදනය සහ පාර්ශවකරුවන්ට වටිනාකමක් ලබා දීම අරමුණු කරගනිමින් පාරිභෝගික තෘප්තිය සහ එහි ව්‍යාපාරික හවුල්කරුවන්ගේ අවශ්‍යතා සඳහා සංවිධානය ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙයි. විවිධ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් සහ රජයේ සහ නියාමන ආයතනවල සහාය ඇතිව, නිෂ්පාදනවල ස්ථාවර සැපයුමක් පවත්වා ගැනීමට සංස්ථාව සැලකිය යුතු උත්සාහයක් ගෙන ඇත. තවද, රජය විසින් නව මිල ක්‍රමයක් ක්‍රියාත්මක කරමින් සිටීම අනාගත පාඩු අවම කර ගැනීමට දායක වේ. ඇත. වර්තමාන මිලකරණ යාන්ත්‍රණය සංස්ථාව ලාභදායිත්වය සුරක්ෂිත කරනවා පමණක් නොව සාමාන්‍ය ජනතාව ඇතුළු සියලුම පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ ලබා දෙන බැවින් සංස්ථාව විසින් විකුණුම් උපරිම කිරීමට සැලසුම් කර ඇති උපාය මාර්ග සකස් කර ඇත. මීට අමතරව, ගබඩා පහසුකම් සහ අනුබද්ධ සේවා සැපයීම කෙරෙහි අවධානය යොමු කරන TPTL සමඟ බද්ධ ව්‍යාපාරයක ආයෝජන හරහා සංස්ථාව ව්‍යාපාර විවිධාංගීකරණය සිදු කිරීමට අපේක්ෂා කරයි.

## මෙහෙයුම් විශිෂ්ටත්වය

අපගේ ව්‍යාපාරික මෙහෙයුම් මූලිකාංගය වන අතර, මෙම විශිෂ්ටත්වය ඉහළ නැංවීම සඳහා අප විසින් සියලු ප්‍රාග්ධන වත්කම් හරහා සැලකිය යුතු සම්පත් වෙන් කිරීමක් සිදු කරනු ලබන අතර එමගින් සංස්ථාවේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තීරනාත්මක වන කාර්යක්ෂමතාව සහ ඵලදායී බව යන දෙකම වැඩි දියුණු කෙරෙයි. සංස්ථාව විදේශ විනිමය මිලදී ගැනීමේ පළමු ආයතනය වශයෙන් විදේශ විනිමය වෙළඳපලට පිවිසීම තුලින් අප, අපගේ සැපයුම්කරුවන් සඳහා නිසි වේලාවට ගෙවීම් කිරීම සහතික කරන අතර, ඒ මගින් මිලදී ගැනීමේ වාසි ලබා ගැනීමට බලාපොරොත්තු වේ. අපගේ කොටස්කරුවන් සඳහා වටිනාකම් උත්පාදනය කිරීමට තුඩු දෙන, අවසානයේ සමාජය සඳහා වැඩි වටිනාකමක් ඇති කරන වඩාත් පිරිවැය-කාර්යක්ෂම ආකාරයෙන් ඛනිජ තෙල් නිෂ්පාදන පිරිපහදු කිරීම සඳහා අපි පිරිපහදුව තුළ අඛණ්ඩ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක කර ඇති අතර, ක්‍රියාවලි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ පිරිවැය ප්‍රශස්ත කිරීම සඳහා නිර්මාණය කර ඇති වත්කම් සංවර්ධන මූලපිරීම් මාලාවක්ද අපි අනුගමනය කරමින් සිටින්නෙමු. මෙයට සමගාමීව සංස්ථාව විසින් විවිධ වත්කම් සංවර්ධනය කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර එමගින් මෙහෙයුම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සහ වියදම් අවම කිරීම මෙන්ම සමාජයට වටිනාකම් නිර්මාණය කිරීම ද බලාපොරොත්තු වේ.

ත්‍රිකුණාමලයේ ටැංකි 24 ක ආයෝජන සහ අපගේ අනුබද්ධිතTPTL වැඩිදියුණු කිරීම ඇතුළු උපායමාර්ගික මූලපිරීම් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. මීට අමතරව සංස්ථාව ලිහිසිතෙල් සහ කෘෂි රසායන නව වෙළඳපල අංශ වෙත යොමු වෙමින් පවතී. මෙහෙයුම් ධාරිතාව වැඩි කිරීම, දෘශ්‍යතාව වැඩිදියුණු කිරීම සහ අපගේ පවතින පිරවුම්හල් ජාලයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා කැපී පෙනෙන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ.



## තාක්ෂණික දියුණුව

ඉක්මණින් වෙනස් වන පරිසරයක සැරිසැරීමට තාක්ෂණික දියුණුව අත්‍යවශ්‍ය වන අතර අප විසින් මේ සඳහා සැලකි යුතු ක්‍රියාමාර්ග ගෙන ඇත. සමස්ත දිවයින පුරා ඉන්ධන සැපයුම අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා නිර්මාණය කර ඇති ක්‍රමානුකූල පාලන යාන්ත්‍රණයක් හරහා ඉන්ධන බෙදා හැරීමේ උපාය මාර්ගය ස්වයංක්‍රීය කොට සහ ප්‍රමිතිගත කර ඇත.

අලෙවි නියෝජිත තොග මට්ටම් අධීක්ෂණ පද්ධතියක් පිහිටුවීම මගින් තීරණ ගැනීමේ ක්‍රියාවලින් කැපී පෙනෙන ලෙස වැඩිදියුණු කර ඇති අතර, අඩු තොග ප්‍රදේශ හඳුනා ගැනීමට සහ ඉන්ධන සැපයුම් කඩිනමින් සංවිධානය කිරීමට පහසුකම් සපයයි. මීට අමතරව අලුතින් හඳුන්වාදෙන ලද ඇණවුම් කිරීමේ ක්‍රියාවලිය මගින් වියදම් අඩු කරමින් බෙදාහැරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කර ඇති අතර අධීක්ෂණය සහ මනා කළමනාකරණය මගින් ඉන්ධන වල ගුණාත්මකභාවය සහතික කරමින් ප්‍රාදේශීය මට්ටමින් මෙය සුපරීක්ෂණය කෙරේ. විශේෂයෙන්ම සම්පූර්ණ ස්වයංක්‍රීය පියවීම් ක්‍රියා පටිපාටි මගින් බෙදුම්කරුවන්ට තමන්ගේ ඉන්ධන ඉන්වොයිස් පත්‍ර කාර්යක්ෂමව පියවීම සඳහා අමතර බැංකුකරණ ආයතන සංස්ථාගත කිරීමත් සමඟ තොරතුරු තාක්‍ෂණය පසුගිය වසර පුරා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත.

එපමණක් නොව, ඩිජිටල් යටිතල පහසුකම් සහ පුහුණුව සඳහා වන ආයෝජනවලට අමතරව, ව්‍යවසාය මූලාශ්‍ර සැලසුම් (ERP) පද්ධතියේ කාර්යක්ෂම භාවිතය තත්‍ය කාලීන දත්ත ලබා දී ඇති අතර, එමගින් මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කරයි. බෙදුම්කරුවන්ගේ තොග මට්ටම් අධීක්ෂණ පද්ධතිය වැඩි දියුණු කිරීම මගින් ප්‍රමාණවත් තොග මට්ටම්වල පැවැත්ම සහතික කර ඇත.

ඉදිරිය දෙස බැලීමක් ලෙස සංස්ථාව විසින් කාර්යාල කටයුතු මෘදුකාංග හරහා ස්වයංක්‍රීය කිරීමට මෙන්ම පවත්නා E R P පද්ධතියේවැඩිදියුණු කරනු ලැබූ අංශය වෙත යොමුවීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වන අතර එමගින් සංස්ථාවේ කාර්යක්ෂමතාව, විනිවිදභාවය මෙන් ම නවීන තාක්ෂණයෙන් යුතු මෙහෙයුම් පද්ධතියක් ඇති කිරීමට බලාපොරොත්තු වේ.



## තිරසාර බව

තිරසාර සංවිධානයක් නිර්මාණය කිරීමේ අපගේ කැපවීම තුළ, නායකත්වයේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා අපගේ මෙහෙයුම්වල සියලුම අංශ හරහා තිරසාර මූලධර්ම ඇතුළත් කර ඇත. සමස්ථයක් වශයෙන් මෙම ක්‍රමයේදී පාරසරික කරුණු පරිපාලනමය කරුණු සාමාජීය කරුණු කෙරෙහි දාර්ශණිකව අවධානය යොමු කර ඇත. සැපයුම් දාමයේ අභියෝගවලට මුහුණ දීමට සිදු වුවද, සංස්ථාව විසින් ධීවර ප්‍රජාවට සහ අඩු ආදායම් මට්ටම් ඇති පදිංචිකරුවන්ට භූමිතෙල් සහ ඉන්ධන සාර්ථකව ලබා දීමට සමත් වී ඇත.

මෙසේ කිරීම තුලින් සංස්ථාව පුද්ගලික ජීවිත සඳහා මෙන්ම අත්‍යවශ්‍ය ආර්ථික කටයුතු පිළිබඳ වගකීම් දරණ අතරම ජාතික ආර්ථිකයේ බලශක්ති ආරක්ෂාව මෙන්ම සමාජීය සුභ සාධනය කෙරෙහිද වගකීම දරයි. පාරිභෝගික තෘප්තිය වැඩි දියුණු කිරීම සහ නෛතික අවශ්‍යතා පිළිපැදීම සහතික කිරීම සඳහා, සංස්ථාව විසින් සවිස්තරාත්මක අනුකූලතා ඇගයීම් මාලාවක් සමඟින් බලශක්ති භාවිතය සහ ද්‍රව්‍ය සහ නිෂ්පාදන ප්‍රසම්පාදනය සඳහා ප්‍රශස්තකරණ උපාය මාර්ග අනුගමනය කර ඇත. පාරිභෝගිකයන්ගේ සතුටුදායක තත්වය වැඩිදියුණු කිරීම සහ නීතිරීති වලට තදින් අනුගතවීම මගින් සංස්ථාව උපාය මාර්ගික ක්‍රම හරහා බලශක්ති භාවිතය උපරිම ලෙස යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර එමගින් යහපත් ප්‍රතිපත්ති යටතේ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම මෙන්ම මෙහෙයුම් කාර්යක්ෂමතාවය පිළිබඳව ද සංකීර්ණ අධීක්ෂණයක් ද සිදු කරයි.

තව දුරටත් අප විසින් ඒකාබද්ධ කර ඇති දිවයින පුරා පුළුල් බෙදාහැරීමේ ජාලය හරහා වක්‍ර රැකියා අවස්ථා 15,000 කට අධික සංඛ්‍යාවක් සංස්ථාව විසින් උත්පාදනය කෙරෙයි. මෙම ජාලය ප්‍රවාහන ක්ෂේත්‍රයේ නියුතු අයට, බෙදුම්කරුවන්ට, සේවා සපයන්නන්ට වැනි පාර්ශවකරුවන්ගේ සමාජීය සංවර්ධනය මෙන්ම වර්ධනය කෙරෙහි හිතකර ලෙස බලපායි. මෙසේ සම්බන්ධ වන ඒකාබද්ධ මෙහෙයුම් ජාලය මගින් සංස්ථාව තිරසාර අනාගතයක් මෙන්ම අපගේ පාරිභෝගිකයන්ට, සේවකයන්ට සහ සමාජයට දිගුකාලීන වටිනාකමක් ලබා දෙමින් පරිසරය ඉදිරි අනාගතය සඳහා ආරක්ෂා කිරීමේ කාර්ය භාරයද ඉටු කරයි.



## මානව ප්‍රාග්ධනය සංවර්ධනය

කඩිනමින් විකාශනය වන මෙහෙයුම් භූ දර්ශනය තුළ අපගේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ ප්‍රධාන අංගයක් ලෙස මානව ප්‍රාග්ධනය ක්‍රියා කරන අතර එය අපගේ ප්‍රමුඛතම උපායමාර්ගික වත්කම නියෝජනය කරයි. අපගේ පාර්ශවකරුවන්ට වටිනාකමක් ලබා දෙන අභිප්‍රේරිත, නියැලී සිටින සහ විශ්වාසවන්ත ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන1.7 මුදලක් වැය කරමින් පුහුණුවීම් ලබා දීම සඳහා සම්පත් කැප කර ඇත්තෙමු. අපගේ කැපවීම අපගේම සේවක මණ්ඩලය වැඩි දියුණු කිරීමෙන් ඔබ්බට විහිදී පුහුණු වැඩසටහන් සහ අඛණ්ඩ සන්නිවේදනය හරහා අපගේ ව්‍යාපාරික හවුල්කරුවන්ගේ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමටත් එමඟින් විශේෂඥතාව වර්ධනය කිරීම සහ පාරිභෝගික තෘප්තිය සහතික කිරීමටද අපි ප්‍රමුඛත්වය දෙන්නෙමු.

තවද, සංස්ථාව හි ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය වන මෙම මූලපිරීම් ඵලදායි කළමනාකරණය සහතික කරමින් සේවක පුහුණුව සහ සංවර්ධනය සඳහා සැලකිය යුතු ආයෝජනයක් සිදු කර ඇති අතර එය නිහඬව දක්වනු ලබන දැනුම වටා බැඳි අපගේ ආයතනික ආචාර ධර්ම සහ සංස්කෘතිය ශක්තිමත් කර ඇත.

## උපාය මාර්ගික ඒකාබද්ධවීම

සංස්ථාව එහි උපාය මාර්ගික ඒකාබද්ධවීම අරමුණු කර ගනිමින් ආයතනයේ මෙහෙයුම් අරමුණු සම්පත් සේවකයින්ගේ පවතින හැකියාවන් ආයතනයේ දිගුකාලීන අරමුණු ලගා කර ගැනීම සඳහා කාර්යක්ෂම ලෙස යොදා ගනිමින් ජාතියට බලශක්ති විසඳුම් ලබා දීමට උත්සහ කරයි. සංස්ථාවේ සියලුම දෙපාර්තමේන්තු සහ බද්ධ ව්‍යාපාරයන් මූලික අරමුණු පදනම් කර ගනිමින් ජාතියේ බලශක්ති ආරක්ෂාව සහ පාරිසරික යහ පැවැත්ම සහතික කරමින් ඇල්මක් දක්වන පුද්ගලයින්ට වටිනාකමක් නිර්මාණය කරනු ලැබේ. සංස්ථාව තාක්ෂණික අංශය කෙරෙහි යොමු වෙමින් පිරිපහදුව වැඩි දියුණු කිරීමද සැපයුම්කරුවන්ගෙන් උපරිමය ලබා ගැනීමද අරමුණු කර ගනිමින් කාර්යක්ෂමව සහ තරගකාරී ලෙස කටයුතු කරයි. නිරන්තරව කාර්යාලීය කටයුතු අධීක්ෂණය කිරීම සහා ආයතනයේ නීති රීති බලාත්මක කිරීම මගින් ව්‍යාපාර කටයුතු වලට යොමුවී ආයතනයේ දැක්ම සහ මෙහෙවරට ලගාවීමට උත්සහ කරයි.



## සැපයුම් දාමය කළමනාකරණය

ආර්ථික සංවර්ධනය සඳහා බලශක්ති සුරක්ෂිතතාවයේ අතිමහත් වැදගත්කම පිළිගනිමින් සැපයුම් දාම කළමනාකරණය කෙරෙහි අපගේ උපායමාර්ගික අවධානය යොමු කෙරේ. සංස්ථාව පිරිපහදු කළ සහ බොරතෙල් නිෂ්පාදන යන දෙකම ආනයනය කිරීම මත සම්පූර්ණයෙන්ම රඳා පවතින බැවින්, ඵලදායී සැපයුම් දාම කළමනාකරණය අපගේ මූලික උපායමාර්ගික අරමුණ වේ. නියමිත වේලාවට ගෙවීම් සිදු කිරීම මගින් සැපයුම්කරුවන්ගේ විශ්වාසය දිනා ගැනීමට හැකිවී ඇති අතර එම නිසා සැපයුම් වලදී ලබා දෙන අධිභාරය අවම කිරීමට හැකිවී ඇත.

මෙම වෙනස් කිරීම් සැලසුම් කර ඇත්තේ වඩාත් තරඟකාරී සහ විනිවිද පෙනෙන පරිසරයක් ඇති කිරීම සඳහා වන අතර, එය අවසානයේදී දේශීය වශයෙන් විදේශ විනිමය ඉතිරි කිරීම් වැඩි කිරීමට හේතු වේ.

# ව්‍යාපාර මාදිලිය

## යෙදවුම්

### මූල්‍ය ප්‍රාග්ධනය
හිමිකරුවන්ගේ අරමුදල්
ප්‍රාග්ධන කළමනාකරණය

### නිපැයුම් ප්‍රාග්ධනය
පිරවුම්හල් ජාලය
දේපල පිරියත හා උපකරණ

### බුද්ධිමය ප්‍රාග්ධනය
තාක්ෂණික නිපුණතා
සන්නාම ක්‍රියාවලිය
ක්‍රියාවලි සංවර්ධනය

### මානව ප්‍රාග්ධනය
අපගේ සේවකයන්
පළපුරුද්ද
හැකියා සහ ශක්‍යතා
පුහුණු සහ සංවර්ධන

### සමාජයීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
කොටස්කරුවන් කළමනාකරණය
සෞඛ්‍ය සහ ආරක්ෂණ ක්‍රියාමාර්ග
පාරදෘෂ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය

### ස්වාභාවික ප්‍රාග්ධනය
බලශක්ති කළමනාකරණය
ජල කළමනාකරණය
අනෙකුත් ස්වාභාවික සම්පත්

## ක්‍රියාකාරකම්

### දැක්ම

#### ක්‍රමෝපායන්
ලාභ වර්ධනය
මෙහෙයුම් විශිෂ්ටත්වය
තාක්ෂණික දියුණුව
තිරසාර බව
මානව ප්‍රාග්ධනය සංවර්ධනය
උපායමාර්ගික ඒකාබද්ධ වීම
සැපයුම් දාම කළමනාකරණය

#### ප්‍රාථමික ක්‍රියාකාරකම් සහ සහා
අලෙවිකරණය
ආනයනය
පිරිපහදු කිරීම
බෙදා හැරීම
ව්‍යාපාර ක්‍රමෝපාය
තාක්ෂණික සහ මූල්‍ය
පිරිස් කළමනාකරණය
තොරතුරු තාක්ෂණ සහා

සංස්ථායික පාලනය
අවදානම් කළමනාකර

බාහිර පරිසරය

මෙහෙය

ව්‍යාපාරික මාර්ග

විදුලිබල උත්පාදනය

ගුවන් තෙල්

කර්මාන්ත

දේශීය

කෘෂි රසායනික

ලිහිසි තෙල්

ය සේවා

ය

ණය

## නිමැයුම්

දළ ආදායම
රු.බි. 971

විකුණුම් ධාරිතාව
ලී.මි. 3,898

දළ ලාභය
රු.බි. 75,720

ශුද්ධ ලාභය
රු.බි. 32.7

කාර්ය මණ්ඩලය සඳහා පිරිවැය
රු.බි. 6.8

රජය වෙත දායකත්වය
රු.බි. 277.87

මුළු පිරවුම්හල්
1002

පිරිපහදුවේ සෞඛ්‍ය සහ ආරක්ෂාව
පිළිබඳ අවම සිද්ධි

## ප්‍රතිඵල

**හිමිකරුවන්**

සම්පත් නිර්මාණය

මූල්‍ය වර්ධනය

**පාරිභෝගිකයන්**

ගුණාත්මක නිෂ්පාදන

රට පුරා නිෂ්පාදන ලබා ගැනීමට ඇති හැකියාව

සාධාරණ මිල

**සේවකයන්**

දක්ෂ සහ කාර්යක්ෂම සේවා බල ඇණිය

ආරක්ෂාකාරී සහ සමාන පරිසරය

**නියාමකයන්**

අනුකූලතාවය

බලශක්ති ආරක්ෂාව

ආර්ථික සංවර්ධනය සඳහා දායකත්වය

**ප්‍රජාව**

තිරසාර සම්බන්ධතා

**සැපයුම්කරුවන්**

තිරසාර අගය දාමය

# මූල්‍ය ප්‍රාග්ධනය



## මූල්‍ය ප්‍රාග්ධනය

**971**
(රු. බි.)
ආදායම

**75.7**
(රු. බි.)
දළ ලාභය

**32.7**
(රු. බි.)
ශුද්ධ ලාභය

**152.61**
(රු. බි.)
කෙටි කාලීන වගකීම්

පිරිවැය පිළිබිඹු කරන මිලකරණ උපාය මාර්ග අඛණ්ඩව පවත්වාගෙන යාම, අඛණ්ඩ පිරිපහදු මෙහෙයුම්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ශේෂ පත්‍රය ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් මූල්‍ය වියදම් අඩුවීම සහ ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන් ස්ථාවරව පවත්වා ගැනීම හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට රුපියල් බිලියන 32.74 ක ශුද්ධ ලාභයක් පවත්වා ගැනීමට දායක විය. තම පිරවුම්හල්වල හිමිකාරිත්වය තරඟකරුවන්ට පැවරුවද, මෙම උපායමාර්ගික පියවර මඟින් වසර අවසානයේදී රුපියල් බිලියන 69.35 ක් වූ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හිමිකම් කොටස් තත්ත්වය තවදුරටත් ශක්තිමත් කරන ලදී. ඊට අමතරව, මාර්ගගත ඩොලර් මිලදී ගැනීමේ වේදිකාවක් හඳුන්වාදීම මඟින් සංස්ථාවේ සමස්ත මූල්‍ය පිරිවැය අඩු කිරීමට උපකාරී වීමෙන් මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු විය.

**දළ සටහන – 2024**

- ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රුපියල් බිලියන 32.7 ක ශුද්ධ ලාභයක් වාර්තා කළේය.
- ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සියලුම කෙටිකාලීන ණය ගැනීම් පියවා ඇත.
- වෙළඳපොළට ඇතුළු වූ තරඟකරුවන් හේතුවෙන් ආදායම 27% කින් අඩු විය.
- වසර අවසානයේ දී කොටස් හිමිකාරිත්වය බිලියන 69.3 දක්වා ශක්තිමත් විය.

## ආදායම

පෙර වසරවල විශාල පසුබෑමකින් පසු ශ්‍රී ලංකා ආර්ථිකය 5% දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයක් අත්කර ගනිමින් ශක්තිමත් ප්‍රකෘතියක් අත්කර ගත්තේය. මෙම ආර්ථික ප්‍රකෘතිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ (CPC) මෙහෙයුම් කෙරෙහි ධනාත්මක ලෙස බලපෑමක් ඇතිකරමින් එය රුපියල් බිලියන 923ක ආදායමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, සංස්ථාව සතු පිරවුම්හල් නව තරඟකරුවන්ට පැවරීම හේතුවෙන් දේශීය විකුණුම් ආදායමේ 31% ක පහත වැටීමකට ලක් විය. අනෙක් අතට, අපනයන අංශයේ විකුණුම් 8% කින් වැඩි වූ අතර, සංස්ථාවේ නැව්තෙල් වෙළඳපොලේ සාර්ථකව සිය ස්ථානය නැවත ලබා ගත්තේය. පහත වැටීම නොතකා, දේශීය විකුණුම් සමස්ත ආදායමේ ප්‍රධාන දායකයා විය. ඊට අමතරව, වසර පුරා ගෝලීය ඉන්ධන මිලෙහි සැලකිය යුතු පහත වැටීමක් රජයට දේශීය ඉන්ධන මිල මාසිකව වෙනස්කිරීමට හේතු විය.

ආදායම




ජාත්‍යන්තර වෙළඳපල ප්‍රවණතා, ආශ්‍රිත පිරිවැය සහ අදාළ බදු වලට අනුකූලව දේශීය විකුණුම් මිල ගළපා ගනිමින් 2024 දී ඩීසල් සහ පෙට්‍රල් සඳහා ඉන්ධන මිල නියම කිරීමේ යාන්ත්‍රණය රජය දිගටම පවත්වාගෙන ගියේය. නව තරඟකරුවෙකු පැමිණීම හේතුවෙන් සංස්ථාව මගින් ක්‍රියාත්මක වන පිරවුම්හල් සංඛ්‍යාව පහත වැටුණද, මිල නියම කිරීමේ උපාය මාර්ගය මගින් සංස්ථාවට සැලකිය යුතු මට්ටමේ ආදායමක් පවත්වා ගැනීමට හැකි විය.

මුළු ආදායමෙන් 71%ක් උත්පාදනය කරමින් ප්‍රවාහන ක්ෂේත්‍රය විශාලතම දායකත්වය සපයනු ලබන අතර, විදුලි ජනන අංශය 12%ක් ලෙස දැක්වේ. ගුවන් සේවා කර්මාන්තය සහ අනෙකුත් අංශ ඉතිරි 17% සඳහා දායක විය.

ඔටෝ ඩීසල් ඉහළම ආදායම් උත්පාදන නිෂ්පාදනයක් ලෙස පැවති අතර පෙට්‍රල් 92 දෙවන ස්ථානයට පත් විය. ගුවන් සේවා කර්මාන්තය පමණක් රුපියල් බිලියන 120 ක ආදායමක් උපයා ඇති අතර, ඉන් 90% කට වඩා ඇමරිකානු ඩොලර් වලින් උපයා ඇති අතර, විනිමය අනුපාත පීඩනයන් ලිහිල් කිරීම සඳහා වටිනා විදේශ මුදල් මූලාශ්‍රයක් විය.

සංස්ථාව විසින් අපනයනකරුවන්ට ඩීසල් සහ දැවි තෙල් එක්සත් ජනපද ඩොලර් වලින් විකිණීමේ ප්‍රතිපත්තිය අඛණ්ඩව කරගෙන ගිය අතර, මෙම ගනුදෙනු වලින් ලැබෙන ආදායම ද එම මුදලින් අගය කරනු ලැබේ. මෙම ඇමරිකානු ඩොලර් ආදායම සංස්ථාවේ විදේශ විනිමය අවශ්‍යතා සපුරාලීමට සහාය වෙමින් ඉන්ධන ප්‍රසම්පාදනය සඳහා සෘජුවම යොදා ගන්නා ලදී.

ආදායම් මිශ්‍රණය




## දළ ලාභය

ජාත්‍යන්තර ඉන්ධන මිලෙහි උච්චාවචනයන් සහ විනිමය අනුපාත විචලනයන් ඇතුළු අනෙකුත් පිරිවැය සාධකවලට ප්‍රතිචාර වශයෙන් දේශීය විකුණුම් මිල සකස් කිරීම, සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ තිරසාර ආදායමක් පවත්වා ගැනීමට දායක වූ බව වාර්තා වේ. මූල්‍ය තොරතුරු වලට අනුව සංස්ථා රු බිලියන 76 ක දළ ලාභයක් මූල්‍ය වර්ෂය තුළදී වාර්තා කළ අතර,එය 2023 වර්ෂයට සාපේක්ෂව 53% ක සැලකිය යුතු පහත වැටීමකි.

දළ ලාභය




පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් මිල ගණන් මෙම පිරිවැය සංරචකවල වෙනස්වීම්වලට අනුකූලව මාසික පදනමින් සංශෝධනය කරන ලදී. තවද, ආනයනය, නිෂ්පාදනය සහ බෙදා හැරීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් දරනු ලබන පිරිවැය පිළිබිඹු වන පරිදි ගුවන් යානා ඉන්ධන සහ දැවි තෙල් මිල ද සංශෝධනය කරන ලදී.

සංස්ථාවේ සමස්ත ලාභදායිතාවයට සෑම අංශයක්ම පාහේ කාර්ය සාධනයට ධනාත්මක දායක වීමක් වාර්තා කරයි. තව දුරටත්, පිරිපහදුව අඛණ්ඩව ක්‍රියාත්මක වීම නිසා ඉහල පිරිපහදු ආන්තිකයක් ජනනය වී ඇති අතර, එය දළ ලාභයට හිතකර ලෙස දායක වී ඇත.

## අනෙකුත් ආදායම්

ගොඩනැගිලිවලින් ලැබෙන කුලී ආදායම, CODO පිරවුම්හල්වල ගාස්තු, කාර්ය මණ්ඩල ණය සඳහා පොලිය, පිරවුම්හල් උපකරණ විකිණීමෙන් ලැබෙන ආදායම සහ වෙනත් විවිධ ප්‍රභවයන් ඇතුළු ආයෝජන දේපළවලින් ලැබෙන ආදායම මෙම කොටස යටතේ වර්ගීකරණය කර ඇත. 2024 දී, වාර්තා වන පරිදි අනෙකුත් ආදායම සැලකිය යුතු ලෙස පහත වැටී ඇති අතර එය රුපියල් බිලියන 10.7 සිට රුපියල් බිලියන 1.2 දක්වා පහත වැටී ඇත. මෙම අනෙකුත් ආදායමෙන් 94% කට වඩා ආයෝජන දේපළවලින් ලැබෙන ආදායම, කාර්ය මණ්ඩල ණය පොලිය සහ විවිධ ආදායම් වලින් සමන්විත විය.

වෙනත් ආදායම්




## විනිමය අනුපාත විචලනය

2024 දී, ජාතික ආර්ථිකයේ ක්‍රමානුකූල ප්‍රකෘතිමත් වීම ප්‍රධාන මුදල් ඒකකවලට සාපේක්ෂව විනිමය අනුපාතිකය ඉහළ යාමට දායක විය. එහි ප්‍රතිඵලයක් ලෙස, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වූ අතර, වසර තුළ විනිමය අනුපාතය රු 328.78 සිට රු 297.02 දක්වා ඉහළ ගියේය. මෙම මුදල් අගය ඉහළ යාම සමස්ත විනිමය ලාභයකට හේතු වූ අතර, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රුපියල් බිලියන 13.86 ක ශුද්ධ විනිමය ලාභයක් වාර්තා කළේය. මෙය රුපියල් බිලියන 13.87 ක දළ විනිමය ලාභයක් වූ අතර, එය රුපියල් බිලියන 0.013 ක විනිමය අලාභයකින් අර්ධ වශයෙන් පියවා ගන්නා ලදී.

## මූල්‍ය ආදායම

භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු, කාලීන තැන්පතු, මුදල් වෙළෙඳපොළ උපකරණ සහ ප්‍රමාද වූ පාරිභෝගික පියවීම්වලට අදාළ ගාස්තු හරහා උපයන ආයෝජන ආදායමෙන් මූල්‍ය ආදායම සමන්විත වේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව උපක්‍රමශීලීව අමතර ආදායමක් උත්පාදනය කිරීමට සහ නිෂ්ක්‍රීය අරමුදල් අවම කිරීම සඳහා තම අතිරික්ත දෛනික මුදල් පොලී ලබන උපකරණවල ආයෝජනය කරයි.

මූල්‍ය ආදායම්




## මූල්‍ය වියදම්

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හි බැංකු ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වසර තුළ පොලී වියදම් ක්‍රමයෙන් අඩු විය. කෙසේ වෙතත්, ඉන්ධන ආනයනය සඳහා ලංකා බැංකුවෙන් ලබා ගත් රුපියල් වලින් කාරක ප්‍රාග්ධන ණය මුදල 2024 වසර පුරාවටම පවත්වා ගෙන ගියේය. මීට අමතරව, වසර පුරා පොලී අනුපාත අඛණ්ඩව පහත වැටීම සමස්ත පොලී පිරිවැය අඩු කිරීමට තවදුරටත් දායක විය.

## ආදායම් බදු වියදම්

පෙර වර්ෂවල ඉදිරියට ගෙන ආ බදු අලාභය, වර්ෂය සඳහා බදු අය කළ හැකි ලාභයට එරෙහිව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඒවා පියවා ගත් බැවින්, එම කාල සීමාව තුළ කිසිදු ආදායම් බදු වගකීමක් ඇති නොවීය. මෙම ඉදිරියට ගෙන යන ලද බදු අලාභ තිබීම හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශනවල විලම්භිත බදු සංස්ථාව විසින් හඳුනාගෙන නොමැත.

## ලාභදායිත්වය

මිල නියම කිරීමේ යාන්ත්‍රණය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර තෙල් මිල පහත වැටීම, පිරිපහදුව අඛණ්ඩ ක්‍රියාත්මක වීම සහ විවිධ උපායමාර්ගික මුලපිරීම් 2024 මූල්‍ය වර්ෂය සඳහා සැලකිය යුතු මෙහෙයුම් ලාභයක් පවත්වා ගැනීමට සාමූහිකව දායක විය.

කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ, 2023 ට සාපේක්ෂව මෙහෙයුම් ලාභය 53% කින් පහත වැටී ඇති අතර, මූලික වශයෙන් ඉන්ධන වෙළඳපොළ ලිහිල් කිරීමේ රජයේ ප්‍රතිපත්තිය අනුගමනය කරමින් තරඟකරුවන්ට පිරවුම්හල් පැවරීම ද ඊට හේතු විය.

එසේ තිබියදීත්, වසරේ සමස්ත ලාභය 73% ක තියුණු පහත වැටීමක් වාර්තා කළ අතර එය රු. බිලියන 32.93 කි. මෙම සැලකිය යුතු අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විනිමය අනුපාත ලාභ සහ මූල්‍ය ආදායම අඩුවීමයි.

මෙහෙයුම්/ශුද්ධ ලාභය/(අලාභය)




### ලාභය සඳහා හේතු

- ජාත්‍යන්තර තෙල් මිල පහත වැටීම.
- පිරිවැය සහ ප්‍රතිලාභ මහජනතාවට ලබා දීම සඳහා දේශීය සිල්ලර මිල මාසිකව සංශෝධනය කිරීම.
- පිරිපහදුවේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය (පිරිපහදු නැවතුම හැර)
- ශ්‍රී ලංකා රුපියලෙහි අගය ඉහළ යාම රුපියල් බිලියන 13.9 ක විනිමය ලාභයකට දායක විය.
- ණය මුදල අඩුවීම සහ පොලී අනුපාතය අඩුවීම මූල්‍ය පිරිවැය තියුනු ලෙස අඩු කිරීමට හේතු විය.
- ඵලදායී භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණය
- පිරිවැය පාලන උපාය මාර්ග

## වෙළඳ ණයගැති ලැබිය යුතු මුදල්

ජාතික ආර්ථිකයේ ඵලදායී ක්‍රියාකාරිත්වයට සහාය වීම සඳහා, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රජයේ ආයතන සහ රජය සතු ව්‍යවසායන් සඳහා ණය පදනම මත ඉන්ධන සැපයීම දිගටම කරගෙන ගියේය.

පෙර වසරවල ස්ථාපිත පිළිවෙත්වලට අනුකූලව, ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය සහ දුම්රිය දෙපාර්තමේන්තුවෙන් වෙළඳ ණයගැති ලැබිය යුතු මුදල් සංස්ථාව විසින් සාර්ථකව අයකරගන්නා ලදී. එය මෙම වසර තුල දී රුපියල් බිලියන 31.22 ක ප්‍රමාණයක් වූ අතර 2023 වර්ෂයේ දී එය රුපියල් බිලියන 30.28 කි. එසේම රජයට ගෙවිය යුතු නිෂ්පාදන බදු වලට එරෙහිව භාණ්ඩාගාරයෙන් පියවා ගැනීමක් හරහා මෙම අයකර ගැනීම සිදු කරන ලදී.

තවද, පෞද්ගලික බෙදුම්කරුවන් සහ ගනුදෙනුකරුවන්ට ණය පහසුකම් දීර්ඝ කිරීම සීමා කිරීම අරමුණු කරගත් ණය ප්‍රතිපත්තිය සංස්ථාව විසින් තහවුරු කරන ලදී. සුමට හා කාර්යක්ෂම ගනුදෙනු සහතික කිරීම සඳහා සංස්ථාව විද්‍යුත් බැංකු සේවා භාවිතය සක්‍රීයව දිරිමත් කරන ලදී. ස්වයංක්‍රීය මාර්ගගත බැංකු පද්ධති ක්‍රියාත්මක කිරීම ඇණවුම් කිරීමේ සහ ගෙවීම් පියවීමේ ක්‍රියාවලිය යන දෙකම සැලකිය යුතු ලෙස විධිමත් කර ඇත.

## ණය සහ ණය ගැනීම්

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ කොටසක් ලෙස නව ජලාපවහන පද්ධතියක් ඉදිකිරීම සඳහා ලබාගත් ණය මුදල රුපියල් බිලියන 10.6 සිට රුපියල් බිලියන 9.2 දක්වා අඩු විය. කෙසේ වෙතත්, වසර අවසාන විනිමය අනුපාතය භාවිතා කරමින් ණය නැවත තක්සේරු කිරීම වාර්තා වූ ණය වටිනාකම වැඩිවීමට දායක විය. ව්‍යාපෘතියේ අඛණ්ඩ ප්‍රගතියට අනුකූලව මුළු ණය මුදල ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## ස්කන්ධ ප්‍රාග්ධනය

රජය ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත ණය මධ්‍යම රජයට භාර ගැනීමත් සමඟ, එම මුදල ස්කන්ධ ප්‍රාග්ධන සම්භාරයක් ලෙස සලකනු ලැබේ.

2023 දෙසැම්බර් 31 වන විට, ස්කන්ධ ප්‍රාග්ධන ප්‍රමාණය රුපියල් බිලියන 36.61 ක් විය. 2024 අවසානය වන විට, ඉදිරියට ගෙන යන ලද සෘණ රඳවා ගත් ඉපැයීම් තිබියදීත්, මෙම තත්ත්වය රුපියල් බිලියන 69.35 දක්වා තවදුරටත් වර්ධනය විය.

## මුදල් ප්‍රවාහ

වසර තුළ, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව එහි එකතු කිරීම් ඇමරිකානු ඩොලර් මිලදී ගැනීමට, හිඟ ණය පියවීමට සහ මෙහෙයුම් වියදම් ගෙවීමට භාවිතා කරන ලදි. උපායමාර්ගික ක්‍රියාමාර්ග සහ , ණය පියවීම සඳහා රජයේ මැදිහත්වීම සමඟ සංස්ථාවේ මුදල් ප්‍රවාහය යහපත් තත්වයකට පවත්වා ගැනීමට හැකි විය. 2023 ට සාපේක්ෂව, 2024 දී මුදල් සහ මුදල් සමාන දෑ රුපියල් බිලියන 12 කින් වැඩිදියුණු වී එය රුපියල් බිලියන 55.19 දක්වා ළඟා විය.

## අගය එකතු කිරීම

| | 2024 (රු. මි.) | 2023 (රු. මි.) |
|---|---|---|
| ශුද්ධ විකුණුම් ආදායම | 923,441 | 1,263,603 |
| වෙනත් ආදායම් | 4,870 | 28,363 |
| මිලදී ගන්නා ලද ද්‍රව්‍ය සහ සේවා | (607,092) | (921,866) |
| ක්ෂයවීම් | (2433) | (2,632) |
| **අගය එකතුකිරීම්** | 318,787 | 367,468 |
| **අදාල වනුයේ පහත පරිදිය** | | |
| සේවකයින් හට ගෙවීම | | |
| වැටුප් සහ අමතර ප්‍රතිලාභ | 6,806 | 6,483 |
| ප්‍රාග්ධන සැපයුම්කරුවන්ට ගෙවීමට | | |
| ණය සඳහා පොලිය | 1,175 | 7,454 |
| **සංස්ථාවට** | | |
| රඳවා ගත් ලාභය | 32,931 | 120,310 |
| **රජය** | | |
| බදු සහ තීරුබදු | 277,875 | 233,220 |
| **අගය එකතු කිරීම** | **318,787** | **367,468** |

# නිපැයුම් ප්‍රාග්ධනය




## නිපැයුම් ප්‍රාග්ධනය

සංස්ථාවෙහි නිෂ්පාදිත ප්‍රාග්ධනය යටතේ පිරිපහදුව, බෙදාහැරීමේ පර්යන්තය, පුළුල් පිරවුම්හල් ජාලයක් සහ ගුවන් සේවා ආශ්‍රිත උපකරණ වැනි ප්‍රධාන යටිතල පහසුකම් ඇතුළත් වේ. මෙම වත්කම්වල ඵලදායී කළමනාකරණය සහ උපායමාර්ගික පෙළගැස්ම අපගේ ආයතනික ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් අංශය සඳහා දිගුකාලීන තිරසාරභාවය සහතික කරමින්, අපගේ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා අපි දැඩි ලෙස කැපවී සිටිමු. මෙම කැපවීමට සහය දක්වමින්, අපගේ පවතින වත්කම් පදනම තවදුරටත් වැඩිදියුණු කරමින්, නව ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා සංස්ථාව රුපියල් බිලියන 2.6 ක් යොදවා ඇත.

### දළ සටහන 2024

- වසර තුළ සංස්ථාව ස්ථාවර වත්කම් සඳහා රුපියල් බිලියන 2.6 ක් ආයෝජනය කර ඇත
- කල්බදු ගිවිසුමක් හරහා ලබා ගත් ත්‍රිකුණාමල ඉහළ ටැංකි පර්යන්තයෙහි ටැංකි 24 ක් අභ්‍යන්තරව ජනනය කරන ලද අරමුදල් භාවිතයෙන් සංවර්ධනය කිරීම.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ පර්යන්ත E හි නව හයිඩ්‍රන්ට් පද්ධති නල මාර්ගයේ මෙහෙයුම් ආරම්භ කිරීම.
- 2024.12.31 වන දිනට දේපල, පිරියත සහ උපකරණවල ශුද්ධ වටිනාකම රුපියල් මිලියන 45,837 කි.

**2.6**
(රු. බි.)
ස්ථාවර වත්කම් මත ආයෝජනය

**235.1**
(රු. බි.)
මුළු වත්කම්

**1,002**
පිරවුම්හල්

**70.4**
(රු. බි.)
ස්ථාවර වත්කම්

අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය සංස්ථාව සතු පිරවුම්හල් ජාලයට අමතරව දේපළ, පිරියත සහ උපකරණ, ආයෝජන දේපළ මෙන්ම උසස් තොරතුරු තාක්ෂණ (IT) පද්ධති සහ මෘදුකාංග වැනි අස්පෘශ්‍ය වත්කම්වලින් සමන්විත වේ. බොරතෙල් කාර්යක්ෂමව පිරිපහදු කිරීම සහ ඛනිජ තෙල් නිෂ්පාදන විශ්වාසදායක ලෙස රට පුරා බෙදා හැරීම සහතික කිරීම සඳහා අපි මෙම ප්‍රාග්ධන පදනම අඛණ්ඩව වැඩිදියුණු කරමින් සිටින්නෙමු. වඩාත් කාර්යක්ෂම හා විශ්වාසදායක සැපයුම් දාමයක් සක්‍රිය කරමින් සංස්ථාව විසින් නව ස්වයංක්‍රිය ඇණවුම් පද්ධතියක් ක්‍රියාත්මක කර ඇති අතර එමඟින් බෙදාහැරීමේ ක්‍රියාවලිය විධිමත් කර මෙහෙයුම් පිරිවැය අඩු කර ඇත. ශ්‍රී ලංකාවේ බලශක්ති යටිතල පහසුකම්වල සක්‍රිය දායකයෙකු ලෙස අපගේ භූමිකාව ශක්තිමත් කරමින් මෙම මුලපිරීම් සාමාන්‍ය ජනතාවට සහ කාර්මික අංශය යන ද්විත්වයටම ප්‍රවේශ්‍යතාව, කාර්යක්ෂමතාව සහ සේවා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම අරමුණු කර ගෙන ඇත.

සංස්ථාව ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්තයේ වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස රැඳී සිටිමින් එම අංශයට සහාය වන යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තු කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අපගේ පාර්ශවකරුවන් සඳහා දිගුකාලීන වටිනාකමක් ලබා දීමට අප කැප වී සිටින අතර මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අපගේ නිෂාපාදිත ප්‍රාග්ධනයේ උපායමාර්ගිකව නැවත ආයෝ'ජනය කරමු. තිරසාර වටිනාකම් නිර්මාණය සහ දිගුකාලීන වර්ධනයට සහාය වීම සඳහා අපගේ වත්කම් පදනම තුළ ආයෝජනය කිරීම සහ වැඩිදියුණු කිරීම අඛණ්ඩ ව සිදු කරන බැවින් මෙහෙයුම් විශිෂ්ටත්වය හඹා යාම සමඟ අපගේ උත්සහයන් සාර්ථකව පෙළ ගැසී ඇත.

## දේපළ, පිරියත සහ උපකරණ (PPE)

අපගේ දේපළ, පිරියත සහ උපකරණ පිරිපහදුව, ගුවන්තොටුපළවල ගුවන් සේවා ආශ්‍රිත යටිතල පහසුකම්, ඉන්ධන ගොඩබෑමේ බෝයා පහසුකම්, බෙදාහැරීමේ පර්යන්තය සහ අපගේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය වැනි ප්‍රධාන වත්කම් ඇතුළත් වේ.





වසර තුළ අපි ස්ථාවර වත්කම් සඳහා රුපියල් බිලියන 2.6 ක් ආයෝජනය කළ අතර එමඟින් අපගේ වත්කම් පදනම තවදුරටත් ශක්තිමත් විය. ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන කටයුතුවලින් ප්‍රධාන කොටසක් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ නව හයිඩ්‍රන්ට් පද්ධතියක් සංවර්ධනය කිරීමට සහ සංවර්ධන ව්‍යාපෘතියට වෙන් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ආයෝජන දේපළ ඇතුළුව අපගේ දේපළ,පිරියත සහ උපකරණ මුළු වටිනාකම රුපියල් මිලියන 70,435 දක්වා වැඩි වූ අතර ශුද්ධ පොත් වටිනාකම රුපියල් මිලියන 45,884 කි.



සපුගස්කන්ද පිරිපහදුව අපගේ ප්‍රධාන උපායමාර්ගික වත්කම ලෙස පවතින අතර එය ජාතියේ බලශක්ති අවශ්‍යතා සපුරාලීම සඳහා 1969 දී ආරම්භ කරන ලදී. වර්තමානයේ පිරිපහදුවට රටේ මුළු ඛනිජ තෙල් ඉල්ලුමෙන් 35%-50% අතර ප්‍රමාණයක් සැපයීමේ හැකියාව ඇත.

ආර්ථිකයේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සඳහා බලශක්ති ආරක්ෂාව අත්‍යවශ්‍ය වන අතර රටේ අඛණ්ඩ බලශක්ති අවශ්‍යතා සපුරාලීම සඳහා පිරිපහදුව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. පිරිපහදුවේ නඩත්තු කිරීම් සහ ධාර්තාව වැඩිදියුණු කිරීම් සඳහා කුඩා හා මහ පරිමාණ මුලපිරීම් රාශියක් දැනට ක්‍රියාත්මක වේ.

සංස්ථාවේ ගුවන් සේවා මෙහෙයුම්, සතියේ දින 7ම 24 පැය පුරාම ක්‍රියාත්මක වන අතර, එහි පවතින ඉන්ධන බෙදා හැරීමේ යටිතල පහසුකම් ගුවන් යානා සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. නවතම තාක්ෂණික දියුණුව සමඟ අනුගත වීම සහතික කරමින් ගුවන් යානා ඉන්ධන මෙහෙයුම් නවීකරණය කිරීම සඳහා ආයෝජන සිදු කරනු ලැබේ.

වර්තමානයේ පවතින සීමාවන් සැලකිය යුතු මෙහෙයුම් අභියෝග පෙන්නුම් කරන බැවින් ගබඩා ධාරිතාව පුළුල් කිරීම කෙරෙහි ප්‍රධාන අවධානයක් යොමු කළ යුතු වේ. මෙයට පිළියමක් ලෙස, ජාතික ගබඩා ධාරිතාව සැලකිය යුතු ලෙස වැඩිදියුණු කරමින් ත්‍රිකුණාමලය ටැංකි පර්යන්තයෙහි අතිරේක ටැංකි 24 ක් සංවර්ධනය කිරීමට සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී.

## ආයෝජන දේපළ

ආයෝජන වත්කම් අතරට තර්ස්ටන් පාරේ සහ මල් පාරේ පිහිටි දේපළ මෙන්ම සංස්ථාව සතු පිරවුම්හල් ද ඇතුළත් වේ. තර්ස්ටන් පාරේ ගොඩනැගිල්ල ජනාධිපති ලේකම් කාර්යාලයට බදු දී ඇති අතර, මල් පාරේ දේපළ ඛනිජ තෙල් සම්පත් අමාත්‍යාංශයට බදු දී ඇත. වසර තුළ මෙම ආයෝජන දේපළ තුළින් කුලී සහ උපයෝගිතා ගාස්තු ආදායම් රුපියල් මිලියන 29 ක් උපයා ඇත.

## බෙදාහැරීමේ මාර්ග

අවසාන ගනුදෙනුකරුවන් සමඟ ශක්තිමත් සබඳතා ගොඩනඟා ගැනීම සහ පවත්වාගෙන යාම සඳහා අපගේ දිවයින පුරා පිහිටි පිරවුම්හල් ජාලය අත්‍යවශ්‍ය උපායමාර්ගික වත්කමක් ලෙස පවතී. මෙම අලෙවිසැල් ප්‍රධාන වශයෙන් සංස්ථාවට හිමි අලෙවි නියෝජිත (CODO) හා අලෙවි නියෝජිතට හිමි අලෙවි නියෝජිත (DODO) ලෙස මාදිලි දෙකක් යටතේ ක්‍රියාත්මක වේ.

මේ වන විට, රජයේ ප්‍රතිපත්තියට අනුකූලව ඇතැම් ඉන්ධන පිරවුම්හල් නව ඉන්ධන සැපයුම්කරුවන් වෙත මාරු කිරීම හේතුවෙන් සංස්ථාවේ ක්‍රියාත්මක ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව 1,002 දක්වා අඩු වී ඇත. වෙළඳපොළට පිවිසි නව තරඟකරුවෙකු 2023 අග භාගයේදී මෙහෙයුම් ආරම්භ කළ නමුත් පසුව මෙහෙයුම් නතර කර ඉන්ධන පිරවුම්හල් ලංකා ඛනිජ තෙල් සංස්ථාවට ආපසු පවරා දී තිබේ.

අපගේ පුළුල් භූගෝලීය ආවරණය සමඟ රටේ සෑම කලාපයකම පාරිභෝගිකයින්ට ඛනිජ තෙල් නිෂ්පාදන ලබා දීමට අපට හැකියාව පවතී. අපගේ සිල්ලර අලෙවිසැල් ජාලය මුළු ආදායමෙන් බහුතර කොටසකට දායක වන බැවින් එය තීරණාත්මක වැදගත්කමක් දරයි.

## ස්වයංක්‍රීය ඉන්ධන බෙදා හැරීමේ මාර්ග

### උතුරු පළාත

| | දිස්ත්‍රික්කය | CODO | DODO | එකතුව |
|---|---|---|---|---|
| 1 | යාපනය | 21 | 24 | 45 |
| 2 | කිලිනොච්චිය | 4 | 5 | 9 |
| 3 | මුලතිව් | 1 | 8 | 9 |
| 4 | වවුනියාව | 1 | 11 | 12 |
| 5 | මන්නාරම | 3 | 9 | 12 |
| | එකතුව | 30 | 57 | 87 |

### වයඹ පළාත

| | දිස්ත්‍රික්කය | CODO | DODO | එකතුව |
|---|---|---|---|---|
| 6 | පුත්තලම | 7 | 53 | 60 |
| 7 | කුරුණෑගල | 14 | 82 | 96 |
| | එකතුව | 21 | 135 | 156 |

### උතුරු මැද පළාත

| | දිස්ත්‍රික්කය | CODO | DODO | එකතුව |
|---|---|---|---|---|
| 8 | අනුරාධපුරය | 12 | 30 | 42 |
| 9 | පොළොන්නරුව | 8 | 15 | 23 |
| | එකතුව | 20 | 45 | 65 |

### බස්නාහිර පළාත

| | දිස්ත්‍රික්කය | CODO | DODO | එකතුව |
|---|---|---|---|---|
| 10 | ගම්පහ | 17 | 112 | 129 |
| 11 | කොළඹ | 37 | 61 | 98 |
| 12 | කළුතර | 11 | 35 | 46 |
| | එකතුව | 65 | 208 | 273 |




### දකුණු පළාත

| | දිස්ත්‍රික්කය | CODO | DODO | එකතුව |
|---|---|---|---|---|
| 13 | ගාල්ල | 12 | 41 | 53 |
| 14 | මාතර | 6 | 28 | 34 |
| 15 | හම්බන්තොට | 7 | 23 | 30 |
| | එකතුව | 25 | 92 | 117 |

### නැගෙනහිර පළාත

| | දිස්ත්‍රික්කය | CODO | DODO | එකතුව |
|---|---|---|---|---|
| 23 | ත්‍රිකුණාමලය | 4 | 14 | 18 |
| 24 | මඩකලපුව | 4 | 30 | 34 |
| 25 | අම්පාර | 6 | 41 | 47 |
| | එකතුව | 14 | 85 | 99 |

### සබරගමු පළාත

| | දිස්ත්‍රික්කය | CODO | DODO | එකතුව |
|---|---|---|---|---|
| 21 | කෑගල්ල | 6 | 26 | 32 |
| 22 | රත්නපුර | 10 | 27 | 37 |
| | එකතුව | 16 | 53 | 69 |

### මධ්‍යම පළාත

| | දිස්ත්‍රික්කය | CODO | DODO | එකතුව |
|---|---|---|---|---|
| 18 | මාතලේ | 2 | 14 | 16 |
| 19 | මහනුවර | 17 | 37 | 54 |
| 20 | නුවරඑළිය | 11 | 3 | 14 |
| | එකතුව | 30 | 54 | 84 |

### ඌව පළාත

| | දිස්ත්‍රික්කය | CODO | DODO | එකතුව |
|---|---|---|---|---|
| 16 | මොණරාගල | 6 | 14 | 20 |
| 17 | බදුල්ල | 7 | 25 | 32 |
| | එකතුව | 13 | 39 | 52 |

## ප්‍රාග්ධන ප්‍රගතිය සහ ඉදිරි ගමන

රජය විසින් ප්‍රාග්ධන ආයෝජනය සඳහා පනවා ඇති සීමාවන් නොතකා, මෙහෙයුම් විශිෂ්ටත්වය වැඩි දියුණු කිරීම සඳහා සංස්ථාව ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ආයෝජනය කිරීම අඛණ්ඩව කරගෙන යයි. නිෂ්පාදිත ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම ප්‍රමුඛතාවයක් ලෙස පවතින අතර එය කාර්යක්ෂමතාව, ඵලදායිතාවය සහ දිගුකාලීන තිරසාරභාවය සඳහා සහාය වේ. මෙම ආයෝජන සංස්ථාවෙහි උපායමාර්ගික අරමුණු සහ වර්ධනය සඳහා වන දැක්ම සමඟ සමපාත වේ. අත්‍යවශ්‍ය උපායමාර්ගික වාණිජ ආයතනයක් ලෙස, සංස්ථාව ජාතියේ බලශක්ති ආරක්ෂාව ආරක්ෂා කිරීමට කැපවී සිටී. දිගු කාලීන මහ පරිමාණ ව්‍යාපෘති සහ කෙටි කාලීන සිට මධ්‍ය කාලීන උපායමාර්ගික මූලපිරීම් යන දෙකම හරහා, සංස්ථාව එහි කොටස්කරුවන් සඳහා වටිනාකමක් නිර්මාණය කරන අතරම රටට ස්ථාවර සහ ආරක්ෂිත බලශක්ති සැපයුමක් සහතික කිරීමේදී එහි කාර්යභාරය ශක්තිමත් කරයි.

ප්‍රාග්ධන ආයෝජන සීමාවන් තිබියදීත්, ව්‍යාපාර අඛණ්ඩතාවයට අත්‍යවශ්‍ය කෙටි, මධ්‍යම සහ දිගු කාලීන ව්‍යාපෘති සඳහා අපි ප්‍රමුඛත්වය ලබා දෙන අතර, මෙහෙයුම් විශිෂ්ටත්වය මෙහෙයවීමට සහ ස්ථාපිත ක්‍රියා පටිපාටි තුළ කර්මාන්ත සංවර්ධනයට සහාය වීමට උපායමාර්ගිකව ඒවා ක්‍රියාත්මක කරමු.

සැලකිය යුතු ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත දැක්වේ.

⇒ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ දෙවන අදියර සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව ගුවන් ඉන්ධන පිරවුම් පර්යන්තය සහ පවතින ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධතිය සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සහ නව පර්යන්තයෙහි ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධතියක් ස්ථාපනය කිරීම. වසර අවසානයේදී මෙම ව්‍යාපෘතිය 96% භෞතික ප්‍රගතියක් සහ 84.72% මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත.

- **නව පර්යන්ත E සඳහා ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධතිය ස්ථාපනය කිරීම**

සියලුම ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර ගුවන් යානා ඉන්ධන සැපයීම සඳහා **පර්යන්ත** E ක්‍රියාත්මක කර ඇත. හදිසි ඉන්ධන හයිඩ්‍රන්ට් වසා දැමීමේ පද්ධතිය ඉතිරිව පවතී.

- **ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන සංකීර්ණ පහසුකම් වැඩිදියුණු කිරීම**

2030 වසර වන විට පවතින අනාගත ඉල්ලුමට සරිලන පරිදි ඉන්ධන සංකීර්ණ තුළ ඉන්ධන සැපයුම් පද්ධතිය නවීකරණය කිරීම අවසන් කර ඇත. ගිනි නිවීමේ පද්ධතිය, ගිනි පෙණ පද්ධතිය, ගිනි හඳුනාගැනීම, බලය වැඩි දියුණු කිරීම, පාලන පද්ධති, ගොඩනැගිලි සංවර්ධනය කිරීම සහ වෙනස් කිරීම ආදිය සිදුවෙමින් පවතී.

⇒ මුතුරාජවෙල ගුවන්තෙල් ගබඩා ටැංකි සහ ඒ ආශ්‍රිත පහසුකම් ඉදිකිරීම සහ මුතුරාජවෙල සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ දක්වා වන ගුවන්තෙල් මාරු කිරීමේ නල මාර්ගය ඉදිකිරීම.




බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ අනාගත ගුවන්තෙල් මෙහෙයුම් සඳහා ව්‍යාපෘතියේ වැදගත්කම හඳුනා ගනිමින් කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සඳහා නව ලංසු කැඳවීමට වසර තුළ කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලදී.

⇒ කිලෝමීටර 5 ක් පමණ දුරින් පිහිටි පාවෙන ගබඩා ප්‍රතිගැස්කරණ ඒකකයේ (FSRYU) පවතින සහ අනාගත කැලණිතිස්ස සහ කෙරවලපිටිය බලාගාර දක්වා ප්‍රතිගැස්කරණය කරන ලද ද්‍රව ස්වාභාවික වායු (R-LNG) නල මාර්ගයක් ඉදිකිරීම.

අඛණ්ඩ සාකච්ඡා අතරතුර අමාත්‍ය මණ්ඩලය විසින් 2023 දී ව්‍යාපෘතිය අත්හිටුවන ලදී. කෙසේ වෙතත්, 2024 අවසානයේ, ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට කැබිනට් තීරණයක් ලැබුණි.

⇒ ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංකීර්ණයෙහි හිමිකාරිත්වය, සංවර්ධනය සහ භාවිතය සම්බන්ධ සංවර්ධනය.

⇒ සපුගස්කන්ද පර්යන්තය සඳහා ටැංකි මිනුම් පද්ධතිය 2024 වර්ෂයේදී සාදා නිම කරන ලදී.

⇒ පිරිපහදුවේ නව තාර ටැංකියක් ඉදිකිරීම 2024 වර්ෂයේදී නිම කරන ලදී.

## ප්‍රාග්ධන හුවමාරුව

සංස්ථාව විසින් නිෂ්පාදිත ප්‍රාග්ධනයේ බොහෝ ආයෝජන සඳහා මුදල් සපයන්නේ පොලී සහිත ණය හරහා වන අතර එමඟින් සැලකිය යුතු මූල්‍ය පිරිවැයක් ඇති වේ. මෙය සමස්ත ව්‍යාපෘති වියදම් වැඩි කරන අතර සමාගමේ ලාභදායිතාවයට අහිතකර ලෙස බලපායි.



# බුද්ධිමය ප්‍රාග්ධනය





## බුද්ධිමය ප්‍රාග්ධනය

බුද්ධිමය ප්‍රාග්ධනය සංවිධානයක ආචාර ධර්ම, සංස්කෘතිය, වටිනාකම්, ආයතනික දැනුම, පද්ධති, ක්‍රියාවලීන්, ක්‍රියා පටිපාටි, ඉගෙනුම් හැකියාවන් සහ සන්නාම සාධාරණත්වය පිළිබිඹු කරන අස්පෘශ්‍ය වත්කම් වලින් සමන්විත වේ. සංස්ථාවෙහි හි, අපගේ කණ්ඩායම ක්‍රියාකාරි ලෙස අභ්‍යන්තර සංවර්ධනය සඳහා පුළුල් වැටුප් හා වේතන පද්ධතියක් නර්මාණය කිරීමේ නියැලී සිටී. කළමනාකරණ පරිචය සම්මානය හරහා ලැබුණු පිළිගැනීම, සංස්ථාවෙහි කොටස්කරුවන් සඳහා වටිනාකමක් ජනනය කිරීම සඳහා සංස්ථාව විසින් එහි බුද්ධිමය ප්‍රාග්ධනය ඵලදායී ලෙස භාවිතා කිරීම පිළිබඳ සාක්ෂියකි. මෙහෙයුම් පාලනය ශක්තිමත් කිරීම සහ සමස්ත කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා පද්ධති සහ ක්‍රියාවලීන් සඳහා අඛණ්ඩ වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක වෙමින් පවතී.

### දළ සටහන 2024

- වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනය විසින් සංවිධානය කරන ලද හොඳම කළමනාකරණ පිළිවෙත් සම්මාන උළෙලේදී 2024 හොඳම කළමනාකරණ පිළිවෙත් සඳහා කුසලතා සම්මානය සංස්ථාව හිමිකරගෙන ඇත.
- දැනුම වැඩි දියුණු කිරීම සඳහා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
- වැටුප් හා වේතන පද්ධතිය සංවර්ධනය කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් සඳහා සහභාගී

**57**

වසර තුළ උසස්වීම් ලැබූ සේවකයින්

**249**

පුහුණුවන්නන්

අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය අපගේ ආචාර ධර්ම, සංස්කෘතිය, වටිනාකම්, ආයතනික දැනුම, පද්ධති, ක්‍රියාවලීන්, ක්‍රියා පටිපාටි, ඉගෙනීම සහ සන්නාම සාධාරණත්වය වැනි අස්පෘශ්‍ය වත්කම් වලින් සමන්විත වේ. අපගේ දැක්ම සහ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන දැනුම ශක්තිමත් කිරීම සඳහා මෙම සම්පත් වැඩි දියුණු කිරීමට අපි කැපවී සිටිමු. සංස්ථාවෙහි , සදාචාරාත්මක මූලධර්ම සහ මූලික වටිනාකම් අපගේ ආයතනික සංස්කෘතිය තුළ ගැඹුරින් මුල් බැස ඇති අතර, අපගේ කොටස්කරුවන්ට තිරසාර වටිනාකමක් ලබා දීමේදී එය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

සීමිත තොග ලබා ගැනීමේ හැකියාව මධ්‍යයේ ඉන්ධන බෙදා හැරීම සාධාරණ ලෙස වෙන්කිරීම සහතික කිරීම කළමනාකරණය කිරීම සඳහා ඵලදායී පද්ධති සහ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීමේදී අපගේ නිහඬ දැනුම සහ අත්දැකීම් සමුදාය වැදගත් කාර්යභාරයක් ඉටු කළ අතර, සාධාරණ ලෙස වෙන් කිරීම සහතික කළේය. එමෙන්ම තාක්ෂණයේ වැදගත්කම හඳුනා ගනිමින් අපි තොරතුරු තාක්ෂණ අංශය කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ඇති අතර පුද්ගල මැදිහත්වීම් අවම කිරීමට සහ බෙදා හැරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමට නිර්මාණය කර ඇති නව ඉන්ධන ඇණවුම් කිරීමේ යෙදුමක් සංවර්ධනය කිරීමට මග පාදයි.

## අපගේ සන්නාමකරණය

වසර 62 කට අධික ඉතිහාසයක් ඇති CEY-PETCO සන්නාමය, දෛනික ජීවිතයේදී ඛනිජ තෙල් නිෂ්පාදන ඉටු කරන තීරණාත්මක කාර්යභාරය සැලකිල්ලට ගෙන, මහජනතාව සමඟ ශක්තිමත් සහ කල් පවතින සම්බන්ධතාවයක් පවත්වයි. අපගේ ඛනිජ තෙල් නිෂ්පාදන සැපයුමේ විශ්වසනීයත්වය පිළිබඳව අපි පාරිභෝගික විශ්වාසය සාර්ථකව නැවත ගොඩනඟා ඇති අතර, මහජනතාවගෙන් ලැබෙන අඛණ්ඩ සහයෝගය සාධාරණ වෙළඳාමට සහ උසස් තත්ත්වයේ ඛනිජ තෙල් නිෂ්පාදන බෙදා හැරීමට කැපවී සිටින විශ්වාසදායක හවුල්කරුවෙකු ලෙස කීර්ති නාමය පිළිබිඹු කරයි.

සිපෙට්කෝ ලිහිසි තෙල් මිශ්‍ර කිරීම ISO 9001:2000 සහතික යටතේ කරනු ලැබේ. මෙම නිෂ්පාදන ඇමරිකානු පෙට්‍රෝලියම් ආයතනය (API), MTU ෆ්‍රෙඩ්රිච්ෂෆෙන් GmbH සහ යුරෝපීය මෝටර් රථ නිෂ්පාදකයින්ගේ සංගමය (ACEA) විසින් නියම කරන ලද ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරාලන අතර එමඟින් කාර්මික සහ මෝටර් රථ යෙදුම් සඳහා ඉහළ කාර්ය සාධනයක් සහතික කෙරේ. මීට අමතරව, සිපෙට්කෝ දැනට කාර්මික තාක්ෂණ ආයතනයෙන් (ITI) සහතිකය ලබා ගැනීමේ ක්‍රියාවලියෙ යෙදී සිටී.

සිපෙට්කෝ කෘෂි රසායන අංශය කෘෂි රසායන වෙළඳපොලේ දශක පහකට වැඩි කාලයක් ප්‍රමුඛ සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කරමින් කෘෂිකාර්මික අංශයට ස්ථාවර සහ විශ්වාසදායක සේවාවක් ලබා දෙයි. 2008 සිට සමාගම ISO සහතිකය ලබා ඇති අතර, තත්ත්ව කළමනාකරණය සඳහා ISO 9001:2015 සහ පාරිසරික කළමනාකරණය (EMS) සඳහා ISO 14001:2015 ලබා ඇත. මීට අමතරව, CPC වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති (OHSMS) සඳහා ISO 45001:2018 සහතිකය ලබාගෙන ඇති අතර, මේ සියල්ල වර්ථමානයේදී සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කළමනාකරණ පද්ධතියක් යටතේ පවත්වාගෙන යනු ලැබේ.

ඉඩම් සකස්කිරීමේ සිට බෝග අස්වැන්න නෙළීම දක්වා කෘෂිකාර්මික ක්‍රියාවලිය පුරාවට ඵලදායි සහ තිරසාර විසඳුම් ලබා දිමට සිපෙට්කෝ කෘෂි රසායන සමාගම කැපවීසිටී. පළිබෝධ, දිලීර සහ වල් පැලෑටි කාර්යක්ෂමව පාලනය කරන හෝ තුරන් කරන නිෂ්පාදන සැපයීමෙන්.සංස්ථාව වැඩිදියුණු කළ වගා පිළිවෙත් සඳහා සහාය වන අතර රට පුරා ගොවීන්ගේ සාර්ථකත්වයට සහ ඵලදායිතාවයට දායක වේ.

## අපගේ වටිනාකම්

සංස්ථාවෙහි හිදී, අපගේ වටිනාකම් සහ මූලධර්ම සංවිධානයේ සංස්කෘතිය තුළ ගැඹුරින් මුල් බැස ඇත. තිරසාර පරිභෝජනය සහ පාරිසරික භාරකාරත්වය යන දෙකම ප්‍රවර්ධනය කිරීමේදී එහි තීරණාත්මක කාර්යභාරය හඳුනා ගනිමින්, අපගේ ඛනිජ තෙල් නිෂ්පාදනවල ගුණාත්මකභාවයට අපි ප්‍රමුඛත්වය දෙමු. මේ සඳහා, අප සේවය කරන ප්‍රජාවන්ගේ පුළුල් වන අවශ්‍යතා සහ අපේක්ෂාවන් නිරන්තරයෙන් සපුරාලන ප්‍රමිතිගත නිෂ්පාදන ලබා දීමට් කැපවී සිටිමු.

ඛනිජමය නිෂ්පාදන හා සම්බන්ධ ආවේණික සෞඛ්‍ය සහ ආරක්ෂක සලකා බැලීම් සැලකිල්ලට ගනිමින්, ඉහළම මට්ටමේ ගුණාත්මකභාවය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා අපි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට දැඩි ලෙස අනුගත වී ඇත. පාරිභෝගික තෘප්තිය සහ කොටස්කරුවන්ගේ වටිනාකම සඳහා අපගේ කැපවීමට සහාය වීම සඳහා, විවිධ කර්මාන්තවල ඉල්ලීම් සපුරාලීම සඳහා සංස්ථාව පුළුල් පරාසයකින් සකස් කරන ලද තාක්ෂණික, මෙහෙයුම් සහ පාරිභෝගික සේවා විසඳුම් සපයයි.

## ක්‍රියාවලි වැඩිදියුණු කිරීම්

අතිරේක බැංකු ස්වයංක්‍රීය ගෙවීම් පද්ධතියට ඒකාබද්ධ කිරීමෙන් සංස්ථාව එහි මාර්ගගත ගෙවීම් යටිතල පහසුකම් ශක්තිමත් කර ඇත. මෙම වැඩිදියුණු කිරීම ගනුදෙනු වල ආරක්ෂාව සහ නිරවද්‍යතාවය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කර ඇති අතර, විශේෂයෙන් ඉහළ පරිමාවන් හැසිරවීමේදී ,අලෙවිකරුවන්ට සහ ගනුදෙනුකරුවන්ට වැඩි පහසුවක් ලබා දෙයි.

මෙහෙයුම් තවදුරටත් විධිමත් කිරීම සඳහා, එක් එක් අලෙවි නියෝජිත ස්ථානයේ තොග මට්ටම් නිරීක්ෂණය කිරීම සඳහා අලෙවි නියෝජිත තොග අධීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කර ඇත. මෙම පද්ධතිය වඩාත් කාර්යක්ෂම ඉන්ධන බෙදා හැරීමකට සහාය වන අතර නිශ්චිත ප්‍රදේශවල හිඟයන් අවම කිරීමට සහ සීමිත සැපයුම් කාලවලදී වඩා හොඳ විකුණුම් කළමනාකරණයක් සහ ඉන්ධන වෙන්කිරීම් සැලසුම්කරණයක් සක්‍රීය කරයි.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, පෙර අතින් කරන ලද ක්‍රියාවලිය ප්‍රතිස්ථාපනය කරමින්, සංස්ථාව අලෙවිකරුවන් සඳහා ඩිජිටල් ඇණවුම් ඉදිරිපත් කිරීමේ යෙදුමක් දියත් කළේය. මෙම දියුණුව විශේෂයෙන් CPSTL විසින් දරන ලද මෙහෙයුම් පිරිවැය අඩු කිරීමට උපකාරී වී තිබේ.

ඊට අමතරව, වැටුප් හා වේතන කළමනාකරණය අනුබද්ධ සමාගමකට පවරා ඇත. මේ අතර, නව අභ්‍යන්තර වැටුප ගෙවීමේ මෘදුකාංග පද්ධතියක් ක්‍රමයක් සංවර්ධනය වෙමින් පවතී. මෙම පද්ධතිය වඩාත් නිවැරදි කාලීන දත්ත ලබා දීමට සහ තවදුරටත් පිරිවැය කාර්යක්ෂමතාව ජනනය කිරීමට නිර්මාණය කර ඇත.



## අඛණ්ඩ ඉගෙනීම සහ සංවර්ධනය

අද ගතික හා වේගයෙන් වෙනස් වන ආයතනික පරිසරය තුළ ශක්තිමත් දැනුම් පදනමක් අත්‍යවශ්‍ය උපායමාර්ගික වත්කමක් ලෙස සේවය කරයි. දැනුම මත පදනම් වූ සංවිධානයක් ගොඩනැගීම සැලකිය යුතු තරඟකාරී වාසියක් සපයන අතර, වටිනාකම් නිර්මාණය සහ දිගුකාලීන තිරසාරභාවය පවත්වා ගැනීමට අපගේ ශ්‍රම බලකායේ පුහුණුව සහ සංවර්ධනය සඳහා අඛණ්ඩව ආයෝජනය කිරීමෙන් සංස්ථාව මෙම ඉලක්කයට කැපවී සිටී.

2024 මූල්‍ය වර්ෂය තුළ, මෙහෙයුම් සහ ආර්ථික අභියෝග මධ්‍යයේ වුවද, සේවක කුසලතා සහ හැකියාවන් වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් CPC ආයතනය පුහුණු සහ සංවර්ධන මුලපිරීම් සඳහා රුපියල් මිලියන 1.68 ක් වෙන් කළේය.

අපගේ සේවය සේවකයින් 1,972 දෙනෙකුගේ විශේෂඥතාව මත ගොඩනගා ඇති අතර, ඔවුන්ගෙන් 1,445 දෙනෙකු වයස අවුරුදු 40 ට වැඩි අය වෙති. වටිනා නිහඬ දැනුම රඳවා තබා ගැනීම සහ මාරු කිරීම සහතික කරමින් සංස්ථාව අඛණ්ඩ ඉගෙනීමේ සහ සහාය දැක්වීමේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කරයි. මෙම ප්‍රවේශය මෙහෙයුම් විශිෂ්ටත්වය පවත්වා ගැනීම සහ දිගුකාලීන තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ.

තවද, පිරිපහදුවේ ඛනිජ තෙල් රසායනාගාරය ශ්‍රී ලංකාවේ වඩාත්ම දියුණු පහසුකම් වලින් එකක් ලෙස පිළිගැනෙන අතර, ඛනිජ තෙල් සහ ඛනිජ රසායනික පිරිවිතරයන් පිළිබඳ පුළුල් පරීක්ෂණ සිදු කිරීම සඳහා සන්නද්ධ වේ. නවතම තාක්ෂණික දියුණුව සමඟ ගැඹුරු කර්මාන්ත දැනුම ඒකාබද්ධ කරමින්, සංස්ථාව ජාතික ආර්ථිකයට සැලකිය යුතු වටිනාකමක් ලබා දෙයි.

## සම්මාන සහ පිළිගැනීම

ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනය විසින් පවත්වන ලද 2024 හොඳම කළමනාකරණ පිළිවෙත් සමාගම් සම්මාන උළෙලේදී හොඳම කළමනාකරණ පිළිවෙත් සඳහා කුසලතා සම්මානය සහ පිළිගැනීමේ සහතිකය සංස්ථාව හට ලැබී ඇති බව සතුටින් නිවේදනය කරමු.




# මානව ප්‍රාග්ධනය

## මානව ප්‍රාග්ධනය

1,972 දෙනෙකුගෙන් සමන්විත කැපවුණු කාර්යාය මණ්ඩලය අප සංවිධානයේ මූලික පදනම වේ. සංස්ථාවෙදී,අපි අපගේ සේවකයින් හුදෙක් කාර්ය මණ්ඩලයක් ලෙස නොව අපගේ අඛණ්ඩ සාර්ථකත්වයට මඟ පෙන්වන වටිනා වත්කම් ලෙස සලකමු. ඔවුන්ගේ කැපවීම, විශේෂ දැනුම සහ වෙහෙස මහන්සි වී වැඩ කිරීම අපගේ උපායමාර්ගික ඉලක්ක සපුරා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ., අපගේ සේවකයින් තුළ ආයෝජනය කිරීමෙන් අපගේ වඩාත්ම අභිලාෂකාමී දැක්ම මැනිය හැකි ජයග්‍රහණ බවට පත් කිරීමට අපි ඔවුන් සවිමත් කරන බව හඳුනා ගනිමින්, පුහුණුව සහ සංවර්ධනය කෙරෙහි  දැඩි අවධානයක් යොමු කරමු.

**1,972**
සේවක සංඛ්‍යාව

**6,806.12**
(රු. මි.)
කාර්ය මණ්ඩල පිරිවැය

**30**
සේවා සම්මාන

**249**
පුහුණු අවස්ථා

### 2024 දළ සටහන

- අභ්‍යන්තර හා බාහිර පුහුණු මාලාවක් ලබා දෙන ලදී.
- වසර තුළ සේවකයින් 110 දෙනෙකු විශ්‍රාම හා ඉල්ලා අස්වී ඇත.
- වසර තුළ බඳවා ගැනීම් සිදු කර නොමැත.
- සේවකයින්ට සේවා සම්මාන 30 ක් ලබා දී ඇත.
- වසර තුළ බාහිර සිසුන් සඳහා පුහුණු අවස්ථා 249 ක් ලබා දී ඇත.



අපගේ ජයග්‍රහණ අපගේ මානව ප්‍රාග්ධනයේ ශක්තිය හා කුසලතාව සමඟ නොවෙනස්ව බැඳී ඇති අතර එය ආයතනික උපාය මාර්ගයේ වැදගත් අංශයක් ලෙස පවතී. අපගේ දැක්ම සහ මෙහෙවර හඹා යාමට සහ සාක්ෂාත් කර ගැනීමට අපට හැකි වන්නේ අපගේ ශ්‍රම බලකායේ කැපවීම, විශේෂඥතාව සහ නොසැලෙන කැපවීම හරහා ය. සංස්ථාව , අපගේ සේවකයින් කෙරෙහි අප ආඩම්බර වන්නේ ඒ ඔවුන්ගේ ඉහළ මට්ටමේ කුසලතා සහ අභිප්‍රේරණයෙන් පමණක් නොව, ඔවුන්ගේ ගැඹුරු වගකීමේ හැඟීම සහ අපගේ ආයතනික වටිනාකම් සමඟ අනුකූල වීමේ හැකියාව නිසා ය.

ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් අංශයේ වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස දිගුකාලීන තත්ත්වය පවත්වා ගැනීමට අපගේ කණ්ඩායමේ සාමූහික දායකත්වය ඉවහල් විය. අපගේ මානව සම්පත් උපායමාර්ගය නිර්මාණය කර ඇත්තේ සේවක යහපැවැත්ම සහ තෘප්තිය ප්‍රමුඛ කිරීම සඳහා ය. පුද්ගලික සහ වෘත්තීය වර්ධනය යන දෙකම ප්‍රවර්ධනය කරන ධනාත්මක සේවා ස්ථාන සංස්කෘතියක් වර්ධනය කිරීමට අපි කැපවී සිටිමු. තරඟකාරී වන්දි ක්‍රම , පුළුල් සෞඛ්‍ය සහ ආරක්ෂණ මුලපිරීම් සහ වෘත්තීය සංවර්ධනය සහ ප්‍රගතිය සඳහා පැහැදිලිව නිර්වචනය කරන ලද අංශ මෙයට ඇතුළත් වේ.

අපගේ ජනතාව තුළ ආයෝජනය කිරීම සදාචාරාත්මක අවශ්‍යතාවයක් පමණක් නොව, උපායමාර්ගික අවශ්‍යතාවයක් බව අපි තරයේ විශ්වාස කරමු. එබැවින්, අපේක්ෂාවන් සපුරාලීමට පමණක් නොව, ඒවා නිරන්තරයෙන් ඉක්මවා යාමට හැකියාව ඇති, අනාගතයට සූදානම් ශ්‍රම බලකායක් පෝෂණය කිරීම සඳහා අපගේ කැපවීම තුළ අපි ස්ථිරව සිටිමු. මෙම කැපවීම තුළින්, අපගේ දිගුකාලීන දැක්ම සමඟ සමපාත වන සහ ඛනිජ තෙල් කර්මාන්තයේ අපගේ නායකත්වය ශක්තිමත් කරන ඉහළ කාර්ය සාධන සංස්කෘතියක් ගොඩනඟා ගැනීමට අපි දිගටම කටයුතු කරන්නෙමු.

| කාණ්ඩය | සේවකයින් ගණන |
|---|---|
| ස්ථිර කාර්ය මණ්ඩලය | 1,972 |
| කොන්ත්‍රාත් පදනම | 2 |
| පුහුණුවන්නන් | 249 |
| **මුළු මානව ප්‍රාග්ධනය** | **2,223** |

## පාලනය

ප්‍රාථමික පාලන ආයතනය ලෙස, මානව සම්පත් ප්‍රතිපත්ති හැඩගැස්වීම සහ සංස්ථාවේ උපායමාර්ගික අරමුණු සමඟ ඒවා පෙළගැස්වීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අවසාන වගකීම දරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟ පෙන්වීම සහ අධීක්ෂණය යටතේ, සංස්ථාවේ මානව ප්‍රාග්ධනය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම මානව සම්පත් කාර්යංශයට පවරා ඇත.

අඛණ්ඩ ඇගයීම සහ උපායමාර්ගික වැඩි දියුණු කිරීම තුළින්, මානව සම්පත් කණ්ඩායම තම මුලපිරීම් පුළුල් ආයතනික ඉලක්ක සමඟ සමපාත වන බව සහතික කරයි. මෙම ගතික ප්‍රවේශය මඟින් මානව සම්පත් ක්‍රියාකාරිත්වයට සංවිධානයේ මෙහෙවරට ඵලදායී ලෙස සහාය වීමට, කාර්ය සාධනය මෙහෙයවීමට සහ තිරසාර සාර්ථකත්වයට අර්ථවත් ලෙස දායක වන ශ්‍රම බලකායක් පෝෂණය කිරීමට හැකියාව ලැබේ.

## විවිධත්වය

සංස්ථාවේ මානව සම්පත් ප්‍රතිපත්තිය විවිධත්වය, සමානාත්මතාවය සහ පරිපූර්ණත්වය යන මූලධර්ම තුළ දැඩි ලෙස මුල් බැස ඇත. ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ජාතිය, ආගම හෝ වෙනත් ඕනෑම පෞද්ගලික ලක්ෂණයක් මත පදනම්ව කිසිදු සේවකයෙකුට අසාධාරණ ලෙස සලකනු නොලබන බව සහතික කරමින්, සියලු ආකාරයේ වෙනස්කම් කිරීම්වලට එරෙහිව අපි සාධාරණ ස්ථාවරයක් පවත්වා ගනිමු.

සැබවින්ම විවිධාකාර සහ පරිපූර්ණ ශ්‍රම බලකායක් ගොඩනැගීම සඳහා අපගේ කැපවීම තුළ, අපි විවිධ පළාත් තුලින් සේවකයින් යොදවන අතර, මහජනතාවට සපයනු ලබන සේවාවේ ගුණාත්මකභාව සහ ප්‍රවේශය යන දෙකම වැඩි දියුණු කිරීම එහි අරමුණයි.

මෙම විමධ්‍යගත පිවිසුම අපගේ මෙහෙයුම් ප්‍රවේශය ශක්තිමත් කරනවා පමණක් නොව, රටේ සියලු ප්‍රජාවට සේවය කිරීම සඳහා අපගේ කැපවීම ද පිළිබිඹු කරයි.

කාන්තාවන් සඳහා සමෘද්ධිමත් සහ නායකත්වයක් සඳහා ඉඩ දිය හැකි සාධාරණ විවිධත්ව කෙරෙහි අපගේ ප්‍රධාන අවධානයන යොමු වී ඇති අතර ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයේ උසස් බව අගයමු. වෘත්තීය පරිසරයන් නිර්මාණය කිරීම සඳහා අපි ක්‍රියාකාරීව නියැලී සිටිමු. අවස්ථාවන්, සම්පත් සහ වෘත්තීය සංවර්ධනයන් සඳහා සාධාරණ ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීමෙන්, ස්ත්‍රී පුරුෂ භාවය නොසලකා සියලුම සේවකයින්ට ඔවුන්ගේ සම්පූර්ණ හැකියාවන් අවබෝධ කර ගත හැකි සහ අපගේ ආයතනික සාර්ථකත්වයට අර්ථවත් ලෙස දායක විය හැකි සේවා ස්ථානයක් සංස්ථාව තුල අඛණ්ඩව පෝෂණය කරයි.

විශේෂයෙන් අපගේ කාන්තා සේවකයින් සඳහා - සහයෝගී, සාධාරණ සහ පරිපූර්ණ වැඩ පරිසරයක් සහතික කිරීම සඳහා අපගේ මානව සම්පත් ප්‍රතිපත්ති අඛණ්ඩව සමාලෝචනය කිරීමට සහ වැඩිදියුණු කිරීමට අපි කැපවී සිටිමු. ගරුත්වය සහ සාධාරණත්වය පිළිබඳ අපගේ ශක්තිමත් සංස්කෘතිය පිළිබිඹු කරමින් පසුගිය වසර පුරාවට විවේචනාත්මක සිදුවීම් කිසිවක් වාර්තා නොවූ බව වාර්තා කිරීමට අපි සතුටු වෙමු.

පළාත අනුව සේවකයන්




ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවකයින්




ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය



අප ආයතනය සෑම තලයක් සඳහාම කාන්තාවන්ගේ නියෝජනය සක්‍රීයව දිරිමත් කරන අතර දැනට ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ ඉහළ මට්ටමේ තනතුරුවලින් 17%ක් කාන්තාවන් දරන බව වාර්තා කිරීමට ලැබීම ගැන ආඩම්බර වේ.මෙය ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ නායකත්ව විවිධත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අපගේ අඛණ්ඩ ප්‍රයත්නවල සැලකිය යුතු සන්ධිස්ථානයක් නියෝජනය කරයි.

වෘත්තීයභාවය සහ ප්‍රගතිශීලී වටිනාකම් කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින්, ආයතනික විශිෂ්ටත්වයේ උපායමාර්ගික ධාවකයන් ලෙස විවිධත්වය සහ පරිපූර්ණත්වය සහිත සේවා ස්ථාන සංස්කෘතියක් අපි අඛණ්ඩව පෝෂණය කරන්නෙමු.

## ප්‍රදාන සහ පිළිගැනීම්

සංස්ථාවෙහි දී අපගේ මෙහෙයුම් සාර්ථකත්වය පිටුපස ඇති ගාමක බලවේගය අපගේ සේවකයින් බව අපි හඳුනා ගනිමු. ඔවුන්ගේ දායකත්වය අගයමින්, ඔවුන් අගය කිරීම සහ අභිප්‍රේරණය කිරීම යන දෙකම අරමුණු කරගත් පුළුල් ත්‍යාග සහ පිළිගැනීමේ ක්‍රමයක් අපි ක්‍රියාත්මක කර ඇත්තෙමු. මෙම ප්‍රවේශය කාර්ය සාධන විශිෂ්ටත්වය ශක්තිමත් කරනවා පමණක් නොව, ආයතනික පක්ෂපාතිත්වය සහ සම්බන්ධතාවය පිළිබඳ ශක්තිමත් හැඟීමක් ද වර්ධනය කරයි.

පවතින වෙළඳපල ප්‍රමිතීන් සමඟ ගැලපෙන ආකාරයට මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ යන දෙකම ඇතුළත් කරමින් තරඟකාරී හා පරිපූර්ණ වන පරිදි අපගේ ප්‍රතිලාභ පැකේජය නිර්මාණය කර ඇත. ස්ථිර සේවකයින් 1,972 දෙනාටම ඔවුන්ගේ භූමිකාවන් සහ වගකීම් නිවැරදිව පිළිබිඹු කරන සාධාරණ වේතනයක් ලැබෙන බව සහතික කරමින්, වන්දි පරිචයන් තුළ සාධාරණත්වය සහ විනිවිදභාවය සඳහා අපි කැපවී සිටිමු.

සේවක පිළිගැනීම කෘතඥතාවයෙන් ඔබ්බට යන බව අපි විශ්වාස කරමු, එය ශ්‍රම බලකායේ තෘප්තිය සහ ඵලදායිතාව සඳහා උපායමාර්ගික ආයෝජනයකි. රැකියා වර්ගීකරණය මත පදනම්ව, අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයින් කාර්ය සාධන ප්‍රසාද දීමනා, වෛද්‍ය පාරිතෝෂික දීමනා, ප්‍රවාහන දීමනා, සුදුසුකම් ලත් ශ්‍රේණි සඳහා වාහන ප්‍රතිලාභ, නිවාඩු නිකේතන පහසුකම්, කාර්ය මණ්ඩල ණය, දීමනා පුළුල් වෛද්‍ය ආවරණය, මාතෘ නිවාඩු, විශ්‍රාම ප්‍රතිලාභ සහ සකසුරුවම් සමිතිය හරහා පාරිතෝෂික ඇතුළු පුළුල් පරාසයක අමතර ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබයි.

දිගුකාලීන සේවය සහ ආදර්ශමත් කැපවීම තවදුරටත් අගය කිරීමක් ලෙස, අපගේ මානව සම්පත් ප්‍රතිපත්තිවලට අනුකූලව, විශිෂ්ට සේවකයින්ට විධිමත් සේවා සම්මාන පිරිනමයි. මෙම සම්මාන අපගේ කාර්ය මණ්ඩලය විසින් පෙන්නුම් කරන ලද නොසැලෙන කැපවීම සහ වෘත්තීයභාවය සඳහා අපගේ අගය කිරීම සංකේතවත් කරයි.

මෙම වසරේදී, ආයතනයෙහි උපායමාර්ගික අරමුණු ඉදිරියට ගෙන යාම සඳහා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ සුවිශේෂී දායකත්වයක් ලබා දුන් පුද්ගලයින්ට සේවා සම්මාන 30 ක් පිරිනැමීමට ලැබීම ගැන අපි ආඩම්බර වෙමු.

| සේවා කාණ්ඩය | සම්මාන ගණන |
|---|---|
| වසර 20 ක සේවාව | 18 |
| වසර 30 ක සේවාව | 01 |
| වසර 35 ක සේවාව | 10 |
| වසර 40 ක සේවාව | 01 |
| **එකතුව** | **30** |

## බඳවා ගැනීම්

සංස්ථාවේ , මූලික වටිනාකම් සහ ආයතනික මූලධර්ම සමඟ සමපාත දක්ෂතා ආකර්ෂණය කර ගැනීමට අපි දැඩි ලෙස කැපවී සිටිමු. අපගේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය ජාතික රෙගුලාසි සහ ආයතනයෙහි විස්තීර්ණ මානව සම්පත් ප්‍රතිපත්ති යන දෙකටම අනුගත වීම තුළින් මෙම කැපවීම පිළිබිඹු කරයි. ප්‍රමුඛ පෙළේ රාජ්‍ය සංස්ථාවක් ලෙස, බඳවා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම අපි අඛණ්ඩතාව, සාධාරණත්වය සහ විනිවිදභාවය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කරමු.

අපගේ බඳවා ගැනීමේ ක්‍රමවේදයට එක් එක් අපේක්ෂකයාගේ භූමිකාව සඳහා යෝග්‍යතාවය පිළිබඳ දැඩි හා අපක්ෂපාතී තක්සේරුවක් ඇතුළත් වේ. මෙයට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ සහ නිපුණතා පාදක ඇගයීම් ඇතුළත් වන අතර අනුමත කාර්ය මණ්ඩල අවශ්‍යතා සමඟ පෙළගැස්වීම සහතික කරයි. මෙම ප්‍රවේශය හරහා, වෘත්තීය වර්ධනය සහ අනාගත නායකත්වය සඳහා ශක්තිමත් විභවයක් පෙන්නුම් කරන ඉහළ සුදුසුකම් ලත් පුද්ගලයින් හඳුනාගෙන බඳවා ගැනීම අපගේ අරමුණයි.

සංස්ථාව සම අවස්ථා සපයන සේවා යෝජකයෙකු වීම ගැන ආඩම්බර වේ. ස්ත්‍රී පුරුෂ භාවය නොසලකා සියලුම අපේක්ෂකයින් සාධාරණ ලෙස ඇගයීමට ලක් කරන සහ ඔවුන්ගේ අදාළ භූමිකාවන් මත පදනම්ව ප්‍රතිලාභ සහ ත්‍යාග ව්‍යුහයන්ට සමාන ප්‍රවේශයක් ලබා දෙන, වෙනස්කම් කිරීම් වලින් තොර බඳවා ගැනීමේ පරිසරයක් පවත්වා ගැනීමට අපි දැඩි ලෙස කැපවී සිටිමු.

අවම වයස් අවශ්‍යතා ඇතුළුව සියලුම ව්‍යවස්ථාපිත බැඳීම්වලට අපි දැඩි ලෙස අනුකූල වන අතර, වයස අවුරුදු 18 ට අඩු කිසිදු අපේක්ෂකයෙකු සලකා බලන්නේ නැත. අපගේ බඳවා ගැනීමේ පිළිවෙත් නීතිමය අනුකූලතාවයෙන් ඔබ්බට ගොස්, සදාචාරාත්මක ප්‍රමිතීන් සහ ශ්‍රම බලකාය සංවර්ධනය සඳහා අපගේ කැපවීම පිළිබිඹු කරයි.

කෙසේ වෙතත්, පවතින ආර්ථික තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන් රජය විසින් හඳුන්වා දී ඇති නව බඳවා ගැනීම් සීමා හේතුවෙන්, අප විසින් වත්මන් වර්ෂය තුළ කිසිදු නව බඳවා ගැනීමක් සිදු කර නොමැත.

## උසස්වීම්

සංවිධානයේ සියලු මට්ටම් හරහා වර්ධනය සහ සංවර්ධනය සඳහා අර්ථවත් අවස්ථා නිර්මාණය කරමින්, සිරස් සහ පාර්ශ්වීය වෘත්තීය ප්‍රගතියට සහාය වීම සඳහා කල්පනාකාරීව ව්‍යුහගත කර ඇත. මෙම ප්‍රතිපත්ති පැහැදිලිව නිර්වචනය කරන ලද මාර්ගෝපදේශවල ශක්තිමත් රාමුවක් මගින් පාලනය වන අතර, සියලුම උසස්වීම් තීරණ ප්‍රධාන වශයෙන් කුසලතා, කාර්ය සාධනය සහ ප්‍රදර්ශනය කර ඇති හැකියාවන් මත පදනම් වන බව සහතික කරයි. මෙම කුසලතා ප්‍රවේශය අපගේ ශ්‍රම බලකාය තුළ විශිෂ්ටත්වය හඳුනා ගැනීම සහ ප්‍රතිලාභ ලබා දීම සඳහා අපගේ කැපවීම ශක්තිමත් කරයි.

## පුහුණුව සහ සංවර්ධනය

පුහුණුව සහ සංවර්ධනය සඳහා ව්‍යුහගත සහ ඉදිරිගාමී ප්‍රවේශයක් තුළින් අපගේ මානව ප්‍රාග්ධනයේ අඛණ්ඩ සංවර්ධනය සඳහා අපි ගැඹුරින් කැපවී සිටිමු. අපගේ වාර්ෂික පුහුණු උපායමාර්ගය නිර්මාණය කර ඇත්තේ ශ්‍රම බලකායේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, නිපුණතා ශක්තිමත් කිරීම සහ අපගේ මෙහෙයුම්වල සමස්ත ඵලදායිතාවයට සහාය වීම සඳහා ය.

ක්‍රියාශීලී ස්ථාවරයක් අනුගමනය කරමින්, සියලුම සේවකයින්ට ඔවුන්ගේ අදාළ භූමිකාවන්හි විශිෂ්ටත්වය දැක්වීමට අවශ්‍ය පුහුණුව ලැබෙන බව අපි සහතික කරමු. මේ සඳහා, අපි තාක්ෂණික විශේෂඥතාව මෙන්ම අත්‍යවශ්‍ය අන්තර් පුද්ගල සහ නායකත්ව කුසලතා ගොඩනැගීම සඳහා සකස් කරන ලද අභ්‍යන්තර සහ බාහිර පුහුණු වැඩසටහන් රාශියක් පිරිනමන්නෙමු.

අපගේ පුහුණු මුලපිරීම් ඵලදායිතාව වැඩි දියුණු කිරීම, ආයතනික පාලනය, වත්කම් කළමනාකරණය,සෞඛ්‍ය,ආරක්ෂාව සහ පාරිසරික අනුකූලතාව වැනි ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරයි. මෙම උත්සාහයන් ආයතනය පුරා අඛණ්ඩ ඉගෙනීමේ සංස්කෘතියක් සහ වෘත්තීය වර්ධනයක් ඇති කිරීම සඳහා අපගේ දැඩි කැපවීම පිළිබිඹු කරයි.

දිගුකාලීන මෙහෙයුම් විශිෂ්ටත්වය අත්කර ගැනීම සඳහා උසස් අධ්‍යාපනය වැදගත් කාර්යභාරයක් ඉටු කරන බව හඳුනා ගනිමින්, සේවකයින්ට තවදුරටත් අධ්‍යයන සුදුසුකම් ලබා ගැනීම සඳහා ද සහාය වේ. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ශාස්ත්‍රපති උපාධි, පූර්ව උපාධි පාඨමාලා සහ ඩිප්ලෝමා පාඨමාලා හදාරන සේවකයින් සඳහා මූල්‍ය ආධාර ලබා දීමට ලැබීම ගැන අපි ආඩම්බර වෙමු. අධ්‍යාපනය සඳහා වන මෙම ආයෝජනය අපගේ කාර්ය මණ්ඩලය උසස් දැනුමෙන් සහ කුසලතාවයෙන් සවිබල ගැන්වීම අපගේ තිරසාර සාර්ථකත්වයට මූලික වන බවට අපගේ විශ්වාසය අවධාරණය කරයි.

## සදාචාරාත්මක හැසිරීම සහ අනුකූලතාව

සංස්ථාවෙහි, අඛණ්ඩතාව සහ වෘත්තීයභාවය අපගේ මෙහෙයුම්වල සෑම අංශයකටම මඟ පෙන්වීමට පදනම් වන වටිනාකම් බව අපි තරයේ විශ්වාස කරමු. මෙම මූලධර්ම අපගේ ආයතනික සංස්කෘතිය තුළ ගැඹුරින් කාවැදී ඇති අතර, සංවිධානයේ සියලුම මට්ටම් හරහා ඒවා පෝෂණය කිරීමට අපි කැපවී සිටිමු.

අඛණ්ඩ පුහුණුව සහ අධ්‍යාපනික වැඩසටහන් හරහා, අපි සදාචාරාත්මක හැසිරීම් සහ උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීමේ වැදගත්කම පිළිබඳ දැනුවත්භාවය ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කරමු. අල්ලස සහ දූෂණය කෙරෙහි අපගේ ශුන්‍ය ඉවසීමේ ප්‍රතිපත්තිය සදාචාරාත්මක ව්‍යාපාරික භාවිතයන් සඳහා අපගේ නොසැලෙන කැපවීම පිළිබිඹු කරයි. සෑම ගනුදෙනුවකදීම සහ වෘත්තීය අන්තර්ක්‍රියාවකදීම සාධාරණත්වය, විනිවිදභාවය සහ අඛණ්ඩතාවයෙන් සියලුම සේවකයින් කටයුතු කරන බවට අපේක්ෂා කෙරේ.

සංස්ථාව ඉහළම සදාචාරාත්මක සහ නීතිමය ප්‍රමිතීන්ට අනුකූලව වගකිවයුතු ආයතනික හැසිරීම සඳහා කැපවීමෙන් ස්ථිරව සිටී. අපි අදාළ වන සියලුම කම්කරු නීති සහ රෙගුලාසි වලට සම්පූර්ණයෙන්ම අනුකූල වන අතර, අපගේ මෙහෙයුම් තුළ ඕනෑම ආකාරයක ළමා ශ්‍රමය, බලහත්කාර ශ්‍රමය හෝ අනිවාර්ය ශ්‍රමය තහනම් කරමු.

මෙම වටිනාකම් ආරක්ෂා කිරීමෙන්, සංස්ථාව අපගේ සංවිධානය තුළ සහ අප සේවය කරන ප්‍රජාවන් තුළ විශ්වාසය, වගවීම සහ ගෞරවය පිළිබඳ සංස්කෘතියක් ගොඩනැගීම දිගටම කරගෙන යයි.

## විශ්‍රාම ගැනීම්

ශක්තිමත්, ඉහළ කාර්යසාධනයක් සහිත ශ්‍රම බලකායක් ගොඩනැගීම සහ පවත්වාගෙන යාම සඳහා අපගේ කැපවීමේ මූලික පදනම ලෙස කුසලතා රඳවා ගැනීම පවතී. අපගේ ආයතනික සංස්කෘතියේ සහ සේවක සහභාගීත්වයේ ශක්තිය පිළිබිඹු කරමින්, සියලු රැකියා මට්ටම් හරහා ඉහළ රඳවා ගැනීමේ අනුපාත පවත්වා ගැනීමේ අපගේ අඛණ්ඩ සාර්ථකත්වය ගැන අපි ආඩම්බර වෙමු.

පසුගිය වසර තුළදී, විශ්‍රාම යෑම්, ඉල්ලා අස්වීම් සහ අවාසනාවන්ත මරණ හේතුවෙන් සේවකයින් 110 දෙනෙක් ආයතනයෙන් ඉවත් විය.

| විශ්‍රාමගැනීම්/මරණ/ඉල්ලා අස්වීම් | | | |
|---|---|---|---|
| වසර | පිරිමි | කාන්තා | එකතුව |
| අවුරුදු 18-30 | 1 | - | 1 |
| අවුරුදු 31-40 | 5 | 2 | 7 |
| අවුරුදු 41-50 | 5 | 1 | 6 |
| අවුරුදු 51-60 | 78 | 18 | 96 |
| එකතුව | **89** | **21** | **110** |

## සෞඛ්‍යය සහ ආරක්ෂාව

ඛනිජ තෙල් කර්මාන්තය හා සම්බන්ධ ආවේණික සෞඛ්‍ය සහ ආරක්ෂක අවදානම් සැලකිල්ලට ගෙන, අපගේ සේවකයින්ගේ යහපැවැත්ම සැමවිටම සංස්ථාවෙහි ප්‍රමුඛතාවයක් වී ඇත. මෙම අභියෝග හඳුනා ගනිමින්, ජාත්‍යන්තරව පිළිගත් සෞඛ්‍ය සහ ආරක්ෂක ප්‍රමිතීන්ට අනුකූල වන ආරක්ෂාවට මුල් තැන දෙන සංස්කෘතියක් ඇති කිරීමට අපි කැපවී සිටිමු.

අපගේ ආරක්ෂක රාමුවේ තීරණාත්මක අංගයක් ලෙස මෙම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ බලගැන්වීම සඳහා පිරිපහදුව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. අඛණ්ඩව ආරක්ෂිත වැඩ පරිසරයක් සහතික කිරීමට, අපි සියලු සේවකයින් සඳහා ශක්තිමත් ආරක්ෂණ කළමනාකරණ පද්ධති සහ පුළුල් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙම මුලපිරීම්වලට නිත්‍ය ආරක්‍ෂක විගණන, පරීක්‍ෂණ සහ හොඳම භාවිතයන් සහ නියාමන අනුකූලතාව ශක්තිමත් කිරීම සඳහා සැලසුම් කර ඇති ප්‍රායෝගික පුහුණුව ඇතුළත් වේ.

කාර්තුමය ආරක්ෂක රැස්වීම් හරහා සේවා ස්ථාන ආරක්ෂාව සඳහා අපගේ කැපවීම තවදුරටත් පෙන්නුම් කෙරේ, එහිදී මෙහෙයුම්, ඉංජිනේරු සහ කළමනාකරණයේ නියෝජිතයින් එක්රැස් වේ. මෙම සහයෝගී සැසි මඟින් සැමට ආරක්ෂිත පරිසරයක් සහතික කරමින් කාර්ය සාධනය සමාලෝචනය කිරීමට, පවතින අවදානම් හඳුනා ගැනීමට සහ අපගේ ආරක්ෂක අධීක්ෂණය අඛණ්ඩව වැඩිදියුණු කිරීමට පහසුකම් සපයයි.

| සෞඛ්‍ය හා ප්‍රවේසම් | | |
|---|---|---|
| ගැටලුව | පිරිපහදුව | ප්‍රධාන කාර්යාලය |
| අනතුර හේතුවෙන් සේවය අහිමි වීම | 4 | - |
| ප්‍රථමාධාර අනතුරු | 1 | - |
| වාර්තා වූ සුළු ගිනි ගැනීම් | 4 | - |

## සුභසාධනය

අපගේ සේවකයින්ගේ යහපැවැත්මට ප්‍රමුඛත්වය දීම කැපවූ, අභිප්‍රේරිත සහ ඉහළ කාර්යසාධනයක් සහිත ශ්‍රම බලකායක් පෝෂණය කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. සේවක තෘප්තිය සහ පක්ෂපාතිත්වය වැඩි දියුණු කිරීමෙන්, සංවිධානය පුරා ඉහළ දක්ෂතා ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට අපගේ හැකියාව අපි ශක්තිමත් කර ඇත්තෙමු.



මෙම අරමුණට සහාය වීම සඳහා, අපගේ කණ්ඩායමේ සමස්ත සෞඛ්‍යය, ස්ථාවරත්වය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් සුභසාධන වැඩසටහන් සහ මුලපිරීම් රාශියක් අප විසින් ඉදිරිපත් කරයි. අපගේ සේවකයින් සංස්ථාවට ලබා දෙන අගනා දායකත්වය අගයමින්, ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට සහ අර්ථවත් මූල්‍ය ආධාර සැපයීමට නිර්මාණය කර ඇති සහනදායි පොලී අනුපාත සහිත ණය යෝජනා ක්‍රම වැදගත් කාර්යයක් ඉටු කරයි.

වසර තුළ සේවකයින්ගේ සුභසාධනය සහ දිගුකාලීන සමෘද්ධිය සඳහා අපගේ අඛණ්ඩ කැපවීමේ කොටසක් ලෙස අප විසින් සේවකයින්ට ණය සහ අත්තිකාරම් පහසුකම් රාශියක් ලබා දෙන ලදී.

### 2024 වර්ෂය තුළ සපයන ලද ණය පහසුකම්




සංස්ථාවෙහි අපගේ සේවකයින් සඳහා සුවදායක රැකියා ජීවිතය සමතුලිතතාවයක් ප්‍රවර්ධනය කිරීම සඳහා අපි විශාල වැදගත්කමක් ලබා දී ඇත. මෙම කැපවීමේ කොටසක් ලෙස, අපගේ ශ්‍රම බලකායේ යහපැවැත්ම සඳහා ඔවුන් ඉටු කරන වැදගත් කාර්යභාරය හඳුනා ගනිමින්, ඔවුන්ගේ පවුල්වලට අපගේ සහයෝගය ලබා දෙන්නෙමු.

මේ සඳහා, උසස් අධ්‍යාපනය හදාරන අය ඇතුළුව කැපී පෙනෙන අධ්‍යයන කාර්ය සාධනයක් පෙන්නුම් කළ සේවකයින්ගේ දරුවන් සඳහා අපි ශිෂ්‍යත්ව වැඩසටහන් පිරිනමන්නෙමු. මෙම මුලපිරීම් අපගේ සේවකයින්ට සහාය වීමට පමණක් නොව, ඊළඟ පරම්පරාවේ අනාගත සාර්ථකත්වයට ආයෝජනය කිරීම සඳහා අපගේ කැපවීම ද පිළිබිඹු කරයි.

අපගෙ වෛද්‍ය යෝජනා ක්‍රමය, සේවකයින්ට සහ ඔවුන්ගේ යැපෙන්නන්ට පුළුල් සෞඛ්‍ය සේවා ආවරණයක් සැපයීම සඳහා නිර්මාණය කර ඇති අතර, ඔවුන්ගේ යහපැවැත්ම සඳහා අපගේ කැපවීම ශක්තිමත් කරමින් සහ සමබර, සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවකට සහාය වේ.

ශාරීරික යහපැවැත්මට අමතරව, අධ්‍යාත්මික යහපැවැත්මේ වැදගත්කම අපි හඳුනා ගනිමු. රැකියා ස්ථානයේ ආගමික වතාවත් සඳහා ප්‍රමාණවත් අවස්ථාවන් ලබා දීමෙන් අපගේ සේවකයින්ගේ විවිධ ආගමික විශ්වාසයන්ට ගරු කිරීම සහ ඒවාට අනුගත වීම සඳහා අපි කැප වී සිටිමු.

සෞඛ්‍යය සහ ආරක්ෂාව තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා, අපි නම් කරන ලද භූමිකාවන්හි සේවකයින්ට සුදුසු නිල ඇඳුම් සපයන්නෙමු, ඔවුන්ගේ රැකියා අවශ්‍යතාවලට අනුකූලව සුවපහසුව සහ ආරක්ෂාව යන දෙකම සහතික කරමු.

අපගේ සේවකයින්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව සහ සමස්ත සුභසාධනය සඳහා අපගේ නොසැලෙන කැපවීම අපගේ ආයතනික වටිනාකම්වල මූලික අංගයක් ලෙස පවතී.

## කාර්මික සබඳතා සහ අනුකූලතාව

අපගේ ආයතනයේ සුමට ක්‍රියාකාරිත්වය කාර්මික සබඳතා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම තුළ ගැඹුරින් මුල් බැස ඇත. සංස්ථාවෙහි මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා කාර්මික සබඳතා ඉටු කරන වැදගත් කාර්යභාරය අපි හඳුනාගෙන ඇති අතර ඒවා අපගේ උපායමාර්ගික රාමුවට ඒකාබද්ධ කර ඇත්තෙමු.

වෙළඳපල ප්‍රමුඛයෙකු ලෙස, ශක්තිමත් කාර්මික සබඳතා මානව සම්පත්, භෞතික වත්කම් සහ මූල්‍ය ප්‍රාග්ධනය ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සැලකිය යුතු ලෙස වැඩිදියුණු කරන බව වටහා ගනිමින් අපගේ ශ්‍රම බලකාය සමඟ ඵලදායී සහ සහයෝගී සබඳතා පවත්වා ගැනීමට අපි දැඩි ලෙස කැපවී සිටිමු.

අපගේ සේවකයින්ගේ සංගමයේ නිදහසට ඇති අයිතියට අපි සම්පූර්ණයෙන්ම ගරු කරන අතර එය ආරක්ෂා කරමු, ඔවුන්ගේ පුද්ගලික තේරීම්වලට අනුකූලව වෘත්තීය සමිතිවලට සම්බන්ධ වීමට ඔවුන්ට ඉඩ සලසයි. 2024 දෙසැම්බර් 31 වන විට, සංස්ථාව තුළ ලියාපදිංචි වෘත්තීය සමිති නවයක් ක්‍රියාකාරී විය. සංස්ථාව මෙම සෑම වෘත්තීය සමිතියක් සමඟම ධනාත්මක සහ සහයෝගී සබඳතා පවත්වාගෙන යන අතර, සුමට මෙහෙයුම් සහ ස්ථාවර සේවා පරිසරයක් සහතික කරයි.

# සමාජීය සහ  සම්බන්ධතා ප්‍රාග්ධනය





## සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීම සඳහා ව්‍යාපාරික හවුල්කරුවන් සහ පුළුල් ප්‍රජාව ඇතුළු අපගේ කොටස්කරුවන් සමඟ ශක්තිමත් සහ ඵලදායී සබඳතා මූලික වේ. සංස්ථාවෙ කාර්යක්ෂම සැපයුම් දාම කළමනාකරණය සහ උසස් තත්ත්වයේ පාරිභෝගික සේවාවක් සැපයීම සහතික කිරීම සඳහා අපගේ බෙදුම්කරුවන් සමඟ සමීප සහයෝගීතාවයකට අපි ප්‍රමුඛත්වය දෙමු. මෙම අලෙවිසැල්වල මෙහෙයුම් අතරතුර ඉහළම සෞඛ්‍ය සහ ආරක්ෂාව ප්‍රමිතීන් පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍රයකි. මේ සඳහා සහාය වීමට, ශක්තිමත්, පාරිභෝගික කේන්ද්‍රීය සබඳතා වර්ධනය කරමින් මෙහෙයුම් ආරක්ෂිතව කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය කුසලතා කාර්ය මණ්ඩලය සන්නද්ධ කිරීම අරමුණු කරගත් ඉලක්කගත පුහුණු වැඩසටහන් අපි සපයන්නෙමු.

**දළ සටහන 2024**

- රජය සඳහා  බදු සහ තීරුබදු දායකත්වය රුපියල් මිලියන 277,875 කි.
- වර්ෂය තුලදී මුළු ඉන්ධන ආනයනය රු බිලියන 772.කි.
- බාහිර සිසුන් සඳහා පුහුණු අවස්ථා සංඛ්‍යාව 249 කි.
- සේවක සංගම් හරහා ප්‍රජා සම්බන්ධතා ව්‍යාපෘති මෙහෙයවන ලදී.

**277,875**
(රු. මි.)
රජයට දායකත්වය

**981**
(ඇ.ඩො.මි.)
බොරතෙල් ආනයනය

**1,155**
(ඇ.ඩො.මි.)
ඉන්ධන ආනයනය

**452**
(රු. මි.)
තෙල් නොවන ප්‍රසම්පාදන



සංස්ථාවේ අඛණ්ඩ මෙහෙයුම් සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය සඳහා ඵලදායී කොටස්කරුවන්ගේ සහභාගීත්වය අත්‍යවශ්‍ය වේ. සංස්ථාව, මහා භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL), මූල්‍ය ආයතන, බොරතෙල් සහ පිරිපහදු කළ තෙල් සැපයුම්කරුවන්, නැව් සමාගම්, දේශීය වෙළෙන්දන්, බෙදුම්කරුවන් සහ අනෙකුත් තීරණාත්මක පාර්ශවකරුවන් ඇතුළු ප්‍රධාන හවුල්කරුවන් සමඟ ශක්තිමත්, සහයෝගී සබඳතා වර්ධනය කර පවත්වාගෙන යාමට කැපවී සිටී.

## ඛනිජ තෙල් ආනයනය

ශ්‍රී ලංකාව සතුව ඛනිජ තෙල් නිධි නොමැති බැවින්, ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය රටේ මුළු ආනයනයෙන් සැලකිය යුතු කොටසක් වේ. මෙම සන්දර්භය තුළ, දේශීය ඉල්ලුම සපුරාලීම සඳහා බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමෙන් ජාතියේ බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා සංස්ථාව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම ආනයන සිදු කරනු ලබන්නේ විනිවිදභාවය, තරඟකාරිත්වය සහ වගවීම පිළිබඳ මූලධර්ම

| කාණ්ඩය | 2024 (ඇ.ඩො. මි) | 2023 (ඇ.ඩො. මි) |
|---|---|---|
| බොරතෙල් | 981.14 | 1,068.14 |
| පිරිපහදු කළ තොග නිෂ්පාදන | 1,154.98 | 1,661.12 |
| එකතුව | **2,136.12** | **2,729.26** |

ආරක්ෂා කිරීම සඳහා නිර්මාණය කල සැලසුම්ගත ගත රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලින් හරහා ය. මෙම ප්‍රමිතීන්ට අනුගතවෙමින් , රටේ ආර්ථික හා කාර්මික කටයුතු සඳහා අත්‍යවශ්‍ය ඛනිජ තෙල් නිෂ්පාදනවල ස්ථාවර සහ පිරිවැය ඵලදායී සැපයුමක් සහතික කරමින්, ගෝලීය වෙළඳපොළෙන් කීර්තිමත්, උසස් තත්ත්වයේ සැපයුම්කරුවන් ආකර්ෂණය කර ගැනීම සංස්ථාවෙ හි අරමුණයි

පිරිවැය අනුව ආනයන





Head office staff training

ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ (CPC) මුළු අලෙවියෙන් ආසන්න වශයෙන් 35% සිට 50% දක්වා ප්‍රමාණයක් පිරිපහදුව මගින් සපයන අතර, ඉතිරි ඉල්ලුම පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන සෘජුවම ආනයනය කිරීම හරහා සපුරා ගනු ලැබේ. සැපයුම් පරතරය පියවා ගැනීම සහ රට පුරා ඉන්ධන අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා, සංස්ථාව ආනයන ක්‍රියාවලිය දිගටම පවත්වා ගනී.

විනිවිදභාවය, සාධාරණත්වය සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා නිර්මාණය කර ඇති ස්ථාපිත රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිවලට අනුකූලව, වාර්තාකරණ කාලය තුළ සංස්ථාව පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන සහ බොරතෙල් යන දෙකම ආනයනය කර ඇති අතර එහි වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 2,136.12 කි. මෙම ක්‍රියා පටිපාටිවල අරමුණ වන්නේ වගවීම තහවුරු කිරීම සහ උසස් තත්ත්වයේ භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය පහසු කිරීමයි. ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා, සංස්ථාව විසින් යෝජනා ඇගයීම සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු ලංසු ඇගයීමේ කමිටුවක් සහ ප්‍රසම්පාදන කමිටුවක් පිහිටුවා ඇත. ගෝලීය තෙල් මිල උච්චාවචනයන්, විනිමය අනුපාත චලනයන් සහ සංස්ථාව විසින් වඩාත් කාර්යක්ෂම ප්‍රසම්පාදන උපාය මාර්ග අනුගමනය කිරීම ඇතුළු සාධකවල එකතුවක් පිළිබිඹු කරමින්, පසුගිය වසරට (2023) සාපේක්ෂව මුළු ආනයන වියදම ඩොලර් 22% ක අඩුවීමක් සනිටුහන් කරයි.

| ඛනිජ තෙල් නොවන ප්‍රසම්පාදන | ප්‍රසම්පාදන ගණන | වටිනාකම (රු.මි) |
|---|---|---|
| පහල බලතල අනුව | 1,066 | 116.9 |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු | 110 | 678.2 |
| එකතුව | **1,176** | **795.1** |

## රජය සඳහා දායකත්වය

සංස්ථාව රජයේ බදු ආදායමට ප්‍රධාන දායකත්වයක් සපයන අතර එය යටිතල පහසුකම් සංවර්ධනය සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා වෙන් කරනු ලැබේ. 2023 දී රුපියල් මිලියන 233,255 ක් වූ සංස්ථාවේ රජයට වූ බදු දායකත්වය 2024 දී රුපියල් මිලියන 277,875 දක්වා ඉහළ ගිය අතර එය 2024 දී මුළු ආදායම 27% කින් අඩු වුවද 19% ක වැඩිවීමක් නියෝජනය කරයි.

රජයේ පුළුල් මූල්‍ය ප්‍රතිපත්ති ගැලපීම්වල ප්‍රතිඵලයක් ලෙස, 2023 ට සාපේක්ෂව 2024 දී ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සඳහා වරාය සහ ගුවන්තොටුපළ බද්ද (PAL) අඩු කිරීම බදු ව්‍යුහයේ සිදු වූ ප්‍රධාන වෙනස්කම් වලින් එකකි. මෙම බදු අඩු කිරීම් තත්වය යටතේ දීත්, වසර තුළ සංස්ථාවේ මුළු බදු සහ තීරුබදු දායකත්වය වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන බලපානු ලැබුවේ 2024 ආරම්භයේදී ක්‍රියාත්මක වූ ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා එකතු කළ අගය මත බද්ද (VAT) හඳුන්වාදීම මගිනි.

**බදු දායකත්වය**




**බදු දායකත්වය**




## ව්‍යාපාර හවුල්කාරිත්වය

අපගේ නිෂ්පාදන සඳහා මහජනතාවට ප්‍රවේශය සහතික කරනු ලබන්නේ පිරවුම්හල් 1,002 කින් සමන්විත ශක්තිමත්, දිවයින පුරා ව්‍යාප්ත අලෙවි නියෝජිත ජාලයක් හරහාය. මෙම පුළුල් බෙදාහැරීමේ ජාලය රට පුරා ඛනිජ තෙල් නිෂ්පාදන ලබා ගැනීමේ හැකියාව පවත්වා ගැනීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් අංශයේ වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස, ජාතික බලශක්ති ආරක්ෂාව සහතික කිරීමේ තම වගකීම ඉටු කිරීම සඳහා ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ ශක්තිමත්, සහයෝගී සබඳතා වර්ධනය කිරීම අත්‍යවශ්‍ය බව ලංකා ඛනිජ තෙල් සංස්ථාව (CPC) පිළිගනී.

බෙදුම්හල් ජාලය පුරා නිෂ්පාදන ගුණාත්මකභාවය ස්ථාවරව පවත්වා ගැනීම සඳහා, සංස්ථාව විසින් පුළුල් ක්‍රියාවලීන් සහ තත්ත්ව පාලන යාන්ත්‍රණ ක්‍රියාත්මක කර ඇති අතර, එමගින් සෑම අලෙවිසැලකින්ම අපේක්ෂිත ප්‍රමිතීන් සපුරාලන ඛනිජ තෙල් නිෂ්පාදන පාරිභෝගිකයින්ට ලැබෙන බව සහතික කෙරේ.

පිරවුම්හල් ජාලයට අමතරව, අපගේ කෘෂි රසායන සහ ලිහිසි තෙල් තොග බෙදුම්කරුවන් සහ අලෙවි නියෝජිතයින් සංස්ථාවෙහි නිෂ්පානද ලබා ගැනීමට සැලකිය යුතු දායකත්වයක් සපයයි. තවද, ගුවන් තෙල් සැපයුම් අංශය සංස්ථාවේ විදේශ මුදල් ආදායමට සැලකිය යුතු ලෙස දායක වන අතර එමගින් සංස්ථාවෙ හි මූල්‍ය ස්ථාවරත්වයට සහ රටේ විදේශ විනිමය ඉපැයීම්වලට සහාය වේ.




## නිෂ්පාදන වගකීම

අපගේ නිෂ්පාදනවල ආවේණික ගිනිගැනීමේ හැකියාව සහ ඒ ආශ්‍රිත ආරක්ෂක අවදානම් සැලකිල්ලට ගෙන, නිෂ්පාදන වගවීම සහතික කිරීම ප්‍රමුඛතාවයකි. අවසාන පාරිභෝගිකයින්ට අඛණ්ඩව උසස් තත්ත්වයේ, ප්‍රමිතිගත නිෂ්පාදනයක් ලබා දීම සඳහා අපගේ කැපවීම ප්‍රසම්පාදනයෙන් ආරම්භ වන අතර මෙහෙයුම් ,බෙදා හැරීම සහ දැඩි තත්ත්ව පාලනය හරහා විහිදේ. අපගේ ගුණාත්මක තත්ව ප්‍රමිතීන්ට අනුකූලව පවත්වා ගැනීම සඳහා සෑම අදියරක්ම සමීපව නිරීක්ෂණය කරනු ලැබේ. මීට අමතරව, ගැටළු ඉක්මනින් හඳුනාගෙන නිවැරදි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා පාරිභෝගික අන්තර්ක්‍රියා ස්ථානවල කැපවූ අධීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක වේ. සියලුම පිරවුම්හල්වල ගිනි නිවන උපකරණ ලබා ගැනීම සහ ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා නිතිපතා පරීක්ෂා කිරීම ඇතුළුව ගිනි උවදුරු අවම කිරීම සඳහා ශක්තිමත් ආරක්ෂක ප්‍රොටෝකෝල ස්ථාපිත කර ඇත.

හඳුනාගත් අඩුපාඩු නිවැරදිකිරීමට සහ අනාගත ගැටළු වළක්වා ගැනීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට කඩිනම් පියවර ක්‍රියාත්මක කර ඇත. භූමිතෙල් මිශ්‍ර කිරීම හඳුනා ගැනීමට සහ පාරිභෝගිකයින්ට ලබා දෙන නිෂ්පාදනවල අඛණ්ඩ ගුණාත්මකභාවය සහතික කිරීමට අතිරේක නියාමන පද්ධති හඳුන්වා දී ඇත. වගවීම තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා, සෑම අලෙවිසැලකම පැමිණිලි ලේඛනයක් තබා ඇති අතර, එමගින් පාරිභෝගිකයින්ට ඕනෑම අකටයුතුකම් හෝ අක්‍රමිකතාවයවයන් වාර්තා කිරීමට ඉඩ සලසයි. සේවා ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සහ උසස් තත්ත්වයේ නිෂ්පාදන අවසාන පාරිභෝගිකයින්ට ලබා දීම සහතික කිරීම සඳහා සංස්ථාව මෙම පැමිණිලි සක්‍රියව සමාලෝචනය කර ප්‍රතිචාර දක්වයි.

ඉහත සඳහන් කරුණු වලට අමතරව, ඕනෑම ආකාරයක අකටයුතුකම් සම්බන්ධයෙන් පැමිණිලි ලබා ගැනීම සඳහා කැපවූ දුරකථන මාර්ග සහිතව ප්‍රධාන කාර්යාලයේම ඒකකයක් ස්ථාපිත කර ඇත. වාර්තා කරන ලද ගැටළු ඵලදායී ලෙස විසඳීම සහතික කිරීම සඳහා ප්‍රාදේශීය කළමනාකරුවන් හරහා සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ.

සංස්ථාව සියලුම රෙගුලාසිවලට දැඩි ලෙස අනුකූල වන අතර ශ්‍රී ලංකාව තුළ කිසිදු තහනම් ද්‍රව්‍යයක් විකිණීමේ නිරත නොවේ.

## අධ්‍යාපනය සඳහා සහයෝගය

ශ්‍රී ලංකාවේ ඇති එකම පිරිපහදුව ලෙස, සිසුන් සඳහා පුළුල් පුහුණු අවස්ථා ලබා දීමෙන් දේශීය කුසලතා වර්ධනය කිරීම සඳහා අපි කැපවී සිටිමු. මෙම වැඩසටහන් සැලසුම් කර ඇත්තේ ඔවුන්ට වටිනා කාර්මික අත්දැකීම් සහ තාක්ෂණික විශේෂඥතාව ලබා ගැනීමට උපකාර කිරීම සඳහා වන අතර, බලශක්ති සහ ඛනිජ තෙල් අංශවල ඔවුන්ගේ අනාගත වෘත්තීමය දියුණුව මෙමඟින් අපේක්ෂා කෙරේ.

දක්ෂ ඛනිජ තෙල් ඉංජිනේරුවන් සඳහා ජාත්‍යන්තර ඉල්ලුම් වර්ධනය වීමත් සමඟ, ශ්‍රී ලාංකික වෘත්තිකයන්ට ගෝලීය රැකියා අවස්ථා වෙත ප්‍රවේශ වීමට හැකි වන පරිදි පුහුණු වැඩසටහන් පුළුල් කිරීමට සංස්ථාව ක්‍රියාකාරීව උත්සාහ කරයි. මෙය පුද්ගල ප්‍රතිලාභයක් පමණක් නොවන අතර , විදේශ විනිමය උත්පාදනය කිරීමෙන් ජාතික ආර්ථිකයට ද දායක වේ.

ඊට අමතරව, අපි තාක්ෂණික හා ඉංජිනේරු ආයතනවල සිසුන් සඳහා ක්ෂේත්‍ර චාරිකා නිතිපතා සංවිධානය කරමින්, ඔවුන්ට ප්‍රායෝගික අත්දැකීම් ලබා දෙන සැබෑ ලෝකයේ පිරිපහදු මෙහෙයුම් පිළිබඳ ඔවුන්ගේ අවබෝධය වැඩි දියුණු කරමු. මෙම ප්‍රයත්නයන් ඊළඟ පරම්පරාවේ කර්මාන්ත නියාමකවරුන්ගේ වෘත්තීය වර්ධනයට සහාය වීමෙහිලා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

විශ්වවිද්‍යාල සහ අනෙකුත් අධ්‍යාපන ආයතනවල දේශීය සිසුන්ට මූල්‍ය, තොරතුරු තාක්ෂණය සහ මානව සම්පත් කළමනාකරණය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක් හරහා ප්‍රායෝගික පුහුණු අවස්ථා ලබා දෙනු ලැබේ.

## ප්‍රජා සහභාගීත්වය

අපගේ උපායමාර්ගය අවධානය යොමු කරන්නේ ප්‍රජාව සමඟ ශක්තිමත් සහ ධනාත්මක සබඳතා වර්ධනය කිරීම කෙරෙහි ය. අපගේ පුළුල් බෙදාහැරීමේ ජාලය හරහා, අපි රට පුරා වක්‍ර රැකියා අවස්ථා 15,000 කට අධික සංඛ්‍යාවකට සහාය වෙමු. මීට අමතරව, අපගේ කෘෂිකාර්මික සහ ලිහිසි තෙල් බෙදාහරින්නන්ගේ ජාලය තවත් රැකියා අවස්ථා දහස් ගණනක් නිර්මාණය කරන අතර එය දේශීය ආර්ථික සංවර්ධනයට සැලකිය යුතු ලෙස දායක වේ.

සැපයුම් සීමාවන් නිසා ඇති වූ අභියෝග මධ්‍යයේ වුවද, වඩාත් විද්‍යාත්මක හා තිරසාර ප්‍රවේශයක් හරහා අලෙවිකරුවන්ට ඉන්ධන බෙදා හැරීම සහතික කිරීම සඳහා උපායමාර්ගික ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කර ඇත. අවසාන පාරිභෝගිකයින් සමඟ ප්‍රධාන සම්බන්ධතා පැවැත්වීම සඳහා ක්‍රියා කරන ලිහිසි තෙල් අලෙවිකරුවන්ගේ සහ තොග බෙදුම්කරුවන්ගේ වැදගත් කාර්යභාරය හඳුනා ගනිමින්, ඔවුන්ගේ පාරිභෝගික සේවය සහ සම්බන්ධතා කළමනාකරණ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අපි නිතිපතා පුහුණුව ලබා දෙන්නෙමු.

උසස් තත්ත්වයේ නිෂ්පාදන සාධාරණ මිල ගණන් යටතේ ලබා ගැනීම සහ පහසු ප්‍රවේශයක් පවත්වා ගැනීම සහතික කිරීමෙන්, අපි සේවය කරන ප්‍රජාවන් සමඟ සෘජු හා වක්‍ර සම්බන්ධතා ගොඩනගා ගැනීම හා ශක්තිමත් කිරීම අඛණ්ඩ ව සිදු කරන්නෙමු.

## සමාජ යහපැවැත්ම

පුළුල් බෙදාහැරීමේ ජාලය හරහා, සංස්ථාව ශ්‍රී ලංකාව පුරා සෘජු හා වක්‍ර රැකියා අවස්ථා 15,000 කට අධික සංඛ්‍යාවක් සපයන අතර, එය රට පුරා ප්‍රජාවන්ගේ ආර්ථික තිරසාරභාවය සහ යහපැවැත්මට දායක වේ. ඛනිජ තෙල් නිෂ්පාදන ජීවන වියදමට සහ සමස්ත ජීවන තත්වයන්ට සැලකිය යුතු ලෙස බලපාන බව හඳුනා ගනිමින්, මූලික ආර්ථික වගකීමක් ලෙස දැරිය හැකි මිලකරණයක් සහ මෙම අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා ඉක්මන් ප්‍රවේශය සඳහා සංස්ථාව ප්‍රමුඛත්වය දෙයි.

කෘෂි රසායන අංශය සාපේක්ෂව අඩු ආදායමක් ජනනය කරන නමුත් තරඟකාරී සමාගම් විසින් සිදු කරනු ලබන හානිවලින් ගොවීන් ආරක්ෂා කිරීම සඳහා සංස්ථාව මෙම වෙළඳපොළ තුළ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. තරඟකාරී මිල ගණන් යටතේ උසස් තත්ත්වයේ නිෂ්පාදන ලබා දීමෙන්, සංස්ථාව කෘෂි රසායන ගොවීන්ට වැඩි ආර්ථික ප්‍රතිලාභ සහතික කරන අතර ජාතික කෘෂිකාර්මික සංවර්ධනයේ පුළුල් ඉලක්කයට සහාය වේ.

# ස්වාභාවික ප්‍රාග්ධනය






## ස්වාභාවික ප්‍රාග්ධනය

මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කරන තිරසාර භාවිතයන් සඳහා කැපවෙමින්, පරිසරය සංරක්ෂණය සහ සහජීවනය සඳහා අපි ප්‍රමුඛත්වය ලබා දෙමු. කාබන් විමෝචනය අවම කිරීම, ජලය සහ බලශක්තිය වගකිවයුතු ලෙස පරිභෝජනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම කෙරෙහි අපගේ මූලික අවධානය යොමු වී ඇත. අපගේ උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් සංස්ථාවේ දිගුකාලීන තිරසාරභාවය සහතික කරමින් පාරිසරික ප්‍රතිපත්ති මගින් මෙහෙයවනු ලැබේ.

**807**
**(000 මෙ.ටො)**
ජල පරිභෝජනය

**84.09%**
මෙහෙයුම් කාර්යක්ෂමතාව

**8,786**
**(මෙ.ටො )**
පිරිපහදුවේදී සාමාන්‍ය හානිය

### සමාලෝචනය 2024

- ♦ පිරිපහදුවේ විශාල සෞඛ්‍ය සහ ආරක්ෂක සිදුවීම් වාර්තා වී නොමැත.
- ♦ සංස්ථාව ජල පිරිපහදුව මගින් ජලය මෙට්‍රික් ටොන් 593,770 ක් පිරිසිදු කරන ඇත.
- ♦ දැල්වීම සඳහා වන CDU වායු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 363 (2023- 310 මෙ.ටො) වේ.
- ♦ පිරිපහදුවේ අපේක්ෂිත අලාභය මෙට්‍රික් ටො න් 8,786 ක් වේ.
- ♦ ජෛව විවිධත්ව පවතින අවස්ථා වාර්තා නොමැත.

අපගේ ක්‍රියාකාරකම්වල දිගුකාලීන තිරසාරභාවය සඳහා අපි සැමවිටම කැපවී සිටිමු. අපගේ බොරතෙල් පිරිපහදු ක්‍රියාවලිය පුරාවටම බලශක්තිය සහ ජලය විශාල ලෙස භාවිතා කළද අප කාබන් බලපෑම අඩු කිරීමට සහ තිරසාර ලෙස බලය භාවිතා කිරීමට සෑම උත්සාහයක්ම දරන්නෙමු. තවද, අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය සඳහා දැඩි නීති, ක්‍රියාවලීන් සහ භාවිතයන් ක්‍රියාත්මක කරමින් ජාතික නීතිරීති වලට අනුගත වන්නෙමු.

## ජල පරිභෝජනය

තෙල් පිරිපහදු ක්‍රියාවලිය සඳහා විශාල ජල ප්‍රමාණයක් අවශ්‍ය වන බැවින් කැලණියේ පිහිටි සංස්ථාවේ ජල පවිත්‍රාගාරය මගින් කැළණි ගඟෙන් ලබා ගත් ජලය සැලකිය යුතු ජල ප්‍රමාණයක් පිරිසිදු කර ඇත. 2024 වර්ෂය තුළදී ජල පවිත්‍රාගාරයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය 44.44% ක් වූ අතර එය 44.17% ක් ලෙස 2023 සටහන් විය.වියළි කාලගුණයක් පැවති අවස්ථා වලදී ගංගා ජලයේ පැවති අධික ලවණ තත්වය හේතුවෙන් ජාතික ජල සම්පාදන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය 214,920 මෙ.ටො භාවිතා කිරීමට සිදුවිය.

අපි සැමවිටම ජල සංරක්ෂණය සහ තිරසාර පරිභෝජන රටාව සඳහා කැපවී සිටිමු. අපවිත්‍ර ජලය නිසි ලෙස පිරිසිදු කර ජාත්‍යන්තරව පිළිගත හැකි ප්‍රමිතීන්ට අනුකූලව පිරිසිදු කර සොබාදහමට මුදා හරිනු ලබන අතර එමගින් පරිසරය කෙරෙහි අපගේ කැපවීම පෙන්නුම් කෙරේ.

| වර්ෂය | 2024 (MT) | 2023 (MT) |
|---|---|---|
| ජල පිරිපහදුව | 593.770 | 608,640 |
| ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය | 214,920 | 108,259 |
| එකතුව | **808,690** | **716,899** |

## බලශක්ති පරිභෝජනය

බොරතෙල් පිරිපහදු කර ඛනිජ තෙල් නිෂ්පාදන බවට පරිවර්තනය කිරීම සඳහා වන තෙල් පිරිපහදු මෙහෙයුම් ක්‍රියාවලියට සැලකිය යුතු විදුලි සහ බලශක්ති ප්‍රමාණයක් අවශ්‍ය වේ. පිරිපහදුව එහි ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය බලශක්තියෙන් කොටසක් ජනනය කරන අතර ඉතිරි ඉල්ලුම ලං.වි.ම සැපයුම හරහා සපුරා ගනී. වර්ෂය තුලදී පිරිපහදුවේ විදුලි උත්පාදනය 145.65 MWH සිට 236.09 MWH වූ අතර පරාසයක පවත්වාගත් අතර අමතර වශයෙන් 5277.02 MWH ජාතික විදුලිබල පද්ධතියෙන් ලබා ගන්නා ලදි.

## ජනන යන්ත්‍ර

ඉල්ලුම අවශ්‍යතා මත පදනම්ව TG I සහ TG II ජනන යන්ත්‍ර වසර පුරා ක්‍රියාත්මක විය. අමතර ඉල්ලුම සැපයීම සඳහා DG I සහ DG II වසර පුරා වරින් වර ක්‍රියාත්මක කරන ලදි.සමස්ථයක් වශයෙන් පිරිපහදුව තුල විදුලිය 26830 MWH ප්‍රමාණයක් ජනනය කරන ලද අතර එය පිරිපහදුවේ විදුලි අවශ්‍යතාවයෙන් 83.56% ක් වේ.

| ජනන යන්ත්‍ර | විදුලිබල ජනනය (MWh) |
|---|---|
| TG I | 6,527 |
| TG Il | 12,554 |
| DG I | 3,789 |
| DG II | 3,960 |

තිරසාරභාවය අපගේ අරමුණ වන බැවින්, ඵලදායී බලශක්ති ඉතිරිකිරීමේ ශිල්පීය ක්‍රම සොයා ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට පිරිපහදුව විසින් හානි සහ කාර්යක්ෂමතා පිළිබඳව නිරන්තර සමීක්ෂණ සිදු කරයි. සංස්ථාව විසින් එහි උපාය මාර්ගතුලට තිරසාර පාරිභෝජනය ඇතුළත් කර ඇති අතර අනාගතය සඳහා මග සකස් කිරීමට සියලුම නිවාඩු නිකේතන සහ ප්‍රාදේශීය කාර්යාල සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන පහසුකම් බවට පරිවර්තනය කිරීම සඳහා සුදුසු පරිදි ආයෝජනය කර ඇත.

## ද්‍රව්‍ය කළමනාකරණය

ඉන්ධන සහ උපකරණ ඇතුළු ප්‍රධාන භාණ්ඩ භාවිතය අපි නිරන්තරයෙන් නිරීක්ෂණය කරන අතර මෙම සම්පත්වල කාර්යක්ෂමතාව ප්‍රශස්ත කිරීමට උත්සාහ කරමු. ස්ථාපිත තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූලව පරිභෝජන කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම අරමුණු කරගත් තාක්ෂණික ක්‍රියාවලීන් අපි සැලසුම් නිර්මාණය කිරිම සහ ක්‍රියාත්මක කිරීම සිදු කරන්නෙමු. ඊට අමතරව, තිරසාරභාවය කෙරෙහි අවධානය යොමු කරමින් කර්මාන්තයේ ඉදිරි දියුණුවට අනුකූල වන පරිදි අපගේ රසායනාගාර පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කරන්නෙමු.

## වගකිව යුතු මූලාශ්‍රකරණය

අපි පාරිසරික වශයෙන් තිරසාර භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමට උත්සාහ කරන්නෙමු. වගකිව යුතු මූලාශ්‍රකරණ ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා සැපයුම්කරුවන් අදාළ සියලු නීති සහ රෙගුලාසි පිළිපැදීම අත්‍යවශ්‍ය වේ. ඊට අමතරව, පුළුල් පරාසයක සැපයුම්කරුවන්ට තම භාණ්ඩ හා සේවා සැපයීම දිරිගැන්වීම සඳහා නිර්මාණය කරන ලද විනිවිදභාවය සහිත ප්‍රසම්පාදන පද්ධතියක් අපි ක්‍රියාත්මක කර ඇත්තෙමු.

විභව සැපයුම්කරුවන් හඳුනා ගැනීම සඳහා සංස්ථාව විවිධ උපාය මාර්ග හඳුන්වා දී ඇති අතර තිරසාරභාවය සඳහා කැපවූවන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය නීතිමය හා නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම, පිරිවිතරයන්ට අනුකූල වීම සහ භාවිත කරන ලද මූලාශ්‍ර ක්‍රමවේදයන් මගින් මෙහෙයවනු ලැබේ.

## අන්තරායකර අපද්‍රව්‍ය බැහැර කිරීම

අන්තරායකර කෘෂි රසායන කළමනාකරණය කර බැහැර කරනු ලබන්නේ අවශ්‍ය නියාමන අනුමැතිය සහ අධීක්ෂණය සමඟ බැඳුණු දැඩි, පරිසර හිතකාමී ක්‍රියාමාර්ග වලට අනුකූලවය. මිනිස් සෞඛ්‍යය හා පරිසරය යන දෙකෙහිම ආරක්ෂාව සහතික කිරීම සඳහා බලයලත් ආයතන විසින් බැහැර කිරීම සිදු කරනු ලැබේ.



පිරිපහදු කිරීමේ ක්‍රියාවලියේදී අනිවාර්යයෙන්ම අන්තරායකර අපද්‍රව්‍ය නිපදවන අතර, පරිසර දූෂණය වැළැක්වීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව කළමනාකරණය කරනු ලැබේ. අනෙකුත් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය අපගේම ප්‍රතිචක්‍රීකරණ පහසුකම් හරහා සකස් කර ඒවා බැහැර කිරීම හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීම පිළිගත් පාරිසරික මාර්ගෝපදේශ සපුරාලන බව සහතික කිරීම සඳහා බලයලත් පාර්ශවයන් වෙත යවනු ලැබේ.

අපවිත්‍ර ජලය අනුමත ප්‍රමිතීන්ට අනුව ප්‍රතිචක්‍රීකරණය කර පරිසරයට වගකිව යුතු ලෙස නිකුත්කරනු ලබයි. අනෙකුත් නැවත භාවිතයට ගත හැකි ද්‍රව්‍ය අපගේම ප්‍රතිචක්‍රීකරණ පහසුකම් හරහා සැකසීම හෝ ඉවත් කිරීම හෝ නැවත භාවිතය පිළිගත් පාරිසරික මාර්ගෝපදේශයන්ට අනුකූල වන බව සහතික කිරීම සඳහා බලය ලත් පාර්ශවයන් වෙත යොමු කරනු ලබයි.

## තිරසාර හා පරිසර හිතකාමී ආර්ජිකය

පරිභෝජනයේ පාරිසරික බලපෑම අවම කිරීම සඳහා පාරිසරික වශයෙන් තිරසාර නිෂ්පාදන ලබා ගැනීමේ හැකියාව වැඩි කිරීමට සංස්ථාව කැපවී සිටී. මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා, සංස්ථාව විසින් පරිසර හිතකාමී Euro IV පෙට්‍රල් සහ ඩීසල් හඳුන්වා දී ඇති අතර, එමඟින් වඩාත් කාර්යක්ෂම හා පිරිසිදු ඉන්ධන විකල්ප ලබා දේ.

## ජෛව විවිධත්වය

තෙල් කාන්දුවීම්, විමෝචන, අපද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීමට අපි කැපවී සිටිමු. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය සියලු පූර්වාරක්ෂාවන් ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා අපි දැඩි මෙහෙයුම් ක්‍රියා පටිපාටි ස්ථාපිත කර ඇත්තෙමු. එමෙන්ම ජෛව විවිධත්වයට බලපාන කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැති බව සඳහන් කරනුයේ ඉතා ආඩම්බරයෙනි.

## අනුකූලතාව

පාරිසරික කළමනාකරණයට කැපවී සිටින වගකිව යුතු ආයතනයක් ලෙස, පසුගිය වසර තුළ මෙහෙයුම් හෝ වාර්තා කළ යුතු මට්ටම්වලදී පාරිසරික නීති හෝ රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා කිසිවක් සිදු නොවූ බව සතුටින් වාර්තා කරමු. ඒ අනුව, දැනටමත් හෙළිදරව් කර ඇති කරුණු හැරුණු විට, වසර පුරාවටම සංස්ථාව සැලකිය යුතු දඩ මුදල් හෝ මූල්‍යමය නොවන දඬුවම් කිසිවකට භාජනය වී නොමැත.

අපගේ මෙහෙයුම් ආවේණික පාරිසරික අවදානම් ගෙන යන බව පිළිගනිමින් සංස්ථාව පාරිසරික බලධාරීන් සමඟ ක්‍රියාකාරීව සහයෝගයෙන් කටයුතු කරයි. අපගේ ක්‍රියාකාරකම්වල අහිතකර බලපෑම් අවම කිරීම සඳහා අපි පුළුල් පියවර ක්‍රියාත්මක කර ඇති අතර විභව පාරිසරික ප්‍රතිවිපාකවලට මුහුණ දීම සඳහා ජාත්‍යන්තර සංවිධාන සමඟ සමීපව කටයුතු කර ඇත. තවද සංස්ථාව ජාත්‍යන්තර තෙල් දූෂණ වන්දි අරමුදලේ (IOPCS) සාමාජිකත්වය දරන අතර,එමඟින් තෙල් ටැංකි මඟින් පරිසරයට කාන්දු වීම නිසා සිදුවන හානිය සඳහා වන්දි ලබා දීම සිදුකරයි.

පාරිසරික වගකීම සඳහා අපගේ කැපවීම පිළිබිඹු කරමින්, සංස්ථාව කෘෂි රසායනික ක්‍රියාවලීන් සහ නිෂ්පාදන සඳහා ISO සහතිකය සහ OHSAS 18001 සහතිකය ද ලබා ගෙන ඇත.

# පාර්ශවකරුවන් කළමනාකරණය




පාර්ශ්වකරුවන්ගේ කළමනාකරණය යනු සංවිධානයක ක්‍රියාකාරකම් කෙරෙහි උනන්දුවක් දක්වන හෝ බලපෑමට ලක්වන පුද්ගලයින් හෝ කණ්ඩායම් හඳුනා ගෙන, ඔවුන් සමඟ සම්බන්ධතා ගොඩනගා ගෙන සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා භාවිත කරන උපායමාර්ගික ක්‍රියාවලියයි. සංස්ථාව තුළ මෙම ක්‍රියාවලිය ආරම්භ වන්නේ සහයෝගී උත්සාහයන් ඒකාබද්ධ කිරීම මඟින් වන අතර එක් එක් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ ආයතනික අරමුණු එකිනෙකට පෙළගස්වන ඒකාබද්ධ උපාය මාර්ග නිර්මාණය කරයි.

අපි සංකීර්ණ සබඳතා ජාලය හරහා ගමන් කරන අතර, එක් එක් පාර්ශ්වකරුගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් සමබරව ගැළපෙන ලෙස කළමනාකරණය කරමු. කාර්යක්ෂම සන්නිවේදනය හරහා, සියලු අදහස් පිළිගෙන විවිධ දෘෂ්ටිකෝණ සැලකිල්ලට ගන්නා බවට අපි සහතික වෙමු. මෙම ප්‍රවේශය සියලු සම්බන්ධතා මට්ටම්වල විශ්වාසය, විනිවිදභාවය සහ සාර්ථකත්වය ප්‍රවර්ධනය කරයි.

මෙම ක්‍රියාවලිය හුදෙක් ගනුදෙනු කිරීමේ ක්‍රියාවලියක් පමණක් නොව, සියලුම කොටස්කරුවන්ගේ විවිධ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් සමබර කරන විශිෂ්ට වෘත්තීය ක්‍රියාවලියකි. අපගේ පළපුරුද්ද සහ කැපවීම උපයෝගී කරගනිමින්, අපි විභව අභියෝග වර්ධනය සහ සහයෝගීතාවය සඳහා අවස්ථා බවට පත් කරමු. අපි ඉදිරියට ගමන් කරමින් සම්බන්ධතාවය සහ අවබෝධය මූලික කරගත් මෙම වැදගත් ක්‍රියාවලියට අප සමඟ එක්වීමට ඔබට ආරාධනා කරමු. එකට එක් ව, අපගේ වටිනාකම් නිර්මාණය කෙරෙහි දිගු කාලීන බලපෑමක් ඇති කරන පාර්ශ්ව කළමනාකරණ රාමුවක් ලබා දීම අපගේ අරමුණයි.

අපි අපගේ ව්‍යාපාරික පරිසරය පිළිබඳ දැඩි අවධානයක් පවත්වා ගෙන යන අතර, අපගේ වත්මන් පාර්ශ්වකරුවන්ගේ බල ගතිකත්වයේ සහ අවශ්‍යතාවල කිසියම් වෙනසක් අපේක්ෂා කරන අතරම, නැගී එන පාර්ශ්වකරුවන් පැන නඟින විට ඔවුන් හඳුනා ගැනීමක් සිදු කරයි.

අපගේ උපායමාර්ගික ප්‍රවේශයේ ප්‍රධාන මෙවලමක් වන්නේ කොටස්කරුවන්ගේ හඳුනාගැනීමයි. එය අපගේ ව්‍යාපාර ආකෘතියට සම්බන්ධව එක් එක් කොටස්කරුවන් සතු බලතල සහ උනන්දු මට්ටම තක්සේරු කිරීමට අපට හැකියාව ලබා දෙන අතර, අපගේ තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි ඔවුන් සතුව තිබිය යුතු සුදුසු බලපෑමේ මට්ටම තීරණය කිරීමට උපකාරී වේ. ඒ අනුව අපි ඔවුන්ගේ සහභාගීත්වයට ප්‍රමුඛත්වය පිළිබඳ ව සලකා බලයි.

අපි අපගේ ව්‍යාපාර අරමුණු සඳහා පාර්ශවකරුවන්ගේ බලපෑම සහ සම්බන්ධතාවය අනුව ඔවුන්ගේ ගැටළු සහ අපේක්ෂාවන් ඇගයීම සිදුකරයි. මෙම තක්සේරුව මඟින් සෑම පාර්ශවකරුවන් කණ්ඩායමක් සමඟම ශක්තිමත්, සහයෝගී සබඳතා ප්‍රවර්ධනය කරන ඉලක්කගත උපාය මාර්ග සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට අපට හැකියාව ලැබේ. අපගේ ප්‍රධාන අරමුණ වන්නේ අර්ථවත්, දිගුකාලීන සම්බන්ධතා ගොඩනගා ගැනීම, පාර්ශවකරුවන් සමාජයේ වටිනා සාමාජිකයින් ලෙස හඳුනාගැනීම,ගෞරවයට ලක්ව ක්‍රියාශීලිව ඇතුලත් කර ඇති බව සහතික කිරීමයි.

| පාර්ශවකරු | අරමුණු | උනන්දුව දක්වන මට්ටම | බල මට්ටම |
|---|---|---|---|
| කොටස්කරුවන් | ආයෝජකයාගේ තොරතුරු සහ ආයෝජනයේ ප්‍රතිලාභ ලබා දීම. | ඉහළ | ඉහළ |
| ගනුදෙනුකරුවන් | ගුණාත්මක නිෂ්පාදනයක් සඳහා ප්‍රවේශය ලබා දීම. | ඉහළ | ඉහළ |
| නියාමකයින් | අනුකූල වීම | ඉහළ | ඉහළ |
| සේවකයින් | සවිබල ගන්වන ලද, සෞඛ්‍ය සහ ආරක්ෂිත පරිසරයක් ලබා දීම. | ඉහළ | ඉහළ |
| ප්‍රජාව | තිරසාර සම්බන්ධතාවය. | මධ්‍යම | පහළ |
| සැපයුම්කරුවන් සහ සේවාසපයන්නන් | වඩා හොඳ මූලාශ්‍ර සඳහා වෘත්තීය සම්බන්ධතාවය | මධ්‍යම | ඉහළ |

● ඉහළ　● මධ්‍යම　● පහළ

### පාරිභෝගිකයන්

- බෙදුම්කරුවන්
- කෘෂි රසායන/ ලිහිසි තෙල් ගබඩාකරුවන්
- රජයේ ආයතන
- ආයතනික පාරිභෝගිකයන්
- විදේශීය පාරිභෝගිකයන්
- පුද්ගලික පාරිභෝගිකයන්

### හිමිකරුවන්

- මහා භාණ්ඩාගාරය
- බලශක්ති අමාත්‍යාංශය

### නියාමකවරු

- බලශක්ති අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා රේගුව/ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- කම්කරු අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය/ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය
- මුදල් අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා මහ බැංකුව
- රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාව
- වරාය අධිකාරිය
- ප්‍රාදේශිය සහ පළාත් පාලන ආයතන

### සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන්

- ඉන්ධන සැපයුම්කරුවන්
- බැංකු
- දේශීය භාණ්ඩ/සේවා සැපයුම්කරුවන්
- ප්‍රවාහන අවශ්‍යතා සැපයුම්කරුවන්
- උපයෝගිතා සහ අනෙකුත් සේවා සපයන්නන්

### ප්‍රජාව

- මහජනයා
- ප්‍රජා සංවිධාන
- මාධ්‍ය
- පරිසර සංවිධාන

### සේවකයන්

| කාණ්ඩය | සහභාගිත්ව යාන්ත්‍රණය | මතු වූ ගැටළු | අපගේ ප්‍රතිචාර |
|---|---|---|---|
| **හිමිකරුවන්** | මාසික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.<br><br>වාර්ෂික මූල්‍ය ප්‍රකාශන.<br><br>වාර්ෂික වාර්තාව.<br><br>ආයතනික වෙබ් අඩවිය. | කාලානුරූපී මූල්‍ය කාර්ය සාධනය සමාලෝචනය.<br><br>මූල්‍ය වාර්තා හෙළිදරව් කිරීම.<br><br>අනාගත වර්ධනය සහ ඉදිරි දැක්ම | නියමිත වේලාවට මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු ඉදිරිපත් කිරීම හා ආයතනික වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම. |
| **පාරිභෝගිකයන්** | නිෂ්පාදන, ප්‍රවර්ධන ව්‍යාපාර පිරවුම්හල් හරහා සම්බන්ධ වීම.<br><br>ඉන්ධන පිරවුම්හල් හරහා සම්බන්ධ වීම.<br><br>පාරිභෝගික තෘප්තිය පිළිබඳ සමීක්ෂණ.<br><br>අලෙවිකරණ ක්‍රියාවලි හරහා සන්නිවේදනය.<br><br>ප්‍රාදේශීය කාර්යාල මගින් මාර්ගගත සහ ප්‍රාදේශීය වශයෙන් සම්බන්ධ වීම. | පහසුව සහ ප්‍රවේශය.<br><br>බෙදාහැරීමේ ප්‍රමුඛතාව.<br><br>නිෂ්පාදන ගුණාත්මකභාවය.<br><br>දැරිය හැකි මිල.<br><br>පාරිභෝගික ආරක්ෂණ සේවා . | පහසු ප්‍රවේශයක් ලබා දීම සඳහා දිවයින පුරා පැතිරුණු බෙදාහැරීමේ ජාලය අප විසින් ශක්තිමත් කර ඇත.<br><br>පාරිභෝගික පැමිණිලිවලට සහභාගී වී වහාම ඒවා විසඳීමට පාරිභෝගික සේවා ඒකකය ශක්තිමත් කිරීම.<br><br>වැඩි දියුණු කළ තොරතුරු පද්ධති. |
| **නියාමකවරු** | වරින් වර සාකච්ඡා පැවැත්වීම හා රජයට සහ නියාමකවරුන්ට වාර්තා කිරීම.<br><br>සංස්ථාවේ කාර්යසාධනය සහ අනුකූලතා පිළිබඳ කාලානුරූපී වාර්තාකරණ පද්ධතිය.<br><br>රාජ්‍ය මූල්‍ය/සාර්ව ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සඳහා කාලෝචිත තොරතුරු රජයට ඉදිරිපත් කිරීම. | යහපාලනය.<br><br>රෙගුලාසිවලට අනුකූල වීම.<br><br>බදු ප්‍රතිපත්තිවලට අනුකූල වීම.<br><br>පාරිසරික ආරක්ෂාව තහවුරු කිරීම. | අපි නියාමකවරු විසින් ඉල්ලා සිටින තොරතුරු ඉදිරිපත් කරන අතර කර්මාන්ත සංවර්ධනය දිරිමත් කිරීම සඳහා නියාමකවරු සමඟ විවෘත සංවාදයක් පවත්වන්නෙමු. |
| **සේවකයන්** | කාර්යසාධනය ඇගයීම.<br><br>සේවක සහභාගිත්ව ක්‍රියාකාරකම්.<br><br>වෘත්තීය සමිති සමඟ රැස්වීම් .<br><br>ක්‍රීඩා සහ අනෙකුත් අංශ<br><br>කාර්ය මණ්ඩල සුභසාධන පහසුකම්. | තරඟකාරී වේතන යෝජනා ක්‍රමය.<br><br>රැකියා සුරක්ෂිතභාවය<br><br>කුසලතා සහ දැනුම වර්ධනය.<br><br>ආරක්ෂිත සේවා ස්ථානයක් .<br><br>වෘත්තීය ප්‍රගතිය සහ අනුප්‍රාප්තිය | අපි අඛණ්ඩ පුහුණු සහ සංවර්ධන අවස්ථා, කර්මාන්තයේ ප්‍රමිතීන්ට අනුකූලව ආකර්ෂණීය ප්‍රතිලාභ පද්ධතියක්, ආරක්ෂිත සේවා පරිසරක් සපයන අතර පූර්ණ වශයෙන් නියැලී සිටින ශ්‍රම බලකායක් සංවර්ධනය කරන්නෙමු. |
| **ප්‍රජාව** | ප්‍රාදේශීය කාර්යාල සමග සම්බන්ධවීම.<br><br>CSR හි ක්‍රියාකාරකම් සහ අනුග්‍රහය දැක්වීම.<br><br>මාධ්‍ය සහ අනෙකුත් සමාජ සිදුවීම්. | රැකියා අවස්ථා<br><br>නිෂ්පාදනය සඳහා ප්‍රවේශය .<br><br>ආර්ථික සහ සමාජීය බලපෑම .<br><br>ආයතනික සමාජ වගකීම් සම්බන්ධ ක්‍රියාකාරකම්.<br><br>අනුග්‍රාහකත්වය. | ප්‍රජාවන් සමඟ සුහද සබඳතාවක් ගොඩ නඟා ගැනීම.<br><br>සවිබල ගැන්වීම සහ ජීවන තත්ත්වය ඉහළ නංවාලීම. |
| **සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන්** | විනිවිදභාවයෙන් යුතු ලංසු ක්‍රියාවලිය.<br><br>සැපයුම්කරු ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය.<br><br>විධිමත් රැස්වීම්, ලිඛිත සන්නිවේදනය සහ සබඳතා කළමනාකරණය . | දිගුකාලීන හවුල්කාරිත්වය.<br><br>නියමිත කාල සීමා තුළ පියවීම්.<br><br>ප්‍රසම්පාදන. මාර්ගෝපදේශ පිළිපැදීම.<br><br>රෙගුලාසිවලට අනුකූල වීම. | දිගු කාලීන යහපත් සබඳතා දිරිමත් කිරීම.<br><br>නියමිත කාල සීමා තුළ පියවීම්.<br><br>නිෂ්පාදන සහ සේවාවන්හි තිරසරභාවය සහ තත්ව ප්‍රමිතීන් සහතික කිරීම. |

# තිරසාරභාවය පිළිබඳ වාර්තාව

ඛනිජ තෙල් අංශය තුළ තිරසාරභාවය පිළිබඳ සංස්ථාවෙහි ප්‍රගතිය නවෝත්පාදනයන් සහ ආයතනික වගකීමේ ශක්තිමත් ඒකාබද්ධතාවයක් පිළිබිඹු කරයි. සෑම මෙහෙයුම් මට්ටමකදීම, සංස්ථාව පාරිසරික භාරකාරත්වයට ප්‍රමුඛත්වය දෙන අතර වර්ධනය තිරසාරභාවය සමඟ සමතුලිත කරන අනාගතයක් කරා කටයුතු කරයි. සෑම තෙල් ඒකකයක්ම බලශක්තිය සහ ප්‍රගතිය පමණක් නොව වගකිවයුතු පරිභෝජනය සඳහා කැපවීමක් ද නියෝජනය කරයි. කාබන් විමෝචනය අඩු කිරීමට සහ තිරසාර බලශක්ති භාවිතයන් ප්‍රවර්ධනය කිරීමට දරන උත්සාහයන් තුළින්, සංස්ථාව හරිත අනාගතයක් සඳහා එහි අඛණ්ඩ කැපවීම පෙන්නුම් කරයි. වේගයෙන් වෙනස් වන කර්මාන්තයක, සංස්ථාව ආදර්ශයෙන් ඉදිරියට යයි.

සංස්ථාව ජාතික බලශක්තිය සැපයීම පමණක් නොව, වක්‍ර වශයෙන් රැකියා අවස්ථා හරහා පුද්ගලයින් 15,000 කට අධික සංඛ්‍යාවකට රැකියා නිර්මාණයටද වැදගත් කාර්යයක් ඉටුකරයි. අපගේ පුළුල් අලෙවි නියෝජිත ජාලය මෙන්ම ලිහිසි තෙල් සහ කෘෂිකාර්මික තොග බෙදාහරින්න් හරහා අපි ප්‍රජාවන් සවිබල ගන්වන සහ ජාතික ආර්ථිකයට අර්ථවත් දායකත්වයක් ලබා දීමට කටයුතු කරමු.

ශ්‍රී ලංකාවේ භූමිතෙල් සපයන එකම සැපයුම්කරු ලෙස, අඩු ආදායම්ලාභී පවුල් සහ ධීවර ප්‍රජාවට සහාය වීම සඳහා සංස්ථාව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ආර්ථික සහන සහ පැවැත්ම සඳහා වන තිරණාත්මක අවශ්‍යතාවය අපි තේරුම් ගෙන ඇති අතර එය මත වැඩිපුරම යැපෙන ප්‍රජාවට මෙම අත්‍යාවශ්‍ය සම්පත් විශ්වාසදායක ප්‍රවේශයක් සහතික කිරීමට අපි කැපවී සිටිමු.

පිරිපහදු කිරීමේ ක්‍රියාවලියේදී මුදා හරිනු ලබන ඛනිජ රසායනික ද්‍රව්‍ය සහ කෘෂිරසායන මඟින් නිපදවන අන්තරායකර රසායනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ තීරණාත්මක වගකීම සංස්ථාව විසින් භාරගෙන ඇත. අපගේ මෙහෙයුම් අපගේ ක්‍රියාපටිපාටි සහ භාවිතයන්හි පදනම තිරසාර ප්‍රතිපත්ති මගින් මෙහෙයවනු ලබන අතර පාරිසරික වගකීම සඳහා අපගේ නොසැලෙන කැපවීම පිළිබිඹු කරයි. ප්‍රමිතිගත ප්‍රොටකෝලයක් අනුගමනය කිරීම හරහා අපි හරිත, වැඩිදියුණු තිරසාර අනාගතයක් සඳහා අර්ථවත් පියවර ගනිමින් සිටිමු.

සංස්ථාව එහි පිරිපහදු මෙහෙයුම් වලදී සැලකිය යුතු ජල ප්‍රමාණයක් භාවිතා කරන අතර, භාවිතා කළ ජලය පරිසරයට පිරිපහදු කිරීම සහ ආරක්ෂිතව බැහැර කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල වීම ගැන අපි ආඩම්බර වෙමු. විශේෂයෙන්, අපි සියලුම පාරිසරික නීති සහ රෙගුලාසි සමඟ පූර්ණ අනුකූලතාවයක් පවත්වා ගෙන ගොස් ඇති අතර එහි කිසිදු උල්ලංඝනයක් වාර්තා වී නොමැත. පාරිසරික, සමාජීය සහ පාලන (ESG) මූලධර්ම කෙරෙහි අපගේ දැඩි අවධානය, තිරසාරභාවය සහ වගකිවයුතු ආයතනික භාවිතයන් සඳහා අපගේ අඛණ්ඩ කැපවීම අවධාරණය කරයි.

## තිරසාර සංවර්ධන ඉලක්ක

තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වර්තමානයේ සහ අනාගත පරම්පරාවන් සඳහා ජනතාවට සහ ලෝකයට සාමය සහ සමෘද්ධිය ඇති කිරීම අරමුණු කරගත් ඒකාබද්ධ රාමුවක් සපයයි. අන්තර් සම්බන්ධිත ඉලක්ක 17 කින් සමන්විත SDGs, සහයෝගී ගෝලීය හවුල්කාරිත්වයක් හරහා සියලු ජාතීන් විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට අත්‍යවශ්‍ය වේ. දරිද්‍රතාවය තුරන් කිරීම, සෞඛ්‍යය හා අධ්‍යාපනය වැඩිදියුණු කිරීම, අසමානතාවය අඩු කිරීම සහ ආර්ථික වර්ධනය මෙහෙයවීම සමඟ අත්වැල් බැඳගෙන යන බවත්, දේශගුණික විපර්යාස සහ සාගර හා වනාන්තර ආරක්ෂා කිරීම වැනි අභියෝගවලට මුහුණ දෙන බවත් ඔවුන් හඳුනා ගනී.

වගකිවයුතු රජයේ ආයතනයක් ලෙස, කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන මුලපිරීම් හරහා අපගේ උපායමාර්ගික සැලසුම්කරණයට ඇතුලත් කිරීම මඟින් තිරසාරසංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරීව දායක වේ. මෙම උපාය මාර්ග පුළුල් සංවර්ධන න්‍යාය පත්‍ර සමඟ සමපාත වන අතර **SDGs** සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ.

**පාරිසරික සමාජීය හා පාලන නිර්ණායක**

**පාරිසරික**

- ජල කාර්යක්ෂමතාව
- බලශක්ති කාර්යක්ෂමතාව
- ජෛව විවිධත්වය
- පාරිසරික කළමනාකරණය
- හානිදායක රසායනික බැහැර කිරීම
- වටිනාකම් දාමයේ කාර්යක්ෂම ක්‍රියාපටිපාටි

**සමාජීය**

- සෞඛ්‍ය සහ ආරක්ෂාව
- සමානාත්මතාවය සහිත අවකාශය
- මානව හිමිකම්
- නිෂ්පාදිත වගකීම
- ප්‍රජා ආයෝජනය
- ගැටුම් කළමනාකරණය

**යහ පාලනය**

- ව්‍යාපාරික ආචාර ධර්ම
- අනුකූලතාව
- පාලන ව්‍යුහය
- තිරසාර උපාය මාර්ග
- අධක්ෂමණ්ඩල ව්‍යුහය
- ආයතනික ආචාර ධර්ම

සංස්ථාව පුද්ගලයන් 1,972 දෙනෙකුගෙන් යුත් විවිධ ශ්‍රම බලකායක් සේවයේ යොදවා ඇති අතර, සාධාරණ ගෙවීම සහතික කරමින් ඔවුන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම සඳහා රුපියල් බිලියන 6,896 වෙන් කර ඇත. ඊට අමතර ව ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල යහපැවැත්මට සහාය වීම සඳහා ණය යෝජනා ක්‍රම සහ වෛද්‍ය පහසුකම් ඇතුළු සුභසාධන මුලපිරීම් රාශියක් ඉදිරිපත් කර ඇත. සෘජු රැකියාවලට අමතරව, සංස්ථාව එහි පුළුල් බෙදාහැරීමේ ජාලය හරහා දිවයින පුරා වක්‍ර රැකියා අවස්ථා 15,000 කට අධික ප්‍රමාණයක් උත්පාදනය කරන අතර දරිද්‍රතාවය අඩු කිරීමේ ජාතික උත්සාහයන්ට අර්ථවත් ලෙස දායක වේ.

ඛනිජ තෙල් නිෂ්පාදන හා සම්බන්ධ ආවේණික සෞඛ්‍ය සහ ආරක්ෂක අවදානම් සැලකිල්ලට ගෙන, සේවකයින්ට සහ පුළුල් ප්‍රජාවට ආරක්ෂිත සහ සුරක්ෂිත පරිසරයක් සහතික කිරීම සඳහා සංස්ථාව කඩිනම් පියවර ක්‍රියාත්මක කර ඇත. පාරිසරික උපද්‍රව ඵලදායී ලෙස අවම කිරීම සඳහා පිරිපහදුව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වේ. එලෙසම , කෘෂි රසායනික අංශය ආරක්ෂිතව හැසිරවීම සහ මෙහෙයුම් සහතික කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂක ප්‍රමිතීන් පවත්වාගෙන යයි.

තවද, සංස්ථාව එහි සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සෞඛ්‍ය සහ යහපැවැත්මට සහාය වීම සඳහා විවිධ වූ නිරීක්ෂණයක හරහා කර ඇති ප්‍රතිලාභ පරාසයක් සපයනු ලබයි. මේවාට පුළුල් වෛද්‍ය ආවරණය, පාරිතෝෂික දීමනාව, මාතෘ නිවාඩු සහ සමස්ත යහපැවැත්ම සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් වෙනත් ආධාරක ප්‍රයන්ත ඇතුලත් වේ.

සංස්ථාව සමාන අවස්ථා සේවා යෝජකයෙකු වන අතර ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ඇඩි වෙනස්කම් නොකිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරයි. සියලුම සේවකයින්ට සමාන ප්‍රතිලාභ පද්ධතියක් යටතේ සාධාරණ ලෙස සලකනු ලබන අතර, එකම රැකියා භූමිකාවන් ඉටු කරන පිරිමින් සහ කාන්තාවන් සඳහා සමාන වැටුප් ගෙවීම (1:1) සහතික කරයි. මෙම ප්‍රවේශය අදාළ වන සියලුම ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතා සමඟ සම්පූර්ණයෙන්ම සමපාත වේ.

පුද්ගලයන්ගේ ජීවනෝපායයන් ඉහළ නැංවීම සහ ආර්ථික ක්‍රියාකාරකම් වලට සහාය වීමට මෙන්ම ජාතියේ බලශක්ති සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම සඳහා නිෂ්පාදන සහනදායී මිල ගණන් යටතේ ලබාදෙනු ලැබේ. ඉහළ තත්වයේ ප්‍රමිතීන්ට අනුකූල ඛනිජ තෙල් නිෂ්පාදන පාරිභෝගිකයන්ට ලැබෙන බව සහතික කිරීම සඳහා ස්ථාපිත ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක වේ.

සංස්ථාව විවිධ බදු සහ තීරුබදු හරහා රුපියල් බිලියන 277.88 ක සැලකිය යුතු මූල්‍ය දායකත්වයක් රජයට ලබා දී ඇති අතර එමගින් රටේ ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඊට අමතරව, 55% කට අධික ඉන්ධන අවශ්‍යතාවයක් පිරිමසා ගැනීම සහතික කර ඇති අතර ආර්ථික සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය බලශක්ති ලබා ගැනීමේ හැකියාව ශක්තිමත් කරන ලදි. පිරිපහදුව සංස්ථාවේ විකුණුම්වලින් 40% ඉක්මවන ආර්ථික වටිනාකමක් ජනනය කිරීමෙන් ජාතික ආර්ථිකයටද ධනාත්මක බලපෑමක් ඇති කර තිබේ.

අපි උසස් තත්වයෙන් යුත් විශ්වාසනීය, තිරසාර යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට කැපවී සිටිමු. මෙමඟින් ආර්ථික වර්ධනය පෝෂණය කිරීම සහ මානව යහපැවැත්ම වර්ධනය කරන අතර සියළු දෙනාට පහසු හා සාධාරණ ප්‍රවේශය සහතික කරයි.අපගේ මෙහෙයුම් ධාරිතාව සහ කාර්යක්ෂමතාවය ශක්තිමත් කිරීම අරමුණු කරගත් මධ්‍යම හා දිගුකාලීන උපායමාර්ග ව්‍යාපෘති මාලාවක් සංස්ථාව ක්‍රියාකාරීව සැලැසුම් කර ක්‍රියාත්මක කරයි.මෙම උත්සාහයන්ට සහය වීම සඳහා මෙම මූල්‍ය වර්ෂය තුල ස්ථාවර වත්කම් සඳහා රු.බිලියන 2.6 ක ආයෝජනයක් කර තිබුණි.

පිරිපහදු සහ කෘෂි රසායනික අංශ තුළ මෙහෙයුම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, සංස්ථාව ඔවුන්ගේ මුළු ජීවන චක්‍රය පුරාම රසායනික ද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය පාරිසරික වශයෙන් වගකිවයුතු කළමනාකරණයට කැපවී සිටී. ස්ථාපිත ජාත්‍යන්තර රාමුවලට අනුකූලව, මිනිස් සෞඛ්‍යයට සහ පරිසරයට ඇති විය හැකි හානිය අවම කරමින් වාතය, ජලය සහ පසට ශූන්‍ය විසර්ජනයක් ලබා ගැනීමට අපි උත්සාහ කරමු. අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණය කර බැහැර කරනු ලබන්නේ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව සහ අදාළ සියලු නීති සහ රීති වලට අනුගත වෙමින් වන අතර තිරසාර නිෂ්පාදන පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සහ වගකිවයුතු පරිභෝජනයකට සහාය වීම සඳහා සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිත කිරීමට සංස්ථාව ප්‍රමුඛත්වය දෙයි. පාරිසරික සංරක්ෂණය පිළිබඳව අපගේ කැපවීමේ කොටසක් ලෙස යූරෝ 4 ප්‍රමිතියෙන් යුත් ඩීසල් සහ පෙට්‍රල් හඳුන්වා දී ඇති අතර .මෙමඟින් පිරිසිදු හා වැඩිකාර්යක්ෂමතාවයකින් යුත් ඉන්ධන විකල්ප සපයන අතර එය තිරසාර ඉන්ධන භාවිතයට දායක වේ.

දේශගුණික ආශ්‍රිත උවදුරු සහ ස්වභාවික විපත් වල බලපෑම් අවම කිරීම සඳහා අපගේ උපායමාර්ගික සැලසුම්කරණයට අපි ක්‍රියාපටිපාටි සහ හොඳම භාවිතයන් ඒකාබද්ධ කර ඇත්තෙමු. අපගේ උපාය මාර්ග රජය විසින් ස්ථාපිත කරන ලද ජාතික දේශගුණික විපර්යාස මුලපිරීම් සමඟ ඒකාබද්ධ වන අතර වගකිවයුතු ප්‍රවේශයක් සහතික කරයි. ඊට අමතරව, පූර්වගාමී පියවර දිරිමත් කිරීම සහ සූදානම ශක්තිමත් කිරීම සඳහා පිරිපහදු නිලධාරීන් සඳහා පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් නිතිපතා පවත්වනු ලැබේ.

සංස්ථාව ශක්තිමත් ගුණාත්මකභාවය පිළිබඳ සහතික කිරීමේ ප්‍රොටෝකෝල ස්ථාපිත කර ඇති අතර එහි අරමුණ වන්නේ විභව ඉන්ධන කාන්දුවීම හඳුනාගෙන ඒවා වලක්වා ගැනීම බව සහතික කරමින් පාරිසරික හා මෙහෙයුම් ආරක්ෂාව පිළිබඳ ඉහලම ප්‍රමිතීන් නිර්ණය කිරීමයි. තෙල් කාන්දු වීමේ අවදානම අවම කිරීම සඳහා ප්‍රවාහනය, ගබඩා කිරීම සහ බෙදා හැරීම යන සියලුම තීරණාත්මක අවස්ථා වලදී පුළුල් ගුණාත්මක සහ නියාමන තක්සේරු කිරීම් සිදු කරනු ලැබේ. ජාත්‍යන්තර තෙල් දූෂණ වන්දි අරමුදලේ (IOPC) සාමාජිකයෙකු ලෙස,ටැංකි ආශ්‍රිත තෙල් කාන්දුවීම මඟින් සිදුවන පරිසර දූෂණ සඳහා ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමට සංස්ථාව ස්ථානගත වී ඇති අතර ජලය අපවිත්‍ර වීම වැළැක්වීම සහ අවම කිරීම සඳහා කාලෝචිත ක්‍රියාමාර්ග අනුගමනය කරයි.

ස්ථාපිත ප්‍රමිතීන්ට අනුකූලව කෘෂි රසායනික නිෂ්පාදන තිරසාර ලෙස නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම සඳහා අපි කැපවී සිටිමු. මෙම කැපවීමට සහාය වීම සඳහා සියලුම ආකාරයේ ජීවිත හානි වලක්වා පරිසර දූෂණය ශූන්‍ය බව සහතික කරන ලද විස්තීර්ණ තොරතුරු සහ පුහුණු වැඩසටහන් අපි ඉදිරිපත් කරන ඇත.

# අවදානම් කළමනාකරණ වාර්තාව

ආයතනයක මෙහෙයුම් සහ මූල්‍ය කාර්ය සාධනයට මෙන්ම සමස්තයක් ලෙස රටේ කීර්ති නාමයට බලපෑම් කළ හැකි පුළුල් පරාසයක අවදානම් වලට ඛනිජ තෙල් කර්මාන්තයේ ආවේණික අවදානම සැලකිල්ලට ගෙන, ශක්තිමත් සමාජීය හා ආර්ථික පරිසරයක් පවත්වා ගැනීම සඳහා ඵලදායී අවදානම් කළමනාකරණය පිළිබඳ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ඛනිජ තෙල් කර්මාන්තයේ වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස, අපගේ ව්‍යාපාර මෙහෙයුම්වල අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා අවදානම් සහිත සියලු ක්ෂේත්‍ර ආවරණය කරන පුළුල් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම අපගේ සංස්ථාව පිළිගනී.

අඛණ්ඩව ක්‍රියාත්මක වන අපගේ සංස්ථා පිරිපහදුව සහ ගුවන් තෙල් අංශය, ඔවුන්ගේ මෙහෙයුම් වලට බලපෑම් කළ හැකි විවිධ අවදානම් වලට නිරාවරණය වේ. එබැවින්, මෙම අවදානම් හඳුනා ගැනීම සහ ඒවා අවම කිරීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීමේ වගකීම අපගේ සංස්ථාව සතුය.

## අවදානම් කළමනාකරණයේ අරමුණ

අවදානම් කළමනාකරණ පිළිවෙත් ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වන්නේ සංස්ථාව විභව අවදානම් වලින් ආරක්ෂා කිරීමයි. බාහිර සාධක, වෙළඳපල උච්චාවචනයන් සහ අභ්‍යන්තර අඩුපාඩු නිසා මෙම අවදානම් උද්ගත වේ. වර්ධනය සහ අවදානම අතර සියුම් සමතුලිතතාවයක් ඇති කර ගැනීම ඉතා වැදගත් වන අතර එමඟින් සංස්ථාවේ තිරසාර පැවැත්ම සහතික කෙරේ. ඒ සමඟම, මෙම පිළිවෙත් අපගේ සේවකයින්ගේ, ගනුදෙනුකරුවන්ගේ සහ සාමාන්‍ය ජනතාවගේ යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා නිර්මාණය කර ඇත. අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමෙන්, ඇතිවිය හැකි ඕනෑම අහිතකර සිදුවීම් වලින් සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම අපගේ අරමුණයි.

අපි උපද්‍රව හඳුනා ගැනීම උපායමාර්ගිකව අධීක්ෂණය කරන අතර ඒවා ශුන්‍ය හෝ පිළිගත හැකි මට්ටමකට අඩු කිරීමට කටයුතු කරන්නෙමු.

## අවදානම් කළමනාකරණ රාමුව

අපගේ සංස්ථාවට බලපාන ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම සඳහා අපගේ අවදානම් කළමනාකරණ රාමුව කල්තියා සකස් කර ඇත. මෙම අවදානම්වල බලපෑම අපි ඇගයීමට ලක් කර ජාතිය සඳහා විශ්වාසදායක බලශක්ති සැපයුමක් සහතික කිරීම සඳහා ඒවා ඵලදායී ලෙස කළමනාකරණය කරමු. අපගේ අවදානම් කළමනාකරණ රාමුවට පැහැදිලිව අර්ථ දක්වා ඇති භූමිකාවන් සහ වගකීම් සමඟ පුළුල් අවදානම් ප්‍රතිපත්ති ඇතුළත් වේ.

ඵලදායී අවදානම් කළමනාකරණ රාමුවක් සාර්ථකව ක්‍රියාත්මක කිරීම අපගේ මෙහෙයුම් බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයයි. 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත, 1971 අංක 38 දරන මූල්‍ය පනත, මූල්‍ය රෙගුලාසි, යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ, රාජ්‍ය ව්‍යවසායන් සඳහා හොඳම භාවිතයන් සහ අනෙකුත් අදාළ රෙගුලාසි ඇතුළු විවිධ නියාමන මෙවලම් මඟින් එය පදනම් වේ.



මෙම රෙගුලාසි අවදානම් හඳුනා ගැනීම, අධීක්ෂණය, කළමනාකරණය සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ශක්තිමත් රාමුවක් ස්ථාපිත කරයි.

සංස්ථාවෙහි අවදානම් කළමනාකරණ රාමුව ස්ථර තුනකින් යුත් ආරක්ෂක පද්ධතියකින් ශක්තිමත් වේ. පළමු ආරක්ෂක රේඛාව අපගේ ව්‍යාපාර සහ මෙහෙයුම් ඒකක වලින් සමන්විත වේ. දෙවන ආරක්ෂක රේඛාවට අපගේ අභ්‍යන්තර පාලන පද්ධතිය සහ අර්ථ දක්වා ඇති අවදානම් රුචිකත්වයට අනුකූලව අවදානම් කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා වගකිව යුතු නම් කරන ලද බලධාරීන් ඇතුළත් වේ. තෙවන ආරක්ෂක රේඛාවට අභ්‍යන්තර විගණනය, බාහිර විගණනය සහ වෙනත් අනුකූලතා ස්ථාපිත ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ නියාමන බැඳීම් පිළිපැදීම සහතික කිරීම සඳහා ඇතුළත් වේ.

## පළමු ආරක්ෂක පෙළ

ආරක්ෂක පෙළ තුළට නිරාවරණය වන ඕනෑම අවදානම් ඵලදායී ලෙස හඳුනාගෙන කළමනාකරණය කරන බව සහතික කිරීම සඳහා අවදානම් හඳුනා ගැනීම, කළමනාකරණය කිරීම සහ වාර්තා කිරීම සඳහා ව්‍යාපාර සහ මෙහෙයුම් අංශ වගකිව යුතුය.

## දෙවන ආරක්ෂක පෙළ

අදාළ පනත් සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව නිර්මාණය කර ඇති පැහැදිලිව අර්ථ දක්වා ඇති ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ඇතුළුව, සංස්ථාව පුළුල් අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක කර ඇත. මෙම පද්ධතිය සංස්ථාවට දෙවන ආරක්ෂක පෙළ හරහා සංස්ථාව හා සම්බන්ධ අවදානම් හඳුනා ගැනීමට, කළමනාකරණය කිරීමට සහ වැළැක්වීමට හැකියාව ලබා දෙයි.

## තෙවන ආරක්ෂක පෙළ

අභ්‍යන්තර සහ බාහිර විගණන කාර්යයන් තෙවන ආරක්ෂක පෙළ තුළ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මෙම කාර්යයන් මූල්‍ය හා මෙහෙයුම් පද්ධතිවල සැලසුම් සහ ක්‍රියාත්මක කිරීම අනුව ඒවායේ කාර්යක්ෂමතාව පරීක්ෂා කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවන ලද අවදානම් කළමනාකරණ කමිටුව, කලින් තීරණය කළ ඉලක්ක සහ අරමුණු සම්බන්ධයෙන් සැලකිය යුතු විගණන සොයාගැනීම්, කළමනාකරණ ප්‍රතිචාර සහ කාර්ය සාධනය පරීක්ෂා කිරීම සඳහා වගකිව යුතුය. ක්‍රමානුකූල අවදානම් පාලන රාමුව මඟින් අවදානම් හඳුනාගෙන, තක්සේරු කර, අවම කර සහ වාර්තා කර ඇති බව සහතික කරයි.

## ඉහළ මට්ටමේ ප්‍රතිචාර සහ අවදානම් පාලනය

සංස්ථාවේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම ඉතා වැදගත් වේ. පවතින ගෝලීය සහ දේශීය ආර්ථික, දේශපාලනික සහ සමාජීය තත්වයන් සැලකිය යුතු අවදානම් නිරන්තරයෙන් හඳුනාගෙන කළමනාකරණය කිරීම සඳහා ක්‍රියාකාරී උපාය මාර්ගයක අවශ්‍යතාවය ඉස්මතු කර ඇත.

සභාපතිවරයාගේ නායකත්වය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් කළමනාකරණය සඳහා මූලික වගකීම දරයි. අවදානම් කළමනාකරණ කමිටුවේ උත්සාහයන් මගින් මෙම වගකීම තවදුරටත් ශක්තිමත් වේ.




අවදානම් ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ සංවර්ධනය කිරීම මෙන්ම අවදානම් සහ ඒවායේ ආශ්‍රිත බලපෑම් අවම කිරීම සඳහා උපාය මාර්ග සකස් කිරීම සඳහා අවදානම් කළමනාකරණ කමිටුව වගකිව යුතුය.

අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවදානම් කළමනාකරණ මණ්ඩලයේ උප කමිටුවක් පිහිටුවන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරයි. මෙම කමිටුව අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වන අතර, අවදානම් ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සහය වන සහ උචිත පාලන සහ අවම කිරීමේ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කරන, සෑම ක්‍රියාකාරී ක්ෂේත්‍ර වලින් යුත් කළමනාකරුවන් සහ විධායක නිළධාරීන්ද ඇතුලත් වේ.අවදානම් කළමනාකරණ කමිටුවට පවරා ඇති ප්‍රාථමික රාජකාරි සහ වගකීම් පහත විස්තර කෙරේ.

### රාජකාරී හා වගකීම්

- ඔවුන් නිරාවරණය වන අවදානම් හඳුනා ගැනීම -එක් එක් මෙහෙයුම් සහ වාර්තාකරණ ප්‍රදේශවලට ගොස් නිරාවරණය වීමට ඉඩ ප්‍රස්ථාව ඇති සියලුම අවදානම් හඳුනා ගැනීම අවශ්‍ය වේ.
- ඇගයීම - නිරාවරණය වන අවදානම් ඇගයීම සහ අවදානම් සිදුවීමට ඇති සම්භාවිතාව සහ වාර ගණන තක්සේරු කිරීම.
- අවදානම් අවම කිරීමේ උපාය මාර්ග සකස් කිරීම - අවදානම් අවම කිරීමේ උපාය මාර්ග හඳුනාගෙන එක් එක් අවදානම් කාණ්ඩය සඳහා අවශ්‍ය උපාය මාර්ග සකස් කිරීම.
- ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය - අවදානම් කළමනාකරණය/අවම කිරීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සහ ඒවා අධීක්ෂණය කිරීම.

## අවදානම් කළමනාකරණ වැඩ රාමුව

සංස්ථාව , විවිධාකාර අවදානම් වලට ලක්වන අතර,විශේෂයෙන් ඛනිජ තෙල් නිෂ්පාදන ආශ්‍රිත සෞඛ්‍ය සහ සුරකුම් සම්බන්ධ අවදානම් වලට නිරාවරණය වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, සංස්ථාව විභව අවදානම් හඳුනා ගැනීම සඳහා ගැඹුරු විශ්ලේෂණයක් සිදු කරන අතර ආරක්ෂක රේඛා තුන හරහා ඒවා ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට සහ අවම කිරීමට උපාය මාර්ග ක්‍රියාත්මක කරයි. මෙම උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම හඳුනාගත් එක් එක් අවදානමේ සම්භාවිතාව සහ බරපතලකම මත රඳා පවතී. අවදානමක් නිසි ලෙස හඳුනාගත් පසු, සංස්ථාව එය වැළැක්වීමේ පියවර ක්‍රියාත්මක කිරීම හෝ අවදානම වෙනත් ආයතනයකට මාරු කිරීම හෝ විභව ප්‍රතිවිපාක පිළිගෙන ඒ අනුව සම්පත් වෙන් කිරීම සිදු කරනු ඇත.

| අවදානම් බලපෑම | | | | | |
|---|---|---|---|---|---|
| 5 | 5 | 10 | 15 | 20 | 25 |
| 4 | 4 | 8 | 12 | 16 | 20 |
| 3 | 3 | 6 | 9 | 12 | 15 |
| 2 | 2 | 4 | 6 | 8 | 10 |
| 1 | 1 | 2 | 3 | 4 | 5 |
| | 1 | 2 | 3 | 4 | 5 |

අවදානම් පැවැත්ම

| අවදානම් අනුපාතය | අවදානම් මට්ටම | සම්බන්ධ විය හැකි මට්ටම |
|---|---|---|
| 1 - 5 | ඉතා අවම | කාර්ය මණ්ඩලය/පහළ කළමනාකරණ මට්ටම |
| 6 - 11 | අවම | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම |
| 12-19 | මධ්‍යම | සංස්ථායික කළමනාකරණ මට්ටම |
| 20 -24 | ඉහළ | කළමනාකාර අධ්‍යක්ෂ |
| 25 | ඉතා ඉහළ | අධ්‍යක්ෂ මණ්ඩලය |

## අවදානම් අභිරුචිය

අවදානම් අභිරුචිය ව්‍යාපාර සහ අවදානම් ආශ්‍රිත ගැටළු කළමනාකරණය කිරීම සඳහා රාමුවක් ලෙස ක්‍රියා කරයි. මෙය අපගේ මෙහෙයුම් සඳහා අත්‍යවශ්‍ය යැයි සැලකෙන තීරණාත්මක අවදානම් කාණ්ඩ සඳහා සීමාවන් නිර්වචනය කරයි. ඛනිජ තෙල් නිෂ්පාදන හැසිරවීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අවදානම් වල ආවේනික ස්වභාවය මත පදනම්ව මෙම සීමාවන් තීරණය වේ. සංස්ථාව විසින් අපගේ මෙහෙයුම් සඳහා ප්‍රමාණාත්මක වශයෙන් බලපෑම් කිරීමේ හැකියාව ඇති විවිධ අවදානම් හඳුනා ගනී.

අපගේ ක්‍රියාකාරකම් සඳහා මෙම අවදානම්වල වැදගත්කම තක්සේරු කිරීම සඳහා සංස්ථාව විසින් ඒවා නම් කරන ලද අවදානම් අභිරුචිය සමඟ ගලපනු ලැබේ. තක්සේරු කරන ලද අවදානම් වල ප්‍රබලත්වය මත පදනම්ව, ඒවායේ සිදුවීම අවම කිරීම, අවදානම බාහිර පාර්ශවයකට මාරු කිරීම හෝ සම්පත් නිසි ලෙස වෙන් කිරීමේදී විභව ප්‍රතිඵල පිළිගැනීම සඳහා මෙම අවදානම් ඒවායේ ප්‍රබලත්වය මත පදනම්ව වර්ගීකරණය කරනු ලැබේ.

පුළුල් පරාසයක අවදානම් සාධකවලට නිරාවරණය වීම හේතුවෙන් පිරිපහදුවේ මෙහෙයුම් කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කෙරේ. පිරිපහදුව වසර පනහකට පෙර පිහිටුවන ලද බැවින්, එය විවිධ අවදානම් වලට විශේෂයෙන් ගොදුරු වන අතර, අවදානම් කළමනාකරණය එහි මෙහෙයුම් රාමුවේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත් කරයි.

මේ හා සමානවම, ගුවන් සේවා කාර්යය ක්‍රියාත්මක වන්නේ ක්‍රියාකාරී ගුවන් තොටුපළ පරිසරයන් තුළ වන අතර, ඒවා නිතැතින්ම බොහෝ අවදානම් වලට නිරාවරණය වේ. මෙම මෙහෙයුම් ක්ෂේත්‍ර දෙක ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සැලකිය යුතු අවදානම්වලට ලක්වන අතර, අවදානම් කළමනාකරණයට ප්‍රමුඛත්වය දීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි. තව දුරටත් කෘෂි රසායන අංශය සෞඛ්‍ය සහ ආරක්ෂක අවදානම් රැසකට නිරාවරණය වන අතර, එමඟින් අඛණ්ඩ ව්‍යාපාර මෙහෙයුම් පවත්වා ගැනීම සඳහා ශක්තිමත් අවදානම් කළමනාකරණ උපාය මාර්ග අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ.

## සංස්ථාව නිරාවරණය වන අවදානම් තත්ව

ඛනිජ තෙල් කර්මාන්තය සඳහා සෘජු හා වක්‍ර ප්‍රතිඵල ඇති කරන එහි මෙහෙයුම් හා බැඳි ප්‍රමාණාත්මක අවදානම් වල විස්තීරණ ඇගයීමක් සංස්ථාව විසින් සිදු කර ඇත. සංස්ථාව මුහුණ දෙන ප්‍රධාන අවදානම් පිළිබඳ සංක්ෂිප්ත දළ විශ්ලේෂණයක්, ස්ථාපිත කර ඇති අනුරූප අවදානම් කළමනාකරණ පියවරයන් මෙන්ම මෙම අවදානම් තවදුරටත් අවම කිරීම අරමුණු කරගත් උපාය මාර්ග සහිතව පහත දක්වා ඇත.

| | | |
|---|---|---|
| **ආර්ථික අවදානම**<br><br>ඛනිජ තෙල් නිෂ්පාදන ඇමරිකානු ඩොලර් භාවිත කරමින් ආනයනය කරනු ලබන අතර ආදායම උපයා ගනු ලබන්නේ ශ්‍රී ලංකා රුපියල් වලින් බැවින් රටේ උද්ධමන අනුපාතය ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරිත්වයට සැලකිය යුතු ලෙස බලපායි. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම නිෂ්පාදනවල අත්‍යාවශ්‍ය ස්වභාවය හේතුවෙන් ඛණිජ තෙල් මිලෙහි උච්චාවචනයන් ජාතික ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් ඇති කරයි.<br><br>උද්ධමනය, පොලී අනුපාත සහ විනිමය අනුපාතවල අහිතකර බලපෑම් නිෂ්පාදන පිරිවැය වැඩි කිරීමට හේතු වන අතර, සමස්ත වියදම් ඉහළ නංවා අවසානයේ ලාභදායිතාවයට බලපායි. වාර්ෂිකව ලීටර් බිලියන 4ක් පමණ වන අලෙවි ධාරිතාවය පිළිබඳව සැලකිල්ලට ගෙන මෙම ආර්ථික දර්ශකවල සුළු වෙනස්කම් වලට වුවද ලාභදායීත්වය කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කල හැකිය. | **අවම කිරීමේ සාධක**<br><br>♦ කාර්යක්ෂම පිරිවැය කළමනාකරණ මූලාශ්‍ර ක්‍රියාත්මක කිරීම.<br><br>♦ සියලුම නිෂ්පාදන සඳහා පාරදෘශ්‍ය මිලකරණ යාන්ත්‍රණයක් අනුගමනය කිරීම.<br><br>♦ ලිහිසි තෙල් සහ කෘෂි රසායනික වැනි නිෂ්පාදන සඳහා තරඟකාරී මිල ගණන් ඉදිරිපත් කිරීම. | **උපාය මාර්ග**<br><br>♦ සංස්ථාවේ ලාභදායිතාවය සහ වත්මන් සමාජ-ආර්ථික තත්ත්වයන් අතර ඵලදායී සමතුලිතතාවයක් ඇති කරන මිලකරණ උපාය මාර්ගයක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම. |
| **භාණ්ඩ මිල අවදානම**<br><br>ඛනිජ තෙල් සම්පත් ශ්‍රී ලංකාව සතුව නොපැවතින බැවින්, ශ්‍රී ලංකාව ගෝලීය වෙළඳපොළෙන් බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය මත විශ්වාසය තබයි.<br><br>මෙම අංශයට සාපේක්ෂව කුඩා ගැනුම්කරුවෙකු ලෙස, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ජාත්‍යන්තර සැපයුම්කරුවන් විසින් නියම කරන ලද මිලකරණයට යටත් වේ.<br><br>එහි ප්‍රතිඵලයක් ලෙස, භාණ්ඩ මිල උච්චාවචනයන්හි ආවේනික අවදානම් වලට සංස්ථාව නිරන්තරයෙන් නිරාවරණය වේ. ජාත්‍යන්තර තෙල් මිලෙහි අහිතකර වෙනස්කම් සංස්ථාවේ විකුණුම් පිරිවැය, ලාභදායිත්වය සහ මුදල් ප්‍රවාහයට අහිතකර ලෙස බලපෑ හැකිය. | **අවම කිරීමේ සාධක**<br><br>♦ මිල උච්චාවචනයන්ගේ වාසිය ලබා ගැනීමට සඳහා අඛණ්ඩ මිල නියාමනයක් ක්‍රියාත්මක කිරීම.<br><br>♦ තොග මිලදී ගැනීම සහ ගබඩා කිරීම සඳහා පිරිවැය-ඵලදායී ක්‍රම භාවිතා කිරීම. | **උපාය මාර්ග**<br><br>♦ ගෝලීය වෙළෙඳපොළ මිල පහත වැටෙන කාලවලදී තොග පවත්වා ගැනීමට ගබඩා ධාරිතාව පුළුල් කිරීම.<br><br>♦ ආශ්‍රිත පිරිවැය සියල්ල ඇතුළත් සියලු නිෂ්පාදන සඳහා වන විනිවිද භාවයෙන් යුතු මිලකරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.<br><br>♦ තරඟකාරිත්වයට ඉඩ සැලසෙන පරිදි සැපයුම්කරුවන් සංඛ්‍යාව වැඩි කිරීම. |
| **පොලී අනුපාත අවදානම**<br><br>පිරිවැය පිළිබිඹු කරන මිලකරණ සූත්‍රයක් හඳුන්වාදීම මඟින් සංස්ථාවට තිරසාර ලාභ උත්පාදනය කිරීමට හැකි වන අතර එමඟින් කොටස් ප්‍රාග්ධනයේ වර්ධනයට දායක වේ. ඊට අමතරව, ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයක් සහතික කිරීමෙන් එය ඵලදායී මූල්‍ය භාණ්ඩාගාර කළමනාකරණයට සහාය වන අතර, එමඟින් ආයතනයට නියමිත වේලාවට සැපයුම්කරුවන්ට ගෙවීමට සහ ගෙවීම් ප්‍රමාදයන් අවම කිරීමට සහය වේ.<br><br>සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රුපියල් මිලියන 1,175.13 ක මූල්‍ය පිරිවැයක් වාර්තා කළ අතර එය පෙර වසරට සාපේක්ෂව 6.3 ගුණයකින් අඩුවීමක් පිළිබිඹු වේ. මෙම දියුණුව තිබියදීත්, පොලී අනුපාතවල උච්චාවචනයන් සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනයට සැලකිය යුතු ලෙස බලපාන අතර ලාභදායිතාවයට අමතර පීඩනයක් ඇති කරයි. | **අවම කිරීමේ සාධක**<br><br>♦ වඩා අඩු පොලී අනුපාත ලබා ගැනීම සඳහා මූල්‍ය ආයතන සමඟ අඛණ්ඩ සාකච්ඡා පැවැත්වීම.<br><br>♦ පොලී උපයන මාර්ගවල ආයෝජනය සඳහා දෛනික අතිරික්ත මුදල් ශේෂයන් භාවිතා කිරීම. | **උපාය මාර්ග**<br><br>♦ ඇමරිකානු ඩොලර් මිලදී ගැනීම සඳහා ඉලෙක්ට්‍රොනික වෙළඳාමේ වේදිකාවක් අඛණ්ඩව පවත්වාගෙන යාම.<br><br>♦ වඩා අඩු පිරිවැයක් සහ දිගු කාලීන මූල්‍යකරණ විකල්ප ගවේෂණය කිරීම. |

| | | |
|---|---|---|
| **ද්‍රවශීලතා අවදානම**<br><br>සංස්ථාව සිය කෙටිකාලීන ගිවිසුම් සහ මූල්‍ය වගකීම් නියමිත වේලාවට හඳුනාගැනීමට අපොහොසත් වීම සැලකිය යුතු ද්‍රවශීලතා අවදානමක් ඇති කරයි. වගකීම් පියවීම ප්‍රමාද වීමෙන් අමතර පොලී පිරිවැයක් ඇති වන අතර මූල්‍ය සම්පත් තවදුරටත් දුර්වල තත්වයට පත්වේ.එපමණක් නොව, සැපයුම්කරුවන්ට නිසිවේලාවට ගෙවීම් කිරීමට අපොහොසත් වීම සංස්ථාවේ කීර්ති නාමයට සහ විශ්වසනීයත්වයට අහිතකර ලෙස බලපායි. | **අවම කිරීමේ සාධක**<br><br>♦ විවිධ කෙටිකාලීන සහ දිගුකාලීන අරමුදල් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.<br><br>♦ කල්පිරීමේ කාලසටහන්වලට අනුකූලව ද්‍රවශීලතා තත්ත්වය සහ කළමනාකරණය අඛණ්ඩව අධීක්ෂණය කිරීම.<br><br>♦ කාර්යක්ෂම එකතු කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම. | **උපාය මාර්ග**<br><br>♦ ණය කළමනාකරණ ප්‍රතිපත්තිය ප්‍රමිතිගත කිරීම.<br><br>♦ දිගුකාලීන අරමුදල් විකල්ප සඳහා අවස්ථා ගවේෂණය කිරීම.<br><br>♦ රජයෙන් ලැබිය යුතු සහනාධාර නිසි පරිදි ලබා ගැනීමට උත්සහ කිරීම. |
| **ආරක්ෂණ අවදානම**<br><br>ඛනිජ තෙල් නිෂ්පාදන වල ආවේණික දහනය සැලකිය යුතු ලෙස සෞඛ්‍ය සහ ආරක්ෂක අවදානම් ඇති කරයි. මෙම උපද්‍රව අවම කිරීම සඳහා, පිරිපහදුව ජාත්‍යන්තරව පිළිගත් සෞඛ්‍ය සහ ආරක්ෂක ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරයි.අනුකූලතාවය සහතික කිරීම සහ ශක්තිමත් ආරක්ෂක පිළිවෙත් පවත්වා ගැනීම සඳහා නිතිපතා පරීක්ෂණ සහ අඛණ්ඩ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. ඒ හා සමානව, පැය 24 පුරාම ක්‍රියාත්මක වන ගුවන් තොටුපළ මෙහෙයුම් හේතුවෙන් ගුවන් සේවා කර්මාන්තය සැලකිය යුතු අභියෝගවලට මුහුණ දෙයි. ආරක්ෂක රෙගුලාසිවලට අනුකූල වීමට අපොහොසත් වීම ව්‍යාපාරික මෙහෙයුම්වලට දැඩි ලෙස බලපෑ හැකි අතර, ආයතනික වත්කම් සහ මානව සම්පත අනතුරේ හෙළීමට හේතු විය හැකි අතර දඩ, දඬුවම් සහ විහව මෙහෙයුම් සීමාවන් හරහා සැලකිය යුතු පිරිවැයක් දැරීමට හේතු විය හැකි ය. | **අවම කිරීමේ සාධක**<br><br>♦ සෞඛ්‍ය සහ ආරක්ෂක සඳහා වන දැඩි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීම.<br><br>♦ ගිනි ආරක්ෂාව සහ සෞඛ්‍ය ක්‍රියාපටිපාටි පිළිබඳව කාර්ය මණ්ඩලයට නිර්න්තරයෙන් පුහුණුවක් ලබා දීම.<br><br>♦ ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම තහවුරු කිරීම සඳහා අඛණ්ඩ නඩත්තු කටයුතු පවත්වා ගැනීම.<br><br>♦ පිරිපහදුව එහි වත්කම් නඩත්තු කිරීම සඳහා සෑම වසර තුනකට වරක් ප්‍රධාන අළුත්වැඩියා කිරීම් ක්‍රියාත්මක කිරීම. | **උපාය මාර්ග**<br><br>♦ අභ්‍යන්තරව සහ බාහිරව ක්‍රියාත්මක වන කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් ව්‍යුහගත සහ ව්‍යුහගත නොවන ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම.<br><br>♦ නවීනතම තාක්ෂණික ප්‍රවර්ධන ඇතුළත් කිරීම සඳහා පිරිපහදුව අඛණ්ඩව වැඩිදියුණු කිරීම.<br><br>♦ මෙහෙයුම් සඳහා ISO සහ SLS වැනි ගුණාත්මකභාවය සහ ආරක්ෂාව සම්න්ධද සහතික ලබා ගැනීමට/පවත්වා ගැනීමට උත්සුක වීම. |
| **තොරතුරු තාක්ෂණ (IT) අවදානම**<br><br>කඩිනම් සහ නිරවද්‍ය කළමණාකර තීරණ ගැනීමෙහිලා විශ්වාසනීය තොරාතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම තීරණාත්මක කරුණකි. වෙළඳපොලේ තරඟකාරී ස්ථානයක් පවත්වා ගැනීමට තත්කාලීන මාර්ගගත තොරතුරු සඳහා ප්‍රවේශය අත්‍යවශ්‍ය වේ. මෙම අවශ්‍යතාවය ස්වකීය වෙළඳපල කොටස වෙත ප්‍රවේශය සහ පවත්වා ගැනීම සඳහා තත්කාලීන තොරතුරු ලබා ගත හැකි වීම තීරණාත්මක වන දැඩි ලෙස තරඟකාරී ලිහිසි තෙල් සහ කෘෂි රසායන අංශ වලදී විශේෂයෙන් දැක ගත හැකිය | **අවම කිරීමේ සාධක**<br><br>♦ ආයතනය එහි කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) හරහා ගනුදෙනු නිවැරදිව ග්‍රහණය කර වාර්තා කිරීම සඳහා SAP ERP පද්ධතිය භාවිත කිරීම.<br><br>♦ පද්ධතිය භාවිතා කිරීමේ ප්‍රගුණාය තහවුරු කිරීමට ස්වකීය පරිශීලකයින්ට තොරතුරු තාක්ෂණ පුහුණුව ලබා දීම. නිරන්තරයෙන් තම පරිශීලකයින්ට අඛණ්ඩව තොරතුරු තාක්ෂණ පුහුණුව ලබා දීම.<br><br>♦ එහි කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය පවත්වා ගැනීම සඳහා ආයතනය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සඳහා නිරන්තරයෙන් ආයෝජනය කිරීම. | **උපාය මාර්ග**<br><br>♦ ස්වකීය මෙහෙයුම් උපරිම මට්ටමට ගෙන ඒමට නිෂ්පාදනාගාර මොඩියුලය, නිෂ්පාදන මොඩියුලය, මානව සම්පත් මොඩියුලය වැනි ආකෘති ක්‍රියාත්මක කිරීම ද ඇතුළු ව ERP පද්ධතියේ ඵලදායි භාවිතය වැඩි කිරීමට ආයතනය ඉලක්ක කරයි.<br><br>♦ දත්තවල එකාග්‍රතාවය සහ ආරාක්ෂාව තහවුරු කිරීමට SAP, ERP පද්ධතියේ යථා තත්වයන් පවත්වා ගැනීමට ආයතනය කටයුතු කරයි.<br><br>♦ වැඩි දියුණු කළ කාර්යයන් සහ ප්‍රවර්ධනයන්ගෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට පද්ධතිය වඩාත් ම නවීන මොඩියුලය දක්වා අඛණ්ඩ ව යාවත්කාලීන කිරීමට ආයතනය කටයුතු කරයි. |

| මානව සම්පත් අවදානම | අවම කිරීමේ සාධක | උපාය මාර්ග |
|---|---|---|
| සේවයේ නියුක්තව සිටින සේවකයින් සංස්ථාවට අත්‍යවශ්‍ය උපායමාර්ගික වත්කමක් වන අතර සුමට මෙහෙයුම් සහතික කිරීම සහ සංස්ථාවේ සම්පත් ආරක්ෂා කිරීම සඳහා ඔවුන් සමඟ ශක්තිමත්, ධනාත්මක සබඳතා වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. වටිනාකම් නිර්මාණය සඳහා පුද්ගල දායකත්වය හඳුනා ගන්නා සහ නීතිමය ආරවුල් අවදානම අවම කිරීමට උපකාරී වන පුළුල් හා තරඟකාරී සහන පැකේජයක් ලබා දීමෙන් දක්ෂ සේවකයින් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට සංස්ථාව කැපවී සිටී. ප්‍රමාණවත් නොවන ශ්‍රම බලකායක් හෝ එක් ගැටළුකාරී සේවකයෙකු සිටීම අහිතකර ගැටුම්වලට තුඩු දිය හැකි අතර, එහි ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදන සමඟ ගුණාත්මක ගැටළු, අකාර්යක්ෂම පාරිභෝගික සේවා සහ අවසානයේ, සංස්ථාවේ හි පිරිවැය සහ ලාභදායිතාවයට ඍණාත්මක ප්‍රතිවිපාක ඇති විය හැකිය. ඊට අමතරව, සේවකයින් සමඟ ගැටුම් පැවතීමෙන් සේවක කළමනාකරණය සහ සංස්ථාව සඳහා නීතිමය ක්‍රියාමාර්ගවලට අදාළ අතිරේක වියදම් දැරීමට සිදුවේ. | ♦ අපේක්ෂකයින්ගේ නිපුණතා තක්සේරු කිරීම කෙරෙහි අවධානය යොමු කරන බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කිරීම.<br>♦ සේවකයින් වඩා හොඳින් හඳුනාගෙන දිරිගැන්වීම සඳහා ත්‍යාග ලබාදීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම.<br>♦ සේවකයින්ගේ කුසලතා සහ දැනුම ප්‍රවර්ධනයට පුහුණු සහ සංවර්ධන වැඩසටහන් ලබා දීම. | ♦ කාර්යසාධනය පදනම්කරගත් දිරිගැන්වීමේ ක්‍රමයක් ප්‍රවර්ධනය මගින් සේවකයින් තවදුරටත් අභිප්‍රේරණය කොට ඉහළ කාර්ය සාධනයක් දක්වන සේවකයන්ට ත්‍යාග ලබා දීම.<br>♦ වෘත්තීය වර්ධනය සහ සංවර්ධනය දිරිමත් කිරීම සඳහා අතිරේක වෘත්තීය සංවර්ධන අවස්ථා නිර්මාණය කිරීම.<br>♦ තාක්ෂණික දියුණුව සහ නවෝත්පාදන සඳහා අවශ්‍ය කුසලතා සහිත සේවකයින් ශක්තිමත් කිරීමට පුහුණු සහ සංවර්ධන මූලාරම්භ සැපයීම. |
| **විනිමය අනුපාත අවදානම** | **අවම කිරීමේ සාධක** | **උපාය මාර්ග** |
| සංස්ථාවේ හි අලෙවි ආදායමෙන් 90% කට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා රුපියල් වලින් ලැබෙන අතර ඛනිජ තෙල් නිෂ්පාදන, කෘෂි රසායන ද්‍රව්‍ය ආනයනය කිරීම සහ NIOC වෙත ආපසු ගෙවීම් සම්බන්ධ පිරිවැයෙන් වැඩි ප්‍රමාණයක් ඇමරිකානු ඩොලර් වලින් පියවනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, සංස්ථාව විනිමය අනුපාත උච්චාවචනයන්ට දැඩි ලෙස මුහුණ දේ.<br><br>රු. 1/- ක විචලනයක් වැනි විනිමය අනුපාතිකයේ සුළු වෙනසක් පවා සංස්ථාවෙහි මූල්‍ය කාර්ය සාධනයට සැලකිය යුතු ලෙස බලපෑ හැකිය. විශේෂයෙන් සැපයුම්කරුවන් හට ඇති හිඟ මුදල් ගෙවීමේ වගකීම හේතුවෙන් ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම විනිමය අනුපාත අලාභ තවදුරටත් වැඩි කරන අතර සංස්ථාවෙහි ලාභදායිතාවය,මූල්‍ය තත්ත්වය සහ මුදල් ප්‍රවාහයට ඍණාත්මකව බලපායි. 2024 මූල්‍ය වර්ෂය සඳහා, විනිමය අනුපාත උච්චාවචනයන් හේතුවෙන් රුපියල් බිලියන 13.9 ක විචලනයක් ඇති විය. | ♦ සියලුම බැංකු විසින් පිරිනමනු ලබන විනිමය අනුපාත අඛණ්ඩව අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සහ සක්‍රීයව එක්සත් ජනපද ඩොලර් මිලදී ගන්නා අතර ම වෙළෙඳපොළ හැසිරීම් නිරීක්ෂණය ද සිදු කරයි. | ♦ බැංකු පද්ධතිය හරහා ඇමරිකානු ඩොලර් මිලදී ගැනීම් සඳහා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම. |
| **ණය අවදානම** | **අවම කිරීමේ සාධක** | **උපාය මාර්ග** |
| ගනුදෙනුකරුවන් නියමිත දිනට තම හිඟ බිල්පත් ගෙවීමට අපොහොසත් වන විට ණය අවදානම් ඇති වන අතර එමඟින් සංස්ථාව විභව මූල්‍ය අවදානම්වලට ලක් විය හැකි ය. රජයේ ආයතනවලට ණයට විකිණීම සිදු කරනු ලබන්නේ කිසිදු ආකාරයක ඇපකර අවශ්‍යතාවයක් නොමැතිව ය.<br><br>ගනුදෙනුකරුවෙකු සංස්ථාවට ගෙවීම් පැහැර හැරීමක් හෝ ප්‍රමාද වීමක් ඇතිවන සේ තම ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වන විට, එය මුදල් ප්‍රවාහ අභියෝගවලට හේතු විය හැකි ණය අවදානමක් නිර්මාණය කරන අතර එය ලාභදායිත්වයට අහිතකර ලෙස බලපායි. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම අංශවල ක්‍රියාකාරිත්වය සංස්ථාවේ ණය තත්ත්වය කෙරෙහි සැලකිය යුතු ලෙස බලපාන අතර අවසානයේ සංස්ථාවෙහි ලාභදායිත්වයට සහ සමස්ත මූල්‍ය ස්ථාවරත්වයට ද බලපෑම් සිදු කරයි. | ♦ රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු මුදල් ගෙවිය යුතු බදුවලින් කොටසකට හිලව් කිරීම.<br>♦ හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා රජයේ මැදිහත්වීම අපේක්ෂා කිරීම.<br>♦ හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.<br>♦ වඩාත් ව්‍යුහගත ණය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම. | ♦ ආරක්ෂක පියවරයන් සහ ගිවිසුම්ගත එකඟතා මත පදනම්ව රජයේ ආයතන වෙත ණයට විකිණීම ක්‍රියාත්මක කිරීම.<br>♦ ණය ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සහ විධිමත් කිරීම.<br>♦ රජය විසින් ගෙවිය යුතු හිඟ මුදල් ශේෂයන් ලබා ගැනීමට මහා භාණ්ඩාගාරය සම්බන්ධ කර ගැනීම.. |

# ආයතනික යහපාලනය

ආයතනික කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සහ උපාය මාර්ගික ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහාය වීම මගින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි තිරසාර සංවර්ධනය සඳහා ඵලදායී ආයතනික යහපාලනය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අපගේ පාලන රාමුව අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණය, පාලන කොටස් හිමියන් සහ අනෙකුත් කොටස්කරුවන් අතර සබඳතා නිර්වචනය කරයි.

තිරසාර වර්ධනය සහ නීතිමය හා නියාමන අවශ්‍යතා සහතික කරමින් නිරපේක්ෂතාව, විනිවිදභාවය සහ වගවීම, දිගුකාලීන ආයතනික සාර්ථකත්වය සමඟ අනුකූලතාවය ප්‍රවර්ධනය කරන මූලධර්ම මගින් අප ආයතනය මෙහෙයවනු ලැබේ.

## අභ්‍යන්තර මෙවලම්

- 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත
- අධ්‍යක්ෂ මණ්ඩල සහ අනු කමිටුවල කාර්යයන්
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ප්‍රතිපත්ති සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ.
- මූල්‍ය අධිකාරිය පැවරීම
- චර්යාධර්ම සංග්‍රහය

## බාහිර මෙවලම්

- 1971 අංක 28 දරන මුදල් පනත.
- යහපාලනය සඳහා වන පොදු ව්‍යවසාය මාර්ගෝපදේශ.
- මහා භාණ්ඩාගාර/රාජ්‍ය චක්‍රලේඛ.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ යහපත් පරිචයන් අන්තර්ගත සංග්‍රහය.
- ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලය විසින් ප්‍රකාශයට පත් කරන ලද ඒකාබද්ධ වාර්තාකරණ රාමුව.
- ජාත්‍යන්තර වාර්තාකරණ ආයතනය මගින් නිකුත් කරන ලද තිරසාර වාර්තාකරණය සඳහා ජාත්‍යන්තර ආයතනික ප්‍රමිතීන්

ආයතනික යහපාලන රාමුව අභ්‍යන්තර හා බාහිර උපකරණවල අඩංගු මූලධර්ම සහ අවශ්‍යතා මගින් මෙහෙයවනු ලැබේ. අපගේ ආයතනික පාලන වාර්තාව මඟින් ප්‍රායෝගිකව පාලනය සඳහා ප්‍රවේශය, අධ්‍යක්ෂක මණ්ඩලය ඔවුන්ගේ වගකීම් ඉටු කළ ආකාරය දක්වා ඇත.

## අධ්‍යක්ෂක මණ්ඩලය

සංස්ථාවේ ප්‍රධාන නාමක බලවේගය ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරන අතර, උපායමාර්ගික, මූල්‍ය සහ කීර්තිනාමය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා වගකිව යුතුය. ශක්තිමත් ආයතනික යහපාලන සංස්කෘතියක් පවත්වා ගැනීමට කැපවී සිටින අධ්‍යක්ෂ මණ්ඩලය, හඳුනාගත් වටිනාකම් සමූහයක්, ආයතනික ආචාර ධර්ම, වගවීම සහ විනිවිදභාවය පිළිබඳ ශක්තිමත් රාමුවක් හරහා තම කැපවීම පෙන්නුම් කරයි. මෙම යහපාලන රාමුව අඛණ්ඩ ඇගයීමකට සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීමකට යටත් වේ,

අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙහෙයුම් ක්‍රියාත්මක වනු ලබන්නේ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත මගිනි. එමගින් යහපත් පාලන පිළිවෙත් සහතික කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධිකාරියේ විෂය පථය මෙන්ම එහි සාමාජිකයින්ගේ භූමිකාවන්, වගකීම්, සංයුතිය සහ ධුර කාලය පැහැදිලිව දක්වා ඇත.

| අධ්‍යක්ෂ හා ධූරයේ ස්වාභාවය | පත්වීම් දිනය |
|---|---|
| ඩී.ජේ.ඒ.එස්. ද එස් රාජකරුණා මහතා (සභාපති) | 24.09.2024 |
| ආචාර්ය මයුර නෙත්තිකුමාරගේ (කළමනාකාර අධ්‍යක්ෂ) | 24.09.2024 |
| ආර්.එම්.එස්. පී.එස්. බණ්ඩාර මහතා (අධ්‍යක්‍ෂ/ භාණ්ඩාගාර නියෝජිත) | 03.10.2024 |
| එම්.එම්. ක්‍රිස්ටි ඩොස් මහතා (අධ්‍යක්ෂ) | 24.09.2024 |
| ඒ.ජේ.එල්. විමලරත්න මහතා (අධ්‍යක්ෂ) | 24.09.2024 |
| මහේන්ද්‍ර ගරුසිංහ මහතා (අධ්‍යක්‍ෂ) | 24.09.2024 |

එච්. ටී. පී චන්දන මහතා අධ්‍යක්ෂවරයෙකු ලෙස 18.02.2025 දින පත්කරන ලදි.

මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විවිධ විශේෂඥතාවන් සහ පුළුල් ව්‍යාපාරික ඥානයක් ඇති පුද්ගලයින්ගෙන් සමන්විත වන අතර, සංස්ථාවේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා තනි තනිව සහ සාමූහිකව දායක වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ වත්මන් සාමාජිකයින් පහතින් ලැයිස්තුගත කර ඇති අතර, ඔවුන්ගේ සුදුසුකම්, වෘත්තීය පළපුරුද්ද සහ විශේෂඥතා ක්ෂේත්‍රවල සාරාංශයක් මෙම වාර්තාවේ 21සිට 23දක්වා පිටුවල දක්වා ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

නිත්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසික පදනමින් පවත්වනු ලබන අතර, හදිසි හෝ විශේෂිත කරුණු විසඳීම සඳහා අවශ්‍ය පරිදි විශේෂ රැස්වීම් කැඳවනු ලැබේ. හොඳින් දැනුවත්ව තීරණ ගැනීම පහසු කිරීම සඳහා, අදාළ විෂයයන් පිළිබඳ ඔවුන්ගේ විශේෂඥතාව ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී වීමට ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ට ආරාධනා කරනු ලැබේ. සෑම රැස්වීමක්ම විධිමත් න්‍යාය පත්‍රයක් මගින් මෙහෙයවනු ලබන අතර, අධ්‍යක්ෂවරුන්ට ආයතනික කළමනාකාරිත්වය විසින් කල්තියාම සවිස්තරාත්මක පසුබිම් තොරතුරු සපයනු ලැබේ. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් 14 ක් පවත්වන ලදි.

අධ්‍යක්ෂ මණ්ඩල සහ අනුකමිටු රැස්වීම්වලට පෙර සියලුම අධ්‍යක්ෂවරුන්ට කාලෝචිත හා අදාළ තොරතුරු සැපයීම සඳහා ආයතනික කළමනාකාරිත්වය වගකිව යුතුය. අවශ්‍ය අවස්ථාවන්හිදී, බාහිර විශේෂඥයින්ගෙන් හෝ වෘත්තිකයන්ගෙන් අමතර අවබෝධයක් ලබා ගනී. මෙම ක්‍රියාවලිය මඟින් පාලනය සහ උපායමාර්ගික අධීක්ෂණය සම්බන්ධයෙන් එහි තනි සහ සාමූහික වගකීම් ඵලදායීව සහ කාර්යක්ෂමව ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත බව සහතික කෙරේ.

## අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන වශයෙන් ස්වාධීන වශයෙන් ක්‍රියාත්මක වන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. මෙම අධ්‍යක්ෂවරුන් කළමනාකරණයෙන් ස්වාධීන වන අතර නිරපේක්ෂ හා අපක්ෂපාතී විනිශ්චයක් ක්‍රියාත්මක කිරීමේ ඔවුන්ගේ හැකියාවට සැලකිය යුතු ලෙස බලපෑම් කළ හැකි ඕනෑම ව්‍යාපාරයකින් හෝ වෙනත් සම්බන්ධතාවකින් තොර වේ. අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව පිළිබඳ විස්තර මෙම වාර්තාවේ පිටු අංක 142 සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 29 හි අනාවරණය කර ඇත.

| අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ තනතුරේ ස්වාභාවය | පත්වීම් දිනය/ නැවත පත්වීමේ දිනය | සේවයෙන් ඉවත් වූ දිනය | රැස්වීම් සඳහා පැමිණීම |
|---|---|---|---|---|
| ආර්.එම්.ඩී.කේ. රත්නායක මහත්මිය | අධ්‍යක්ෂ | 13.01.2020 | 23.09.2024 | 10/10 |
| ජේ. මනෝජ් ගමගේ මහතා | අධ්‍යක්ෂ | 12.12.2022 | 23.09.2024 | 09/10 |
| ඩබ්ලිව්.එම්. ගිහාන් රෂාන්ත මහතා | අධ්‍යක්ෂ | 23.03.2023 | 23.03.2024 | 07/10 |
| එන්. කේ. ද අල්විස් මහතා | අධ්‍යක්ෂ | 01.03.2024 | 25.09.2024 | 08/08 |
| කර්නල් (විශ්‍රාමික) එස්.ආර්.පී. රත්නායක | කළමනාකාර අධ්‍යක්ෂ | 27.07.2023 | 24.09.2024 | 10/10 |
| සාලිය වික්‍රමසූරිය මහතා | සභාපති | 05.10.2023 | 24.09.2024 | 10/10 |
| කේ.කේ.එස්.ඒ. පෙරේරා මහතා | නිරීක්ෂක | 16.10.2023 | | 09/10 |
| ඩබ්.ඒ.ටී.එම්. විජේසිංහ මහතා | අධ්‍යක්ෂ | 21.08.2024 | 24.09.2024 | 01/02 |
| එන්.එස්. ඉලංගකෝන් මහතා | අධ්‍යක්ෂ | 21.08.2024 | 24.09.2024 | 02/02 |
| ඩී.ජේ.ඒ.එස්. ද එස් රාජකරුණා මහතා | සභාපති | 24.09.2024 | | 04/04 |
| ආචාර්ය මයුර නෙත්තිකුමාරගේ | කළමනාකාර අධ්‍යක්ෂ | 24.09.2024 | | 04/04 |
| ආර්.එම්.එස්. පී.එස්. බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත | 03.10.2024 | | 03/03 |
| මහේන්ද්‍ර ගරුසිංහ මහතා | අධ්‍යක්ෂ | 24.09.2024 | | 04/04 |
| එම්.එම්. ක්‍රිස්ටි ඩොස් මහතා | අධ්‍යක්ෂ | 24.09.2024 | | 04/04 |
| ඒ.ජේ.එල්. විමලරත්න මහතා | අධ්‍යක්ෂ | 24.09.2024 | | 04/04 |

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම්

සංස්ථාවේ සාර්ථකත්වය සහ දිගුකාලීන තිරසාරභාවය සඳහා සමස්ත වගකීම සහ වගවීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලැබේ. එහි මූලික කාර්යය වන්නේ හොඳ භාරකාරත්වයක් ක්‍රියාත්මක කිරීම, සමාගමේ උපායමාර්ගික දිශාව මෙහෙයවීම සහ එහි සමස්ත කාර්ය සාධනය අධීක්ෂණය කිරීමයි.

මෙම භූමිකාවේ ප්‍රධාන අංගයක් වන්නේ සියලුම කොටස්කරුවන්ගේ යහපත ආරක්ෂා කිරීමයි. ඉහත සඳහන් කරුණු වලට අමතරව, පහත සඳහන් කාර්යභාරය සහ වගකීම් ද ඉටු කළ යුතුය.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම්

- සංස්ථාවේ උපායමාර්ගික සැලැස්ම හරහා උපායමාර්ගික දිශාව සකස් කිරීම
- ප්‍රධාන කාර්ය සාධන දර්ශක ක්‍රියාත්මක කරන බව සහතික කිරීම.
- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි උපාය මාර්ගය සාක්ෂාත් කර ගැනීම සඳහා වගවීම, එහි මෙහෙයුම් කාර්ය සාධනය සහ මූල්‍ය ප්‍රතිඵල අධීක්ෂණය කිරීම.
- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි ආයතනික පාලන රාමුවේ අවසාන භාරකරු ලෙස ක්‍රියා කිරීම.
- අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය සහ අනුකූලතා පද්ධති ස්ථාපිත කිරීම
- මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලීන්, පාලන පද්ධතිය, අවදානම් කළමනාකරණය සහ මෙහෙයුම් පාලනයෙහි විශ්වාසය සහතික කිරීම.
- ආයතනය තුළ නවෝත්පාදනයන් සඳහා ආයතනික සහාය ලබා දීම.
- ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම.
- ප්‍රධාන ක්‍රියාවලීන් සහ ක්‍රියා පටිපාටි නිසි ලෙස ලේඛනගත කර කාලානුරූපව යාවත්කාලීන කර ඇති බව සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල පත් කිරීම සහ ඒවායේ නිසි ක්‍රියාකාරිත්වය සහතික කිරීම.

පවරා ඇති කාර්යභාරයන් සහ වගකීම් ඵලදායි ලෙස ඉටු කිරීමට අවශ්‍ය පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය එහි අධිකාරිය සහ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු, තනි අධ්‍යක්ෂවරුන් හෝ සේවකයින් වෙත පැවරීමට බලය ඇත. හොඳ මෙහෙයුම් සහ වාර්තාකරණ පිළිවෙත් සඳහා සහාය වන ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම මගින් සංස්ථාව තුළ ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම සහ සම්පත් කාර්යක්ෂමව භාවිතය සහතික වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අභ්‍යන්තර හා බාහිර විගණකවරුන් මෙන්ම ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සියලුම මට්ටම් සේවකයන් සමඟ සෘජු සන්නිවේදනයක් පවත්වාගෙන යයි.

ඊට අමතරව, සංස්ථාවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන,වාර්ෂික අයවැය, ආයතනික සැලැස්ම, වාර්ෂික වාර්තාව සහ ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු අතර මූල්‍ය කාර්ය සාධනය නිතිපතා සමාලෝචනය කරයි. ප්‍රධාන පත්කිරීම් , කාර්ය මණ්ඩල උසස්වීම්, ප්‍රධාන ප්‍රාග්ධන ආයෝජන, ණය ගැනීම් සහ ගනුදෙනුකරුවන්ට ණය පහසුකම් සැපයීම සඳහා ද මණ්ඩලය අනුමැතිය ලබා දෙයි.

## සභාපතිවරයාගේ භූමිකාව

සියලුම අධ්‍යක්ෂවරුන් තනි තනිව සහ සාමූහිකව තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඵලදායී ලෙස දායක වන බව සහතික කරමින් සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයයි. මෙම නායකත්වය ඔවුන්ගේ වගකීම් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීමට දායක වන අතර, සංස්ථාව දිගුකාලීන තිරසාර වර්ධනයක් කරා මෙහෙයවයි.

**<u>සභාපතිවරයාගේ භූමිකාවන්</u>**

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල මෙහෙයවීම හා අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටීන් නිසියාකාරාව ක්‍රියාත්මක වන බව සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ක්‍රමානුකූලව පවත්වන බව සහතික කිරීම.
- ඵලදායී තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කිරීම.
- නිසි වාර්තා පවත්වා ගැනීම.
- සාමාජිකයින්ගේ විවිධ අදහස් ඉදිරිපත් කිරීමට පහසුකම් සැලසීම සහ දිරිගැන්වීම.
- සාකච්ඡා සඳහා සියලුම අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය සහතික කිරීම.
- අදාළ වන සියලුම නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම සහතික කිරීම.

## කළමනාකාර අධ්‍යක්ෂ භූමිකාව

කළමනාකාර අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ලද උපායමාර්ගික තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතුය. ඔහු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකරණය භාරව සිටින අතර අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරිත්වය අතර අත්‍යවශ්‍ය සම්බන්ධකය ලෙස ක්‍රියා කරයි. ඔහුගේ කාර්යභාරය වන්නේ උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීතාවයෙන් ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා සමස්ත සංස්ථාවම අධීක්ෂණය කිරීමයි.

**<u>කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ භූමිකාවන්</u>**

- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ලද අරමුණු සහ මූලික කාර්යසාධන දර්ශක වෙත ළඟා වීමට සහාය වන උපායමාර්ගික, උපායශීලී සහ මෙහෙයුම් සැලසුම් සංවර්ධනය කිරීම.
- උපායමාර්ගික උපදෙස් ක්‍රියාත්මක කිරීම සඳහා හොඳ අභ්‍යන්තර පරිසරයක් සහතික කිරීම.
- අවදානම් තක්සේරු කිරීම සහ කළමනාකරණය අඛණ්ඩව සම්බන්ධ කර ගැනීම.
- සංස්ථාව තුළ ඉගෙනීම සහ නවෝත්පාදන සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම.
- ව්‍යාපාර හැසිරීම් වෙනස්වීම සහ ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග සන්නිවේදනය කිරීම.
- තොරතුරු ඵලදායී ලෙස ගලා යාම සඳහා සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණය අතර සන්නිවේදන සබඳතා ගොඩනැගීම.
- සංස්ථාවේ මෙහෙවර සහ ඉලක්ක සපුරාලීමට සහ අදාළ සියලුම ව්‍යවස්ථාපිත සහ අනෙකුත් රෙගුලාසි වලට අනුකූල වීමට සුදුසු ප්‍රතිපත්ති සකස් කර ඇති බව සහතික කිරීම.

## අධ්‍යක්ෂවරයාගේ වේතනය

සභාපතිවරයාගේ, කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ වේතනය තීරණය කර ගෙවනු ලබන්නේ මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛවලට අනුකූලවය. ප්‍රධාන කළමනාකාරිත්වයට ගෙවන ලද වේතනය පිළිබඳ විස්තර මෙම වාර්තාවේ පිටු අංක 142 යටතේ වන සටහන් අංක 29 යටතේ පෙන්වයි.

## අනු කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලයට සිය රාජකාරි කාර්යක්ෂමව ඉටු කිරීමට සහාය වීම සඳහා නිශ්චිත කාර්යයන් සඳහා අනු කමිටු පිහිටුවා ඇත.අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම් කිහිපයක් ඉටු කිරීමේ අරමුණින් විගණන හා කළමණාකරණ කමිටුව මෙන්ම අවදානම් කළමණාකරණ කමිටුව පත් කර ඇත.

| අනු කමිටුව | ආවරණය වන ක්ෂේත්‍ර |
|---|---|
| විගණනය සහ කළමනාකරණය කමිටුව | මූල්‍ය පද්ධතිය සහ වාර්තාකරණය.<br>අභ්‍යන්තර විගණනය සහ බාහිර විගණනය.<br>අභ්‍යන්තර පාලනය |
| අවදානම් කළමනාකරණය කමිටුව | අවදානම් හඳුනා ගැනීම<br>අවදානම් කළමනාකරණය<br>උපාය මාර්ග සංවර්ධනය |

අදාළ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණයෙන්, රට පුරා නිෂ්පාදන අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා තොග සමාලෝචන කමිටුවක් ස්ථාපිත කර ඇත. ඊට අමතරව, සියලුම ප්‍රසම්පාදන ක්‍රියාවලීන්හි විනිවිදභාවය සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා පැහැදිලිව නිර්වචනය කරන ලද අධිකාරී මට්ටම් සහිතව, මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදන කමිටු පිහිටුවා ඇත.

## විගණන සහ කළමනාකරණ කමිටුව

විගණන සහ කළමනාකරණ කමිටුව කළමනාකරණයෙන් ස්වාධීනව ක්‍රියාත්මක වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත මෙම කමිටුව විගණන සහ අවදානම් ආශ්‍රිත කරුණු අධීක්ෂණය කිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. එහි සංයුතිය, ප්‍රඥප්තිය, රැස්වීම් වාර ගණන, වගකීම් සහ පැමිණීම පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 85 සහ 86 පිටුවල විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාවේ දක්වා ඇත.

## තොග සමාලෝචන කමිටුව

පවතින තොග මට්ටම් විශ්ලේෂණය කිරීමෙන් ඉදිරි මාස තුන සඳහා තොග අවශ්‍යතා ඇගයීමට ලක් කරන්නේ තොග සමාලෝචන කමිටුවයි. එය ඛණිජතෙල් තොග පර්යන්ත සමාගම (CPSTL),ලංකා ඉන්දියන් ඔයිල් සමාගම (IOC),ලංකාවිදුලිබල මණ්ඩලය(CEB) හි නියෝජිතයින් සමඟ සතිපතා රැස්වේ. පුරෝකථනය කරන ලද ජාතික ඉල්ලුම, පිරිපහදු නිෂ්පාදන ධාරිතාව සහ පවතින ටැංකි ගබඩා ධාරිතාවය මත පදනම්ව ආනයන ප්‍රමාණ සහ නැව්ගත කිරීමේ කාලසටහන් සැලසුම් කර ඇත. මෙම සම්බන්ධීකරණ ප්‍රවේශය හරහා, ජාතියට අඛණ්ඩ ඉන්ධන සැපයුමක් සහතික කිරීම සඳහා කමිටුව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

## ප්‍රසම්පාදන කමිටුව සහ BEC

රාජ්‍ය ආයතන සඳහා නිෂ්පාදන, භාණ්ඩ, සේවා සහ වැඩ ප්‍රසම්පාදනය සඳහා ජාතික ප්‍රසම්පාදන ආයතනය (NPA) විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව, ප්‍රසම්පාදන කටයුතු කළමනාකරණය කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටු (PC) සහ ලංසු ඇගයීම් කමිටු (BEC) වාර්ෂිකව හෝ අවශ්‍ය පරිදි ස්ථාපිත කරනු ලැබේ.

PC සහ BEC යන දෙකම NPA මාර්ගෝපදේශ යටතේ ක්‍රියාත්මක වන්නේ විනිවිදභාවය සහතික කිරීම, ප්‍රමාදයන් අඩු කිරීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සඳහා වඩාත්ම මූල්‍යමය වශයෙන් වාසිදායක සහ ගුණාත්මකව උසස් භාණ්ඩ හා සේවා සැපයීම සඳහා ය. ලංසු ඇගයීම් කමිටුව යෝජිත මිලදී ගැනීම්වල තාක්ෂණික පිරිවිතර සහ අනුකූලතාව ඇගයීම කෙරෙහි අවධානය යොමු කරන අතර, ප්‍රසම්පාදන කමිටුව ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අනෙකුත් සියලුම අංශ අධීක්ෂණය කරයි.

ප්‍රසම්පාදනයේ වටිනාකම මත පදනම්ව, ප්‍රදේශීය ප්‍රසම්පාදන කමිටුව, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව සහ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව ඇතුළු විවිධ මට්ටමේ කමිටු සම්බන්ධ වේ.

## පාලන සමාගම සමඟ පවත්වනු ලබන සම්බන්ධතා

සංස්ථාවේ තිරසාර සාර්ථකත්වය රඳා පවතින්නේ එහි සියලුම පාර්ශ්වකරුවන් සමඟ ධනාත්මක සහ අර්ථවත් සබඳතා ඇති කර ගැනීම මත ය. සංස්ථාව සහ එහි කොටස්කරුවන් අතර

අධ්‍යක්ෂවරුන්ගේ දෘෂ්ටිකෝණයෙන්,

ශ්‍රී ලංකා රජය අවසාන මව් සමාගම සහ පාලන ආයතනය ලෙස සේවය කරයි. සංස්ථාවේ මෙහෙයුම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා බලශක්ති අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය සහ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) සමඟ සමීප සහයෝගීතාවයක් පවත්වා ගෙන යනු ලැබේ.

සභාපති හෝ කළමනාකරණ අධ්‍යක්ෂවරයා රජයේ බලධාරීන් සමඟ ප්‍රාථමික සම්බන්ධීකාරක ලෙස කටයුතු කරන අතර, වාචිකව සහ ලිඛිතව සන්නිවේදනය සිදු කරනු ලැබේ.

## අභ්‍යන්තර පාලන

සංස්ථාවට කාර්යක්ෂමව ක්‍රියාත්මක වීමට සහ එහි දිගුකාලීන තිරසාරභාවය සහතික කිරීමට ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් අත්‍යවශ්‍ය වේ. මෙම පද්ධතිය සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීමට, නිවැරදි වාර්තා පවත්වා ගැනීමට සහ උපායමාර්ගික තීරණ ගැනීමට සහාය වන කාලෝචිත, විශ්වාසදායක තොරතුරු ලබා දීමට නිර්මාණය කර ඇත.

අභ්‍යන්තර පාලන රාමුව ව්‍යාපාරයේ අඛණ්ඩ සහ තිරසාර ක්‍රියාකාරිත්වයට තීරණාත්මක අවදානම් කළමනාකරණ පිළිවෙත් සමඟ මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා පාලනයන් ආවරණය කරයි. එය ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර සුපරීක්ෂාකාරීව නිරීක්ෂණය කරමින් අවදානම් අවම කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීම තුළින් ඒවා පිළිගත හැකි සීමාවන් තුළ පවතින බව සහතික කරයි. මෙම පුළුල් අධීක්ෂණය මඟින් සංස්ථාවට එහි දැක්ම සහ මෙහෙවර සාර්ථකව සාක්ෂාත් කර ගැනීමට හැකියාව ලැබේ.

එපමණක් නොව, ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් මඟින් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන නිවැරදි බවත් ප්‍රමාණාත්මක දෝෂ හෝ වැරදි ප්‍රකාශනවලින් තොර බවත් විශ්වාසදායක සහතිකයක් ලබා දේ.

## අභ්‍යන්තර විගණනය

විගණන සහ කළමනාකරණ කමිටුව විසින් සමාලෝචනය කර අනුමත කරනු ලබන පුළුල් විගණන සැලසුම් සංවර්ධනය කිරීම අභ්‍යන්තර විගණන කාර්යයට පැවරී ඇත.

මෙම ක්‍රියාවලිය සැලසුම් කර ඇත්තේ අභ්‍යන්තර පාලනයන්හි කාර්යක්ෂමතාව ඇගයීම, අවදානම් හඳුනාගැනීම සහ සම්භාවිතාව තක්සේරු කිරීම, ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ ගනුදෙනුවල සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා ය.

නියමිත විගණන ක්‍රියාකාරකම් වලට අමතරව, අභ්‍යන්තර විගණන කාර්යය අවශ්‍ය පරිදි විශේෂ විගණන ද සිදු කරයි.

මෙම විගණන මගින් කළමනාකරණයට විගණන කණ්ඩායමේ අවධානයට යොමු කරන නිශ්චිත ගැටළු පිළිබඳව සවිස්තරාත්මක නිරීක්ෂණ සහ ක්‍රියාකාරී නිර්දේශ ලබා දේ.

අභ්‍යන්තර විගණන කාර්යය මෙහෙයවනු ලබන්නේ වෘත්තීයමය අධ්‍යාපන සුදුසුකම් ලත් පිරිස් විසින් වන අතර, එමඟින් යහපාලන පිළිවෙත් පිළිපැදීම සහතික කරන අතර සංස්ථාව තුළ එහි වගකීම් ඵලදායී ලෙස ඉටු කරයි.

**<u>අභ්‍යන්තර විගණනයේ කාර්යභාරය සහ වගකීම්</u>**

- අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම සහ නිවැරදි කිරීම සඳහා දුර්වලතා නිවැරදි කරගැනීම සඳහා සන්නිවේදනය කිරීම.
- විගණකාධිපති වාර්තාව, එහි නිවැරදි කිරීම් හා වාර්තාවේ සොයාගැනීම් වල වත්මන් තත්ත්වය සාකච්ඡා කිරීම.
- අනුමත විගණන සැලැස්මට අනුව විගණන ක්‍රියාත්මක කිරීම.
- කළමනාකරණය හෝ විගණන සහ කළමනාකරණ කමිටුව විසින් යොමු කරන ලද විශේෂ විමර්ශන විගණන න්‍යායන් ක්‍රියාත්මක කිරීම.
- ක්‍රියාවලියේ සංවර්ධනය හඳුනාගැනීම හා එහි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට කළමකාකරණ විගණන පවත්වාගෙන යාම.

## ආයතනික කළමනාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කරන ලද උපායමාර්ගික දිශාව, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව සංස්ථාවේ එදිනෙදා මෙහෙයුම් කළමනාකරණය කිරීම සඳහා සභාපති සහ කළමනාකරණ අධ්‍යක්ෂවරයා වගකිව යුතුය. ඔවුන් සියලුම මෙහෙයුම් ක්ෂේත්‍ර හරහා අධීක්ෂණය කිරීම, කාර්ය සාධනය නිරීක්ෂණය කරීම සහ සංස්ථාවේ උපායමාර්ගික අරමුණු සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා අවශ්‍ය පරිදි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරයි.

පාලනය සහ අධීක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා, සංස්ථාවේ මෙහෙයුම් සහ මධ්‍යම පරිපාලනය ප්‍රාථමික කොටස් දෙකකට ව්‍යුහගත කර ඇත: පිරිපහදු මෙහෙයුම් සහ ප්‍රධාන කාර්යාල මෙහෙයුම්, ඒවාට ප්‍රාදේශීය කාර්යාල ද ඇතුළත් වේ. පිරිපහදු මෙහෙයුම් මෙහෙයවනු ලබන්නේ පිරිපහදු කළමනාකරු විසින් වන අතර, විදුලි හා උපකරණ, නිෂ්පාදන සහ මෙහෙයුම්, නඩත්තු සහ ව්‍යාපෘති සහ තාක්ෂණික සේවා වැනි ප්‍රධාන තාක්ෂණික ක්ෂේත්‍ර අධීක්ෂණය කරන නියෝජ්‍ය පිරිපහදු කළමනාකරුවන්ගේ සහාය ඇත.

ප්‍රධාන කාර්යාලයේ කාර්යයන් අංශ කිහිපයකට සංවිධානය කර ඇති අතර, ඒ සෑම කාර්යාංශයක්ම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකු හෝ කළමනාකරුවෙකු විසින් මෙහෙයවනු ලබන අතර, ඔහු දෛනික මෙහෙයුම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේදී සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂවරයාට සහාය වේ. පිරිපහදුව සහ ප්‍රධාන කාර්යාලය යන දෙකෙහිම ආයතනික කළමනාකරණ කණ්ඩායම, ශක්තිමත් අධ්‍යයන පසුබිම් සහ අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ඇති ඉහළ කුසලතා ඇති වෘත්තිකයන්ගෙන් සමන්විත වේ. ඔවුන්ගේ සුදුසුකම් සහ විශේෂඥතාව ඇතුළුව සාරාංශගත සුදුසුකම් මෙම වාර්තාවේ 24 සිට 26 දක්වා පිටුවල ඉදිරිපත් කර ඇත.

## බැඳියාව

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව සියලුම අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධති, ක්‍රියා පටිපාටි සහ ක්‍රියාවලීන් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. සෑම අධ්‍යක්ෂවරයෙකුම, තනි තනිව සහ සාමූහිකව, මෙම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ නියාමන පිළිපැදීම සහතික කිරීම සඳහා වගකිව යුතුය.

තීරණ ගැනීමේ ක්‍රියාවලියේ අඛණ්ඩතාව ශක්තිමත් කිරීම සහ බැඳියාව පිළිබඳ ගැටුම් අවම කිරීම සඳහා, සියලුම අධ්‍යක්ෂවරුන් වාර්ෂික ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. ඊට අමතරව, සියලුම අධ්‍යක්ෂවරුන්, කළමනාකරුවන් සහ සේවකයින් අඛණ්ඩතාව සහ සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. පුද්ගලික ලාභ සඳහා ඔවුන්ගේ තනතුරු භාවිතා කිරීම හෝ ඕනෑම අනවසර අරමුණක් සඳහා සංවේදී හෝ රහස්‍ය තොරතුරු හෙළි කිරීම ඔවුන්ට දැඩි ලෙස තහනම්ය.

## අනුකූලතාව

ලංකා ඛනිජ තෙල් සංස්ථාව (CPC) එහි සියලුම මෙහෙයුම් සහ ගනුදෙනු හරහා විනිවිදභාවය පවත්වා ගැනීමට කැපවී සිටී. අදාළ නීති, රෙගුලාසි, ප්‍රමිතීන්, යහපත් පරිචයන් සහ කේතයන්ට අනුකූල වීම සංස්ථාවේ සාර්ථකත්වයට සහ දිගුකාලීන තිරසාරභාවයට මූලික වේ.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි ආයතනික පාලන රාමුව මුදල් අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ මෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ යහපත් පරිචයන් සංග්‍රහය මගින් මෙහෙයවනු ලැබේ. සංවිධානය පුරා වගවීම, විනිවිදභාවය සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මෙම පාලන ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට සම්පූර්ණයෙන්ම කැපවී සිටී.

ඊට අමතරව, 1971 අංක 38 දරන මූල්‍ය පනතට සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ පනතට අනුකූලව ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවෙහි අභ්‍යන්තර පාලන පද්ධති එහි මෙහෙයුම් තුළට ඇතුළත් කර ඇත. සෑම වසරකම, විගණකාධිපතිවරයාගේ වාර්තාව සමඟ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කර පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන අතර, එමඟින් යහපාලනය සහ පොදු වගවීම සඳහා සංස්ථාවෙහි කැපවීම තවදුරටත් ශක්තිමත් වේ.

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

විගණන සහ කළමනාකරණ කමිටුව යනු අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවකි. එය විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන්ගේ අදාළ කුසලතා සහ ඔවුන්ගේ මූල්‍ය ,මෙහෙයුම්,පාලන කුසලතාවයක් මත තෝරා ගනු ලැබේ. කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන අතර එයට සෘජුවම වාර්තා කරයි.

## මූලික වගකීම්

විගණන සහ කළමනාකරණ කමිටුවේ මූලික වගකීම වන්නේ මූල්‍ය වාර්තාකරණ සහ විගණන ක්‍රියාවලීන්හි අඛණ්ඩතාව සහතික කිරීම අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධතිවල ඵලදායීතාවය අධීක්ෂණය කිරීමයි.කමිටුව සිය සොයා ගැනීම් සහ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුවත් තීරණ ගැනීම් සඳහා ඉදිරිපත් කරයි. කමිටුව සඳහා වන වගකීම් පහත පරිදි වේ.

- හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් ද යන්න මෙන්ම වාර්තාකරණ නිර්ණායක සපුරා ඇත්දැයි තහවුරු කර ගැනීම.
- සමාගම් ක්‍රියාකාරම්වල අනුකූලතාව අධීක්ෂණය කිරීම.
- මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව සහ ඒවායේ අඩංගු වැදගත් වාර්තාකරණ විනිශ්චය කිරීම .
- අභ්‍යන්තර විගණන කාර්යාංශයේ ක්‍රියාමාර්ග සහ ඵලදායීතාවය පරීක්ෂා කිරීම.
- අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණ පද්ධතිවල කාර්යක්ෂමතාව ඇගයීම.
- සංස්ථාව නිරාවරණය වී ඇති අවදානම් හා එම අවදානම් අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාකාරකම් සහ ඒවායේ කාර්යක්ෂමතාව ඇගයීම් කිරීම.
- වාර්ෂික විගණන සැලැස්ම සාකච්ඡා කර අනුමත කිරීම.
- විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන වාර්තා සාකච්ඡා කිරීම.

## කමිටුවේ සංයුතිය

විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් පත් කර ඇත. සමාලෝචනයට භාජනය වන මූල්‍ය වර්ෂය තුළ සංස්ථාව විගණන කමිටු රැස්වීම් හතරක් (04) පවත්වා ඇත. අංක 104, සිට 107 දරන විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම සඳහා කමිටු සාමාජිකයින් ලෙස ආර්.එම්.ඩී.කේ. රත්නායක මහත්මිය (සභාපති), මනෝජ් ගමගේ මහතා (සාමාජික) සහ ඩබ්ලිව්.එම්. ගිහාන් රශාන්ත මහතා (සාමාජික) ලෙස කටයුතු කරන ලදි. අංක 107 දරන විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම සඳහා ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා (සභාපති), මිගාර එම්.සී. ඩොස් මහතා (සාමාජික) සහ ඒ.ජේ.එල්. විමලරත්න මහතා (සාමාජික) කමිටු සාමාජිකයින් විය.

විගණන සහ කළමනාකරණ කමිටුවල හැසිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසායන් සඳහා නිකුත් කරන ලද භාණ්ඩාගාර චක්‍රලේඛයේ දක්වා ඇති වගකීම්, අධිකාරීන් සහ විශේෂිත බැඳීම්වල විෂය පථය ඇතුළත් කිරීම සඳහා කමිටුවේ ප්‍රඥප්තිය ස්ථාපිත කර ඇත.

## රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළදී, විගණන කමිටු රැස්වීම් හතරක් (04) පවත්වා ඇත.

| දිනය | සහභාගී වූ සාමාජිකයන් | සහභාගීත්වය |
|---|---|---|
| 21.03.24 | ආර්.එම්.ඩී.කේ රත්නායක මිය,<br>මනෝජ් ගමගේ මහතා,<br>ඩබ්ලිව්. එම්. ජී. | 3/3 |
| 05.06.24 | ආර්.එම්.ඩී.කේ රත්නායක මිය,<br>මනෝජ් ගමගේ මහතා,<br>ගිහාන් රශාන්ත මහතා | 3/3 |
| 27.08.24 | ආර්.එම්.ඩී.කේ රත්නායක මිය,<br>මනෝජ් ගමගේ මහතා, | 2/3 |
| 09.12.24 | ආර්. එම්. එස්. පී. එස්. බණ්ඩාර මහතා,<br>එම්. එම්. සී. ඩොස් මහතා,<br>ඒ. ජේ. එල්. විමලරත්න | 3/3 |

## කමිටුව විසින් ඉටු කරන ලද කාර්යයන්

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අනුගමනය කරන ලද මූල්‍ය වාර්තාකරණ ක්‍රමය කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. තවද, එය සම්මත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අනුකූලතාව හෙළිදරව් කිරීම් සහ අනෙකුත් නියාමන අවශ්‍යතා ඇතුළුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා භාවිතා කරන SLFRS/LKAS ඇතුළු මූල්‍ය වාර්තාකරණ පද්ධතියට අනුකූල වීම සහතික කරයි. සංස්ථාවේ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව, කාලෝචිතභාවය සහ ඉදිරිපත් කිරීම ද කමිටුව විසින් පරීක්ෂා කර අධීක්ෂණය කරයි.

ඉහත ලැයිස්තුගත කර ඇති ක්‍රියාකාරකම් වලට අමතරව, කමිටුව ඉටු කරන ලද කාර්යයන්:

- 2019, 2020 සහ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවල වර්තමාන තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීම.
- 2024 වර්ෂයේ වාර්ෂික විගණන සැලසුම සමාලෝචනය කර අනුමත කිරීම.
- ප්‍රධාන කාර්ය සාධන දර්ශක පරීක්ෂා කිරීම.
- අවදානම් විශ්ලේෂණය සහ අවම කිරීමේ පියවර සාකච්ඡා කිරීම.
- වර්ෂය තුළ මතු වූ අනෙකුත් මෙහෙයුම් සහ අනුකූලතා කරුණු සමාලෝචනය කිරීම.

## අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණනයේ කාර්යභාරයට අභ්‍යන්තර පාලනයන්හි කාර්යක්ෂමතාව තක්සේරු කිරීම, අවදානම් ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා ගනුදෙනුවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සත්‍යාපනය කිරීම ඇතුළත් වේ. වර්ෂය ආරම්භයේ දී විගණන කමිටුව විසින් විගණන සැලසුම සහ එහි පරාසය අධීක්ෂණය කරමින් ආයතනයේ වත්කම්වල ආරක්ෂාව සහතික කිරීම සඳහා විගණන වාර්තා සාරාංශ කරන ලදී.

ඉහත කරුණු වලට අමතරව, අභ්‍යන්තර විගණන අංශය කළමණාකාරිත්වයේ උපදෙස් පරිදි විශේෂ විමර්ශන පවත්වමින් විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම,සහතික කිරීම සඳහා වරින් වර සමාලෝචන සැලසුම් කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණනය විසින් ඉටු කරන ලද කාර්යයන්හි සාරාංශය පහත දැක්වේ.

- අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සමාලෝචනය කර නිවැරදි කළ යුතු දුර්වලතා සන්නිවේදනය කිරීම.
- විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ වාර්තාවේ සොයාගැනීම්වල වත්මන් තත්ත්වය සාකච්ඡා කිරීම.
- අනුමත විගණන සැලැස්මට අනුව විගණන 121 ක් සහ සභාපතිවරයා විසින් පවරන ලද විශේෂ විගණන සිදු කරන ලදී.
- විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමේදී අභ්‍යන්තර විගණන වාර්තාවන් සාකච්ඡා කිරීම.
- ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් හඳුනා ගැනීම සහ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා කාර්ය සාධන විගණනයක් සිදු කිරීම.
- COPE සටහන්වල ඇතුළත් කරුණු සහ පසු විපරම් ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම.

## නිගමනය

සංස්ථාවේ අභ්‍යන්තර පාලන පද්ධතිය මඟින් සංස්ථාවේ කටයුතු සංස්ථාව විසින් නියම කර ඇති ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව කළමනාකරණය කරන බවටත්, සංස්ථාවේ වාර්තාකරණ පද්ධතිය නිසි ලෙස නඩත්තු කරන බවටත්, වත්කම් ප්‍රමාණවත් ලෙස ආරක්ෂා කර ඇති බවටත් සාධාරණ සහතිකයක් ලබා දෙන බව විගණන සහ කළමනාකරණ කමිටුව සහතික කරයි.

ආර් එම් එස් පී එස් බණ්ඩාර

සභාපති

විගණන සහ කළමනාකරණ කමිටුව

20.11.2025

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32(3) වගන්තියට අනුකූලව, සංස්ථාවේ සහ එහි සමූහයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙන්ම සභාපතිවරයාගේ පණිවිඩය, කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ සමාලෝචනය, කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය, වටිනාකම් නිර්මාණය, ආයතනික යහපාලනය, විගණන කමිටු වාර්තාව, විගණකාධිපති වාර්තාව සහ අනෙකුත් තොරතුරු ඇතුළත් 2024 වර්ෂයේ වාර්ෂික වාර්තාව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය අභිමානයෙන් ඉදිරිපත් කරයි.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාපිත වූ රාජ්‍ය ව්‍යාපාරික ආයතනයකි. සංස්ථාව කළමනාකරණය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයක් විසිනි. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 හි පිහිටා ඇත.

අනුබද්ධ සමාගම්

| | | |
|---|---|---|
| නම | ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) | ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත පුද්ගලික සමාගම (TPTL) |
| කොටස | 2/3 | 51% |
| ප්‍රධාන ක්‍රියාකාරකම් | ඉන්ධන ගබඩා කිරීමේ සහ බෙදා හැරීමේ පහසුකම් සැපයීම සහ තොරතුරු තාක්ෂණ සේවා සැපයීම | ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදනලට පමණක් සීමා නොවන ව්‍යාපාර කටයුතු කරගෙන යාම, සංවර්ධනය කිරීම, භාවිතා කිරීම සහ ගබඩා පහසුකම් කළමනාකරණය කිරීම; සමාගම විසින් ගබඩා කර ඇති ඛනිජ තෙල් සහ ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හෝ වෙනත් ඕනෑම නිෂ්පාදනයක් ආනයනය කිරීම, ගබඩා කිරීම, විකිණීම සහ අපනයනය කිරීම; අදාළ නීති සහ රෙගුලාසි මගින් අවසර දී ඇති වෙනත් ඕනෑම ව්‍යාපාරයක් කරගෙන යාම. |

අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ අනුදැනුමට අනුව, මේ සමඟ ඇති විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRSs / LKASs) මෙන්ම 1971 අංක 38 දරන මූල්‍ය පනතේ සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ සංශෝධිත විධිවිධානවලට අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ශ්‍රී ලංකාව තුළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම, පිරිපහදු කිරීම සහ අලෙවි කිරීමයි. සංස්ථාව ඇතැම් ඛනිජ තෙල් නිෂ්පාදන කිහිපයක් අපනයනය කිරීම ද කරයි.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා එම සමූහයේ මූල්‍ය ප්‍රකාශන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2025 ජූනි 30 වන දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

සංස්ථාව විසින් සියලුම ගනුදෙනු සඳහා නිසි ගිණුම් පොත් පවත්වාගෙන යන බවට සහ වර්ෂය සඳහා පවතින තත්වය, ලාභ අලාභ පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන සකස් කරන බවට සහතික කිරීමේ වගකීම සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ නිරන්තර රැස්වීම් සහ විගණන සහ කළමනාකරණ කමිටුව හරහා මූල්‍ය වාර්තාකරණය සඳහා කළමනාකාරිත්වයේ වගකීම් අධීක්ෂණය කරයි. විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව 85 සිට 86 දක්වා පිටුවල දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඵලදායී හා පුළුල් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කර ඇති අතර මූල්‍ය, මෙහෙයුම්, අනුකූලතාව සහ අවදානම් කළමනාකරණය ආවරණය වන අභ්‍යන්තර පාලන සමාලෝචනයක් සිදු කර ඇති අතර එහි වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා ඒවායේ කාර්යක්ෂමතාව සහ ව්‍යාපාර කටයුතු ක්‍රමවත්ව කරගෙන යාම සඳහා සාර්ථක ලෙස අනුගත වීම පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා ගෙන ඇත. සංස්ථාවේ ආයතනික / ව්‍යාපාර සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කර ඇති අතර, ඉදිරි කාලය සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සංස්ථාව සතුව ඇති බවට සෑහීමකට පත්වෙමින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත සකස් කිරීම සිදුකර ඇත.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

ඇතැම් ගිණුම්කරණ ප්‍රතිපත්ති සංශෝධනය කරන ලද අතර, අනෙක් ඒවා සමාලෝචිත වර්ෂය තුළදී, 'මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 මගින් නියම කර ඇති පරිදි, ඇතැම් ගිණුම්කරණ ප්‍රතිපත්ති සංශෝධනය කරන ලද අතර වෙනස් නොකරන ලද ගිණුම්කරණ ප්‍රත්පත්ති පසුගිය වර්ෂයේ පැවති ආකාරයෙන්ම පවත්වාගෙන අවශ්‍ය ගැළපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර, ඒවා නිසි පරිදි අනාවරණය කර ඇත.

## විගණන වාර්තාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණක වාර්තාව 92 සිට 108 දක්වා පිටුවල දක්වා ඇත.

## කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය

2024 මූල්‍ය වර්ෂය තුළ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කාර්ය සාධනය සහ කටයුතු පිළිබඳ සමාලෝචනයක් සභාපතිවරයාගේ සමාලෝචනය යටතේ 13 සිට 15 දක්වා පිටුවල ද, කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ සමාලෝචනය 16 සිට 18 දක්වා පිටුවල ද, සංස්ථාවේ කාර්ය සාධනය 33 සිට 42 දක්වා පිටුවල ද ඇතුළත් වේ.

## අධ්‍යක්ෂවරු

2024.12.31 දිනට තනතුරු දරමින් සිටි අධ්‍යක්ෂවරුන්ගේ නම්;

- ඩී.ජේ.ඒ.එස්. ද එස් රාජකරුණා මහතා (සභාපති)
- ආචාර්ය මයුර නෙත්තිකුමාරගේ මහතා (කළමනාකාර අධ්‍යක්ෂ)
- ආර්.එම්.එස්. පී.එස්. බණ්ඩාර මහතා (අධ්‍යක්‍ෂ/භාණ්ඩාගාර නියෝජිත)
- මහේන්ද්‍ර ගරුසිංහ මහතා (අධ්‍යක්ෂ)
- එම් එම් ක්‍රිස්ටි ඩොස් මහතා (අධ්‍යක්ෂ)
- ඒ.ජේ.එල්. විමලරත්න මහතා (අධ්‍යක්ෂ)

එච්.ටී.පී. චන්දන මහතා අධ්‍යක්ෂක ලෙස 2025 පෙබරවාරි 18 දින පත්විය.

## රැස්වීම

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් වලින් සමන්විත අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් පිළිබඳ විස්තර, පිටු අංක 81 සිට 84 දක්වා ඇති ආයතනික පාලන වාර්තාවේ දක්වා ඇත.වර්ෂය තුළ පවත්වන ලද රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම වාර්ෂික වාර්තාවේ 82 පිටුවේ දක්වා ඇත.

## අධ්‍යක්ෂවරුන්ගේ වේතන

වර්ෂය තුළ ගෙවන ලද අධ්‍යක්ෂවරුන්ගේ වැටුප් පහත පරිදි වේ;

| | 2024 (රු. මි.) | 2023 (රු. මි.) |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ වේතන | 9.710 | 9.702 |

## කොන්ත්‍රාත්තු කෙරෙහි අධ්‍යක්ෂවරුන්ගේ බැඳියා

සංස්ථාව සමඟ ඇති කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ඍජු සහ වක්‍ර උනන්දුව මූල්‍ය ප්‍රකාශනවල සටහන 29 හි හෙළිදරව් කර ඇත

## අභ්‍යන්තර පාලන පද්ධතිය

සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී හා පුළුල් අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක කර ඇත. අභ්‍යන්තර ක්‍රියාපටිපාටි, අවදානම් විශ්ලේෂණය, අනුකූලතා සහ අනෙකුත් පාලනයන් විශ්ලේෂණය කිරීම, තක්සේරු කිරීම සහ සත්‍යාපනය කිරීම සඳහා, සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරීවරයෙකු විසින් මෙහෙයවනු ලබන සුවිශේෂී අභ්‍යන්තර විගණන කාර්යංශයක් පවතී. එහි නිරීක්ෂණ විගණන සහ කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබන අතර නිරීක්ෂණ නිවැරදි කිරීම සඳහා යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ කළමනාකාරිත්වයට ලබා දෙනු ලැබේ.

## අවදානම් කළමනාකරණය

සංස්ථාව විසින් නිරාවරණය කර ඇති අවදානම් අවම කිරීම සඳහා ප්‍රායෝගික සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී අවදානම් කළමනාකරණ රාමුවක් මෙන්ම අවදානම් කළමනාකරණ කමිටුවක් ද ස්ථාපිත කර ඇත. අවදානම් කළමනාකරණ වාර්තාව පිටු අංක 75 සිට 80 දක්වා සවිස්තරාත්මක ව දක්වා ඇති අතර උපද්‍රව, අවදානම්වල ඇතවුම් සහ අවදානම් බලපෑම් පාලනය කිරීමට හෝ අඩු කිරීමට විස්තර කෙරේ.

## මූල්‍ය කාර්යය සාධනය

2024 දී, නව තරඟකරුවන් විසින් එල්ල කරන ලද අභියෝග මධ්‍යයේ වුවද, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉන්ධන වෙළඳපොලේ ශක්තිමත් ස්ථානයක් පවත්වා ගෙන ගිය අතර, අනෙකුත් වෙළඳපල අංශ හරහා ද එහි තරඟකාරිත්වය පවත්වා ගෙන ගියේය. පිරිපහදුව සැලසුම් සහගත අලුත්වැඩියාවන් සඳහා ප්‍රධාන වසා දැමීමකට ලක් වූ අතර, එම කාලය තුළ මෙහෙයුම් තාවකාලිකව නතර කරන ලදී. කෙසේ වෙතත්, මෙහෙයුම් කාලවල පැවති කාර්යක්ෂමතාවය නිසා පිරිපහදුව නිෂ්පාදන සඳහා පවතින මිලකරණ යාන්ත්‍රණය සංස්ථාවෙ හි මූල්‍ය කාර්ය සාධනයට තවදුරටත් සහාය වූ අතර, සාමාන්‍ය ජනතාවට සාධාරණ වටිනාකමක් සහතික කළේය. මීට අමතරව, සංස්ථාවෙහි ණය සහ බිල්පත් රජය විසින් පවරා ගැනීම නිසා සංස්ථාවෙහි මූල්‍ය බර සැලකිය යුතු ලෙස අඩු කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වසර සඳහා මූල්‍ය පිරිවැය සැලකිය යුතු ලෙස අඩු විය. තවද, විදේශ මුදල් මිලදී ගැනීමේ ක්‍රියාවලිය හඳුන්වාදීම මගින්, සැපයුම්කරුවන්ට නිසි ගෙවීම් කිරීම සැපයුම්කරුවන්ගේ මිල අඩු කිරීමට දායක වූ අතර අවසානයේ සමස්ත විකුණුම් පිරිවැය අඩු විය.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ සාරාංශය පහත දැක්වේ.

| | 2024 (රු. මි.) | 2023 (රු. මි.) |
|---|---|---|
| ශුද්ධ ආදායම | 923,441 | 1,263,603 |
| දළ ලාභය/ (පාඩුව) | 75,721 | 162,115 |
| මෙහෙයුම් ලාභය/ (අලාභය) | 16,613 | 89,871 |
| ශුද්ධ ලාභය/ (අලාභය) | 32,931 | 120,310 |
| වෙනත් විස්තීරණ ආදායම | (192) | (107) |
| මුළු විස්තීරණ ආදායම | 32,739 | 120,203 |

| | 2024 (රු. මිලියන) | 2023 (රු. මිලියන.) |
|---|---|---|
| ප්‍රවාහන | 649,089 | 959,301 |
| බලශක්තිය | 112,149 | 181,386 |
| ගුවන් සේවා | 120,057 | 121,519 |
| කර්මාන්ත | 19,497 | 18,799 |
| ගෘහස්ථ | 41,243 | 32,212 |
| කෘෂිකාර්මික | 870 | 1,612 |
| නැව් තෙල් සැපයුම් හා අපනයනය | 28,251 | - |
| මුලු වටිනාකම | **971,156** | **1,314,829** |

2024 දී, මුළු ආදායම රුපියල් මිලියන 1,314,829 (2023) සිට රුපියල් මිලියන 971,156 දක්වා අඩු වූ අතර, ප්‍රධාන වශයෙන් ප්‍රවාහන සහ විදුලිබල අංශවලින් ලැබුණු ආදායම අඩු වීමේ හේතුව බලපෑ අතර එය පිළිවෙලින් 32% සහ 38% ක් ලෙස පහත වැටුණි. ගුවන් සේවා ආදායම සාපේක්ෂව ස්ථාවරව පැවති අතර, සුළු අඩුවීමක් පමණක් පෙන්නුම් කළේය. ඊට අමතර ව, කර්මාන්ත සහ දේශීය අංශ මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළ අතර, කෘෂිකාර්මික අංශය සැලකිය යුතු පහත වැටීමක් අත්විඳින ලදී. 2024 දී ඉන්ධන සැපයුම් සහ අපනයන ක්‍රියාකාරකම් වලින් නව ආදායම් ප්‍රවාහයක් මතු වූ අතර, එය සමස්ත පහත වැටීම අර්ධ වශයෙන් පියවා ගන්නා ලදී. සමස්තයක් වශයෙන්, ප්‍රධාන අංශවල අඩු වූ කාර්ය සාධනය වසරේ මුළු ආදායම අඩු වීමට හේතු විය.

## අංශ කාර්ය සාධනය

* ප්‍රවාහන අංශයේ ආදායම 2023 දී රුපියල් මිලියන 959,301 සිට 2024 දී රුපියල් මිලියන 649,089 දක්වා පහත වැටුණු අතර එය 32% ක අඩුවීමක් පිළිබිඹු කරයි. ඊට අනුරූපව, විකුණුම් පරිමාව ලීටර් මිලියන 2,740 සිට ලීටර් මිලියන 2,257 දක්වා පහත වැටුණි. ආදායම සහ ප්‍රමාණය යන දෙකෙහිම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පෙර කාලපරිච්ඡේදයට සාපේක්ෂව වසර තුළ අඩු ඉල්ලුම සහ මිල ගැලපීම් ය.

* 2023 දී බිලියන 181 ක් වූ විදුලිබල අංශයේ විකුණුම් 2024 දී 38% කින් පහත වැටී බිලියන 112 ක් විය. විකුණුම් පරිමාව ද 25% කින් පහත වැටී පෙර වසරේ ලීටර් මිලියන 769 සිට ලීටර් මිලියන 579 දක්වා වාර්තා විය. වටිනාකම සහ පරිමාව යන දෙකෙහිම අඩුවීම් විදුලිබල අංශයෙන් ඇති දුර්වල ඉල්ලුම ඉස්මතු කරයි.

* අඛණ්ඩ ඉන්ධන සැපයුමක් සහතික කිරීම සඳහා කැපවීමෙන්, ගුවන් යානා ඉන්ධන අලෙවි පරිමාව 24% කින් වැඩි විය. කෙසේ වෙතත්, ගෝලීය ඉන්ධන වෙළඳපොලේ උච්චාවචනයන් පිළිබිඹු කරමින් ආදායම බිලියන 122 සිට බිලියන 120 දක්වා සුළු වශයෙන් පහත වැටුණි .

* 2024 දී, දේශීය අංශයේ විකුණුම් ආදායම 28% කින් වර්ධනය වූ අතර, විකුණුම් පරිමාවේ 55% ක වැඩිවීමක් දක්නට ඇත. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් වෙළඳපොල තුල මිල උච්චාවචනයන් හේතුවෙන්, ආදායම් වර්ධනය පරිමාවේ වැඩිවීමට සමපාත නොවිය.

* 2024 දී ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සිය නැව් තෙල් මෙහෙයුම සාර්ථකව නැවත ස්ථාපිත කල අතර, මුළු විකුණුම් පරිමාව ලීටර් මිලියන 107 ක් විය. මෙය සමස්ත විකුණුම් ආදායමට ආසන්න වශයෙන් ඩොලර් බිලියන 28 ක් දායක වූ අතර ඩොලර් මිලියන 390 ක ශුද්ධ ලාභයක් උපයා ගත්තේය.

## ලාභ

වසර මැදදී සැලසුම්සහගත නඩත්තු කටයුතු සඳහා සැලසුම් කළ ප්‍රධාන වසා දැමීමක් හැරුණු විට, පිරිපහදුව 2024 පුරාම අඛණ්ඩව ක්‍රියාත්මක විය. එහි මෙහෙයුම් සංස්ථාවට ධනාත්මක ලාභයක් ජනනය කළ අතර සමස්ත ලාභදායිතාවයට වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. තවද, සාමාන්‍ය ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා පවතින මිලකරණ යාන්ත්‍රණ මගින් සහ ගුවන් සේවා අංශයේ ශක්තිමත් ක්‍රියාකාරිත්වය සමාගමේ ලාභදායිතාවයට සැලකිය යුතු ලෙස දායක විය

සංස්ථාව රුපියල් බිලියන 33 ක සැලකිය යුතු ලාභයක් වර්ෂය තුලදී අත්කර ගත් අතර, එයට ප්‍රධාන සාධක කිහිපයක් දායක විය. මේවාට අනෙකුත් ආදායම් උත්පාදනය, විදේශ විනිමය ලාභ, මූල්‍ය ආදායම සහ පොලී වියදම් අඩුවීම ඇතුළත් වූ අතර, මේ සියල්ල සමස්ත ලාභදායිතාවයට ධනාත්මක බලපෑමක් ඇති කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම ශක්තිමත් මූල්‍ය කාර්ය සාධනය වසර අවසානයේදී සංස්ථාවේ ධනාත්මක කොටස් තත්ත්වය තවදුරටත් ශක්තිමත් කළ අතර, එහි මූල්‍ය ස්ථාවරත්වය සහ අනාගත මෙහෙයුම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කළේය.

## බදුකරණය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සහ එහි සංශෝධන අනුව ආදායම් බදු වියදම ගණනය කරනු ලැබේ. ඉදිරියට ගෙන යන සමුච්චිත බදු අලාභයක් ඇති බැවින්, වර්ෂය සඳහා සැලකිය යුතු ආදායම් බදු වගකීමක් පැන නැගී නොමැත. සවිස්තරාත්මක බදු වගකීම 123 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවල සටහන 07 හි දක්වා ඇත.

## විශේෂ ගාස්තුව

2014 දී, මහා භාණ්ඩාගාරය සංස්ථාව වෙත වාර්ෂික ගාස්තුවක් ගෙවීමට උපදෙස් දුන් අතර, ආදායම් ප්‍රකාශයේ 2014 දී රුපියල් මිලියන 250 ක්, 2015 දී රුපියල් මිලියන 750 ක් සහ 2016 සිට 2024 දක්වා වාර්ෂිකව රුපියල් මිලියන 1,000 ක් ලෙස ගාස්තුව සැලකිය යුතුය. ඒ අනුව, 2024 වසර සඳහා රුපියල් මිලියන 1,000 ක් කපා හරින ලදී. ඊට අමතරව, 2024 දී රුපියල් බිලියන 10 ක විශේෂ දායකත්වයක් සංස්ථාව විසින් ලබා දෙන ලදී.

## දේපල, පිරියත සහ උපකරණ

සංස්ථාවේ සහ එහි සමූහයේ දේපළ, සහ උපකරණ පිරියත සහ ආයෝජන දේපළ පිළිබඳ විස්තර 124 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවල 08 වන සටහනේ දක්වා ඇත. වසර තුළ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ස්ථාවර වත්කම් සඳහා රු. බිලියන 2.6 ක් ආයෝජනය කර ඇත.

## ආයෝජන

වසර තුළ, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ත්‍රිකුණාමලය ටැංකි සංකීර්ණයේ ඇති තෙල් ටැංකි සඳහා ආයෝජනයෙන් ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා ඇති ටැංකි ලංකා IOC PLC සමඟ ඒකාබද්ධ ව්‍යාපාරයක් වන ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් (පුද්ගලික) සමාගමේ රුපියල් මිලියන 39 ක් ආයෝජනය කළේය.

## දායක ප්‍රාග්ධනය

2024 දෙසැම්බර් 31 වන විට මුළු දායක ප්‍රාග්ධනය රු. මිලියන 912,580.51 (2023 - රු. මිලියන 912,580.51) විය.

## ප්‍රාග්ධන සංචිත

2024 දෙසැම්බර් 31 වන විට සංස්ථාවේ ප්‍රග්ධන සංචිතය රු. මිලියන 4,992.69 විය.(2023 - රු. මිලියන 4,992.69 ) විය.

## මානව සම්පත්

මානව සම්පත සංස්ථාවේ ප්‍රධාන උපායමාර්ගික වත්කමක් වන අතර, සංස්ථාවෙ හි දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා නියැලී සිටින සේවකයින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. වසර පුරාවටම, ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම සහ සංස්ථාවේ දිගුකාලීන මෙහෙයුම් සඳහා එහි දායකත්වය උපරිම කිරීම සඳහා මුලපිරීම් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. සංස්ථාවෙ හි මානව සම්පත් උපාය මාර්ගය පුහුණුව, සංවර්ධනය සහ වෘත්තීය ප්‍රගතිය අවධාරණය කරන අතර, දිගු කාලීනව සංවිධානයේ වර්ධනයට සහ උපායමාර්ගික අරමුණු සඳහා සහාය වන කුසලතා, අභිප්‍රේරිත සහ තිරසාර මානව ප්‍රාග්ධන පදනමක් ගොඩනැගීම අරමුණු කරයි. වටිනාකම් නිර්මාණයේ 58-62 පිටුවල මානව ප්‍රාග්ධනය විස්තරාත්මකව සාකච්ඡා කෙරේ.

## කැපී පෙනෙන නීති කෘත්‍යයන්

මූල්‍ය ප්‍රකාශනවල 26 වන සටහන යටතේ හෙළිදරව් කර ඇති සංස්ථාවට එරෙහිව විභාග වෙමින් පවතින නඩු, සංස්ථාවේ මූල්‍ය ස්ථායිතාවයට හෝ එහි අනාගත මෙහෙයුම් වලට සැලකිය යුතු බලපෑමක් ඇති නොකරන බව අධ්‍යක්ෂවරුන්ගේ මතයයි.

## නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම

අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ උපරිම දැනුම හා විශ්වාසයට අනුව, සංස්ථාව අදාළ නීති සහ රෙගුලාසි උල්ලංඝනය කරන කිසිදු ක්‍රියාකාරකමක නිරත වී නොමැත .

## පාරිසරික ආරක්ෂාව

අදාළ පාරිසරික නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම සඳහා සංස්ථාව සියලු උත්සාහයන් ගෙන ඇත.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා විශ්වාසය අනුව, නියාමන සහ ව්‍යවස්ථාපිත බලධාරීන්ට ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් (රේගු ගෙවීම්වල තාවකාලික ප්‍රමාදයන් හැර) පවතින සීමිත මූල්‍ය හැකියාවන් සමඟ නියමිත වේලාවට පියවා ඇත.

## රජය වෙත දායකත්වය

වසර තුළ දී, සංස්ථාව රජයට රුපියල් මිලියන 277,875 ක දායකත්වයක් ලබා දුන් අතර, එය 2023 දී රුපියල් මිලියන 233,220 ක් වූ අතර, එය ශ්‍රී ලංකා රේගුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු තීරුබදු, බදු සහ අනෙකුත් ව්‍යවස්ථාපිත බදු ආකාරයෙන් වැඩි වේ.

## වාර්තා කළ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනයේ 140 පිටුවේ ඇති මූල්‍ය ප්‍රකාශනවල සටහන 27 හි හෙළිදරව් කර ඇති සිදුවීම් හැර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කිරීමේ දිනයෙන් පසු වෙනත් කිසිදු ප්‍රමාණාත්මක වැදගත් සිදුවීමක් වාර්තා වී නොමැත.

## අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ සමස්ථ ව්‍යුහය වර්ධනය කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ මෙහෙයුම්වල මූල්‍ය සහ වාණිජ ස්ථායීභාවය තහවුරු කිරීම සඳහා ප්‍රතිපත්ති සමඟ සංස්ථාවේ සැලැස්ම සකස් කර ඇත. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම මූලධර්මය ඔස්සේ සකස් කර ඉදිරිපත් කර ඇත.

## විගණකවරුන් පත් කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව විගණකවරයා පත් කර ඇති අතර ඒ අනුව, විගණකාධිපතිවරයා සංස්ථාවේ විගණකවරයා වේ .

විගණකවරයාගේ ගාස්තුව 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා පනත සහ ජාතික විගණන පනතට අනුකූලව තීරණය කරනු ලැබේ.

## විගණකවරුන්ගේ ගාස්තුව සහ ලංකා ඛනිජ තෙල් සංස්ථාව සමඟ ඇති කර ගත් ගිවිසුම සඳහා වන උනන්දුව

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාව විසින් රුපියල් මිලියන 8 ක (2023 - රුපියල් මිලියන 7.0) විගණන ගාස්තුවක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇත. අධ්‍යක්ෂවරුන්ගේ දැනුමට අනුව , විගණකවරුන්ට සංස්ථාව සමඟ හෝ එහි අනුබද්ධිත ආයතනය සමඟ ගිවිසුම් සම්බන්ධයෙන් වෙනත් කිසිදු සම්බන්ධතාවයක් හෝ උනන්දුවක් නොමැත.

## වාර්තාවේ අන්තර්ගතය පිළිගැනීම

1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32(3) වගන්තියට අනුව, 2024 වර්ෂය සඳහා සංස්ථාවේ වාර්ෂික වාර්තාව සකස් කර ඉදිරිපත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම වාර්ෂික වාර්තාවේ අත්සන් කරන ලද්දේ;



**සභාපති** **කළමනාකාර අධ්‍යක්ෂතුමා**

19.12 .2025

# විගණකාධිපති වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන


| | පිටු අංකය |
|---|---|
| විගණකාධිපති වාර්තාව | 92 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 109 |
| මූල්‍ය තත්ව ප්‍රකාශය | 110 |
| ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 111 |
| මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 112 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 113 |

ජාතික විගණන කාර්යාලය

මගේ අංකය: ENR/A/CPC/1/24/01 ඔබගේ අංකය: දිනය: 2025 සැප්තැම්බර් 24

සභාපතිතුමා

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි අනුබද්ධිත ආයතනවල මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව.**

---

**1.මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය කළ මතය**

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම වෙනස්වීම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු ඇතුළුව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ("සංස්ථාව") සහ එහි අනුබද්ධිත සමාගම්වල ("සමූහය") මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියේ විධිවිධාන සමඟ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මූල්‍ය පනතේ විධිවිධාන සමඟ ඒකාබද්ධව කියවන ලද මගේ මඟ පෙන්වීම යටතේ සිදු කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තියේ විධිවිධාන අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන මගේ වාර්තාව නියමිත වේලාවට සභාගත කරනු ලැබේ.

මගේ මතය අනුව, මගේ වාර්තාවේ තත්වගණනය කල කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම් හැර, සංස්ථාවේ සහ සමූහයේ මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මගින් 2024 දෙසැම්බර් 31 වන දිනට සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනට සමූහයේ අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ලබා දේ.

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) සමාලෝචනයට භාජනය වන වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමට (CPSTL) ගෙවිය යුතු සහ ලැබිය යුතු ශේෂයන් පිළිවෙලින් රුපියල් මිලියන 6,754 ක් සහ රුපියල් මිලියන 187 ක් විය. කෙසේ වෙතත්, CPSTL හි මූල්‍ය ප්‍රකාශනවලට අනුව, අනුරූප ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් පිළිවෙලින් රුපියල් මිලියන 8,100 ක් සහ රුපියල් මිලියන 180 ක් විය. ඒ අනුව, මෙම ශේෂයන් අතර රුපියල් මිලියන 1,346 ක් සහ රුපියල් මිලියන 7 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) පාරිභෝගිකයින් 24 දෙනෙකුගෙන් ලැබුණු අත්තිකාරම් රුපියල් මිලියන 8.32 ක් පාරිභෝගික ලෙජර් ගිණුමේ සටහන් කර ඇත. කෙසේ වෙතත්, මෙම ලැබීම් පියවා ගැනීමෙන්  හෝ සංස්ථාවේ ආදායමක් ලෙස හඳුනා ගැනීමකින් තොරව පැවතුනි.

(ඇ) LKAS 16 හි 24 සහ 55 ඡේදවලට අනුව, කළමනාකාරීත්වය විසින් අදහස් කරන ආකාරයට වත්කමක් භාවිතයට යෙදවීමට හැකි ව පවතින කෙරීගෙන යන වැඩ  ප්‍රාග්ධන වැඩ, (CWIP) සිට දේපල, පිරියත සහ උපකරණ (PPE) හි  සුදුසු කාණ්ඩයට මාරු කළ යුතු අතර, ඒ අනුව ක්ෂය විය යුතුය. කෙසේ වෙතත්, රුපියල් මිලියන 131.7 ක වියදමින් නිම කරන ලද ප්‍රාග්ධන ව්‍යාපෘති හතරක් ප්‍රාග්ධනීකරණය කර නොතිබුණි.එහි ප්‍රතිඵලයක් ලෙස, ක්ෂයවීම් ආරම්භ කිරීමේ ප්‍රමාදය වත්කම් සහ ශුද්ධ ලාභය අධිප්‍රකාශනය කිරීමට හේතු වී ඇත.

(ඈ) 2021 ඔක්තෝබර් මාසයේදී නව තාර  අංගනයක් සඳහා රුපියල් මිලියන 23.47 ක වියදමින් ප්‍රසම්පාදනය කර ස්ථාපනය කරන ලද පොම්පයක් ප්‍රාග්ධනීකරණය කර නොතිබුණි. තවද, 2014 සිට මෙම වාර්තාවේ දිනය දක්වා තාර නිෂ්පාදන කටයුතු සඳහා වත්කම භාවිතා නොකර පැවතුනි. කෙසේ වෙතත්, LKAS 36 හි 09 වන ඡේදයට අනුව කිසියම් හානියක් තක්සේරු කිරීමට සහ ඒ අනුව අවශ්‍ය ගැලපීම් සිදු කිරීම සඳහා අපහානයනය පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ඉ) භාණ්ඩ නැව්ගත කිරීම ප්‍රමාද වීම හේතුවෙන් දඩ මුදලක් ලෙස ලැබුණු රුපියල් මිලියන 33.34 ක මුදලක් වෙනත් ආදායම් ගිණුමේ ගිණුම්ගත කිරීම වෙනුවට ගෙවිය යුතු ගිණුමේ ගිණුම්ගත කර තිබුණි. එබැවින් සමාන වටිනාකමකින් වෙනත් ආදායම් අවතක්සේරු වී ඇති අතර ගෙවිය යුතු මුදල අධිතක්සේරු වී ඇත.

(ඊ) LKAS 40 - ආයෝජන දේපල ප්‍රමිතියට අනුකූලව, ආයෝජන දේපල පසුව අගය කිරීම පිරිවැය මත සිදුකිරීම සංස්ථාව විසින් අනුගමනය කර ඇත. කෙසේ වෙතත්, ආයෝජන දේපල සඳහා සාධාරණ වටිනාකම හෙළිදරව් කිරීම 2012 සහ 2016 දී සිදු කරන ලද තක්සේරු කිරීම් මත පදනම් වේ. එබැවින්, ආයෝජන මත සාධාරණ වටිනාකම් හෙළිදරව් කිරීමේදී  මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට තාත්වික තොරතුරු ඉදිරිපත් කර නැත.

(උ) සංස්ථාව සතුව ඇති තොරතුරුවලට අනුව, පිරිපහදුවේ වත්කම් තාක්ෂණිකව යල් පැන ගිය අතර එමඟින් ධාරණ මුදල අයකර ගත නොහැකි විය හැකි බව පෙන්නුම් කරයි. එහෙත්, කිසිදු හානිකරණ සමාලෝචනයක් සිදු කර හෝ ඒ අනුව අවශ්‍ය ගැලපීම් සිදු කර නැත.

(ඍ) SLFRS 10 හි B86(C) ඡේදයට අනුව, සමූහයේ ආයතන අතර ගනුදෙනුවලට අදාළ අන්තර් සමූහ වත්කම් සහ වගකීම්, හිමිකම්, ආදායම්, වියදම් සහ මුදල් ප්‍රවාහයන් සම්පූර්ණයෙන්ම ඉවත් කළ යුතුය. කෙසේ වෙතත්, සංස්ථාව ගෙවිය යුතු ශේෂය රු. මිලියන 7 ක් සහ ලැබිය යුතු ශේෂය රු. මිලියන 1346 කින් යුත් අන්තර් සමාගම් ශේෂයන් හඳුනා ගැනීමට, සැසඳීමට හා ඉවත් කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඎ) LKAS 16 හි 36 වන ඡේදයට අනුව, දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන්නේ නම්, එම වත්කම අයත් වන දේපල, පිරියත සහ උපකරණවල සමස්ත පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතුය. කෙසේ වෙතත්, පර්චස් 2,220.88 ක වපසරියකින් යුත් ඉඩම් කැබලි 18 ක් සහ වපසරිය විගණනයට ලබා නොදුන් රුපියල් මිලියන 126.4 ක පිරිවැයට වාර්තා කළ ඉඩම් කැබලි 10 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ඎඎ) LKAS 1 හි 54 වන ඡේදයෙන් අවශ්‍ය වන පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ගෙවිය යුතු ආදායම් බද්ද නියෝජනය කරන රුපියල් මිලියන 2,411 ක මුදලක්, ජංගම වගකීම් යටතේ වෙනම රේඛීය අයිතමයක් ලෙස ඉදිරිපත් කර නැත.

(ඏ) 2005 වර්ෂයේදී නිකුත් කරන ලද හර නෝට්ටු තුනක් හරහා LIOC ආයතනයෙන් රුපියල් මිලියන 54.07 ක පොලියක් අය කර තිබුණි. කෙසේ වෙතත්, අදාළ ගිණුම් වාර්තා සහ ආදාල ලේඛන විගණනය සඳහා සපයා නොමැත. මෙම ආධාරක ලියකියවිලි නොමැතිකම මෙම ගනුදෙනුවලට අදාළ ඓතිහාසික මූල්‍ය වාර්තාකරණයේ සම්පූර්ණත්වය සහ විශ්වාසදායි බව පිළිබඳ ගැටළු මතු කරයි. තවද, 2020 ජූනි 16 දිනට අධ්‍යක්ෂක මණ්ඩල ව්‍යවස්ථා අංක 07/1240 ට අනුව, සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉහත සඳහන් හර නෝට්ටු අවලංගු කිරීමට සහ අදාළ මුදල LIOC වෙත ආපසු ගෙවීමට තීරණය කළේය. ප්‍රමාණවත් වාර්තා නොමැතිවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමෙන් හෝ ලැබිය යුතු දේ නිසි ලෙස ලේඛනගත කිරීමට සහ සාක්ෂි රඳවා ගැනීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්වයන් රඳවා ගැනීමෙන් තොරව මෙම තීරණය ගෙන ඇති බව පෙනේ.

(ඐ) 2024 වර්ෂය සඳහා ගෙවිය යුතු මුදලක් ලෙස රුපියල් මිලියන 6.17 ක මුදලක් සටහන් කර තිබූ අතර, එම මුදල 2022 දී කුලියට ගත් ඉන්ධන බවුසර් මගින් සිදු කරන ලද ප්‍රවාහන සේවාවන්ට අදාළ බව සඳහන් කර තිබුණි. කෙසේ වෙතත්, 2022 දී ප්‍රවාහන සේවා සැබවින්ම ලැබුණු බව සනාථ කිරීම සඳහා ඉන්වොයිසි, බෙදාහැරීමේ සටහන්, සේවා තහවුරු කිරීම් හෝ ගිවිසුම්ගත වාර්තා වැනි කිසිදු ආධාරක ලියකියවිලි ලබා දී නැත. ප්‍රමාණවත් සාක්ෂි නොමැති විට, වියදමේ වලංගුභාවය, නිරවද්‍යතාවය සහ කාල සීමාව පිළිබඳ අදාළත්වය තහවුරු කිරීමට නොහැකි වේ.

(එ) 2022 වසරේ දී ප්‍රවාහන සේවා සඳහා කුලියට ගත් ඉන්ධන බවුසර් සඳහා සංස්ථාව වෙනුවෙන් CPSTL සමාගම විසින් ගෙවා ඇති බව සඳහන් කරමින් 2023 වසරේදි එම සමාගම රුපියල් මිලියන 89.12ක මුදලකට හිමිකම් කියා ඇත. මෙම හිමිකම් පෑම මත පදනම්ව සංස්ථාව 2024 දී එම මුදල එහි ලෙජරයේ ගෙවිය යුතු මුදලක් ලෙස සටහන් කර ඇත. කෙසේ වෙතත්, හිමිකම් කියන සේවාවන් සංස්ථාව විසින් සැබවින්ම ලබාගෙන ඇති බව තහවුරු කිරීම සඳහා සේවා බෙදා හැරීමේ වාර්තා, ප්‍රවාහන ලොග්, ගෙවීම් වවුචර් හෝ සේවා ලැබුණු බවට තහවුරු කරන කිසිදු තහවුරු ලේඛනයක් සපයා නොමැත.

(ඒ) 2019 සිට 2024 දක්වා කාලය තුළ සංස්ථාවේ බැංකු ගිණුම් 17 ක් හරහා ලැබුණු රුපියල් මිලියන 143.52 ක සෘජු බැංකු ප්‍රේෂණ, බැංකු සැසඳීමේදී නිෂ්කාශනය නොකර අඛණ්ඩව ඉදිරියට ගෙන ගොස් තිබුණි.

(ඓ) 2024 දෙසැම්බර් 31 වන විට, සංස්ථාව විසින් ශ්‍රී ලංකා රේගුවට ගෙවිය යුතු ශේෂය රුපියල් මිලියන 35,094.30 කි. මෙයින් රුපියල් මිලියන 14,651.19 ක ශේෂයක් 2010 සිට 2022 දක්වා කාලයට අදාළ වේ. කෙසේ වෙතත්, අදාළ නැව්ගත කිරීම්, අවසාන බිල්පත් වටිනාකම්, අදාළ බදු අනුපාත, මුළු තීරුබදු සහ ගෙවිය යුතු බදු, ගෙවන ලද මුදල් සහ උපචිත මුදල් ප්‍රමාණයන් පිළිබඳ විස්තර විගණනයට ලබා දී නොමැත. තවද, ශ්‍රී ලංකා රේගුවෙන් ලැබුණු තහවුරු කිරීම අනුව, සංස්ථාව වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 36,834.24 ක මුදලක් ලැබිය යුතු බව තහවුරු කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස සංස්ථාවේ වාර්තා සහ රේගු තහවුරු කිරීම අතර රුපියල් මිලියන 1,739.94 ක වෙනසක් ඇති විය.

(ඔ) 2024 දෙසැම්බර් 31 වන විට, සංස්ථාව නීතිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රුපියල් මිලියන 0.58 ක ශේෂයක් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ශේෂ තහවුරු කිරීම අනුව රුපියල් මිලියන 12.30 ක මුදලක් සංස්ථාවෙන් ලැබිය යුතු බව වාර්තා වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රුපියල් මිලියන 11.72 ක නොගැලපුන ලද වෙනසක් ඇති විය.තවදුරටත් ආයතන දෙකෙහිම අදාළ පොදු ලෙජර පරීක්ෂා කිරීමේදී, නීතිපති දෙපාර්තමේන්තුවේ ලෙජරය 2005 සිට 2022 දක්වා සංස්ථාවෙන් ලැබිය යුතු මුදල් පිළිබිඹු කරන බව නිරීක්ෂණය විය. ඊට වෙනස්ව, සංස්ථාවේ වාර්තා හඳුනා ගන්නේ 2023 සහ 2024 වසරවලට අදාළ ගෙවිය යුතු මුදල් පමණි.

(ඕ) සමාලෝචනයේදී, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර ඇති ලැබිය යුතු ශේෂයන් සහ අලෙවිකරුවන් 16 දෙනෙකු විසින් තහවුරු කරන ලද අනුරූප ගෙවිය යුතු ශේෂයන් අතර රුපියල් මිලියන 261.32 ක නොගැලපෙන වෙනසක් නිරීක්ෂණය විය. එය අලෙවිකරුවන්ගෙන් මුළු ලැබිය යුතු ශේෂයෙන් සියයට 4 ක් නියෝජනය කරයි. තවද, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර ඇති ලැබිය යුතු ශේෂයන් සහ රජයේ ගනුදෙනුකරුවන් දෙදෙනෙකු විසින් තහවුරු කරන ලද අනුරූප ගෙවිය යුතු ශේෂයන් අතර ගැටලුවක් හේතුවෙන් රුපියල් මිලියන 422.97 ක වෙනසක් හඳුනා ගන්නා ලදී.

(ඖ) පරිපාලිත සමාගමක් වන සීමාසහිත ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් (පුද්) සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් තත්වාගණනය නොකළ විගණන මතයක් නිකුත් කරන ලදී. සමාලෝචනයට භාජනය වන වර්ෂය සඳහා අනෙක් පරිපාලිත සමාගම වන සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL) හි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය මා විසින් තත්වාගණනය කරන ලදී. සංස්ථාවට සහ සමූහයට අනුරූප ශේෂයන්/ගනුදෙනු සම්බන්ධනයෙන් එකඟ නොවීමට හේතු වන වැදගත් කරුණු පහත දැක්වේ.

(i) සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වල පිරිවැය රු. මිලියන 10,477 ක් වූ අතර එය LKAS 16 - දේපළ පිරියත සහ උපකරණ ප්‍රමිතියේ 51 වන ඡේදයට අනුව සමාගම විසින් සුන්බුන් වටිනාකම සහ ඵලදායි ජීව කාලය සමාලෝචනය නොකර අඛණ්ඩව භාවිතා කරන දේපළ පිරියත සහ උපකරණ අයිතම 26,267 කින් සමන්විත වන අතර එම වත්කම් ප්‍රමිතියේ 79(b) ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොමැත. තවද, 2003 දී සමාගම ආරම්භ කළ දා සිට සමාගම ඉඩම් සහ ගොඩනැගිලි හැර එහි අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණනය කර නොමැත. එබැවින්, ඉඩම් සහ ගොඩනැගිලි හැර

ජංගම නොවන වත්කම්වල සාධාරණ වටිනාකම සමාලෝචනයට භාජනය වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු කර නැත.

(ii) LKAS 16 - දේපළප පිරියත සහ උපකරණ ප්‍රමිතියේ 36 වන ඡේදයට අනුව, "දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කළහොත්, එම වත්කම අයත් වන දේපළ, පිරියත සහ උපකරණවල සමස්ත පන්තියම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ" යනුවෙන් සඳහන් වේ. කෙසේ වෙතත්,සංස්ථාව සතු ගොඩනැගිලි 371 න් ගොඩනැගිලි 81ක් ප්‍රත්‍යාගණනය කිරීමට සංස්ථාව අපොහොසත් වී ඇති අතර, එහි පිරිවැය රුපියල් මිලියන 246.99 ක් හෙවත් ගොඩනැගිලිවල මුළු පිරිවැයෙන් සියයට 13 ක් විය. තවද, තක්සේරු ලැයිස්තුවේ ඇති ප්‍රත්‍යාගණනය කරන ලද ගොඩනැගිලි 147 ක් ස්ථාවර වත්කම් ලේඛනය සමඟ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(iii) 2024 වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ලංකා ඉන්දියානු තෙල් සමාගමෙන් (LIOC) ලැබිය යුතු මුදල රුපියල් මිලියන 1,164 කි. කෙසේ වෙතත් LIOC විසින් තහවුරු කරන ලද ශේෂය රුපියල් මිලියන 356 කි. ඒ අනුව, ශේෂ දෙක අතර රුපියල් මිලියන 808 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එය LIOC විසින් තොග ප්‍රවාහන ගාස්තු වාර්තා නොකිරීම හේතුවෙන් ඇති වූ රුපියල් මිලියන 637ක වෙනස සම්බන්ධයෙන් සංස්ථාව LIOC,සමඟ අන්‍යෝන්‍ය වශයෙන් එකඟතාවයකට පැමිණ නොතිබීම නිසා වූ වෙනස්කමක් වේ. එබැවින්, මෙම ආදායමේ අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිතය. තවද රු. මිලියන 2.50ක ලැබිය යුතු දිගුකාලීනව හිඟ ශේෂය වසර 8කට අධික කාලයක් පියවීමෙන් තොරව ඉතිරිව ඇත.

(iv) සංස්ථාව කලාපීය පදනම මත ගබඩා පහසුකම් නඩත්තු කිරීම සඳහා දිගුකාලීන කුලී පදනම මත දුම්රිය සංචිත 09 ක් භාවිතා කරන අතර එකඟ වූ පරිදි 2013 වසර දක්වා කුලී ගෙවීම් සිදුකර ඇත. . දුම්රිය දෙපාර්තමේන්තු සාමාන්‍යාධිකාරිවරයාගේ 2024 සැප්තැම්බර් 12 දිනැති ලිපියට අනුව ගෙවිය යුතු හිඟ කුලිය රුපියල් මිලියන 111.11 කි. සංස්ථාව විසින් මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු කුලිය ලෙස දක්වා ඇති මුදල රුපියල් මිලියන 99.88 ක් වූ අතර 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු කුලිය සඳහා ඌන ප්‍රතිපාදනය රුපියල් මිලියන 11.23 කි. තවද, මෙම කල්බදු ගිවිසුම් 2013 වර්ෂයේදී කල් ඉකුත් වී ඇති අතර, තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කුලී වටිනාකම දැන ගැනීමෙන් පසු දුම්රිය දෙපාර්තමේන්තුව කල්බදු ගිවිසුම් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, කුලී වටිනාකම සමඟ එකඟ නොවීම හේතුවෙන් සංස්ථාව ගිවිසුමට අත්සන් කර නැත.

(v) රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.7 ඡේදයට අනුව, ස්ථාවර වත්කම් වාර්ෂික පදනමින් භෞතිකව සත්‍යාපනය කළ යුතුය. කෙසේ වෙතත්, 2003 වර්ෂයේ සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු සංස්ථාව රුපියල් මිලියන 18,598 ක ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය කර නැත.

මම මෙම විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව සිදු කළෙමි. එම ප්‍රමිතීන් යටතේ මගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වන විගණකාධිපතිවරයාගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මා ලබාගෙන ඇති විගණන සාක්ෂි මගේ තත්වාගණනය කළ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු බව මම විශ්වාස කරමි.

**කරුණු අවධාරණය කිරීම**

2022 මාර්තු 10 දිනැති 1038 චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමට එරෙහිව දිස්ත්‍රික් අධිකරණයේ විභාග වෙමින් පවතින නඩු පහක් සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතින නඩු පහක් (අභියාචනා) සම්බන්ධයෙන් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල අංක 26 සටහන වෙත මම අවධානය යොමු කරමි. තවද, CPC ට එරෙහිව අභියාචනාධිකරණයේ විභාග වෙමින් පවතින නඩු දෙකක් තිබේ. ඉහත සඳහන් නඩු CPC ට පක්ෂව තීරණය කළහොත්, 2024 දෙසැම්බර් 31 වන විට අලෙවිකරුවන්ගෙන් CPC වෙත ලැබිය යුතු මුදල රුපියල් මිලියන 37,604 කි.

## 1.3 සමූහයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

අනෙක් තොරතුරුවලට 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරු ඇතුළත් වේ, නමුත් මෙම විගණන වාර්තාවේ දිනයෙන් පසුව ලබා ගත හැකි වනු ඇතැයි අපේක්ෂා කරන මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳ විගණන, වාර්තාව ඇතුළත් නොවේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර ඒ පිළිබඳව කිසිදු ආකාරයක සහතික කිරීමේ නිර්ණායකයක් මම ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනය සම්බන්ධයෙන්, ඉහත හඳුනාගෙන ඇති අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම මගේ වගකීම වන අතර, එසේ කිරීමේදී, අනෙක් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ සැලකිය යුතු ලෙස නොගැලපේද නැතහොත් විගණනයේදී ලබාගත් මගේ දැනුම සමඟ සැලකිය යුතු ලෙස නොගැලපේද නැතහොත් වෙනත් ආකාරයකින් සැලකිය යුතු ලෙස වැරදි ලෙස ප්‍රකාශ කර ඇති බව පෙනේද යන්න සලකා බැලීම මගේ වගකීම වේ.

වාර්ෂික වාර්තාව කියවන විට, එහි සැලකිය යුතු වැරදි ප්‍රකාශයන් ඇති බව මා නිගමනය කරන්නේ නම්, එම කාරණය නිවැරදි කිරීම සඳහා පාලනය භාරව සිටින අයට දැනුම් දිය යුතුය. තවත් සැලකිය යුතු නිවැරදි නොකළ වැරදි ප්‍රකාශයන් තිබේ නම්, ඒවා නියමිත වේලාවට සභාගත කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධානවලට අනුකූලව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන මගේ වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණයේ සහ පාලනය භාරව සිටින අයගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා කළමනාකරණය වගකිව යුතු අතර, කළමනාකාරිත්වය තීරණය කරන පරිදි එවැනි අභ්‍යන්තර පාලනයක් සඳහා වංචා හෝ දෝෂ හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවලින් තොර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, සමූහයේ අඛණ්ඩ පැවැත්මේ හැකියාව තක්සේරු කිරීම, අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අදාළ වන පරිදි හෙළිදරව් කිරීම සහ කළමනාකරණය විසින් සමූහය අවසන් කිරීමට හෝ මෙහෙයුම් නැවැත්වීමට අදහස් කරන්නේ නම් හෝ එසේ කිරීම හැර වෙනත් යථාර්ථවාදී විකල්පයක් නොමැති නම් මිස අඛණ්ඩ පැවැත්මේ ගිණුම්කරණ සංකල්පය භාවිතා කිරීම කළමනාකරණයේ වගකීමකි.

කළමනාකරණය භාරව සිටින සියලුම දෙනා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තියට අනුව, සංස්ථාවේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකිවන පරිදි, සංස්ථාව සහ සමූහය ඔවුන්ගේ සියලු ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ නිසි පොත්පත් සහ වාර්තා පවත්වා ගැනීමට අවශ්‍ය වේ.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකවරයාගේ වගකීම්

මගේ අරමුණ වන්නේ වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන සමස්තයක් ලෙස සැලකිය යුතු වැරදි ප්‍රකාශයන්ගෙන් තොරද යන්න පිළිබඳව සාධාරණ සහතිකයක් ලබා ගැනීම සහ මගේ මතය ඇතුළත් විගණක වාර්තාවක් නිකුත් කිරීමයි.සාධාරණ සහතිකය යනු ඉහළ මට්ටමේ සහතිකයක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන ලද විගණනයක් සෑම විටම සැලකිය යුතු වැරදි ප්‍රකාශනයක් පවතින විට එය අනාවරණය කරන බවට සහතිකයක් නොවේ. වැරදි ප්‍රකාශන වංචාවක් හෝ දෝෂයක් නිසා ඇති විය හැකි අතර ඒවා තනි තනිව හෝ සමස්තයක් වශයෙන් මෙම මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව ආර්ථික තීරණ ගනු ලබන පරිශීලකයින්ට බලපෑම් කිරීම සැලකිය යුතු ලෙස අපේක්ෂා කළ හැකි නම් ඒවා වැදගත් ලෙස සැලකේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනයක කොටසක් ලෙස, මම වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කරන අතර විගණනය පුරාවටම වෘත්තීය සංශයවාදය පවත්වා ගනිමි. එමෙන්ම මම;

- වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්හි අවදානම් හඳුනාගෙන තක්සේරු කරමි. එම අවදානම් වලට ප්‍රතිචාර වශයෙන් විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන අතර, මගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගනිමි. වංචාවක් ආකාරයට කුමන්ත්‍රණයක්, ව්‍යාජ ලේඛන සකස් කිරීමක්, හිතාමතා අතපසු කිරීම්, වැරදි නිරූපණයන් හෝ අභ්‍යන්තර පාලනය ඉක්මවා යාමක් ඇතුළත් විය හැකි බැවින්, වංචාවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් අනාවරණය නොකිරීමේ අවදානම දෝෂයකින් ඇති වන එකකට වඩා වැඩිය.

- සංස්ථාවේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොව, තත්ත්වයන් යටතේ සුදුසු විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ කළමනාකරණය විසින් සිදු කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තු සහ අදාළ හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය ඇගයීම කර ඇත.

- ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්මේ පදනම කළමනාකරණය විසින් භාවිතා කිරීමේ යෝග්‍යතාවය සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, සමූහයේ අඛණ්ඩ පැවැත්මේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සිදුවීම් හෝ කොන්දේසි සම්බන්ධයෙන් සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් තිබේද යන්න පිළිබඳව නිගමනය කරමි. සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් පවතින බව මම නිගමනය කළහොත්, මූල්‍ය ප්‍රකාශනවල අදාළ හෙළිදරව් කිරීම් කෙරෙහි මගේ විගණක වාර්තාවේ අවධානය යොමු කිරීමට හෝ එවැනි හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවේ නම්, මගේ මතය වෙනස් කිරීමට මට අවශ්‍ය වේ. මගේ නිගමන පදනම් වී ඇත්තේ මගේ විගණක වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත ය. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ කොන්දේසි සමූහයේ අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාම නැවැත්වීමට හේතු විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය නිරීක්ෂණය සහ මූල්‍ය ප්‍රකාශන සාධාරණ ඉදිරිපත් කිරීමක් සාක්ෂාත් කර ගන්නා ආකාරයෙන් ආදාළ වන ගනුදෙනු සහ සිදුවීම් නියෝජනය කරන්නේද යන්න නිරීක්ෂණය කරමි.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතනවල හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නෙමි. සමූහයේ විගණනයේ දිශාව, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා අපි වගකිව යුතුය. මගේ විගණන මතයට මම සම්පූර්ණයෙන්ම වගකිව යුතු ය.

මගේ විගණනයේදී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ඇතුළුව, අනෙකුත් කරුණු, සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලනය භාරව සිටින අය සමඟ මම සන්නිවේදනය කරමි.

**2. වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත් වේ.

2.1.1 මගේ වාර්තාවේ තත්වාගණනය කළ මතයේ පදනමේ විස්තර කර ඇති කරුණු වල බලපෑම් හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන ඇති අතර මගේ පරීක්ෂණයෙන් පෙනෙන පරිදි 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව සංස්ථාව විසින් නිසි ගිණුම්කරණ වාර්තා තබා ඇත.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (d) (iii) වගන්තියේ අවශ්‍යතාවයට අනුව, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පෙර වර්ෂයට අනුකූල වේ.

2.1.3 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (d) (iv) වගන්තියේ අවශ්‍යතාවයට අනුව, මගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනමේ විස්තර කර ඇති 1.2 (a), (h), (i), සහ (q) හි විගණන කරුණු හැර, පෙර වර්ෂයේ මා විසින් කරන ලද සියලුම නිර්දේශ ඇතුළත් වේ.

2.2 පදනම් කරන ලද ක්‍රියා පටිපාටි සහ ලබාගත් සාක්ෂි වලට සීමාවූ සැලකිය යුතු කරුණු කිසිවක් මගේ අවධානයට යොමු වී නොමැත;

2.2.1 018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (d) වගන්තියේ අවශ්‍යතාවය අනුව සාමාන්‍ය ව්‍යාපාරයෙන් බැහැරව සංස්ථාව විසින් ඇති කර ගන්නා ලද ඕනෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් සංස්ථා මණ්ඩලයේ පාලක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව ප්‍රකාශ කිරීම.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (f) වගන්තියේ අවශ්‍යතාවයට අනුව සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීතිය, සාමාන්‍ය සහ විශේෂ විධාන කිසිවක් සංස්ථාව විසින් අනුගමනය කර නොමැති බව ප්‍රකාශ කිරීමට; හැර

| නීති/ නියමයන් ආදිය වෙත යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත | |
| (i) 16(2) වගන්තිය | පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචනය කරන අවස්ථාවේදී සංස්ථාව විසින් 2024 වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 38 (2) වගන්තිය | අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීතාවය නිරීක්ෂණය කිරීම සඳහා සහ එවැනි සමාලෝචන ලිඛිතව ලේඛනගත කර විගණකාධිපතිවරයාට ලබා ගත හැකි බව සහතික කිරීම සඳහා ආයතනයක ගිණුම්කරණ නිළධාරියා වරින්වර සමාලෝචන පැවැත්විය යුතු වුවද,සංස්ථාව මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොමැති බව නිරීක්ෂණය විය. |
| (ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක PED 01/2021 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය මගින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ | |
| (i) මාර්ගෝපදේශය 2.2.5 (ආ) | මව් රාජ්‍ය ව්‍යවසායෙහි අධ්‍යක්ෂ මණ්ඩලය, පුළුල් නියාමන සහ නීතිමය රාමුව තුළ එහි අනුබද්ධ සමාගම්වල කටයුතු සමාලෝචනය කිරීමේ වගකීම භාර ගත යුතුය. ඒ අනුව, මව් රාජ්‍ය ව්‍යවසායෙහි මණ්ඩලය;<br><br>(i.) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී පරිපාලිත සමාගම්වල කාර්ය සාධනය නිතිපතා සමාලෝචනය කළ යුතු ය.<br><br>(ii.) පරිපාලිත ආයතනයෙන් පැන නගින මව් රාජ්‍ය ව්‍යවසායනයට අවසානයේ බලපෑ හැකි සියලු සැලකිය යුතු අවදානම් සහ අනෙකුත් ගැටළු පිළිබඳව දැනුවත් විය යුතු ය.<br><br>(iii.) පරිපාලිත සමාගම් අතර සිදුවන අන්තර් |

සමාගම් ගනුදෙනු සමීපව නිරීක්ෂණය කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත අවශ්‍යතා සපුරා නොතිබුණි.

(ii) මාර්ගෝපදේශය 3.2

අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතා අනුව සමාගම් පනත හැර අනෙකුත් ප්‍රඥප්ති යටතේ සංස්ථාගත කර ඇති ආයතන, වාර්ෂික වාර්තාව (AR) ඉදිරිපත් කිරීම සඳහා වාර්ෂික කාර්යසාධන සමාලෝචන රැස්වීම(APRM) පැවැත්වීම සහ ප්‍රධාන ආයතනයේ කාර්ය සාධන කොටස්කරුවන් සමඟ සාකච්ඡා කිරීමට පහසුකම් සැලසිය යුතු වේ.කෙසේ වෙතත්, සංස්ථාව 2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන සමාලෝචන රැස්වීම පවත්වා නොමැති බව නිරීක්ෂණය විය.

(iii) මාර්ගෝපදේශය 4.3

ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුව, ලංකා ඛනිජ තෙල් සංස්ථාව (CPC) අවදානම් කමිටුවක් පිහිටු විය යුතු රාජ්‍ය හිමිකාරීත්වය දරන ව්‍යවසායයක් (SOE) ලෙස හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා සංස්ථාව අවදානම් කමිටුවක් පිහිටුවා නොතිබුණි. අවදානම් කමිටුවක් නොමැතිකම සැලකිය යුතු අවදානම් කල්තියා හඳුනා ගැනීමට, තක්සේරු කිරීමට සහ අවම කිරීමට සංස්ථාවට ඇති හැකියාව දුර්වල කළ හැකිය. මෙය මෙහෙයුම් අඛණ්ඩතාව,මූල්‍ය ස්ථාවරත්වය සහ සමස්ත පාලන කාර්යක්ෂමතාවයට අහිතකර ලෙස බලපෑ හැකි ය

(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 01/2021 මගින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසාය සඳහා මෙහෙයුම් අත්පොත

(i) මාර්ගෝපදේශ 2.3 සහ පරිපූරක III

සංස්ථාවේ සියලුම ප්‍රධාන කටයුතු සඳහා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් අත්පොත නිසි ලෙස සකස් කර නොතිබූ අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගෙන නොමැත.

| | |
|---|---|
| (ii) මාර්ගෝපදේශ 3.4 ix | පුරප්පාඩු වූ තනතුරක රාජකාරි ආවරණය කිරීම වසරක් (1) නොඉක්මවන කාලයකට සීමා කළ යුතුය. කෙසේ වෙතත්, පුරප්පාඩු වූ තනතුරු ආවරණය කිරීම සඳහා නිලධාරීන් 124 දෙනෙකු භාරගෙන තිබූ අතර, ඉන් A ශ්‍රේණියේ තනතුරු 63 ක් ද ඇතුළත් විය. එයින්, පුරප්පාඩු වූ තනතුරු ආවරණය කිරීම සඳහා නිලධාරීන් 57 දෙනෙකු සහ නිලධාරීන් 08 දෙනෙකු පිළිවෙලින් වසර 01 සිට වසර 03 දක්වා කාලයක් සඳහා භාරගෙන තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාවයට සංස්ථාව සිය බලතල, කාර්යයන් සහ රාජකාරි අනුව කාර්යයන් ඉටු කර නොමැති බව ප්‍රකාශ කිරීමට;

2013 ඔක්තෝබර් 29 දිනැති අංක 38/1140 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, 2014 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම සංස්ථාව සතු අලෙවි නියෝජිතයින් විසින් ක්‍රියාත්මක කරන (CODO) පිරවුම්හල් සහ භාණ්ඩාගාරික හිමිකාරීත්වය දරන අලෙවි නියෝජිතයින් විසින් ක්‍රියාත්මක කරන (TODO) පිරවුම්හල් වලින් මාසික උපයෝගිතා ගාස්තුවක් (MUF) අය කිරීමට මණ්ඩලය අනුමත කර තිබුණි. කෙසේ වෙතත්, තීරණය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර නොතිබූ අතර 2016 පෙබරවාරි 16 දිනැති අංක 11/1179 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් අනුමත කරන ලද සංශෝධිත ගිවිසුමකට එළඹීමට සංස්ථාව අපොහොසත් වීම හේතුවෙන් අලෙවිකරුවන් 220 කට වැඩි සංඛ්‍යාවකින් අලෙවිකරුවන් 11 දෙනෙකුගෙන් පමණක් මාසික උපයෝගිතා ගාස්තු අය කර තිබුණි. ඒ අනුව, 2024 වසර අවසන් වන විට අයකර නොගත් MUF රුපියල් මිලියන 7,228 දක්වා වැඩි කර තිබුණි. 2015 වසරේ සිට මේ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා අඛණ්ඩව වාර්තා කර ඇතත්, මේ දක්වා උපයෝගිතා ගාස්තු අයකර ගැනීමට සංස්ථාව විසින් සුදුසු සහ කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොමැත. දැනට, මාසික උපයෝගිතා ගාස්තු (MUF) සම්බන්ධයෙන් අධිකරණ නඩු හයක් පවතින අතර, ඒ සියල්ලේම තීරණ විභාග වෙමින් පවතී.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව අදාළ නීතිවලට අනුකූලව සහ අදාළ නීතිවලට අනුකූලව සංස්ථාවේ සම්පත් ආර්ථිකව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව සඳහන් කිරීමට;

(අ) LP ගෑස් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සහ ක්‍රීඩා පිටියක් සංවර්ධනය කිරීම සඳහා 1983 දී සංස්ථාව විසින් වනාතමුල්ල, හල්ගහ කුඹුරේ අක්කර 10 ක ඉඩමක් රුපියල් මිලියන 10.6 ක වියදමින් අත්පත් කර ගන්නා ලදි. කෙසේ වෙතත්, දශක හතරකට අධික කාලයක් තිස්සේ ඉඩම එහි අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කර නොමැති අතර දැනට එය අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කරගෙන ඇති අතර, එමඟින් වත්කම කෙරෙහි ඵලදායී පාලනයක් ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට නොහැකි වී තිබේ. මෙම දිගුකාලීන භාවිතය නොකිරීමේ සහ අනවසරයෙන් අත්පත් කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස, සංස්ථාව ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට (UDA) පැවරීමට යෝජනා කර ඇත. කෙසේ වෙතත්, විගණන දිනය වන විට විධිමත් පැවරීමක් සම්පූර්ණ කර නොතිබූ අතර ඉඩම සංස්ථාවේ පොත්වල වත්කමක් ලෙස සටහන් කර තිබුණි. එහි වර්තමාන තත්ත්වය පිළිබඳ ව හෝ නාගරික සංවර්ධන අධිකාරියට යෝජිත පැවරීම හෝ ඉඩම අත්පත් කරගෙන සිටින අනවසර පදිංචිකරුවන් පිළිබඳව හෝ මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව්වක් කර නොමැත.

(ආ) පවතින ලිපි ලේඛනවලට අනුව, සංස්ථාව විසින් රුපියල් මිලියන 0.63 ක් වියදම් කර මහහේන ඉඩමෙන් පර්චස් 21.18 ක් අත්පත් කර ගැනීමට කටයුතු කර තිබුණි.

කෙසේ වෙතත්, 2012 සහ 2014 වසරවලදී කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පවරාදීමෙන් පසුවද මෙම ඉඩම කලින් අයිතිකරුවන් විසින් පරිහරණය කර ඇත. එබැවින් මෙම ඉඩම එළිපෙහෙළි කර ලබාදීමට කටයුතු කරන ලෙස සංස්ථාව 2012 සිට 2023 දක්වා කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නැවත නැවතත් ඉල්ලීම් කර තිබුණි. කෙසේ වෙතත්, විගණන දිනය වන විට, ඉඩම විධිමත් ලෙස සංස්ථාවට භාර දී නොතිබුණි.

(ඇ) පිරවුම් යන්ත්‍ර 08ක් සහිත බහාලුම් කරන ලද ජංගම LPG පිරවුම් කම්හල සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරන ලදී.

(i) 2008 දී, සංස්ථාව ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) ව්‍යාපාරයට පිවිසීමට සැලසුම් ආරම්භ කළේය. කෙසේ වෙතත්, මෙම මුලපිරීම සිදු කරන ලද්දේ නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර ආසන්න වශයෙන් රුපියල් මිලියන 37 ක් වැය කරමිනි. මෙයින් රුපියල් මිලියන 25 ක් විශේෂයෙන් වියදම් කර ඇත්තේ පිරවුම් යන්ත්‍ර අටක් සහ අවශ්‍ය ආරක්ෂක අංගයන්ගෙන් සමන්විත බහාලුම් කළ ජංගම LPG පිරවුම් කම්හලක සැපයුම, ස්ථාපනය, ක්‍රියාත්මක කිරීම සහ පරීක්ෂා කිරීම සඳහා ය. පිරිපහදුවෙන් නිෂ්පාදනය කරන ලද LPG විකිණීම සම්බන්ධයෙන් සංස්ථාවට එරෙහිව පෞද්ගලික LPG සමාගමක් විසින් ගොනු කරන ලද අංක 397/2007 දරණ නීතිමය නඩුවක් තිබුණද, නීතිමය අවසරය ලබා ගැනීමකින් හෝ LPG ව්‍යාපාරය තුළ අඛණ්ඩ මැදිහත්වීම සම්බන්ධයෙන් සංස්ථාවේ නීති අංශයේ මතය විමසීමකින් තොරව ප්‍රසම්පාදන කමිටුව 2008 ඔක්තෝබර් 02 වන දින ජංගම LPG පිරවුම් කම්හල ප්‍රසම්පාදනය කිරීමට කටයුතු කර ඇත,. එහි ප්‍රතිඵලයක් ලෙස, LPG පිරවුම්හල ආනයනය කළ දා සිට අක්‍රියව පවතින අතර සංස්ථාවේ මෙහෙයුම් සඳහා දායක වී හෝ කිසිදු උපායමාර්ගික හෝ ජාතික අවශ්‍යතාවයක් ඉටු කර නොමැත.

(ii) යන්ත්‍රය දීර්ඝ කාලයක් තිස්සේ භාවිතා නොකිරීම සම්බන්ධයෙන් 2015 දී අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වන ලද අතර, 2020 දී අමාත්‍යාංශ මට්ටමින් තවත් පරීක්ෂණයක් පවත්වන ලදී. ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොමැති බව පරීක්ෂණ දෙකෙන්ම තහවුරු විය. කෙසේ වෙතත්, මෙම වාර්තාවල සොයාගැනීම් සම්බන්ධයෙන් කිසිදු පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් වග නොවන බව පෙන්නුම් විය. තවද, මෙම විගණනයේ දිනය වන විට විමර්ශන වාර්තාවල දක්වා ඇති නිර්දේශ සංස්ථාව ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම ගැටළු ව්‍යාපෘති සැලසුම් කිරීම, මූල්‍ය විචක්ෂණභාවය සහ වගවීම පිළිබඳ අඩුපාඩු පිළිබඳව දැඩි සැලකිල්ලක් මතු කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස මහජන අරමුදල්වල ඵලදායී නොවන වියදම් සහ සැලකිය යුතු කාලයකට පසුව වුවද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අඛණ්ඩව අපොහොසත් වීම සිදු වී ඇත.

**2.5** වෙනත් කරුණු

(අ) 2024 දෙසැම්බර් 31 දිනට ණයගැතියන්ගේ වයස් කාල විශ්ලේෂණයට අනුව, රුපියල් මිලියන 53.82 ක සමස්ත ණය ශේෂයක් මාසයක සිට අවුරුදු තුනක් දක්වා කාලයක් තුළ පියවා නොගෙන පැවතුනි. තවද ණයගැතියාගේ වයස් කාල විශ්ලේෂණයට අනුව, මාසයක සිට මාස 12 දක්වා කාලය තුළ ණයගැතියන්ගෙන් රුපියල් මිලියන 1,120.63 ක් හිඟව තිබූ අතර, වසර පහ ඉක්ම වූ ලැබිය යුතු රුපියල් මිලියන 148.91 ක් ඇතුළුව රුපියල් මිලියන 5,393.17ක් වසරකට වඩා වැඩි කාලයක් ඉක්ම වූ අයකර ගැනීමට නොහැකිව ණයගැතියන්ගෙන් හිඟව තිබුණි.

(ආ) 2018 දී, යොමු: BK/17/2018 ඉන්ධන නැව්ගත කිරීම ගොඩබෑමේ ප්‍රමාදය සම්බන්ධයෙන් ඉන්ධන සැපයුම්කරුවෙකු සංස්ථාවෙන් ඇමරිකානු ඩොලර් 50,400 ක ප්‍රමාද ගාස්තුවක් ඉල්ලා සිටින අතර සංස්ථාව ඒ අනුව ඇමරිකානු ඩොලර් 40,320 (රු. මිලියන 11.98 ට සමාන) ක මුදලක් ගිණුම්ගත කර ඇත. තවද, එම අවස්ථාවේ දී LIOC නෞකාවේ දිගුකාලීන මුදා හැරීමේ මෙහෙයුම් හේතුවෙන් ප්‍රමාදය සිදුවී ඇති බවට පදනම මත 2021 දී, ඉහත මුදල LIOC වෙතින් ලැබිය යුතු මුදලක් ලෙස ඒකපාර්ශ්විකව හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, වසර දෙකකට වැඩි කාලයක් ගත වී ඇතත්, සංස්ථාව තවමත් මෙම මුදල අයකරගෙන නොමැත.

(ඇ) 2022 දී සිදු වූ BK/01 සිට BK/135 දක්වා නැව්ගත කිරීම් නවයකට (09) අදාළ විහව ප්‍රමාද ගාස්තු ලෙස ඉන්ධන සැපයුම්කරුවෙකු ඇමරිකානු ඩොලර් මිලියන 3.36 ක් සහ ඇමරිකානු ඩොලර් මිලියන 3.62 ක් රඳවා ගෙන ඇත. මෙම මුදල් සංස්ථාව විසින් අයකර ගැනීමට හෝ එම සැපයුම්කරුට ගෙවිය යුතු මුදල්වලට එරෙහිව සුදුසු පරිදි පියවීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, මෙම වාර්තාවේ දිනය වන විට, ඉහත ලැබිය යුතු මුදල් අයකර ගැනීමට හෝ එම සැපයුම්කරු සමඟ රඳවා ගත් මුදල් සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණීමට සංස්ථාව අපොහොසත් වී ඇත.

(ඈ) 2022 සැප්තැම්බර් මාසයේදී, සංස්ථාව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ඉන්වොයිස් හතරක් යටතේ රුපියල් මිලියන 3.72 ක් වටිනා භූමිතෙල් ඉන්වොයිස් කර ඇත. පසුව, නිසි සමාලෝචනයකින් හෝ අනුමැතියකින් තොරව රුපියල් මිලියන 1.86 ක් වටිනා ඉන්වොයිස් දෙකක් අවලංගු කරන ලද අතර, ඉතිරි ඉන්වොයිස් දෙකට අදාළ භූමිතෙල් තොග නිකුත් කරන ලදී. කෙසේ වෙතත්, මෙම ඉන්ධන අලෙවියෙන් වසර දෙකකට වැඩි කාලයක් ගතවී ඇතත්, අදාළ මුදල තවමත් ලැබී නොමැති අතර එම මුදල සංස්ථාවට ගෙවිය යුතු බව තහවුරු කරන ශේෂ තහවුරු කිරීමක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලබාගෙන ද නොමැත. එපමණක් නොව සංස්ථාවේ ණය ප්‍රතිපත්තියට අනුව, ණය පදනමක් මත ඉන්ධන විකිණීම "එක් වරක් පමණක් ගනුදෙනු කරන ගනුදෙනුකරුවන්ට" සිදු නොකළ යුතුය. එහෙත් මෙම ප්‍රතිපත්තියට පටහැනිව, සංස්ථාව ඉහත භූමිතෙල් තොග එම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ණයට නිකුත් කර තිබුණි.

(ඉ) ගබඩා සහ අමතර කොටස්, නිමි භාණ්ඩ, රසායනික ද්‍රව්‍ය සහ අනෙකුත් අයිතමවලට අදාළ හඳුනා නොගත් ශේෂයන් රුපියල් මිලියන 611.42 ක් "නිෂ්කාශන ගිණුම්" ලෙස වර්ගීකරණය කර ඇති පොදු ලෙජර් වගකීම් ගිණුම් විස්සක් (20) යටතේ සටහන් වී තිබූ අතර, ඒවා 2010 සිට 2024 දක්වා නිෂ්කාශනය නොවී පැවතුනි.

(ඊ) වෙළඳ ලැබිය යුතු ගිණුම් ලෙස වර්ගීකරණය කරන ලද පුද්ගලික ගනුදෙනුකරුවන් 177 දෙනෙකුගෙන් ශේෂ තහවුරු කිරීම් කැඳවා කැඳවා තිබූ අතර එහි මුළු වටිනාකම රුපියල් මිලියන 5,438.51 කි. එයින් ගනුදෙනුකරුවන් 8 දෙනෙක් පමණක් ඔවුන්ගෙ ගෙවිය යුතු රුපියල් මිලියන 281.74 ක ශේෂයක් තහවුරු කර ඇත. තවද, ඉල්ලා සිටි ශේෂ තහවුරු කිරීම්වලින්, රුපියල් මිලියන 129.50 ක මුළු ශේෂයන් සම්බන්ධයෙන් ඉන්වොයිසි, ණය සටහන්, පාරිභෝගික ඇණවුම් වැනි ආධාරක ලේඛන විගණනය සඳහා ලබා ගත නොහැකි වූ අතර එම ශේෂයන් වසර තුනකට වැඩි කාලයක් තිස්සේ හිඟව පැවතුනි. මෙම ගැටළු වෙළඳ ලැබිය යුතු ගිණුම්වල සැලකිය යුතු කොටසක නිරවද්‍යතාවය, වලංගුභාවය සහ අයකර ගැනීමේ හැකියාව මෙන්ම ලැබිය යුතු ගිණුම් අධීක්ෂණය පිළිබඳ පාලනයන්හි ප්‍රමාණවත්භාවය පිළිබඳ ගැටළු මතු කරයි.

(උ) රේගු ගනුදෙනු සම්බන්ධයෙන් රුපියල් මිලියන 1,243.44 ක හර ශේෂයන් සංස්ථාවේ පොදු ලෙජරයේ වෙනම ලෙජර් ගිණුම් හයක් (06) යටතේ සටහන් කර තිබුණි. මෙම ශේෂයන් අයකර නොගෙන වසර දහයකට (10) වැඩි කාලයක් හිඟව පැවතුනි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය ප්‍රකාශනයට අනුව ඊට අනුරූපී ගෙවිය යුතු ශේෂයක් නොතිබුණි.

(ඌ) රට තුළ දැනට ක්‍රියාත්මක වන දුම්රිය සහ බවුසර් ප්‍රවාහන පද්ධතිය ඇතුළුව, රට තුළ භාවිතා කරන ලද ඛනිජ තෙල් ගබඩා ධාරිතාව සහ ඉන්ධන ප්‍රවාහන නල පද්ධතියේ යෝග්‍යතාවය සහ ඵලදායිතාව ඇගයීම පිළිබඳ විශේෂ විගණන වාර්තාවක් 2020 වර්ෂයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත්, වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නැත.

(ඍ) 2007 සිට 2009 දක්වා කාලය තුළ තෙල් ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් සිදු කරන ලද හෙජින් ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂණයට අනුව, එම ගනුදෙනුවලින් රටට සිදු වූ මුළු පාඩුව රුපියල් මිලියන 14,028 කි. එපමණක් නොව, කොමර්ෂල් බැංකුව ඇමරිකානු ඩොලර් 8,648,300 ක් ඉල්ලා සංස්ථාවට එරෙහිව කොළඹ වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කර තිබේ.

(ඎ) ටැංකි 100 කින් සමන්විත ත්‍රිකුණාමල ටැංකි සංකීර්ණය 1930 දී ඉදිකර 1964 දී ශ්‍රී ලංකාව විසින් අත්පත් කර ගන්නා ලදී. ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීම සහ භාවිතා කිරීම සඳහා මූලපිරීම් කිහිපයක් ආරම්භ කර තිබුණද, එම මූලපිරීම් 2021 වසර දක්වා ඵලදායී මෙහෙයුම් ප්‍රතිඵල බවට පත් නොවීය. 2021 දී, සංස්ථාව සහ ලංකා IOC (LIOC) ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීම අරමුණු කරගත් ගිවිසුමක් යටතේ ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් (පුද්ගලික) සමාගම - ඒකාබද්ධ ව්‍යාපාර සමාගමක් පිහිටුවන ලදී. කෙසේ වෙතත්, ඒකාබද්ධ ව්‍යාපාරය එහි උපායමාර්ගික සැලැස්මේ දක්වා ඇති නියමිත කාලරාමුව තුළ එහි ව්‍යාපාර මෙහෙයුම් ආරම්භ කිරීමට අපොහොසත් විය. සංවර්ධන අයවැයට මුදල් සැපයීමට අවශ්‍ය ආරක්ෂිත අභ්‍යන්තර හෝ බාහිර අරමුදල් ප්‍රභවයන් නොමැතිකම මෙම ප්‍රමාදයට ප්‍රධාන වශයෙන් හේතු විය. මෙහෙයුම් ක්‍රියාකාරකම් නොමැතිව තිබියදීත්, සමාගමට වාර්ෂිකව ආසන්න වශයෙන් රුපියල් මිලියන 32.04 ක අඛණ්ඩ පවත්වා ගැනීමේ පිරිවැයක් දැරීමට සිදුවී ඇති අතර, එයට අනුරූපී ආදායමක් හෝ උපායමාර්ගික ප්‍රගතියක් නොමැතිව අඛණ්ඩ මූල්‍ය බරක් නියෝජනය කරයි.

(ඏ) දැනට දේශීය ව බොරතෙල් සහ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 4,233 ක් පමණ වැය කරන අතර එය ශ්‍රී ලංකාවේ මුළු ආනයන වියදමෙන් සියයට 25.2 ක් පමණ වේ. මෙම මුදලින් ඇමරිකානු ඩොලර් මිලියන 1,137.50 ක් බොරතෙල් ආනයනය සඳහා සහ ඇමරිකානු ඩොලර් මිලියන 3,095.50 ක් පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වැය වේ. පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වන දේශීය ඉල්ලුම සපුරාලීමේදී, සපුගස්කන්ද පිරිපහදුව සියයට 25 ක් පමණ සපුරාලන අතර, සියයට 75 ක් ආනයන හරහා සපුරා ගනී. සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති යෝජනා සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ;

(i) ජාතික බලශක්ති ප්‍රතිපත්තියට අනුව, සපුගස්කන්ද පිරිපහදුව පුළුල් කිරීම සහ බලශක්ති ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා දෙවන පිරිපහදුවක් ඉදිකිරීම අවශ්‍ය වුවද, මෙම වාර්තාවේ දිනය වන විට කිසිදු ක්‍රියාත්මක කිරීමක් සිදුවී නොමැත. 2021 දී සිදු කරන ලද ශක්‍යතා අධ්‍යයනයක් සඳහා රුපියල් මිලියන 171.39 ක් ඇතුළුව ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රුපියල් මිලියන 1,684.53 ක මුළු වියදමක් දරා ඇත. කෙසේ වෙතත්, පිරිපහදුව නවීකරණය කිරීම හෝ

පුළුල් කිරීම සඳහා කිසිදු භෞතික ප්‍රගතියක් දක්නට නොලැබුණි. තවද, පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා අත්පත් කරගත් ඉඩම් නිෂ්ඵලව සහ භාවිතයට නොගෙන පවතින අතර, එම ස්ථානවල සංස්ථාව විසින් ආර්ථික වශයෙන් ඵලදායී ක්‍රියාකාරකමක් සිදු නොකෙරේ.

(ii) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, සපුගස්කන්ද නව පිරිපහදු ව්‍යාපෘතිය සඳහා අක්කර 59 ක භූමි ප්‍රමාණයකින් යුත් ඉඩම් කට්ටි 196 ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අත්පත් කර ගෙන තිබුණේ ඉඩම් කට්ටි 181 ක් පමණක් වන අතර, ඉතිරි ඉඩම් තවමත් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ පවතී.

(ඍ) සංස්ථාවේ එක් වරක් ගනුදෙනු කරන පාරිභෝගිකයන් සඳහා වන ගනුදෙනු ණය විකුණුම් ප්‍රතිපත්තියට අනුව නිතිමතින් ම මුදල් පදනමක් මත සිදු කළ යුතුය. කෙසේ වෙතත්, ඊට පටහැනිව, සංස්ථාව විසින් ගනුදෙනුකරුවන් 13 දෙනෙකුට රුපියල් මිලියන 9.55 ක මුළු විකුණුම් ලෙජර් ගිණුම් අංකය 900013 – "එක් වරක් ගනුදෙනුකරු" යටතේ වාර්තා කර ඇත, "මෙම ලැබිය යුතු මුදල් වලින් රුපියල් මිලියන 2.35 ක් මාස 0 -1 ක් සඳහා හිඟව පැවති අතර රුපියල් මිලියන 7.20 ක් අයකර නොගෙන වසර 2-3ක් සඳහා හිඟව පැවතුනි.

(එ) අදාළ ටෙන්ඩර් ලේඛනවල දක්වා ඇති ඉන්වොයිසි කොන්දේසිවලින් බැහැරව නැව්ගත කිරීම් දෙකක් සඳහා ඉන්වොයිසි කිරීමේ කටයුතු සඳහා නැව්භාර පතෙහි ප්‍රමාණයක් අයදුම් කිරීමට පෞද්ගලික විදේශීය සමාගමක් සමඟ එකඟ විය. මෙම අපගමනය තිබියදීත්, සංස්ථාව පසුව ටෙන්ඩරයේ 2.9.2.10 වගන්තියට අනුව ප්‍රතිදාන පාඩු දක්වමින් සැපයුම්කරුගෙන් එකඟතාවය ලබා නොගෙන හිමිකම් සඳහා රුපියල් මිලියන 787.45 ක හර නෝට්ටු දෙකක් රැස් කළේය. කෙසේ වෙතත්, සැපයුම්කරු මෙම හිමිකම් ප්‍රතික්ෂේප කර ඇත. පසුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයට අනුව, සැපයුම්කරුගේ ප්‍රතික්ෂේප කිරීම සැලකිල්ලට ගනිමින් ඉහත ලැබිය යුතු දේ සඳහා හානි ප්‍රතිපාදනයක් සිදු කරන ලදී. තවද, මෙම සිද්ධිය සම්බන්ධයෙන් විනිවිදභාවය සහ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා පරීක්ෂණයක් සිදු කරන ලෙස මණ්ඩලය අභ්‍යන්තර විගණන අංශයට උපදෙස් දුන්නේය. කෙසේ වෙතත්, මෙම වාර්තාවේ දිනය වන විට, සංස්ථාව අභ්‍යන්තර විමර්ශනය සම්පූර්ණ කිරීමට අපොහොසත් වී ඇත.

(ඒ) සැපයුම්කරු විසින් නැව්ගත කිරීමේ ඇණවුම් ප්‍රමාද වී ලබා දීම සහ කාර්ය සාධනය නොකිරීම හේතුවෙන් පිරිපහදු අංශයට සිදු වූ පාඩුව අයකර ගැනීම සඳහා අදාළ ටෙන්ඩර් ලේඛනවල හෝ ප්‍රදානය කිරීමේ ලිපිවල බැඳීම් නියමයන් සහ කොන්දේසි නොතිබුණද, සංස්ථාව ගිණුම්කරණයේ විචක්ෂණ සංකල්පයට පටහැනිව 2023 දී ලෙජර් ගිණුම්වල හර සටහන් දෙකක් නිකුත් කර රුපියල් මිලියන 6,971.70 ක් වෙනත් ආදායමක් ලෙස වාර්තා කර තිබුණි. තවද, 2024 ජනවාරි 23 වන දින පැවති රැස්වීමේදී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නොසැලකිලිමත්කම, ක්‍රියා පටිපාටික අඩුපාඩු හෝ හිතාමතා කරන ලද විෂමාචාර අලාභයට හේතු වූවාද යන්න තීරණය කිරීම සඳහා කිසිදු අභ්‍යන්තර පරීක්ෂණයක් නොපවත්වා, එකී ලැබිය යුතු දේ සඳහා හානි සඳහා ප්‍රතිපාදනයක් නිර්මාණය කිරීමට තීරණය කළේය.

(ඓ) පෙර විගණන වාර්තාවල නැවත අවධාරණය කළ පරිදි, සංස්ථාව 2010 දී CPSTL විසින් මිලදී ගෙන වැඩිදියුණු කිරීම් නොමැතිව ක්‍රියාත්මක කරන ලද යල් පැන ගිය SAP ECC 6.0 පද්ධතිය දිගටම භාවිතා කරයි. තවද, CPSTL විසින් පත් කරන ලද පුද්ගලික විගණන සමාගමක් විසින් රුපියල් මිලියන 8.60 ක වියදමින් SAP පද්ධතියේ විකුණුම් සහ බෙදාහැරීමේ ක්‍රියාවලිය පිළිබඳ ව්‍යවහාරික විගණනයක් සහ අභ්‍යන්තර පාලන සමාලෝචනයක් පවත්වන ලදී. විගණන වාර්තාව 2024 පෙබරවාරි 27 වන දින CPSTL වෙත නිකුත් කරන ලදී. කෙසේ වෙතත්, ව්‍යවහාරික විගණන වාර්තාවේ ඉස්මතු කර ඇති පද්ධතියට අදාළව සැලකිය යුතු සොයාගැනීම් තිබියදීත්, මෙම වාර්තාවේ දිනය වන විට සංස්ථාව හෝ CPSTL මෙම සොයාගැනීම් සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිකර්ම ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

(ඔ) 2023-2024 දී, අමාත්‍යාංශය, CPC සහ CPSTL ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සැපයුම් දාමය ශක්තිමත් කිරීම සඳහා සිනොපෙක්, RM පාර්ක්ස් ඉන්කෝපරේෂන් සහ යුනයිටඩ් පෙට්‍රෝලියම් සමඟ දිගුකාලීන ගිවිසුම් අත්සන් කළහ. මෙම ගිවිසුම් යටතේ, DODO ඉන්ධන පිරවුම්හල් 450 ක් එක් එක් සමාගමට 150 බැගින් මාරු කිරීමට නියමිතව තිබුණි. CPC හි වත්කම් මෙම සමාගම් වෙත පැවරීම පිළිබඳව පහත නිරීක්ෂණ සිදු කරන ලදී.

(i) ඉහත සමාගම් සමඟ ඇති කරගත් ගිවිසුමේ 5(ආ)(III) වගන්තියට අනුව, අදාළ අලෙවි නියෝජිත අවසන් කිරීමේ ගිවිසුමට අනුව, එක් එක් ඉන්ධන පිරවුම්හල සඳහා නිශ්චිත භාරදීමේ දිනයට පෙර, අලෙවිකරුවන් සංස්ථාවේ වත්කම් භාර දී හෝ ඔවුන්ගේ වෙළඳපල වටිනාකම සංස්ථාවට ගෙවා තිබිය යුතුය. කෙසේ වෙතත්, ඉහත සමාගම් තුනෙන් සංස්ථාවේ වත්කම්වල අයිතම 357 ක වටිනාකම අයකර ගැනීමට හෝ පවරා ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ii) සංස්ථාව 2024 මැයි 21 වන දින M/S SINOPEC Fuel Oil (Pvt) Limited සමඟ පමණක් උපකරණ කල්බදු ගිවිසුමකට එළඹුණු අතර, එය 2023 සැප්තැම්බර් සිට 2024 ජූනි 30 දක්වා කාලය සඳහා බලපැවැත්වෙන අතර එය තවමත් අලුත් කර නොතිබුණි. කෙසේ වෙතත්, අනෙක් සමාගම් දෙක සමඟ එවැනි ගිවිසුම්වලට එළඹ නොමැති අතර, 2024 සිට කිසිදු ගාස්තුවකින් තොරව සංස්ථාවේ වත්කම් භාවිතා කිරීමට ඔවුන්ට අවසර දෙන ලදී. තවද, ඉහත සමාගම සඳහා මාසික කල්බදු කුලිය තීරණය කිරීමේ පදනම විගණනය සඳහා ලබා ගත නොහැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, කුලී ගාස්තු වල සාධාරණත්වය සහ නිරවද්‍යතාවය විශ්වාසදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

(iii) M/S RM Parks Inc. වෙත භාර දුන් තෙල් ගබඩා ටැංකි 28 ක් සඳහා රුපියල් මිලියන 38.50 ක වෙළඳපල වටිනාකමක් සහ M/S United Petroleum (Pvt) Limited වෙත භාර දුන් තෙල් ගබඩා ටැංකි 10 ක් සඳහා රුපියල් මිලියන 13.90 ක වෙළඳපල වටිනාකමක් සංස්ථාව විසින් හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, සමාගම් දෙකටම මාරු කරන ලද අනෙකුත් වත්කම් තක්සේරු කර නොමැත. තවද, ප්‍රකාශිත වෙළඳපල වටිනාකම්වල සාධාරණත්වය සහ නිරවද්‍යතාවය සත්‍යාපනය කිරීම සඳහා විශ්වාසදායක තොරතුරු වෙත ප්‍රවේශ වීමට විගණනයට නොහැකි විය.

(iv) සංස්ථාව විසින් M/S SINOPEC හි උපකරණ කල්බදු ගිවිසුම් කොන්දේසි RM Parks Inc. සහ M/S United Petroleum (Pvt) Limited වෙත ද අදාළ කර ගත්තේ නම්, එහි වත්කම්වලින් රුපියල් මිලියන 46.06 ක් උපයා ගත හැකිව තිබුණි. එසේ කිරීමට අපොහොසත් වීමෙන් විභව ආදායම අහිමි විය.

(v) RM Parks Inc. සහ Sinopec වෙත මාරු කරන ලද අලෙවිකරුවන් 215 දෙනෙකුගෙන් සංස්ථාවට ලැබිය යුතු රුපියල් මිලියන 64.32 ක ලැබිය යුතු මුදල් තිබුණි. කෙසේ වෙතත්, ඉහත ගිවිසුමේ 05(ආ) (ii) ඡේදයේ දක්වා ඇති පරිදි, මාරු කිරීමට පෙර මෙම හිඟ ශේෂයන් අයකරගෙන හෝ අයකර ගැනීමේ නියමයන් සහිත අවසන් කිරීමේ ගිවිසුම් ක්‍රියාත්මක කර හෝ නොමැත.

(ඕ) 2024 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් 264 ක් සහ ව්‍යාපෘති 31 ක් සැලසුම් කර ඇති අතර, ඒ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 58,005.60කි. කෙසේ වෙතත්, ක්‍රියාකාරී ක්ෂේත්‍ර හයක් යටතේ රුපියල් මිලියන 178 ක් වටිනා ක්‍රියාකාරකම් 53 ක ප්‍රගතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොමැත.

අනුමත ක්‍රියාකාරී සැලැස්මේ විෂය පථයෙන් පිටත ඉංජිනේරු සහ පරිශ්‍ර අංශය විසින් රුපියල් මිලියන 12.6 ක් වටිනා ක්‍රියාකාරකම් හතරක් සිදු කර ඇතත්, මෙම අතිරේක ක්‍රියාකාරකම් පිළිබිඹු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර නොමැත. තවද, සංස්ථාව වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 13 ක් පැවැත්වුවද, රාජ්‍ය ව්‍යවසායන්හි ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 2.3 වගන්තියට අනුව අවශ්‍ය පරිදි 2024 සඳහා අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘතිවල ප්‍රගතිය මණ්ඩලය විසින් ඇගයීමට ලක් කර ඇති බවට කිසිදු සාක්ෂියක් නොමැත.

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | සටහන | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|---|
| | | 2024 | 2023 | 2024 | 2023 |
| | | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. |
| ආදායම | 2 | 923,441.58 | 1,263,602.85 | 929,197.15 | 1,261,783.07 |
| විකුණුම් පිරිවැය | | (847,721.02) | (1,101,488.23) | (855,206.62) | (1,105,709.24) |
| දළ ලාභය/ (අලාභය) | | 75,720.56 | 162,114.62 | 73,990.53 | 156,073.83 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 3 | 1,235.87 | 10,774.52 | 2,237.20 | 11,706.91 |
| විකුණුම් හා බෙදාහැරීම් වියදම් | | (45,072.71) | (54,011.66) | (34,005.96) | (44,665.65) |
| පරිපාලන වියදම් | | (15,270.47) | (29,005.98) | (20,953.79) | (34,122.79) |
| මෙහෙයුම් ලාභය / (අලාභය) | 4 | 16,613.25 | 89,871.49 | 21,267.98 | 88,992.30 |
| විනිමය අනුපාත විචලනය | 4.2 | 13,857.90 | 20,340.30 | 13,857.90 | 20,340.30 |
| මූල්‍ය ආදායම් | 5 | 3,634.82 | 17,588.92 | 3,969.94 | 17,898.96 |
| මූල්‍ය වියදම් | 6 | (1,175.13) | (7,454.35) | (1,201.97) | (7,484.87) |
| බදු පෙර ලාභය / (අලාභය) | | 32,930.84 | 120,346.36 | 37,893.85 | 119,746.69 |
| ආදායම් බදු වියදම | 7 | - | (36.00) | (1,616.83) | 315.11 |
| වසර සඳහා ලාභය / (අලාභය) | | 32,930.84 | 120,310.36 | 36,277.02 | 120,061.80 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | | | |
| ලාභය හෝ අලාභය සඳහා වර්ගීකරණය නොකෙරෙන අයිතම | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම සම්බන්ධ ලාභ/(අලාභ) නැවත ඇගයීම | 18 | (192.28) | (107.16) | (22.82) | (686.58) |
| ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන ලාභය | | - | - | 24,097.25 | - |
| වෙනත් විස්තීර්ණ ආදායම් මත බදු | | - | - | (7,280.01) | 173.82 |
| වසර සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් / (වියදම්) | | (192.28) | (107.16) | 16,794.42 | (512.76) |
| වසර සඳහා මුළු විස්තීර්ණ අදායම/ (වියදම) බදු පසු | | 32,738.55 | 120,203.20 | 53,071.44 | 119,549.04 |
| මුළු විස්තීර්ණ ආදායම සම්බන්ධිත | | | | | |
| ආයතනයේ හිමිකරුවන් | | 32,738.55 | 120,203.20 | 46,299.33 | 119,694.94 |
| පාලනය කළ නොහැකි අයිතිය | | - | - | 6,772.11 | (145.90) |
| | | 32,738.55 | 120,203.20 | 53,071.44 | 119,549.04 |

පිටු 113 සිට 143 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | සංස්ථාව 2024 | සංස්ථාව 2023 යළි ප්‍රකාශිත* | සමූහය 2024 | සමූහය 2023 යළි ප්‍රකාශිත* |
|---|---|---|---|---|---|
| | | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. |
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | **8** | 45,837.40 | 45,684.02 | 86,405.28 | 61,635.53 |
| ආයෝජන වත්කම් | **8.3** | 46.60 | 48.51 | 46.60 | 48.51 |
| අස්පෘශ වත්කම් | **8.4** | - | 0.20 | 103.77 | 9.53 |
| වත්කම් භාවිතා කිරීමේ අයිතිය | **9.2** | 110.88 | 97.00 | 320.32 | 310.89 |
| පරිපාලිත සමාගම් ආයෝජනය | **10** | 5,142.80 | 5,102.00 | - | - |
| ජංගම නොවන මූල්‍ය වත්කම් | **11** | 0.54 | 13.04 | 0.54 | 13.04 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ | **12** | 6,446.26 | 4,964.73 | 7,925.89 | 6,298.30 |
| | | 57,584.48 | 55,909.50 | 94,802.40 | 68,315.80 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොගය | **14** | 104,391.89 | 166,802.60 | 105,259.62 | 167,685.66 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ | **12** | 17,704.36 | 25,454.54 | 24,013.18 | 31,536.01 |
| කෙටි කාලීන ආයෝජන | | 190.69 | 169.84 | 1,338.86 | 1,169.84 |
| මුදල් හා මුදල් සමාන දෑ | **15** | 55,186.13 | 43,337.62 | 59,611.58 | 44,540.43 |
| | | 177,473.07 | 235,764.60 | 190,223.24 | 244,931.94 |
| **මුළු වත්කම්** | | **235,057.54** | **291,674.10** | **285,025.64** | **313,247.74** |
| **ස්කන්ධය හා වගකීම්** | | | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | | | |
| දායකත්ව ප්‍රාග්ධනය | **16** | 912,580.51 | 912,580.51 | 912,580.51 | 912,580.51 |
| ප්‍රාග්ධන හා සංචිත | **17.1** | 4,992.69 | 4,992.69 | 4,992.69 | 4,992.69 |
| මූල්‍ය වත්කම් මත සංචිතය | | (38.00) | (38.00) | (38.00) | (38.00) |
| නැවත තක්සේරුකරන සංචිතය | **17.2** | 28,049.11 | 28,049.11 | 28,049.11 | 28,049.11 |
| රඳවාගත් ඉපැයුම් | | (876,234.71) | (908,973.26) | (850.066.33) | (896,365.66) |
| පාලන කළ නොහැකි අයිතිය | | - | - | 15,694.69 | 8,883.38 |
| **මුළු ස්කන්ධය** | | 69,349.61 | 36,611.05 | 111,212.67 | 58,102.03 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | **18** | 2,046.22 | 1,734.71 | 3,953.20 | 3,653.61 |
| විලම්භිත බදු | **19.1** | 3,111.96 | 3,111.96 | 12,167.60 | 4,678.03 |
| ණය හා ණය ගැනීම්වල ජංගම නොවන කොටස | **20** | 7,822.28 | 9,271.53 | 7,822.28 | 9,271.53 |
| කල්බදු වගකීම් | **9.3** | 121.60 | 107.10 | 355.50 | 341.05 |
| | | 13,102.06 | 14,225.30 | 24,298.58 | 17,944.22 |
| **ජංගම වගකීම්** | | | | | |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | **21** | 151,199.36 | 180,408.45 | 148,107.81 | 176,772.17 |
| කල්බදු වගකීම් | **9.3** | 5.14 | 2.54 | 5.19 | 2.59 |
| ණය හා ණය ලබාගැනීම්වල ජංගම කොටස | **20.1** | 1,1401.37 | 1,406.85 | 1,401.37 | 1,406.85 |
| කෙටි කාලීන ණය ලබාගැනීම් | **22** | - | 59,019.90 | - | 59,019.90 |
| | | 152,605.87 | 240,837.74 | 149,514.37 | 237,201.51 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **235,057.54** | **291,674.10** | **285,025.64** | **313,247.74** |

*මෙහි දක්වා ඇති ඇතැම් සංඛ්‍යා 2023 මූල්‍ය ප්‍රකාශනවලට අනුරූප නොවන අතර 25 වන සටහනෙහි විස්තර කර ඇති පරිදි ගැලපීම් පිළිබිඹු කරයි.

පිටු 113 සිට 143 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

මෙම මූල්‍ය ප්‍රකාශන මගින් 2024 දෙසැම්බර් 31 වන දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි සමූහයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබාදෙන අතර, එම අවසන් වූ වර්ෂය සඳහා එහි ලාභයද මෙයින් පෙන්වයි.

M C D Perera
ACTG. DY. GENERAL MANAGER (FINANCE)

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලද්දේ,

D J A S De S Rajakaruna
CHAIRMAN

Dr. N K M C Neththikumara
MANAGING DIRECTOR

P C Hewa Thondilege
DIRECTOR

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| සංස්ථාව | දායක ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන සංචිත | ප්‍රාග්ධන සංචිත | මූල්‍ය වත්කම් මත සංචිත | රඳවා ගත් ඉපැයුම් | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|---|
| | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. |
| **2023 ජනවාරි 1 දිනට** | **912,580.51** | **28,049.11** | | **(38.00)** | **(1,032,316.2** | **(86,731.94)** |
| පූර්ව කාල ගැලපීම් | - | | - | - | 3,139.79 | 3,139.79 |
| **2023 ජනවාරි 1 දිනට සංශෝධිත ශේෂය** | **912,580.51** | **28,049.11** | | **(38.00)** | **(1,029,176.4** | **(83,592.15)** |
| වසර සඳහා ලාභය/ (අලාභය) | | | | | 120,310.36 | 120,310.36 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | | | (107.16) | (107.16) |
| ගැලපීම් | | | | | | - |
| **2023 දෙසැම්බර් 31 දිනට** | **912,580.51** | **28,049.11** | | **(38.00)** | **(908,973.26)** | **36,611.05** |
| වසර සඳහා ලාභය | | | | | 32,930.84 | 32,930.84 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | | | (192,28) | (192.28) |
| **2024 දෙසැම්බර් 31 දිනට** | **912,580.51** | **28,049.11** | | **(38.00)** | **(876,234.71)** | **69,349.61** |

| සමූහය | දායක ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන සංචිත | ප්‍රාග්ධන සංචිත | මූල්‍ය වත්කම් මත සංචිත | රඳවා ගත් ඉපැයුම් | කොටස් හිමියන්ගේ අරමුදල් | පාලනය කල නොහැකි අයිතිය | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. |
| **2023 ජනවාරි 1 දිනට** | **912,580.51** | **28,049.11** | **4,992.69** | **(38.00)** | | **(73,603.27)** | **9,106.69** | **(64,496.58)** |
| පූර්ව කාල ගැලපීම් | | | | | 3,139.79 | 3,139.79 | | 3,139.79 |
| **2023 ජනවාරි 1 දිනට** | **912,580.51** | **28,049.11** | **4,992.69** | **(38.00)** | | **(70,463.48)** | **9,106.69** | **(61,356.79)** |
| TPTL සඳහා ආයෝජනය | | | | | - | - | 49.00 | 49.000 |
| වර්ෂය සඳහා ලාභය | | | | | 120,072.50 | 120,072.50 | (10.71) | 120,061.79 |
| වසර සඳහා වෙනත් විස්තීර්ණ ආදායම | | | | | (377.56) | (377.56) | (135.20) | (512.75) |
| ගැලපීම | | | | | (12.82) | (12.82) | (6.41) | (19.23) |
| ගෙවූ ලාභාංශ | | | | | | | (120.00) | (120.00) |
| **2023 දෙසැම්බර් 31 දිනට** | **912,580.51** | **28,049.11** | **4,992.69** | **(38.00)** | **(896,365.66)** | **49,218.65** | **8,883.38** | **58,102.03** |
| TPTL සඳහා ආයෝජනය | | | | | | | 39.20 | 39.20 |
| වසර සඳහා ලාභය/ (අලාභය) | | | | | 35,167.15 | 35,167.15 | 1,109.87 | 36,277.02 |
| වසර සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් | | | | | 11,132.19 | 11,132.19 | 5,662.24 | 16,794.43 |
| ගැලපීම් | | | | | | | | - |
| ගෙවූ ලාභාංශ | | | | | | | | - |
| **2024 දෙසැම්බර් 31 දිනට** | **912,580.51** | **28,049.11** | **4,992.69** | **(38.00)** | **(850,066.33)** | **95,517.98** | **15,694.69** | **111,212.67** |

*මෙහි දක්වා ඇති ඇතැම් සංඛ්‍යා 2023 මූල්‍ය ප්‍රකාශනවලට අනුරූප නොවන අතර 25 වන සටහනෙහි විස්තර කර ඇති පරිදි ගැලපීම් පිළිබිඹු කරයි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2024 | 2023 | 2024 | 2023 |
| | රු. මි. | රු. මි. | රු. මි. | රු. මි. |
| **මෙහෙයුම් ක්‍රියාකරකම් තුළින් ලද මුදල් ප්‍රවාහ** | | | | |
| බදු පෙර ලාභය/(අලාභය) | **32,930.84** | **120,346.36** | **37,893.85** | **119,746.69** |
| **ගැලපීම් :** | | | | |
| ක්ෂය වීම | 2,435.35 | 2,634.63 | 3,150.48 | 3,465.41 |
| ලැයිස්තුගත ස්කන්ධ සඳහා වෙන්කිරීම | 12.50 | - | 12.50 | - |
| ක්‍රමක්ෂය කිරීම | 440.51 | 531.92 | 440.51 | 559.49 |
| වත්කම් භාවිතා කිරීමේ අයිතිය ක්‍රමක්ෂය කිරීම | 8.38 | 4.68 | 16.76 | 9.14 |
| විදේශ මුදල් පරිවර්තන මත උපලබ්ධි නොවූ විනිමය | (6,343.37) | (12,021.01) | (6,343.37) | (12,021.01) |
| ලාභාංශ ආදායම | - | (240.00) | - | (240.00) |
| පොළී ආදායම | (3,634.82) | (17,588.92) | (3,969.93) | (17,898.96) |
| හානිකරන සඳහා වෙන්කිරීම | - | 18,137.08 | 535.94 | 18,134.88 |
| පොළී | 1,158.51 | 7,439.95 | 1,158.51 | 7,439.95 |
| විශ්‍රාමික ගෙවීම් සඳහා ප්‍රතිපාදන | 319.95 | 352.13 | 658.21 | 652.64 |
| දේපළ, පිරියත හා උපකරණ අලෙවියෙන් (ලාභය)/ අලාභය) | (2.38) | (7.45) | (29.35) | (7.45) |
| කල්බදු පොලිය | 16.63 | 14.40 | 43.47 | 44.93 |
| වත්කම් ප්‍රත්‍යාගණය කිරීමෙන් ලැබූ අලාභය | - | - | 83.86 | - |
| විශේෂ ගාස්තු ක්‍රමක්ෂය කිරීම | 1,000.00 | 1,000.00 | 1,000.00 | 1,000.00 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහයුම් ලාභය /(අලාභය)** | **28,342.10** | **120,603.77** | **34,651.44** | **120,885.71** |
| | | | | |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | | | |
| තොග (වැඩිවීම) / අඩුවීම | 62,410.71 | (17,499.27) | 62,423.22 | (17,525.95) |
| වෙළඳාම සහ අනෙකුත් ලැබීම්වල (වැඩිවීම)/ අඩුවීම | 4,513.92 | 228,216.21 | 2,660.00 | 228,899.47 |
| වෙළඳාම සහ අනෙකුත් ගෙවීම්වල (වැඩිවීම)/ අඩුවීම | (24,028.27) | (56,004.72) | (23,774.31) | (56,616.82) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදන වන /(භාවිතා වන මුදල්)** | **71,238.46** | **275,315.99** | **75,960.35** | **275,642.41** |
| | | | | |
| ගෙවන ලද පොළිය | (1,158.51) | (6,896.51) | (1,158.51) | (6,896.51) |
| ගෙවන ලද විශ්‍රාම පාරිතෝෂිතය | (200.72) | (226.66) | (381.45) | (471.55) |
| ගෙවන ලද බදු / රැඳවුම් බදු | - | - | (145.97) | (19.23) |
| **මෙහෙයුම් ක්‍රියාකරකම් වෙතින් ලද/ (භාවිතා කළ) ශුද්ධ මුදල්** | **69,879.23** | **268,192.82** | **74,274.42** | **268,255.12** |
| | | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද මුදල් ප්‍රවාහ** | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල් | 2.38 | 7.45 | 29.35 | 7.45 |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම | (1,199.63) | (853.97) | (2,540.87) | (1.056.89) |
| ලාභාංශ ආදායම | - | 204.00 | - | 204.00 |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | - | - | (98.36) | - |
| ආයෝජන | (40.80) | (51.00) | 39.20 | 49.00 |
| ලැබූ පොළිය | 3,594.38 | 17,467.89 | 3,929.49 | 17,777.93 |
| ස්ථාවර තැම්පතු වල ආයෝජන | (20.86) | (87.00) | (169.03) | (1,087.00) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් ලද/ (භාවිතා කළ) ශුද්ධ මුදල්** | **2,335.47** | **16,687.37** | **1,189.78** | **15,894.49** |
| | | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | | |
| ගෙවන ලද ලාභාංශ | - | - | - | (120.00) |
| ලබාගත් අලුත් ණය | - | 450,053.03 | - | 450,053.03 |
| ණය ආපසු ගෙවීම | (60,344.43) | (708,705.51) | (60,344.43) | (708,705.51 |
| කල්බදු සඳහා ගෙවීම | (21.78) | (19.19) | (48.66) | (70.07) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද/ (භාවිතා කළ) ශුද්ධ මුදල්** | **(60,366.21)** | **(258,671.67** | **(60,393.09)** | **(258,842.5** |
| | | | | |
| **මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)** | 11,848.51 | 26,208.53 | 15,071.15 | 25,307.05 |
| වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | 43,337.62 | 17,129.09 | 44,540.43 | 19,233.38 |
| **වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | **55,186.13** | **43,337.62** | **59,611.58** | **44,540.43** |

පිටු 113 සිට 143 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1.1 ආයතනික තොරතුරු

### පොදු

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යනු 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත අනුව සංස්ථාපිත කර, පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සංස්ථාවකි. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 යන ලිපිනයෙහි පිහිටා ඇත.

### ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

| ආයතනය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, පිරිපහදුව සහ අලෙවිය |
| **අනුබද්ධ ආයතනය** ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත (පුද්ගලික) සමාගම | ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදා හැරීම |
| **අනුබද්ධ ආයතනය** ට්‍රින්කෝ පෙට්‍රෝලියම් පර්යන්ත (පුද්ගලික) සමාගම | ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන ඇතුළුව නමුත් ඒවාට සීමා නොවී ව්‍යාපාර කරගෙන යාමට, ගබඩා පහසුකම් හිමිකර ගැනීම, සංවර්ධනය කිරීම, භාවිතය සහ කළමනාකරණය කිරීම; සමාගම විසින් ගබඩා කර ඇති ඛනිජ තෙල් සහ ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හෝ වෙනත් නිෂ්පාදන ආනයනය කිරීම, ගබඩා කිරීම, විකිණීම සහ අපනයනය කිරීම; අදාළ නීති සහ රෙගුලාසි මගින් අවසර දී ඇති වෙනත් ඕනෑම ව්‍යාපාරයක් සිදු කිරීම. |

### මූලික සමාගම සහ බලාධිකාරය

සංස්ථාව බලශක්ති අමාත්‍යාංශය යටතට අයත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයට අනුව සංස්ථාවේ අවසන් පාලන පාර්ශවය ශ්‍රී ලංකා රජය වේ.

### නිකුත් කිරීම සඳහා බලය පවරන දිනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2025 ජූනි මස 30 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතය මඟින් ප්‍රකාශයට පත් කිරීමට අවසර දී ඇත.

### අනුකූලතා ප්‍රකාශය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් (මූල්‍ය ප්‍රකාශන) ඇතුළත් වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRSs/ LKASs) සහ 1971 අංක 38 මුදල් පනතේ විධිවිධාන හා ඊට පසුව සිදුකරන ලද සංශෝධන වලට අනුකූලව සකස්කර ඇත.

## 1.2 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති අන්තර්ගත SLFRS සහ LKAS (මෙතැන් පටන් SLFRS යනුවෙන් හඳුන්වනු ලැබේ.) වලට අනුකූලව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

ආයෝජන දේපළ සහ ඇතැම් කාර්යාල දේපළ හැර (දේපළ, පිරියත සහ උපකරණ ලෙස වර්ගීකරණය කර ඇති) මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත්තේ උපචිත පදනම සහ ඓතිහාසික පදනමටයි. මූල්‍ය වත්කම් අගය කර තිබෙන්නේ සාධාරණ වටිනාකම් සහ හඳුනාගත් වර්තමාන ප්‍රතිලාභ වගකීම් වටිනාකම අනුව වේ.

### ගිණුම් ඉදිරිපත් කරන ව්‍යවහාර මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල්වලින් ඉදිරිපත් කර ඇති අතර එය ලංකාව තුළ භාවිත වන ව්‍යවහාර මුදල් වේ. වෙනත් ආකාරයකින් දක්වා ඇති අවස්ථාවන් හැර සෙසු සියලු අගයන් ආසන්නතම මිලියනය දක්වා වටයා ඇත.

### ප්‍රමාණාත්මක සහ සමූහනය

මූල්‍ය ප්‍රකාශන තුළ සමාන අයිතම වල සෑම ද්‍රව්‍ය පන්තියක්ම වෙන වෙනම ඉදිරිපත් කර ඇත. අසාමාන්‍ය ස්වභාවයක් හෝ ක්‍රියාකාරිත්වයක් ඇති අයිතම ඒවා වැදගත් නම් වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

### ඒකාබද්ධ කිරීමේ පදනම

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන,සංස්ථාව සහ එහි අනුබද්ධිත සමාගම් වලින් සමන්විත වේ. (සමූහය ලෙස හැඳින්වේ).

අනුබද්ධ ආයතන යනු සමූහය විසින් පාලනය කරනු ලබන ආයතන වේ. සමූහය නිරාවරණය වූ විට හෝ අයිතිවාසිකම් ඇති විට, ආයෝජකයා සමඟ ඇති සම්බන්ධතාවයෙන් විචල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීම සහ ආයෝජකයා කෙරෙහි ඇති බලය තුළින් එම ප්‍රතිලාභ කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාව ඇති විට පාලනය ලබා ගත හැකිය.

නිශ්චිතවම, සමූහය ආයෝජකයෙකු විසින් පාලනය කරන්නේ පමණක්ම වේ නම්, කණ්ඩායමට :

- ආයෝජකයා කෙරෙහි බලය (එනම්, ආයෝජකයාගේ අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමට වර්තමාන හැකියාව ලබා දෙන පවත්නා අයිතිවාසිකම්)
- ආයෝජකයා සමඟ සම්බන්ධවීමෙන් ලැබෙන විචල්‍ය ප්‍රතිලාභ සඳහා නිරාවරණය හෝ අයිතිවාසිකම්
- එහි ප්‍රතිලාභ කෙරෙහි බලපෑම් කිරීමට ආයොජකයාට වඩා එහි බලය භාවිතා කිරීමේ හැකියාව ලැබෙනු ඇත.

පොදුවේ ගත් කළ, ඡන්ද අයිතියෙන් බහුතරයක් පාලනය කිරීමට හේතු වේ යැයි උපකල්පනයක් ඇත. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) හි කොටස් වලින් 2/3 ක් සංස්ථාව සතුව ඇති අතර, CPSTL එහි අනුබද්ධිත ආයතනය ලෙස සලකයි.

ට්‍රින්කො පෙට්‍රෝලියම් ටර්මිනල් (ප්‍රයිවට්) ලිමිටඩ් (TPTL) හි කොටස් වලින් 51% ක් සංස්ථාව සතුව ඇති අතර TPTL සංස්ථාවේ අනුබද්ධ ආයතනය ලෙස සලකයි.

ඉහත පාලන අංග තුනෙන් එකක් හෝ වැඩි ගණනක වෙනස්කම් ඇති බව කරුණු සහ තත්වයන් පෙන්නුම් කරන්නේ නම් සමූහය එය ආයෝජකයෙකු පාලනය කරන්නේද නැද්ද යන්න නැවත තක්සේරු කරයි. අනුබද්ධිත ආයතනයක් ඒකාබද්ධ කිරීම ආරම්භ වන්නේ සමූහය අනුබද්ධිතයා මත පාලනය ලබාගත් විට සහ සමූහයට අනුබද්ධිත පාලනය අහිමි වූ විට නතර වීමෙනි. වර්ෂය තුළ අත්පත් කර ගත් හෝ බැහැර කරන ලද අනුබද්ධිත ආයතනයක වත්කම්, වගකීම්, ආදායම සහ වියදම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වේ. වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකරන්නේ නම් සහ අනුබද්ධිතයාගේ මූල්‍ය ප්‍රකාශන සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව සකස් කර ඇති අතර, ඒවා දෙසැම්බර් 31 වනදායින් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් ඇත.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සියලුම අන්තර කණ්ඩායම් ශේෂයන් සහ ගනුදෙනු, ආදායම සහ වියදම් ඉවත් කරනු ලැබේ.

#### පාලනය නොකරන අවශ්‍යතා

ලාභය හෝ අලාභය සහ අනුබද්ධිත අනෙකුත් විස්තීර්ණ ආදායම්වල (OCI) එක් එක් අංගයන් සමූහයේ මූලු කොටස් හිමියන්ට සහ පාලනය නොකිරීමේ අවශ්‍යතාවන්ට ආරෝපණය කර ඇත.

## 1.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්

සම්මත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් පෙර වර්ෂවල භාවිත කළ ප්‍රතිපත්තිවලට අනුකූල වේ.

#### සංසන්දනාත්මක තොරතුරු

පෙර වර්ෂවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇති අතර, වඩා හොඳ ඉදිරිපත් කිරීමකට අදාළ වන අතර, වත්මන් වර්ෂයේ ප්‍රකාශ සමඟ සැසඳිය හැකිය.

#### අඛණ්ඩ පැවැත්ම

මෙම මූල්‍ය ප්‍රකාශන සකසා ඇත්තේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා සමූහය අඛණ්ඩ පැවැත්මෙන් ව්‍යාපාර කටයුතු සිදු කරන්නේය, එනම් පුරෝකථනය කළ හැකි අනාගතයක් උදෙසා මෙහෙයුම් කටයුතු සිදු කරන්නේය යන උපකල්පනය මත පදනම්වය. එබැවින්, 2024 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර සඳහා සකසන ලද මූල්‍ය වාර්තාවන්ට අනුව සිය මෙහෙයුම්වල ප්‍රමාණාත්මක අඩු කිරීමේ හෝ භෞතික වශයෙන් සීමාකිරීමේ අදහස හෝ අවශ්‍යතාවල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට නැතැයි උපකල්පනය කෙරෙයි.

#### ප්‍රමාණාත්මක ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා ඇතැම් තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතා කිරීම අවශ්‍ය වේ. සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලියේදී එහි විනිශ්චය ක්‍රියාත්මක කිරීම කළමනාකරණයට අවශ්‍ය වේ. විනිශ්චයන් සහ ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ ඓතිහාසික අත්දැකීම් සහ තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අපේක්ෂාවන් ඇතුළු වෙනත් සාධක මතය. එබැවින් සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු මත පවතින උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරෙන අතර ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධනයන් අනාගතයේදී හඳුනා ගැනේ.

ඉහළ මට්ටමේ විනිශ්චයන් හෝ සංකීර්ණත්වයක් ඇති ක්ෂේත්‍ර හෝ මූල්‍ය ප්‍රකාශන සඳහා උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර අදාළ සටහන් වල පහත පරිදි විස්තර කෙරේ.

- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂිකය : සටහන අංක 1.4.12
- මූල්‍ය වත්කම් හානි කිරීම : සටහන අංක 1.4.14
- දේපළ, පිරියත සහ උපකරණවල ඵලදායී ආයුකාලය : සටහන අංක 1.4.6
- විලම්භිත බදුකරණය : සටහන 1.4.2

## 1.4 ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

### 1.4.1 ආදායම් හඳුනා ගැනීම

නිෂ්පාදන පාරිභෝගිකයා වෙත ලබා දෙන විට කාර්ය සාධන වගකීම තෘප්තිමත් වන ප්‍රමාණයට ආදායම හඳුනා ගැනේ. තවද, නිෂ්පාදන පාරිභෝගිකයා විසින් පිළිගැනීමට බලපාන ඉටු නොකළ වගකීමක් නොමැති අතර ,සාධාරණ අගයකින් ගණනය කරමින් එය මුදලින් ලැබුනා හෝ නොලැබුන ආදායම ලෙස සටහන් කරනු ලබන අතර ඒ සඳහා ගිවිසුම්ගත කරුණු කෙරෙහිද ව්‍යාපාර ශුද්ධ බදු වලින් පසු මුදලද සැලකිල්ලට ගනු ලැබේ.ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් යටතේ ලබා දිය හැකි භාණ්ඩ සහ සේවා වෙනම කාර්ය සාධන බැඳීම් ('බැඳීම්') ලෙස හඳුනා ගැනේ. තනි භාණ්ඩ හා සේවා වෙනම බැඳීම් ලෙස හඳුනා ගත යුතු නිර්ණායක සපුරා නොමැති විට, වෙනම බැඳීමක් හඳුනා ගන්නා තෙක් ඒවා ගිවිසුමේ ඇති අනෙකුත් භාණ්ඩ හා/ හෝ සේවාවන් සමඟ එකතු කරනු ලැබේ.

ගනුදෙනු මිල හඳුනාගත් බැඳීම් අතර වෙන් කරනු ලබන්නේ බැඳීම්වල සාපේක්ෂ විකුණුම් මිල ගණන් අනුව ය. ගිවිසුමේ ඉදිරිපත් කළ හැකි සෑම බැඳීමකම ස්වාධීන විකුණුම් මිල තීරණය කරනු ලබන්නේ, බැඳීමෙහි ඇතුළත් කර ඇති එකම භාණ්ඩ හා සේවා සමාන පාරිභෝගිකයෙකුට ස්වාධීන පදනමක් මත විකිණීමෙන් සමූහය ලබා ගන්නා මිල ගණන් අනුව ය. සංස්ථාව විසින් නිර්වචනය කරන ලද ව්‍යවස්ථාපිත සහ අනෙකුත් අවශ්‍යතා හෝ පිරිවැය සහිත සාධාරණ ආන්තික ප්‍රවේශය අනුව ස්වාධීන විකුණුම් මිල ගණන් ඇස්තමේන්තු කරයි.

සංස්ථාව ස්වාධීන මිල තීරණය කිරීම සඳහා කොන්ත්‍රාත්තුවේ සපයා ඇති වට්ටම්/කොමිස් මුදල් සලකා බලන අතර මෙම වට්ටම් විකුණුම් සහ බෙදාහැරීමේ වියදම්වල හඳුනාගනු ලැබේ.

#### භාණ්ඩ විකිණීම

භාණ්ඩවල හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සම ප්‍රතිලාභ ගැනුම්කරු වෙත ලබා දුන් විට, සලකා බැලීම යථා තත්වයට පත් කිරීම, ආශ්‍රිත පිරිවැය සහ භාණ්ඩ ආපසු පැමිණීම විශ්වාසදායක ලෙස තක්සේරු කිරීම, භාණ්ඩ සමඟ අඛණ්ඩ කළමනාකරණ සම්බන්ධතාවයක් නොමැති අතර, ආදායමේ ප්‍රමාණය විශ්වාසනීයව මැනිය හැකි වීම යන කරුණු මත භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලබයි.

භාණ්ඩ යැවීමේදී භාණ්ඩ අලෙවියෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලැබේ. නැතහොත් භාණ්ඩ පාරිභෝගිකයාට භාර දීමේදී නෛතික හිමිකාරිත්වය පැවරෙන්නේ පාරිභෝගිකයාට භාණ්ඩ ලබා දීමෙන් පසුව පමණි. එවැනි සෑම අවස්ථාවකදීම, භාණ්ඩ බෙදාහරින විට හෝ බෙදාහරින විට සහ බෙදාහරින්නන් / ගනුදෙනුකරුවන් විසින් පිළිගත් විට විකුණන ලද භාණ්ඩ කෙරෙහි විධිමත් පාලනයක් නොමැත.

#### ගිවිසුම්ගත වත්කම්

ගිවිසුම්ගත වත්කමක් යනු ගනුදෙනුකරු වෙත මාරු කරන ලද භාණ්ඩ හා සේවා සඳහා හුවමාරු කර ගැනීමේ අයිතියයි. පාරිභෝගිකයා විසින් මුදල් ගෙවීමට පෙර හෝ ගෙවීමට නියමිත දිනට පෙර පාරිභෝගිකයෙකුට භාණ්ඩ හෝ සේවා මාරු කිරීමෙන් සංස්ථාව ගිවිසුම ඉටු කරන්නේ නම්, එය ගිවිසුම්ගත වත්කමක් ලෙස හඳුනාගනු ලැබේ.

#### ගිවිසුම්ගත වගකීම්

ගිවිසුම්ගත වගකීමක් යනු සංස්ථාව විසින් පාරිභෝගිකයාගෙන් මුදල් ලබාගෙන ඇති විට භාණ්ඩ හෝ සේවා මාරු කිරීමට සංස්ථාවේ බැඳීමයි.භාණ්ඩ හෝ සේවා පාරිභෝගිකයා වෙත මාරු කිරීමට පෙර ගනුදෙනුකරුවෙකු සඳහා මුදල් ගෙවන්නේ නම්, ගෙවීම සිදු කිරීමත් සමඟ එය ගිවිසුම්ගත වගකීමක් ලෙස හඳුනා ගැනේ. සංස්ථාව කොන්ත්‍රාත්තුව යටතේ කාර්ය සාධන වගකීම් සම්පූර්ණ කරන විට සංස්ථාව ගිවිසුම්ගත වගකීම් ආදායමක් ලෙස හඳුනාගනී. වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු වගකීම් යටතේ ගිවිසුම්ගත වගකීම් අනාවරණය කර ඇත.

#### පොලී ආදායම සහ වියදම

ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලබන සියලුම මූල්‍ය උපකරණ සඳහා. ඵලදායී පොලී අනුපාතය භාවිතා කරමින් පොළී වියදම් සහ ආදායම සටහන් කරනු ලැබේ. එය ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ආයු කාලය හෝ කෙටි කාලයක් තුළ ශුද්ධ ධාරක වටිනාකමට වට්ටම් කරන අනුපාතයයි.

මූල්‍ය වත්කම් හෝ වගකීම්වල ශුද්ධ ධාරක වටිනාකමට එකතු කිරීමේ හැකියාව සැක සහිත නොවේ නම් මිස පොලී ආදායම උපචිත පොළිය ලෙස හඳුනා ගැනේ. ආදායම් ප්‍රකාශනයේ සේවක ණය පොලිය හැර පොලී ආදායම මූල්‍ය ආදායම යටතේ දක්වා ඇති අතර පොලී වියදම මූල්‍ය වියදම යටතේ දක්වා ඇත.

#### ලාභාංශ

ගෙවීම් කොටස් කරුවන්ට ලැබීමේ අයිතිය තහවරු වූ විට ලාභාංශ ආදායම හඳුනා ගැනේ.

#### කුලී ආදායම

කුලී ආදායම කල්බදු කාල සීමාව සඳහා රේඛීය පදනමක් මත ගණනය කරනු ලබන අතර ලාභ හෝ අලාභ ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායමට ඇතුළත් වේ.

සංස්ථාවේම පිරවුම්හල් සඳහා මාසික කුලී ගාස්තු හඳුනාගනු ලබන්නේ අදාළ අලෙවිකරුවන් විසින් උපයන වට්ටම් මත පදනම්ව වේ.

#### දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබෙන ලාභය / අලාභය

දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ඇතිවන ලාභය (අලාභය) විකිණීම සිදුවන කාල සීමාව තුළ හඳුනාගෙන ඇති අතර, වෙනත් ආදායම් යටතේ වර්ගීකරණය කර ඇත.

#### ආයෝජන සුරැකුම්පත් වලින් ඇතිවන ලාභ හෝ අලාභ

ආයෝජන සුරැකුම්පත් වලින් ඇතිවන **ලාභ හෝ අලාභ**ගනුදෙනුව සිදු වූ දිනය වන විට කොටස් සහ මූල්‍ය උපකරණ විකිණීමෙන් ඇතිවන ලාභ හෝ අලාභ

#### වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 1.4.2 වියදම් හඳුනා ගැනීම

ව්‍යාපාර පවත්වාගෙන යාමේ දී සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව නඩත්තු කිරීම සඳහා දරන ලද සියලු වියදම් මෙම කාල සීමාව සඳහා ආදායම් ප්‍රකාශයට අයකර ඇත.

#### බදුකරණය

මෙම කාල සීමාව සඳහා වන බදු වියදම් වර්තමාන හා විලම්භිත බද්දෙන් සමන්විත වේ.

#### i. වර්තමාන බදු

වර්තමාන සහ පෙර කාල පරිච්ඡේදයන් සඳහා පවත්නා ආදායම් බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති පරිදි සහ ආදායම් හා වියදම්වල සංරචක මත පදනම්ව බදු අධිකාරීන්ගෙන් අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන ප්‍රමාණය 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සහ එහි සංශෝධන අනුවය.

කොටස් වලින් හෝ වෙනත් පුළුල් ආදායමකින් සෘජුවම හඳුනාගෙන ඇති අයිතම වලට අදාළ වර්තමාන ආදායම් බද්ද කොටස් හෝ වෙනත් පුළුල් ආදායමකින් හඳුනාගෙන ඇති අතර එය ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ නොව වෙනත් විස්තීරණ ආදායම් ලෙස හඳුනා ගැනේ.

#### ii. විලම්භිත බදුකරණ

වත්කම් හා වගකීම්වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා ඒවා රැගෙන යන මුදල් අතර වාර්තා කිරීමේ දිනය තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්භිත බදු සඳහා ප්‍රතිපාදන සපයනු ලැබේ.

ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක වත්කමක් හෝ වගකීමක් මුලින් හඳුනා ගැනීමෙන් විලම්භිත ආදායම් බදු වගකීම් පැන නගින විට හැර, බදු අය කළ හැකි සියලු තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත ආදායම් බදු වගකීම් හඳුනාගෙන ඇත.

අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සහ ඉදිරියට ගෙන යාම සඳහා බදු අයකළ හැකි ලාභයක් ලබා ගත හැකිතාක් දුරට, අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් භාවිතයට නොගත් බදු වත්කම් ඉදිරියට ගෙනයාම සහ භාවිතයට නොගත් බදු අලාභයන් සඳහා විලම්භිත ආදායම් බදු වත්කම් හඳුනාගෙන තිබේ. අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් වලට අදාළ විලම්භිත ආදායම් බදු වත්කම් ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක වත්කමක් හෝ වගකීමක් මුලින් හඳුනා ගැනීමෙන් සහ ගනුදෙනුවේදී හැරෙන්නට භාවිතා නොකළ බදු වත්කම් සහ භාවිතයට නොගත් බදු අලාභ භාවිතා කළ හැකිය. එම වටිනාකම් ගිණුම්කරණ ලාභයට හෝ බදු අය කළ හැකි ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැත.

